THARANGA DISSANAYAKE

# තරංගා දිසානායක

තාරා පොතක්



http://e-pusthakalaya.blogspot.com/

# මාල ගිරා තටු

Mala Gira Thatu

ප්‍රථම මුද්‍රණය 2013

© තරංගා දිසානායක

ISBN. - 978 - 955 - 1116 - 72 - 9

කවර නිර්මාණය : විහංග නයනජිත්

පරිගණක අක්ෂර සංයෝජනය : දිනූෂා විරාෂිනී

ප්‍රකාශනය හා බෙදා හැරීම :

තාරා ප්‍රකාශන
250 / A / 6,
පින්කොටුවත්ත,
පොල්ගහජේන,
රාගම.
0714 - 244873 / 071 - 1705595
tharaprakashana@gmail.com

මධු ප්‍රින්ටින් වර්ක්ස්
71 / බී නව නුවර පාර,
උඩුපිල, දෙල්ගොඩ.



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

# 01

කලාභවනේ ඉදිරිපිට විහාර මහාදේවි උද්‍යානයේ යකඩ වැට දිගට චිත්‍ර රාශියක් එල්ලා තිබේ. සංකේත් තම රථය අයිනට වෙන්නට නතර කළේය.

"ඇයි දැන් හදිස්සියි කියලා නේද දුවගෙන ආවේ..?"

සංකේත්ගේ අතිජාත මිතුරා විමසුවේය. මේ ඔවුන් පිටත්ව ගියේ පන්නිපිටියේ විකුණන්නට තිබුණ ඉඩමක් බලන්නටය. ගැනුම්කරුවන් බොහෝමයක් ඇති බැවින්.. අපායට යා යුත්තේත් පළමුවෙන් වග පංකජ නම් දැන සිටියේය.

"ලස්සන චිත්‍ර ටිකක් බලලම යමු.."

"අනේ මන්දා උඹ නම්.."

පංකජ කාරයෙන් බැස්සේ නැත.

"මල ඉලව් චිත්‍ර.. අඳින්ඩ පුළුවන් නම් කමකුත් නෑ.."

සංකේත් පළමු චිත්‍රය අභියස නැවතුණේය. එහි වූයේ කුඩා දැරියන් දෙදෙනකු තුරුළු කරගත් ගැහැනියක පායන හිරු දෙස බලා සිටිනා අයුරකි. ගැහැනිය හා දරු දෙදෙනා අඳුරේය. ඈතින් පායන හිරු රන්වන් පාටය.

එවැනි සුන්දර, හැඟීම්බර තේමා රැගත් චිත්‍ර යකඩ වැට දිගටම එල්ලා තිබුණි.

අවුරුදු පහළොවක තරම් කුඩා කෙට්ටු කෙල්ලක තමා වෙතට පැමිණෙනු සංකේත් දුටුවේය. මේ චිත්‍ර අඳින්නේ මේ නාඹර කෙලි පැටික්කිය විය නොහැකිය.

"අයියා.. පේන්ටින් එකක් ගන්නවද.."

"ගන්න නම් ඕන.. කීයද මේක..?"

සංකේත් අත ළඟම තිබූ චිත්‍රය පෙන්නුවේය. එහි වූයේ රාත්‍රී සඳ පැයූ පාළු දර්ශනයකි.

"ඒක පන්දාහයි.."

"කවුද මේවා අඳින්නෙ..?"

"අක්කා.."

ඇය එසේ කියමින් ඈත ගණුදෙනුකරුවෙකුට චිත්‍රයක් විස්තර කරමින් උන් සුදු යුවතියක පෙන්වූවාය. ඇය උන්නේ පැත්තට හැරීගෙනය. සංකේත් ඇගේ මුහුණ හරිහැටි දැක්කේ නැත.

"මට මේක දෙන්න.."





සංකේත්.. තම පසුබිම්යෙන් දම්පාට පන්දාහේ නෝට්ටුවක් ගෙන දැරිය අතට දුන්නේය. දැරිය එම චිත්‍රය ගලවා සංකේත් අතට දුන්නාය. තවත් පරක්කු වූවහොත් මිතුරාගෙන් බැනුම් අහන්නට සිදුවෙයි.

චිත්‍රය කාරයේ පසුපස අසුනට හේත්තු කළ සංකේත් රිය පැණ ගැන්වූයේය.

"ලස්සන චිත්‍ර ටිකක් තිබුණා.."

පංකජ එයට හූ මිටි තැබුවේ නැත. මේ යන්නේ ව්‍යාපාරික ගමනකි. සංකේත් රණබාහු වික්‍රමසූරිය පවුලේ එකම පුතාය. ඔහු සතු වගකීම් රාශියක් තිබේ. පන්නිපිටියේ පර්චස් හතළිහක පමණ ඉඩමක් ඇතැයි පුවත්පත් දැන්වීමට තිබුණි. ඔහු එම ඉඩම බැලීමට අදහස් කළේ පන්නිපිටිය වැනි ප්‍රදේශයක් ආයෝජනයට හොඳ කඩඉමක් සේ පෙනුණ නිසාය.

සංකේත් පන්නිපිටියේ ඉඩම් අසළට පැමිණෙන විට ඉඩම් හිමි ගුණසිංහ එතනට ඇවිත් තිබුණි. ප්‍රධාන පරේ හයිලෙවල් පාරට මායිම් අතුරු පාරකට ද මායිම්ව පිහිටා තිබුණ එම ඉඩමේ සැහෙන ආර්ථක වටිනාකමකින් යුතු එකක් වග සංකේත් අවබෝධ කර ගත්තේය.

"මේක බලන්ඩ කීප දෙනෙක් ආවා මහත්තයා.. මෙතන ඉතින් පාර අයිනෙ හින්දා.. බිස්නස් එකකට තමයි හොඳ.."

ගුණසිංහ කියා සිටියේය.

"එතකොට අංකල්.. ඔම පාර අයිනෙ තියෙන කඩ.."



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

"ඒක නම් මය සයිකල් වැඩපොලක්.. අනික කෙසෙල් කඩනේ.. ඒවාගෙ බද්ද ඉවරයි.. තාවකාලිකව හදාගෙන ඉන්නෙ.."

ගුණසිංහ තවත් යමක් කියන්න පැටලෙන විග සංකේත් තේරුම් ගත්තේය.

"ඇයි අංකල්..?"

"මහත්තයො.. මේ එහා පාර කෙළවරට වෙන්න තියෙන පොඩි ගේ.. ඒකත් මං කුලියට දීලා තියෙන්නෙ.. ඒ මිනිස්සු දැන් අවුරුදු ගාණක් තිස්සෙ ඉන්නවා.."

"මෙහෙමයි අංකල්.. මට කුලීකාරයො, කඩකාරයො ඉවත් කරලා දෙන්න.. මට ඕවාට වෙහෙසෙන්න වෙලාවක් නෑ.. ඉඩම මම ගන්නම්.. මට වෙක් කරගන්න ඔප්පුවෙ කොපියක් දෙන්න.."

The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

එසේ කියූ සංකේත් ඉඩමේ පහළට ඇවිදගෙන ගියේය. ඈත කොණට වන්නට තනි පලයට ගැසූ කුඩා ගෙය පැහැදිලිව පෙනේ. අතුරුපාරට ගේට්ටු දමා තාවකාලික වැටකින් ගේ වෙන්කර ඇත. ඒ ගෙදර සිට ළමුන් රාශියක් පාරට යන හැටිත්, ඒ ළමයින් ගෙන යාමට වාහන පෝලිමක්, ත්‍රීවීලර්, මෝටර් සයිකල් ආදිය නවතා ඇති සැටිත් සංකේත් දුටුවේය.

"ඒ මහත්තයෝ.. ඒ ගෙදර ඉන්නෙ ඉස්කෝලෙ නෝනා කෙනෙක්.. රස්සාව නැතිවෙලා.. දැන් ටියුෂන් කරනවා.. මය ගෙදර ඇතුළෙ පන්තියක් කරනවා.."

"ඒක කරදරයි අංකල්.. මට ඒ ගේ හිස් කරලා දෙන්න.. ඉස්සරලාම මං මේක වටේටම තාප්පෙ බඳින්න ඕන.."





ගුණසිංහගේ හිතට සතුටක් ආවේය. මේ ඉඩම දැන් අවුරුදු ගණනක් තිස්සේ විකුණන්නට බලාපොරොත්තු වූ නමුත් එය සිදුවුණේ නැත. නියම ගැණුම්කරුවා දැන් පැමිණ ඇත. තමා ඉඩම විකුණන්නට බලාපොරොත්තු වන බව ඉංග්‍රීසි නෝනා දනියි. ඇය හිත හොඳ ගැහැනියක වුවද.. දැන් ඉතින් ගෙය නැවත ඉල්ලා ගත යුතු වෙයි. පව් පිං බල බලා මේ වැඩ කරන්නට නොහැකිය.

* * * * * * *

සංතුසීත්, ඩිනලිත් ගෙදර පැමිණියේ හොඳටම හෙම්බත් වීමෙනි. වෑන් එකක් නවතා ඉතිරි චිත්‍ර සමූහය නැවත ගෙට ගෙනෙනා හැටි අනුත්තරාට පෙනෙයි. තම දරුවන් දෙදෙනා ජීවිතය ගෙන යාමට විශාල දුකක් විඳින හැටි ඇයට පෙනෙයි. එහෙත්.. ලොකු දුව සංතුසී.. ලෙහෙසියෙන් සැලෙන්නේ නැත. ඇය තම ජීවන ගමනට ශක්තියක් වෙමින් සිටින්නීය.

ඩිනලිට තවම ජීවිතය ගැන හරි හැටි අවබෝධයක් නැත. තමා මේ ලෝකයේ තනිවූ ගැහැනියක වූයේ පෙර කළ කුමන පවකටදැයි අනුත්තරා සිතා බැලුවාය.

සැමියා අහිමිවීමෙන් රැකියාව අහිමිවීමෙන් සිදුවූයේ ගහෙන් ගෙඩි එන්නා සේය. අවුරුදු පහක් වයසැති සංතුසී සමග තමා මේ ලෝකෙය් තනිවූ හැටි අනුත්තරා කල්පනා කළාය.

"අම්මා.. මහන්සියි.. තේ ටිකක් හදන්නකො.. මං වෑන් හයර් එක දීලා එන්නම්.."

සංතුසී මඳක් හඬ නගා කීවාය. ඇයට අද කෝතලය ලිප

නැතිමට අමතක වුණා සේය. චිත්‍ර ටික ගෙට ගෙනෙන්නට උදව් කල වැන් රියදුරාටත් තේ එක දිය යුතුය.

"ඩ්‍රයිවර්ට ඉන්න කියන්න තේ එකක් බොන්න.."

කෝතලය ලිප තබා සාලයට ආ අනුත්තරා කීවේ විනාලීටය. ඒ වනවිටත් රියදුරා වාහනය හරවාගෙන තිබුණි.

"අපරාදෙ.. ගියා නේද.. තේ එකක් දෙන්න තිබුණා.."

"අද අම්මට ඒක අමතක වුණා.. අම්මගෙ කටහඬත් වෙනස්වෙලා.. ෂත්.. මට හොඳ රස්සාවක් කරන්න තිබුණානම්.."

"ඒවා හිමිහිට බලමු ලොකු දුව.. මට පුළුවන් මේක කොහොම හරි කරගෙන යන්න.. ඒත්.."

අනුත්තරා ඒත් කියා නැවැත්තුවාය. ගුණසිංහ අවුත් කී මේ කාරණාව ලොකු දුගේ හිතට බර වැඩි නොවේද..? තමාත් දරුවන් දෙදෙනාත් ජීවත්වන්නේ ටියුෂන් කිරීමෙන් ලබන ආදායමෙනි. තමාට මෙපමණ කල් මෙතන ඉන්නට ලැබුණේ ගුණසිංහගේ හිත හොඳකම නිසාය. නමුත් දැන් ඉඩම ගන්නට යන මහත්තයා.. කුලී ගෙයක නිවැසියන් ඉවත් කරන්නටත්.. පාර අයිනට වෙන්නට තියෙන බයිසිකල් වැඩපලත්, කෙසෙල් කඩයත් ඉවත් කරන ලෙස කියා ඇත. තව මාස දෙකක් පමණ ඉන්නටවත් ඉඩ නොලැබෙනු ඇත. ටියුෂන් ගැනීමට එන දරුවන් අතරමං කිරීමටත් නොහැක. දරුවන්ගේ අධ්‍යාපනයටම වියදම් කළා මිස ඉතුරු කරගත් යමක්ද නොමැත. දැන් පුරුදු වූ තැන දමා අලුත් තැනකට යාමද ලෙහෙසි නැත.





"අම්මා.. ඔය කේතලේ උතුරනවා.. අම්මා අද නම් ඉන්නෙ මේ ලෝකෙ නෙමේ.."

නාන්නට යන්නට චිත්තය ඇඟ වටා ඔතාගත් සංකුසී කුස්සියට එමින් කෑගැසුවාය.

"ඉන්න ඉන්න.. තේ ටික බීලම ගිහිං ඇඟ හෝදගන්න.. කෝ නංගි.."

"අන්න ආව ගමන් ඇඳ බදාගෙන.."

"මහන්සි ඇති.. කොහොමද අද චිත්‍ර ගියාද පුතේ..?"

අනුත්තරා.. ඇන්කර් පිටි හැඳි දෙකක් තේ හදන කෝප්පයට දමා.. ඊට වොකලට් කුඩු හැඳි භාගයක් පමණ එකතු කර සීනි ද දමා කලවම් කළාය. අම්මා රසට තේ හදන්නීය. සංකුසී ද ගුටුම් පිහුම් පුරුදු වුණේ අම්මාගෙනි.

"චිත්‍ර හතරයි ගියේ අම්මා.. උදේ වැන් එකටයි, ආපහු ගේන්නයි හයර් එක දෙදාහක් ගියා.. මේ ආ.."

අතේ ගුලි කරගෙන සිටි තාසි නෝට්ටු කිහිපයක් ඇය අම්මා අත තැබුවාය. එය ගණන් කර බැලීමට අනුත්තරා උත්සාහ කළේ නැත. දරුවාගේ දාඩිය බිඳු ගණන් කරන්නේ කෙසේද..? නමුත් එතන රුපියල් පහළොස් දහසක් පමණ ඇතැයි ඇය සිතුවාය. මුළු දවසම ගිනි අව්වේ පිච්චි පිච්චි අලෙවි කර ඇත්තේ චිත්‍ර හතරකි.

"එක චිත්‍රයක් අඳින්න මොන තරම් මහන්සි වෙනවද..? පත්තරේකටවත් ඉන්ටර්විව් එකක් කරගත්තොත් හොඳයි නේද..?"



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

අනුත්තරා.. තේ කෝප්පය සංතුසි අතට දෙමින් කීවාය. ඇය අනෙක් තේ කෝප්පය රැගෙන කාමරයට ගමන් කළේ ඩිනලි සොයාගෙනය. ඇය ආ ඇඳුම පිටින්ම මුනින් තලාවී නිදාගෙන උන්නාය.

'තාත්තා නොදැක්ක මගෙ අහිංසකී..' අනුත්තරා එසේ කීවේ නැත. එහෙත් පසුව ඇතුළේ එම හැනීම තෙරපී තෙරපී වද දෙන හැටි අනුත්තරාට දැනිණි. ධම්ම මිය යනවිට පොඩි දූ කුසට ඇවිත් වගක්වත් අනුත්තරා දැන සිටියේ නැත. තමා ජීවිතයේ උසුලා ගත්තේ පුදුම තරම් දුකකි.

"චූටි පුතේ.. ආ.. නැගිටලා මේක බීලා ඉන්න.. කෝ ඉතින් නැගිටින්න.."

අනුත්තරා ඩිනලිගේ කකුල් දෙකෙන් අල්ලා සෙලවූවාය.

"බඩගිනියි අම්මා.. කන්න මුකුත් නැද්ද..?"

ගේ හරියේ කන්නට දෙයක් නැත. තව ටිකකින් හංදියට ගොස් මාසයේ බඩු ටික රැගෙන ආ යුතුය. ඩිනලි කටට රසට කන්න ආසා නමුත් සංතුසි නම් දෙන දෙයක් රස නොරස නොබලා ගිල දමයි.

"උදේ ගන්න පාං කාලක් විතර තියෙනවා.. බටර් ටිකක් ගාලා ගේන්නද..?"

"හා.. ඉක්මනට.."

ඒ තරම් තද බඩගින්නකි. දවල්ට කන්නට බත් මුල් දෙකක් බැඳ දුන්නත්.. මේ වනවිට දෙන්නාටම හොඳටම බඩගිනි ඇත.





සාමාන්‍ය ගෘහනියක සේ ගෙදර සියලුම අවශ්‍යතා නොපිරිහෙලා ඉටු කිරීමට තමාට අවකාශයක් නැත. සෙනසුරාදා දවසම උදේ අටේ සිට පන්ති පැවැත්වෙයි. පාන්දර පහට විතර අවදිවෙන අනුත්තරා.. උදේ කෑම හා දවල් කෑම එකවිටම සාදා නිම කරයි. සෙනසුරාදාට පන්ති නිමවන්නේ සවස හයට හතට පමණය. ඒ වනවිට ඇයට හොඳටෝම මහන්සිය. රෑට යමක් හදා ගැනීමට කම්මැලි සිතුණහොත් හංදියේ රෙස්ටුරන්ට් එකෙන් රෑට කන්නට යමක් ගෙනෙයි.

ඇය පාන් පෙති දෙකේ බටර් තවරා ඩිනලි වෙත ගෙන ගියාය. ධම්ම ජීවත්ව සිටියා නම් මේ දරුවන් මෙලෙස දුක් විඳින්නේ නැත. ඔහු සිටුවරයෙකි. ඒ සිටුවරයා තමා හා විවාහ වූ හැටි සිහිනයක් පමණි. තමාගේ කාලකන්නිකමට සිටුවරයා මියගිය බව පවසමින් ඔහුගේ පවුලේ උදවිය තමාට ගැරහූ හැටි.. අනුත්තරාට අද ඊයේ මෙන් මතකය. නොදන්වා සේවයට නොයා සිටීමේ වරදට ගුරු රැකියාවද අහිමි විය. ලොකු දූ අතින් උස්සාගෙන, පොඩි දූ බඩේ තියාගෙන තමා පටාචාරාවක් සේ දුක් විඳි හැටි අනුත්තරාට මතකය. කුලී ගෙයින් කුලී ගෙයට මාරුවෙමින්.. ගත කළේ කාලකණ්ණි හිඟන ජීවිතයකි. තමාගේ සැමියාගේ දෙමාපියන් හා සහෝදරිය.. තමාට කුමක් සිදුවුවාදැයි බැලුවේවත්.. ඔහු සතු මහා ධනස්කන්ධයෙන් එක තඹ දොයිත්තක්වත් තමාට දුන්නේත් නැත. අනුත්තරාද ඒවා ඉල්ලමින් ඔවුන් පසුපස ගියේ නැත.

තමාගේ ළඟ සිටින්නේ ඒ මහා සිටුවරයාගේ ජීව රුධිරයෙන් උපන් දරු දෙදෙනාය. ඩිනලි කුසට ආ පසු අනුත්තරා එකම



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

එක වරක් සංකුසීත් රැගෙන 'ඉසුරුභවන' හෙවත් සැමියාගේ දෙමාපියන්ගේ මැදුරට ගොඩවූවාය.

"තාත්තත්තාරෙ ගිහිං.. බඩවල් හදාගෙන.. දැන් අර මැරිච්ච එකාට අවනම්බු කරපිය.."

ආනන්ද රණබාහු.. තම මාමණ්ඩිය බැණ වැදුණ හැටි අනුත්තරා සිහි කළාය. නැන්දම්මා හා නැනණ්ඩිය කීවේද ඒ විකමය. පාරේ හිහාකෑවත් නැවත 'ඉසුරු භවනට' පය නොගසන්නට හිතා ගත් අනුත්තරා.. නැවත කොළඹ එන බසයක නැංගේය. තනියට උන්නේ බඩේ සිටි දරුවාත්.. අතේ සිටි දරුවාත් පමණි. තම දරුවන් කිසිදා සැපක් විඳින්නට පිං කර නැතැයි සිතද්දී දෙකපුල් හරහා සීතල කඳුළු බිඳු දෙකක් රූරා පහළට වැටුණිය.

"නංගි.. මින්.. නිදිද..? යනවා.. යනවා.. ගිහිං ඇඟ හෝදා ගන්නවා.."

The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

සංකුසී ඇඟ සෝදාගෙන පැමිණ ඇත. ඇය සැහැල්ලුවට අත්කොට ගවුමක් දමාගෙන උන්නාය. ඇය ඉන්නේ භද්‍ර යෞවනයේය. දියණියගේ සුන්දරත්වය, ආකර්ශනය ගැන අනුත්තරා ආඩම්බර වූවාය.

"නංගි.. යනවා ඉතින්.."

ඇය ඕනලිට සැර කරන්නීය. අනුත්තරා 'තාත්තා නොදැකපු කෙල්ල' කියමින් හුරතල් කරන විට සංකුසී එයට එරෙහි වන්නීය.

"ඔහොම හුරතල් කරල නම් අම්මට නංගිව හදාගන්න බැරිවෙනවා.."





ඒ වචනවල මහා හයියක් ගැබ්ව ඇති හැටි අනුත්තරාට දැනෙයි. සංකුසී තමාට තව දුරටත් ජීවත්වීමට දෙන්නේ පුදුම ශක්තියකි. ධම්ම මියගිය බව ආරංචි වූ වෙලාවේ.. සංකුසී නොවුණා නම්.. තමාටත් ජීවත්වී එලක් නැතැයි අනුත්තරාට හිතෙන්නට තිබිණි.

"අද ඔයාට චයිනීස් අරන් දෙනවා.. ඇයි ඔයාගෙ කම්පන් එක.. මෙයා අද කොල්ලෙකුට පේන්ටිං එකක් විකුණුවනේ අම්මා.."

සංකුසී සිනාසෙමින් කියන්නීය. හංදියේ රෙස්ටුරන්ට් එකේ බත් කෑමට ඕනලී දක්වන්නේ පුදුම ආශාවකි. අනුත්තරාට නම් එම තෙල් අධික, මිරිස් සෝස් අධිකව යෙදූ කෑම හරියන්නේ නැත. ඕනලී 'චයිනීස් රයිස්' කන ආශාවෙන් වහා නැගිට තුවායත් කරේ දාගෙන ළිඳට ගියාය. තවදුරටත් අනුත්තරාට මේ කාරණාව වසං කරගෙන සිටින්නට නොහැක.

"ලොකු පුතේ.."

"ඇයි අම්මා..?"

තවත් බරක් මේ යෞවනියගේ හිතට කෙසේ පටවන්නද..? මේ වයසට ඇය සිටිය යුත්තේ සමනලියක සේ සැහැල්ලුවෙනි.

"අද ගුණසිංහ අංකල් ආවා.."

"රෙන්ට් එක හැම මාසෙම තිස් වෙනිදාට දෙනවනේ.. මේ පාරේ හදිසි වෙලාද..?"

"අනේ නෑ ලොකු පුතේ.. වෙන කාරණාවක් ගැන කතා කරගන්න.."

"ඒ මොකක් ගැනද..?"

"ඔය මාතලේ පැත්තෙ මහත්තයෙක් මේ ඉඩම ගන්න යනවලු.."

"මෙච්චර කල්ම විකුණුණේ නැනෙ.. එතකොට අපිට අලුත් ලැන්ඩ් ලෝඩ් කෙනෙක්..."

"නෑ පුතේ.."

"එහෙනම්..?"

"ඒ මහත්තයා කියනවලු අපිව මෙහෙන් යවන්න කියලා.. එයාට ඉඩම වටේට තාප්පෙ ගහලා වෙන් කරගන්න ඕනෙලු.. කඩ දෙකත් අයින් කරගන්න කිව්වලු.."

එසේ නම් ප්‍රශ්නය ලෙහෙසි වන්නේ නැත. පිරිමි හයියක් නොමැතිව.. තවත් ගෙයකට මාරුවිය යුතුවෙයි. එහෙත් මෙතරම් පහසු තැනක.. ගෙයක කුලිය ලෙහෙසි වන්නේ නැත. අම්මා ගුණසිංහ අංකල්ට තවම ගෙවන්නේ රුපියල් හයදාහකි. මේ කාලයේ අඩුම කුලිය පහළොස් දහසකින් මෙහා ගෙයක් සොයාගන්නට වන්නේ නැත.

"ඒ කියන්නෙ අපිට යන්න වෙනවා.. දැන් අවුරුදු දහසයකටත් වැඩියිනේ අපි මෙතන.."

"පුරුදු තැන පුතේ.. අපට අපේම තැනක් වගේනේ.."

"එහෙම වුණත් අනුන්ගෙ තැනක්නෙ.. අපි වෙන තැනක් හොයාගන්න බලමු.."



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/



සංතුසී එපමණ ලෙහෙසියෙන් මේ ප්‍රශ්නය විසඳනු ඇතැයි අනුත්තරා සිතුවේ නැත. ඇයට යම් සැහැල්ලුවක් දැනිණි.

ඇයට යාන්තමට අවුරුදු විසි එක පිරුණා පමණි. සංතුසී ළමා පුවත්පත් ආයතනයක චිත්‍ර ශිල්පිනියක ලෙස සේවය කළාය. රැකියාවට ගොස් තවම මාස හයක් පමණි. එතනින් ලොකු වැටුපක් ලැබුණේ නැත. නිවාඩු දිනවල සංතුසී කළේ චිත්‍ර ඇඳීමය. ප්‍රශ්නය වූයේ චිත්‍ර අලෙවි කර ගැනීමය. මාසයකට සැරයක් දෙසැරයක් පමණ ඇය කලාභවන ඉදිරිපිට.. හා මහජන පුස්තකාලයේ චිත්‍ර විකිණීමේ කාර්යයෙහි යෙදුණාය. එයට උදව් කළේ ඩිනලීය. ඩිනලී සංතුසීට වඩා අවුරුදු පහක් බාලය.

"අම්මා ඔච්චර හිතන්න එපා.. අම්මට සිද්ධ වෙච්චි අසාධාරණේ හැටියට මේක මොකක්ද.. අපි වෙන ගෙයක් හොයාගමු.."

"එතකොට පුතේ ටියුෂන් ක්ලාසස්.."

"ක්ලාසස් කරන්න පුළුවන් විදිහේ ගෙයක් හොයාගම්මු.. අම්මා කියන්න ගුණසිංහ අංකල්ට.. අපි මාස දෙකක් විතර කල් දෙන්න කියලා.. තව ගේකට දෙන්න ඇඩ්වාන්ස් එක හොයා ගන්නත් ඕනෙ.."

බරපතලම ප්‍රශ්නය වූයේ එයයි. අනුත්තරාට කියා මේ මිහිපිට එක බිම් අඟලක්වත් නැත. ධම්මගේ මුදලයෙන් උරුම වූ දෙයක් ද නැත. රැකියාවත් අහිමි වූ පසු දරු දෙදෙනා ජීවත් කරවීමට ඇය නොවිඳිනා දුක් වින්දාය.

"මම එහෙනම් ගුණසිංහ අංකල්ට එහෙමවත් කියලා බලන්නම්.."

"ආ.. කෝ දෙන්න අම්මා බඩු ලිස්ට් එක.. මං හංදියට ගිහින් බඩු ටික ගේන්න.. නංගිට වයිනීස් පුඩ් ගන්නත් එපැයි.."

සංතුසී සිනාසෙමින් කියද්දි අනුත්තරාට මහා ශක්තියක් තමා සතුව ඇතැයි සිතුණි.

"ධම්මගෙ දුව අපට දෙන්න.. ඒ ළමයට තියෙන්නෙ අපේ ලේ.. අපි දරුවා හදාගන්නං.."

ධම්මගේ දෙමාපියන්.. ධම්මගේ මරණයෙන් පසු සංතුසී ඉල්ලූ සැටි මතක්වෙයි.

"මං හොඳ නැත්තං.. මගෙ දරුවා හොඳ වෙන්නෙ කොහොමද..?"

"ධම්මට අපි දේපල ලියලා තිබුණේ නෑ.. ධම්ම නැති වුණාම ඒ සේරම දේපල නීතියෙන් අයිතිවෙන්නෙ අක්කට.. අක්කා.. මේ කෙල්ල හදාගනියි.. ඔය හිඟන රස්සාවෙන් කොහොමද දරුවා හදන්නෙ..?"

"බෑ.. බෑ.. ඒක කොහෙත්ම කරන්න බෑ.."

අනුත්තරා දැඩි හඬකින් කියා සිටියාය. අනුත්තරා එවකට හිටියේ පොළොන්නරුවේ පාසලකය.

"මට රස්සාව තියෙනවා.. මට පුළුවන් මගෙ හිඟන පඩියෙන් මගෙ කෙල්ල ජීවත්කරවන්න.."





අනුත්තරා.. කුඩා සංතුසී බදාගනිමින් කීවාය. තමා සතු.. ධම්මගේත් තමාගේත් ආදරයෙන් ලද එකම තිළිණය සංතුසී බදාගෙන ඇය කියා සිටියාය.

* * * * * * *

"පුදුම හැඟීමක්.. පුදුම පාළුවක් දැනෙනවා.. මේ පේන්ටිං එක දිහා බලනකොට.."

සංකේත්.. තම නිදන කාමරයේ බිත්තියට චිත්‍රය සවි කරමින් කීයේය. 'ගන්න ගිය ඉඩම ගැනවත් කරන්න ගිය බිස්නස් ගැනවත් නෙමේ මුගේ කතාව.. කෙහෙම්මල් චිත්‍රයක් ගැන.. මූ හොඳයි කලා ආයතනයක ප්‍රින්සිපල් කරන්න..'

පංකජ සිතුවේය. සිතුවා මිසක ඔහු වචන කටින් පිට කරන්නට නොගියේය.

"මන්.. මාත් යන්න ඕන.. මටත් මගෙ වැඩ තියෙනවනේ.. ඉඩම සම්බන්ධයෙන් මොකක් හරි දෙයක් නම් මට කතා කරපං.."

"පලයං පලයං.. කලාවක් ගැන මෙලෝ හසරක් නොතේරෙන මෝඩයා.."

"ඔව්.. ඔව්.. උඹ මහා ප්‍රඥාවන්තයා.. උඹේ ප්‍රඥාවට අහු නොවෙන දෙයක් මේ මෝඩයා කියන්නද..?"

"කියපං බලන්න.."

"උඹ හිතන්නෙ ආර්ට් එක ගැන නෙමේ.. ඒක ඇඳපු අර හීන කැල්ල ගැන.."



The Reader's Place http://e-pusthakalaya.blogspot.com/

"ඔය කිව්වෙ මොඩ කතාවක්.. උඹ ඒකිට ඇහැ දාගෙන හිටියා මිසක ඒකි කළුද සුදුද කියලවත් මං දැක්කෙ නෑ.."

සංකේත් එසේ කියද්දි පංකජ සරදම් සිනාවක් නගමින් කාමරයෙන් පිටව ගියේය.

"ආන්ටි මං යනවෝ.."

යන වචනය ඔහුට ටික මොහොතකින් ඇසුණි. ඒ සමගම ඔහුගේ මෝටර් සයිකලයේ 'ර්ර්... ර්...' ගෙරවුම් හඬද ඈසී කෙමෙන් නැසී ගියේය.

මේ මාතලේ නගරයයි. මාතලේ නගරයේ ප්‍රභූවරුන්ගේ පැලැන්තියේ නවත් එක පවුලක් වූයේ සංකේත්ගේ පවුලයි. සංකේත්ගේ පියා ප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙක් විය. එහෙත් තාත්තාගේ ව්‍යාපාර ගෙන යාමට සංකේත් තුළ ප්‍රිය මනාපයක් නොවිය. තාත්තා කළේ වාහන පිටරටින් ගෙන්වා අලෙවි කිරීමයි. සංකේත් ඉගෙනීමට දක්ෂයෙක් විය. ඔහු ඉගෙන ගත්තේ පිටරට විශ්ව විද්‍යාලයකය. ලංකාවට පැමිණීමෙන් පසු ඔහු ව්‍යාපාර ක්ෂේත්‍රයට අත ගැසුවේ.. තමාගේම ව්‍යාපාරයක් අරඹන අදහසිනි. ඔහු පන්නිපිටියේ ඉඩම මිලදී ගැනීමට තීරණය කරේ නම් අරමුණකින් තොරවය. එහෙත් එතන රෙස්ට් හවුස් එකක්, නිවාඩු නිකේතනයක් හෝ උත්සව ශාලාවක් ඉදි කිරීමට හොඳම තැනක් වග ඔහුට තේරුම් ගියේය. එකම රාමුවකට කොටුවී සිටීමට සංකේත් තුළ ආශාවක් නොවිය.

"පුතා.."

අම්මාගේ කටහඩින් සංකේත් ගැස්සී සිටියේය.





"ආන්.. අම්මා.."

"මහන්සිද..?"

"ඔව්.. හරි මහන්සියි ඩ්‍රයිව් කරලා.."

"ඇයි පංකජ එක්කරගෙන ගියේ කාරෙක එළවන්න නේද...?"

"ඌ එලෙව්ව ඉට්ටගෙඩියක් නෑ.. බමුණා වගේ නිදියාගෙන ගියා මිසක්.. ඌ එක්ක ගියාට වැඩිය හොඳයි ඉන්ටර්සිටියක නැගලා සිංදුවක් අහ අහා නිදාගෙන ගියා නම්.."

මුදිතා තම පුතුගේ හැටි හොඳ හැටි දනියි. ඔහු දැන් විසිහය හැවිරිදි තරුණයෙකි. තමා දැනුවත්ව නම් තවම ඔහුට පෙම්වතියක් නැත. ඉන්නේ එකම දරුවාය. ඔහුට ගැළපෙන කෙනෙක් හොයාගන්නට ඉඩ ඇරියා දැන් හොඳටම ඇතිය. මේ දේපළ, ව්‍යාපාර පාලනය කිරීමට හැකි උගත්, බුද්ධිමත් ලේලියක සෙවීමේ වැඩට දැන් ඉතින් අත ගැසිය යුතුය. දැන හඳුනාගෙන අවුරුද්දකින් දෙකකින් හෝ විවාහ වීමට පුළුවන. එවිට පුතාටත් අවුරුදු විසි අටක් විසි නවයක් පමණ වනු ඇත.

"ඉතිං.. දැන් ඔය බලපු ලැන්ඩ් එක කොහොමද..?"

"ඒක නම් හොඳයි අම්මා.. බැන්ක් ලෝන් එක දාගන්න ඕන.."

"ඉඩමක් අරන් තියෙන එක නම් හොඳයි.. අපිට ඉතිං නැගයා ඉන්නෙත් මාතලේ, කුරුණෑගල, නුවර.. ඔතනින් එහාට හදිසියෙ කොළඹ ගියාම නවතින්නවත් තැනක් නැනේ.."



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

"ඒක නීරුවක් වාගෙ ඉඩමක්... රිසෙප්ෂන් හෝල් එකකට වාගෙ හොඳයි.. මගෙ ඔළුවෙ නාම අයිඩියා එකක් නෑ මොකද කරන්නෙ කියලා.. ඒත් ඒ ඉඩම ගන්නවා.."

ඔහු තිර අධිෂ්ඨානයකින් කීවේය. සැමියාගේ ව්‍යාපාරවලට හවුල්වීමට අදහසක් නැතත්, වාහන ව්‍යාපාරය ගැන බලන්නේද පුතාය. සැමියාත් තමාත් දැන් මේවාගෙන් නිදහස් විය යුතුය.

"ඔය දේපලවලට ඉතිං උදව්වට තමන්ගෙම කෙනෙක් ඉන්න ඕන කාලෙනෙ මේ.."

අම්මා වහෙන් ඔරෝ භාෂාවෙන් කියන්නේ මොනවාදැයි සංකේත් දනී. විවාහය.. විවාහය සඳහා ගැහැනියක විශ්වාස කරන්නේ කෙසේද..? ඕන කෙල්ලක් බලන්නේ සල්ලිකාරයෙකුගේ කරේ එල්ලීමටය. තමාට මිස මුදලට ආදරය කරන කෙල්ලක.. වැඩක් නැත.

"මං කිව්වෙ පුතේ.."

"මට තේරෙනවා අම්මෙ.. අනේ වුව්වක් කරදර නොකර අම්මා යන්ඩකෝ.."

"අර.. අලුත් කාර් දෙකක් ගේන්න නුවර යන්න තියෙනවා කීවා තාත්තා.. හෙට.."

"ඔය ඉතින්.. පාඩුවෙ ඉන්න නෑ.."

"මටත් ඔය දෙන්නගෙ ඇසිස්ටන්ට් වැඩේ කරලා එපා වෙලා.. තමුන්ගෙ සෙක්‍රටරි පෝස්ට් එකට කෙනෙක් හොයාගන්න වෙයි.. මට හෙට පන්සලට දානෙ ලැස්ති කරන්නත් තියෙනවා.."





"අම්මටයි ඇසිස්ටන්ට් කෙනෙක් ඕන වෙලා තියෙන්නෙ.. අම්මා වහෙන් ඔරෝ කියන්නෙ මට මැරි කරන්ඩ කියලනෙ.. මැරි කරන්ඩ නම් එපා දැන් ඉන්න කෙල්ලො එහෙයි නැන්දම්මෙ කියාගෙන කීකරුකමට ඉඳියි කියලා.."

"අනේ මට කීකරු නැතත් කමක් නෑ.. පුතාට ගැළපෙනව නම් මට ඒ ඇති.. අපිට බැරියැ අප් වැඩපල කරගන්ඩ.. ඒවට ඔය වැඩකාරයොත් ඉන්නෙ.."

මුදිතා ඔසරිපට හරි ගස්සාගෙන කාමරයෙන් පිට වූවාය. පුතා කියන විදිහේ ගැහැනු සෙවීම දැන් ඇත්තටම විහිලුවක් වී ඇත. එවැනි කීකරුකමට හැදුණු කෙල්ලන් දැන් නැත. මෙයාටම කියලා අයිතිකාරියක් කොහේ හරි ඇති.. ඒ ඉරණම්කාරි එන්ඩ තාක් ඉමාවෙයි වගේ..

සංකේත් නාන කාමරයට වැදී හොඳ හැටි නාගත්තේය. පස්සෙ හොඳ නින්දක් ගසා රෑ හෙනට විතර වවුමට යාමට ඔහු අදහස් කර උන්නේය. නාගෙන ආ සැණින් ඇඳේ වාඩිවූ ඔහුගේ නෙත ගැටුණේ චිත්‍රයයි. ඒ චිත්‍රයේ ඇති පාළු ගතිය තුළ සාමකාමී ශාන්ත බවක් තැන්පත් වී තිබේ. පංකජ කියන්නාක් සේ එම චිත්‍රය ඇඳි 'සුදු කෑල්ල' ගැන තමාට සිතක් පහළ වූයේද..? හිතක් පහළ වන්නට තමා හරිහැටි ඇය දුටුවේ නැත. නමුත් ඇය සන්සුන් පෙනුමකින් යුතු තරමක් ආඩම්බර යුවතියක වන්නට ඇතැයි ඔහුට සිතුණි. ඔහු චිත්‍රය ළඟට ගොස් බැලුවේය. සංතුසී යන්න කලාත්මක අත්සනක් එහි යොදා තිබුණි. සංතුසී.. ඒ නම හරි අපූරු කමක් යැයි ඔහුට සිතුණි.

* * * * * * *



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

සංතුසී ලංකාදීප පුවත්පත ගෙන කුලී ගෙවල් බැලුවාය. පත්තරේ හැටියට ඒ සෑම ගෙයකම කුලිය රුපියල් පහළොස් දාහකින් විසිදාහකින් එහාය. අම්මාට නිදහසේ පන්තිය කර ගැනීමටත්, ළමයින්ට පැමිණීමට පහසු තැනකුත් විය යුතුය. පසුවදා සංතුසී කෙටි නිවාඩුක් දමා ත්‍රිවීලරයක්ද කුලියට ගෙන අම්මා සමග ගෙවල් බැලීමට ගියාය.

"අපි ගෑනු තුන්දෙනෙක් විතරක් ඉන්න තැකක ආරක්ෂාවත් තියෙන තැනක් වෙන්න ඕන ලොකු පුතේ.."

"ආරක්ෂාව ඉතින් අපි බලාගන්න ඕන.."

"ඔයා නම් හිත හයියට එහෙම කියනවා.. නංගි තාම ළාමකයි ලොකු පුතේ.. මම ඔය එහෙ මෙහ එළියට ගියාම එහෙම නංගි ගෙදර තනියමනේ ඉන්නෙ.."

අම්මා කියන්නේ ඇත්තකි. අම්මාට මේ ලෝකයේ තමන් දෙදෙනා ඇර වෙන සම්පතක් නැති වග සංතුසී දනී. ඇය ඉක්මන් රැකියාවකට පෙළඹුණේත් එනිසාය. චිත්‍ර සීයක් පමණ එකතු කරගෙන ඒක පුද්ගල චිත්‍ර දර්ශනයක් පැවැත්වීම ඇයගේ අරමුණු ගොන්නේ ඉහළින්ම පැවති දෙයකි. චිත්‍ර ඇඳීමට අවශ්‍ය දේවල් ගැනීමද අද වැඩි වියදම් කටයුත්තකි. කලාත්මක හදවත් ඇති මිනිසුන් අද නැත. අද ඉන්නේ හින්දි නළු නිළියන්ගේ පින්තූර කාමරවල එල්ලාගෙන කාඩ්බෝඩ් වීරයන්ය. චිත්‍රයක් මිලදී ගන්නේ එහෙමත් කෙනෙකි.

"එඩ්‍රස් එක හරි නම් මෙන්න මේ ගෙදර මිස්.."

ත්‍රිවීල් රියදුරා කීවේය. සංතුසී ත්‍රීවීලරයෙන් බැස ගේට්ටුවට





තට්ටු කළාය. ගේට්ටුව විවර කරේ කළු මහත මිනිසෙකි. ඔහු උඩුකයට කිසිවක් ඇඳ සිටියේ නැත.

"මේ පත්තරේ ඇඩ් එකට.."

"ආ මිස්.. එන්ඩ.. තියම පොට් එක මිස්ලාට.. පිටිපස්සෙන් එන්ඩ.."

සංතුසීට ආපසු හැරී යන්නට සිතුණි. අම්මා ද පස්සෙන් ආවේ එතැන හරියන්නේ නැති බව සියලුම ඉඳුරන්ගෙන් ප්‍රදර්ශනය කරමිනි. සිටි වැසූ බ්ලොක්ගලින් ගොඩ නැගූ කාමර දෙකක නිවසකි. වැසිකිළිය අප්‍රසන්නය. කුකුල් කූඩු දෙකකි. මෙවැනි තැනකට විශ්‍රූෂන් ළමයි ගෙන්වා ගත නොහැක.

"මාසෙට පහළොස්දාහ ගානේ හැම මාසෙම පළවෙනිදාට ඕනෙ.. අවුරුදු එකහමාරක ඇඩ්වාන්ස් එකක් ඕනෙ.."

මිනිසා කීවේය.

"අපි පස්සෙ බලන්නම්.."

"ඇයි ගාන වැඩිද..? මේ ගානට මේවා තමයි මිස්.. ලක්සරි ගෙවල් තිස්පන්දාහෙන් එහා.."

තමා දෙස මනාව බැලූ මිනිහා කීයේය. අනුත්තරාගේ ඇස් දූකෙන් බරවී තිබිණි.

"අපි යමු ලොකු පුතේ.."

"දැන් ගෙවල් හතරක් බැලුවා.. එකක්වත් හරියන්නෑනේ අම්මා.."



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

සංතුසී ත්‍රීවීලරයට නගිමින් පැවසුවේ කණගාටුවෙන් යුතුවය.

"අපටය කියලා පර්චස් හයක් හරි ගන්න බැරිවෙයිද අම්මා.."

"බැංකුවකින් වුණත්. අපට ණයක් දෙන්නැ පුතේ.. එක්කො ස්ථිර රස්සාවක් තියෙන්න ඕන.. නැත්තං බිස්නස් එකක් තියෙන්න ඕන.."

"ඉතිං.. මගේ පේ ශීට් පෙන්නලා ගන්න බැරිද..?"

"බලමු.."

දරුවාගේ ධෛර්යය එකවර සිඳ දමන්නට නොහැකි නිසා අනුත්තරා එසේ කීවාය. ඉඩමක් මිලට ගැනීමට බැංකුවකින් දෙන්නේ සියයට හැටක පමණ මුදලකි. ඉතිරි ටික තමන් අතේ තබාගත යුතුය. මිලදී ගන්නා ඉඩම ඇපයට බැංකුවේ තැබිය යුතුවෙයි. ඊටත් සංතුසීගේ පඩියේ හැටියට ලක්ෂ තුන හතරකට එහා ණය මුදලක් ගත නොහැකි වෙයි. මේ පැත්තේ පර්චසය ද ලක්ෂ පහක් පමණ වෙයි. සිහිනවල තිබෙන තිත්ත ඇත්ත දරුවාට අවබෝධ කරවන්නේ කොසේද..? ඇය තවම මව් උකුලෙන් පිටතට පැන ජීවිතය සොයා යාමට පටන් ගන්නා පමණි.

"අපි ආපහු යමු ළමයො.. අදට ඔය බැලුවා ඇති.."

"තව එක තැනනේ මැඩම්.."

"ඒකත් එච්චර තමයි.."

"අසුබවාදී වෙන්න එපා මැඩම්.."





ත්‍රීවීලර් කොල්ලා කියයි. ඒ වචනයත් හිතට දිරියකි. එහෙත් ධම්ම නැතිවූදා පටන් මේ දුෂ්කර වන්දනාව දැන් නම් අනුත්තරාට එපාම වී ඇත. දරුවා නොසිටියා නම් ධම්ම සමගම ඒ ගමන යන්නට තිබිණි.

"මන්නොහේ ඒකත් බලලම යමු අම්මා.."

සංතුසී කියන්නීය. ඇය කියනවා නම් එය කළ යුතු ද වෙයි.

"මට හිතෙනවා ඔය ඉඩම ගන්න මහත්තයා හම්බවෙලාවත් මේ ගැන කතා කරන්න පුතේ.. ඉඩම ගන්නට දැම්ම මොනවත් කරන්නෙ නැතිවෙයි.."

"මොකටද අම්මා එක එක මිනිස්සුන්ට බාල්දු වෙන්නෙ..?"

"බාල්දුවීමක් නෙමෙයි පුතේ.. එහෙම නැතිව ජීවත්වෙන්න අපට මොනවා තිබිලද..?"

අනුත්තරා එය නිතරම කියන්නීය. ඇති දෙයක් නැත. සංතුසී නව අවුරුදු දෙක තුනකින් හෝ විවාහ කර දිය යුතුවෙයි. දරුවාට දෙන්නට ඉතිරි කළ දායාදයක් නොමැත. යාන්තං පිරිමසාගෙන ජීවත්වුණා පමණි.

"මෙතන පන්ති නම් තියන්න බෑ.. අලුත්ම ගෙදරනේ.. ළමයි ගේ දොර නාස්ති කරනවා.."

අන්තිමට බලන්නට ගිය ගෙදර ගෙහිමියන් කීහ. තමා සොයන පරිදි ආරක්ෂාව ඇති, පන්ති කිරීමටත් හැකි, ගණනත් සාධාරණ නිවසක් සොයා ගැනීම ලෙහෙසි නැත. සෑම දෙයම

The Reader's Place http://e-pustakalaya.blogspot.com/

දුෂ්කරය. ඒ මදිවාට ඩිනලීට.. බල්ලා සහ හාවුන් තිදෙනා ඇති කිරීමටද පහසු තැනක්ද විය යුතුය. හාවුන් මිදුලේ පැන පැන සිටින්නේ පුදුම නිදහසේය. බල්ලා වූ විකිරා නම්.. පාරේ දමා ගිය අසරණ වූ බලුපැටියෙකි. ඌට ඩිනලීගේ රැකවරණය මනාව ලැබුණි.

අම්මාත් දුවත්.. ගෙට ගොඩවැදුණේ සියලු බලාපොරොත්තු සුන්වූ විලාසයෙනි. ගෙයක් සොයා ගැනීම අමාරුය. ඊටත් පුරුදු වූ මෙම කුඩා නිවහන දමා යාමද පහසු නැත. ගේ වටේට අඹ ගස්, අලි පේර ගස්, තැඹිලි ආදියත් කෙසෙල් ගස් මල් එහෙම වවා ගත්තේ තමාත් දුවරුන් දෙදෙනාත්ය. එළවළු කඩෙන් ගෙනාවා නම් ඒ ඔය කැරට්, ලීක්ස්, ගෝවා වැනි දෙයක් පමණි. පිටුපස එළවළු පාත්ති කිහිපයකි.

"මං ගුණසිංහ අංකල් හම්බවෙලා බලන්න ඕන.. මෙතන පන්තිය කරගන්න බැරිවුණොත් අපි ලොකු අමාරුවක වැටෙනවා.."

අනුත්තරා ශීතකරණයෙන් පොල් බෑගයක් අතට ගෙන කීවාය. එද්දි පාන් රාත්තලක් රැගෙන ආ නිසා.. දැන් එය කන්නට අල හොද්දක්වත් හැදිය යුතුවෙයි. මේ දුප්පත් ආර්ථික රටාව දරුවන්ට හුරුය. ඉඳහිට පිටින් කෑමක් කන්නට අඬන්නේ ඩිනාලීය. සංතුසීට වුවද යෞවනියකගේ ආසාවන් කොපමණ ඇද්ද..? ඒ කිසිදු ආසාවක් සඳහා ඇය හඬන්නේ නැත. කියුටෙක්ස් එකක්, ලිප්ස්ටික් එකක්වත් ඇය සතුව නැත. ළමයින්ගේ පන්ති ගාස්තු ලැබුණු පසු අනුත්තරා දෙදෙනාටම බේබි ඕඩිකලෝන් දෙකක් ගෙනැවිත් දුන්නාය. ඩිනලී ඊළඟ අවුරුද්දේ ඕලෙවල් විභාගයට වාඩිවෙන නිසා ඇයට පන්ති ගාස්තු නම් අපමණව





දැරිය යුතු වෙයි. දැන් කාලයේ පන්ති නොයන්නේ බුද්ධාගමට පමණි.

අල හොද්ද ඉදෙන සුවඳ ගේ පුරාම පැතිරෙයි. දොරට තට්ටුවක් ඇසුණ නිසා අනුත්තරා සාලයට පැමිණ ජනේලයෙන් හිස දමා බැලුවාය.

"ආ.. මිස්ටර් ගුණසිංහ.. මං මේ හම්බවෙන්නත් හිතාගෙන හිටියෙ.."

අනුත්තරා ඔහුට දොර අරින ගමන් පැවසුවාය.

"අනේ මිස්ටර් ගුණසිංහ.. අදත් ගිහින් ගෙවල් පහක් බැලුවා.."

"හරියන එකක් නැද්ද..?"

"එකක්වත් හරියන්නෑ.. මිස්ටර් ගුණසිංහ ඉදගන්න.. මං කියන්න හිටියෙ.."

"මටත් තේරෙනවා ඉංග්‍රීසි මිස් මූණපාලා ඉන්න තත්වෙ.."

"අපි කුලිය ටිකක් වැඩි කරලා හරි දෙන්නම්.. තව ටික කාලයකට හරි බැරිවෙයිද ඒ මහත්තයාගෙන් මේ ගේ ඉල්ලා ගන්න.."

"ඒ මහත්තයා කිව්වොත් කිව්වා නෝනා.. කඩ දෙකත් අයින් කරනවා ගෙට දිහාට.. ඔප්පු ලියන්න දවස් හතරකින් එනවා කීවා.. එදාට තාප්පෙ ගහන්න.. බාස්ලාව බලන්න කියලත් මට කිව්වා.."



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

"සල්ලිකාරයෙක් වෙන්න ඇති.. දුප්පතාගෙ දුක දන්නෙ නැති.."

අම්මා පිංසෙණ්ඩු වෙනවා වැඩි යයි කාමරයේ උන් සංතුසීට සිතුණි. එක එකාට බාල්දු වෙමින් ජීවත්වනේ කුමකටද..? අම්මාගේ පන්තිය කර ගැනීමට හැකි කුලී ගෙයක් මේ අවටින් සොයාගත නොහැකි වුවහොත් සිදුවන්නේ ටිකක් ඈතකට යාමටය. සංතුසි වැඩ කළ පුවත්පත් ආයතනය පිහිටා තිබුණේ නුගේගොඩය. ඕනලි පාසල් ගියේ පන්නිපිටියේ ධර්මපාලයටය. මේ සියලුම දෙයට පහසුම තැන මේ තමා ඉන්නා තැනයි.

"ලොකු පුතේ.. මේ අංකල්ට තේ එකක් ගේන්න.."

අනුත්තරා හඬ නගා කීවාය. සංතුසී කුස්සියට ගොස් තේ කෝප්පයක් සෑදුවාය.

"බලන්නකො දරුවො. වෙච්ච දේ නේද..?"

සංතුසී අතින් තේ කෝප්පය අතට ගත් ගුණසිංහ කීවේය.

"කමක් නෑ අංකල්.. පුළුවන් තරම් ඉක්මනට අපි ගෙයක් හොයනවා.. අම්මගේ මේ පන්තියයි නංගිගෙ ඉස්කෝලෙ ගමනයි තමයි ප්‍රශ්නෙ.."

සංතුසී කාටවත් අනපාන්නට කැමති නැත. එය ඇගේ ජන්මයෙන් ආ පුරුද්දක් යැයි අනුත්තරාට සිතෙයි.

"තව දවස් හතරකින් ඒ මහත්තයා ඉඩම ගන්නවාලු.."



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/



අනුත්තරා එසේ කියද්දි සංතුසීගේ පපුවට විදුලිසැරයක් වැදුණාක් බඳු හැඟීමක් ඇතිවිය.

"තාප්පෙත් බඳිනවලු.."

"ඒත් අම්මා කුලී ගෙවල්වල නීතියක් කියලා දෙයක් තියෙනවා.. සරණාගතයො වගේ අපිව එළියට ඇදලා දාන්න බෑ.."

"හරි හරි දරුවො.. තාප්ප නෙමෙයි මොන බිල්ඩිම ගැහුවත්.. මහ නුහක් යනකං ඉන්න පුළුවන්.. ඒත් ඒ මහත්තයගෙ ප්ලෑනෙ හැටියට මේ ගේත් ගලවන්න වෙයිලු.."

"මේ ගේ.. කඩන්න..? ඒ මොන අපරාධයක්ද..?"

අනුත්තරාට කියවුණි. සංතුසීටත් ඒ වචනය පපුවේ ගැඹුරුම ලෙස දැනිණි. කුලියට තිබියාට තමාගේ අතින් වවාගෙන, මල් පලගෙන ආදරයෙන් ජීවත්වුන මේ කැදැල්ල තවකෙකු විනාශ කිරීමට යන බව අදහන්නේ කෙසේද..?

"වෙන විකල්පයක් නෑ ඉතින්.. ටිකක් ඈතකින් හරි ගෙයක් හොයාගන්නවා ඇරෙන්න.."

අනුත්තරා කීවාය.

"අනේ මාත් එක්ක කරහවෙන්න එපා ඉංග්‍රීසි නෝනා.."

"මිස්ටර් ගුණසිංහ මොනවා කරන්නද..? වෙලාව ආව වෙලාවෙ විකුණාගන්න එපැයි.."

අනුත්තරා එදා ඇඳට ගියේ බොහෝ වේදනාවෙනි. දෛවය

තව තවත් තමාගේ ජීවිතය අවුල් කරන්නට හදන්නේ ඇයි..? ධම්ම හිටියා නම් අද තමා ජීවත්වන්නේ මිහිපිට රැජිණක පරිද්දෙනි. ඔහුගෙන් ඇය ලද ආදරය.. තවමත් ඇයව ජීවත් කරවයි. පොලොන්නරුවේ දුෂ්කර පාසලක සේවය කරමින් සිටියදී.. එම පළාතට පත්වී ආ අලුත් දොස්තර මහතා වූයේ ධම්ම රණබාහුයි. ඔහු ඉතා කරුණාවන්ත, කාගේත් සිත් දිනාගත් වෛද්‍යවරයෙක් විය. නුවර ප්‍රභූ පැලැන්තියකින් ආ ඔහු.. ධනවතෙක් විය. එබැවින් මිනිස්සුන්ගේ කැස්ස හෙම්බිරිස්සාවෙන් බඩවියත රැක ගන්නට සිතුවේ නැත. ඔහුගේත් තමාගේත් ප්‍රේමය ලියලා වැඩුණේ.. එකල පැතිර යමින් තිබුණ වසංගත උණක් අනුත්තරාට වැළඳුණ පසුවය. අනුත්තරා නැවතී සිටියේ ගුරු නිවාසයේය.

ඇයව වෛද්‍යවරයා වෙත රැගෙන ගියේ විදුහල්පතිතුමාගේ බිරිඳයි.

The Reader s Place
http://e-pusthakalaya.blogspot.com/

"මේ මිස් කොහෙද..?"

"කුලියාපිටියෙ.. දොස්තර මහත්තයා.."

"මාසයක් විතර විවේකයෙන් ඉන්න වෙනවා.. මැලේරියාව.. මේ පැත්තෙ පරෙස්සම හොඳ මදි.."

තරුණ වෛද්‍යවරයා ඉතා කරුණාවෙන් පැවසූ හැටි.. අනුත්තරාට සිහිපත් වෙයි. දෙතුන්පාරක් බෙහෙත් කළ පසු අනුත්තරා.. කුලියාපිටියේ තම නිවසට යාමට සිතුවාය. බස්රිය දුවන්නේ දවසට තුන් වතාවකි. උදෑසනම බස්රිය වැරදුණ අනුත්තරා හැතැප්ම තුනක් පමණ තම බෑගයත් කරේ ඔසවාගෙන





පයින් යාමට සිතුවේ කාගේ හෝ බයිසිකලයක් නැවැත්තුවහොත් එයට ගොඩවෙන්නට හැකි බව සිතමිනි.

"මිස්.. ගමේ යනවද...?"

නතර කළේ බයිසිකලයක් නොව ඩොක්ටර් ධම්මගේ කාරයයි.

"නගින්න.."

ඔහු ඉදිරිපස දොර ඇර දුන්නේය. අනුත්රාට අතීතය සිහිවෙද්දී දැනෙන්නේ පුදුම මිහිරකි. ඒ අතීතයේම ඉන්න තිබුණා නම් හොඳයි.. වර්තමානය හා අනාගතය නොපෙනන දුකකින් පැටලී ගොස් අඳුරු මායාවක් තුළ තමා සිරගත වී ඇති හැටි ඇයට දැනෙයි.

* * * * * * *

# 02



සිංතුසී ජනේලය හැරියේ පාන්දර පහට පමණය. සිසිල් සුළං රැල්ලක් අවුත් ඇගේ සියුමැලි ගතේ දැවටුනේ දුක ඇ... විමසන්නට මෙනි. එහෙත් උදැසන සුන්දරත්වය දකින්නට කලි... විසඳාගත යුතු ප්‍රධාන ප්‍රශ්නය එයයි. තව අවුරුද්දකින් නංගි සාමාන්‍ය පෙළ විභාගය කරන නිසා.. එතමණ කාලයකට ව... ගෙය ඉල්ලා ගැනීමට තියෙනවා නම් හොඳයි. අම්මාගේ පන්... නැවැත්වීමටත් නොහැක. ජීවත්වන්නේ ඒ ආදායමෙනි.

"ලොකු පුතේ.."

අනුත්තරා කාමරයට ආවේ තේ දෙක හදාගෙනය. ඩිනලි තවම සුව නින්දකය.

"මෙයා අද ඉස්කෝලෙ යන්නෙ නැද්ද මංදා.. ගෙදරින් දුවන්නෙ පළවෙනි බෙල් එකේ සද්දෙ ඇහෙනකොට.."

සංතුසී තම තේ කෝප්පය ගත්තේ එසේ කියමිනි. පාසල





ඇත්තේ ඉතාම ළඟිනි. විනාඩි පහට පයින් ඇවිදගෙන යා හැකිය. මෙතන පදිංචිය කොතරම් පහසුවක්ද..?

"පොඩි එකීනෙ.."

"එයා තවද හරි කසාද බැන්ද දවසකත් අම්මට පොඩි එකී වෙයි.. අම්මගෙ හුරතලේ හින්ද තමයි නරක්වෙලා තියෙන්නෙ.."

සංතුසී සෙනෙහසින් ඩිනලිගේ පස්සට පහරක් ගැසුවාය.

"මහ්.. හරි අප්.. හරි අප්.. දැන් පස්සටත් එළිය වැටිලා.."

අනුත්තරා.. තේ කෝප්පය මේසය මත තබා නැවත කුස්සියට ගියාය. එහි ඉඳෙන පුවඳ ගේ පුරා පැතිරෙයි. ඩිනලි පාසලටත් සංතුසී කාර්යාලයටත් ගෙනියන්නේ බත්ය. හැන්දෑවට අම්මාට කලත් පාන්දරට නම් කුස්සියට යන්නට සංතුසීක් කම්මැලි ... ළමුන් දෙදෙනාම ගෙදරින් පිටත්වෙන්නේ එකම වෙලාවටය. සංතුසීට කාර්යාලයට එක බස් එකකි.

"අම්මා.."

අනුත්තරා බත් මුට්ටිය ලිපෙන් බෑවාය. ගැස් ලිපක් තිබුණත් ... ඇනිව අවදි වුණොත් ඇය දර ලිප දල්වාගනී.

"අම්මා ගින්නට පිච්චෙනවා.."

"ගානක් නෑ පුතේ.."

තාත්තා උන්නා නම් අම්මා රැජිණක සේ ඉඳිනු ඇත. දොස්තර මහත්මයෙකුගේ බිරිඳක් කෙතරම් සැප සම්පත්



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

විඳිනවාද..? තාත්තා උන්නා නම් තමාටත් කෙසේ හෝ ඉහළට ගෙන ගන්නට තිබිනි.

"මම බලන්නම් ඔෆිස් එකේ සර්ට කියලා ලෝන් එකක් ගන්න.. ගේකට ඇඩ්වාන්ස් දෙන්න.."

සංතුසී එසේ කියමින් ළිඳට යන පඩිපෙළ බැස්සාය. ඊළඟට නිදි ගැට කඩමින් ඩිනලි කුස්සියට පැමිණියාය.

දරුවන් දෙදෙනාම පිටත් කර හැර.. අවිස්සාවේල්ලේ පුංචි අම්මා හමුවීමට යාමට අනුත්තරා හිතාගෙන උන්නාය. ඒ ගමන උදේන්ම පිටවිය යුතුය. මේ ගමන දරුවන්ට නොකියා යන්නට අනුත්තරා හිතාගෙන උන්නාය. ඇයට නෑදෑයෙකුට සිටියේ අම්මාගේ නැගණිය වූ පුංචි අම්මා පමණි. වෙනත් නෑදෑයින් හිටියත් ඔවුන් සමග වැඩි ඇසුරක් නැත. අසරණ වූ විට අතපාන්නට එනු ඇතැයි නෑදෑයින් ගැන හිතාගත්තා පිය හැකිය. පත්තිපිටියෙන් නිවස මිලදී ගත්තේ හැමෝගෙන්ම වෙනවී තමාගේ පාඩුවේ ජීවත්වීමට හිතාගෙනය.

ඉඩම ගන්නට යන මහත්තයා තව ටික කලක් හෝ නැවතීමට ඉඩ දෙන්නට කැමැත්තක් නොමැති වග ගුණසිංහගෙන් ආරංචි විය. ඉදින් තවදුරටත් ඔහුට පිංසෙණ්ඩු වීමට යාමට නොහැක. තවත් තැනක ටියුෂන් පන්තිය පිහිටුවාගෙන කරගෙන යාමට කලක් ගතවේ. මේ ප්‍රදේශයේ දරුවන් නම් තමාගේ නම පවා හොඳින් හඳුනයි. පිට තැනකට ගොස් එසේ කීර්තිනාමයක් දිනා ගැනීමට කාලයක් ගතවෙයි. එසේ වුවද යළිත් ජීවිතය කොතනකින් හෝ පටන් ගත යුතු වෙයි. තමා ජීවත්වන්නේ දරුවන් දෙදෙනා නිසා බව සැබෑවක් නම් ඒ සැබෑව වෙනුවෙන්





ඕනෑම දුක් ගැහැටක් විඳ දරා ගැනීමට අභිත ශක්තියක් තමාට තිබිය යුතුය.

* * * * * * *

එළියේ කවුදෝ කතා කරන හඬ සංකේත්ට ඇසෙයි. අම්මාගේ යෙහෙළියක වූ හෙලන් ඇන්ටි අද එන වගත් ඇගේ දියණිය එන වගත් සංකේත් දැනගත්තේ කුස්සියේ වැඩ කරන බණ්ඩි මැණිකාගෙනි.

"මහත්තයා.. අද සේල්පොලට යනවද..? ලොකු මහත්තයා උදේන්ම ගියා.. දොළහට විතර එනවා කියලා ගියේ.."

බණ්ඩි මැණිකා සංකේත්ගේ තේ කෝප්පය කාමරයට ගෙන එමින් කීවාය.

"මට යන්ඩ කීවද..?"

"ලොකු නෝනාට කිව්වා මොකක්ද පණිවිඩයක්.."

බණ්ඩි මැණිකා එසේ කියමින් කාමරයෙන් පිට වූවාය.

සංකේත් වාහන ව්‍යාපාරය ගැන ආසාවක් නැත. ඔහු පිටරට ගොස් ඉගෙන ගත්තේ ව්‍යාපාර පරිපාලනය වූ නමුත් ඔහුට අවශ්‍ය වූයේ තෘප්තියක් ලැබෙන ව්‍යාපාරයක් කිරීමටයි.

"මචං ඒ ඉඩම හොඳ ගෙස්ට් හවුස් එහෙකට නෙවෙ.. ඒක හොඳ එඩියුකේෂනල් මොනවට හරි.. බලපන් නුගේගොඩට ළමයි ටියුෂන් එන තරම්.. රොටරි.. සක්යා.. රටේ නැති ඉන්ස්ටිටියුට් ඔක්කොම තියෙන්නෙ නුගේගොඩ... මහරගමට සතර.. එතනින් මෙහා මුකුත් නෑ.."



The Reader's Place http://e-pusthakalaya.blogspot.com/

පංකජ් ඔහුගේ ඔලුවට එම අදහස දැමූ පසු සංකේත්ගේ ඔලුවේ වැඩ කළේ එම අදහසයි.

"පුතා.."

අම්මාගේ කටහඬ ඇසෙද්දී සංකේත් ඇඳෙන් නැගිට්ටේය. තවම තේ එක මේසය මතය.

"තේ එක ඇල්වෙලා නේද..?"

"වෙන එකක් ගේන්ඩ කියන්ඩ.. බණ්ඩි මැණිකට.."

"මොනවද පුතා.. ඒ ගැනිට මොන කරදරයක්ද..? මීට පස්සෙ තමන්ට තේ ඕන වුණාම කුස්සියට ගිහින් ඉල්ලාගෙන බොන්න.."

අම්මාට තමාගේ පුරුදු රුස්සන්නේ නැත. පවුලේ එකම දරුවා වූ බැවින් සංකේත්ට හුරතලය වැඩිවී ඇත. දැන් දැන් ඒ හුරතලය මුදිතාට කරදරයක් වී ඇත. පුතුගේ තරුණ ජීවිතයට මොන තරම් ආසාවන් ඇද්ද..? අඩු ගණනේ දුරකථනයේ රැඳී ඉන්නට තවම පෙම්වතියක් නැත. යෙහෙළියක්ද නැත. ඉතා ඉක්මනින් කෝන්ති යන බැවින් යහලුවන් රැඳෙන්නේ ද නැත. ඔහුගේ සියලුම නුගුණ අහස පොළොව සේ උහුලන්නේ පංකජ පමණි. ඔහුට මුහුණටම බනින බැනුම්වල හැටියට ඔහු මේ නිවසට එන එකත් පුදුමය. තවත් දරුවන් දෙතුන් දෙනෙක්වත් හිටියා නම් කොපමණ හොඳදැයි මුදිතාට සිතෙන්නේ දැන්ය. දැන් පුතු තනිවී ඇත.

"ඔන්න ලොකු නෝනා.. කෝ මහත්තයා..?"





බණ්ඩි මැණිකා තේ එක ගෙනැවිත් මුදිතා අතට දුන්නාය. සංකේත්ට අවශ්‍ය විදියට තේ සාදන නියමිත ප්‍රමිතියක් තිබේ. බණ්ඩි මැණිකාටවත් මුදිතාටවත් තවම ඒ ප්‍රමිතයට අල්ලා ගන්නට නොහැකි වී ඇත. සංකේත් තේ බොන්නේ මුණ ඇඹුල් කරගෙනය.

"කවුද තේක හැදුවෙ අම්මද..?"

සංකේත් අවුත් මුදිතාගේ අතින් තේ එක ගනිමින් උගුරක් බිව්වේය. කහට ගානට නමුත් සීනි වැඩිය.

"තමුන්ට හරියන තේ හදන්න පුළුවන් කෙනෙක් ගෙන්නා ගන්නෙ නැත්තෙ ඇයි..?"

පුතාගේ මුහුණ ඇඹුල් වෙනු දැක මුදිතා ඇසුවාය. ඔහු බිව් තේ එකේ බාගයකි.

"අම්මා දාන්නයෝ ඇඩ් එකක් තේ හැදීම පුහුණු කර ඇති කෙනෙක් අවශ්‍යයි කියලා.."

"ඒකත් සුදුසුකමක් කියලම මං මේ සිළුමිණ පත්තරේට මංගල යෝජනාවක් යවන්න හිතාගෙන ඉන්නෙ.."

සංකේත් සිනාසුණේය. මේ ආකර්ශනීය සිනහවට වශීවන කෙල්ලන් ඕනෑ තරම් ඇත. එහෙත්.. ඉරණම්කාරි එනතුරු අමාවී ඉන්නට සිදුව ඇත.

"කවුද අම්මා අද එන්නෙ..?"

"ආ.. හෙලන් ඇන්ටි.. පුතාට මතකද නුවර ඉන්න කාලෙ.. පේරාදෙණියෙන් හිටියෙ එයාලා.. දැන් ඉන්නෙ කොළඹ.."



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

"ඉතිං මෙහෙ එන්නෙ.. අළුවිහාරේ වඳින්නවත් යන ගමන්ද..?"

"දුවත් ස්ටඩීස් ඉවර වෙලා ඇවිත්ලු.. වෙන්ජ් එහෙකටත් එක්ක එනවා කිව්වා.. ඔයා හවසටවත් ගෙදර ඉන්න.. එයාලා ලන්ච් එකට එයි.."

ඔහුට හෙලන් ඇන්ටි යාන්තමට මතකය. සංකේත්ට අවුරුදු දහයක් පමණ වනතුරු සිටියේ නුවරය. තාත්තා මාතලේ ගේ හැදූ පසු අම්මාත් පුතාත් මාතලේට ගෙන්වා ගත්හ. ඉන්පසු නුවර ගියේ ආත්තම්මාත් අත්තාත් බැලීමට පමණි.

"ඔයාට මතකද පුතා.. හෙලන් ආන්ටිගෙ දුව.."

"කවුද බනීද..?"

"අන්න හරි.. බනී තමයි.. මොකක්ද ඒ ළමයගෙ නම.. මට මතකත් නෑ.."

"මටත් මතක නෑ.. බනීස් කියල දුවනකොට ගහන්න එන හොටු කෙල්ලෙක් මතකයි.. එච්චරයි.."

සංකේත් කීවේ සිනාසෙමිනි. ඔහු එසේ පැහැල්ලුවෙන් ඉන්නවා නම් හොඳයි.

"දැන් ඔය කොහෙද යන්න හදන්නෙ..?"

"ආකිටෙක්ට් කෙනෙක් හම්බවෙන්න තියෙනවා.."

"පුතා අර ඉඩම ගන්නවද..?"

"ඔව්.. බැන්ක් ලෝන් එකත් හරි.. හෙට ඒ වැඩේට කොළඹ



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/



යන්න තියෙනවා.. අනේ අම්මා ප්ලීස්.. තාත්තට කියන්න.. ඔය අනං මනං වෙහිකල් කේස් නම් මගෙ ඔළුවට දාන්න එපා කියලා.."

"එතකොට ඒවා තාත්තා දාන්නෙ කාගෙ ඔලුවටද...?"

"මගෙ ඔළුව තියෙන්නෙ ඊට වඩා දුර හිතන්න.. ඒක තාත්තාට කියන්න.."

පුතා කියන්නේ ඇත්තය. වාහන පිටරටින් ගෙන්වා විකිණීමට මහා ලොකු උගත්කමක් අවශ්‍ය වෙන්නේ නැත. පුතාගේ ඔළුවේ ඊට වඩා හොඳ සැලසුම් තියෙන පාටය. අනේ ඒ හැමදේටම උදව් කරන්න කෙනෙක් හිටියා නම්..

සංකේත් පිටව ගියේ නගරයේ සිටිනා ප්‍රසිද්ධියේම වරලත් වාස්තු විද්‍යාඥයෙකු සොයාගෙනය. තමා ගොඩ නැගීමට යන ආගමන කේන්ද්‍රයේ සැලසුම් අන්දවාගත යුතුවෙයි. ඉඩම පර්චස් පාළිකක් පමණ වන නිසා තට්ටු තුනකට පමණ යන පරිදි අංග සම්පූර්ණ අධ්‍යාපන කේන්ද්‍රයක් ඉදි කිරීමට සංකේත් හිතාගෙන උන්නේය. ඔහු චිත්‍රවලට ආසා නිසා චිත්‍ර, නැටුම්, සංගීතය වැනි පංති පැවැත්විය හැකි කලාකේන්ද්‍රයක් ද අනෙක් පස අධ්‍යාපනයට අදාල පන්ති පවත්වන තැනක්ද ලෙස එය නිර්මාණය විය යුතුය.

ඒ සැලසුමේ හැටියට වත්ත කොණේ ඇති ඒ සුන්දර පුංචි නිවස කඩා දමන්නට සිදුවේ.

සංකේත් ගිය වැඩේ කරගෙන තාත්තාත් හමුවී ඔහුත් සමග නිවසට ආවේය. මුදිතා හෙලන්ට එන්නට කීවේ තවත් අරමුණක්

ඇතිව වග රවී දනී. නිවසට ළංවන විටම නිවසේ ඉදිරිපස මිදුලේ වෙරළු ගහ ළඟ ඇති පැද්දෙන ඔන්චිල්ලාවේ වාඩිවී සිටි යුවතිය රවීට නම් අඳුනාගත හැකිවිය. මේ හෙලන්ගේ දුව බනී. ඔහුටත් ඇගේ නම මතක නැත. මේ මවුන් හමුවන්නේ කොපමණ කාලයකට පසුවද..? අවුරුදු විස්සකට පමණ පසුව යයි සෙනරත්නට සිතුණි.

"ඇයි රවී පරක්කු වුණේ.. හෙලන්ලා ඇවිත් පැය තුනක් විතර.."

මුදිතා ඉදිරියට දිව ආවේ එසේ කියාගෙනය. පියාගේ කාරයේම පුතාත් සිටීම මුදිතාට සහනයක් විය. ඇය සිතාගෙන උන්නේ සංකේත් මහ රෑටවත් ගෙට ගොඩවනු නැතැයි සිතාය. සංකේත්ගේ හැටි එහෙමය. මාතලේ ටවුන් එකට යනවා කියා ගියහොත් ගිහින් නවතින්නේ කුරුණෑගලය. නැතහොත් කෑගල්ලේ හෝ නුවරය.

"ආ.. පුතා.. කොච්චර වෙනස්ද..?"

හෙලන් එසේ කියමින් සංකේත්ව අල්ලා ගත්තේ සෙනෙහසිනි.

"බනී... මේ බලන්න සංකේත් අයියා.."

යුවතිය දුවගෙන ආවාය. දුඹුරු පැහැ කොට හිසකෙස් විලාසිතාවකින් යුතු බනී.. කුඩා කාලයේ සිටි බනීදැයි හඳුනාගන්නට නොහැක. ඇඳ උන්නේ යාන්තම් වැහෙන රැලි ගවුමකි. කුඩා කාලයෙන් වෙනස්වී නැත්තේ එපමණය.

"හායි සංකේත්නයියා.. අඳුරන්නත් බෑ.."





ඇය කිසිම බියක් ලැජ්ජාවක් නොමැතිව කතා කරමින් සංකේත්ට සිපාචාර දැක්වූවාය.

"ඉතිං.. ඉතිං.. දැන් බඩගිනිත් ඇති.. යමු කන්න.."

මුදිතා ආරාධනා කළාය. අම්මා අද ඉන්නේ ඉතාම සතුටින් වග සංකේත්ට තේරුම් ගියේය.

"භුවනි දැන් මොනවද කරන්නෙ..?"

"මං දැන් මේ කනවා සංකේත්.."

බනී එසේ කියමින් සිනාසුණාය. හෙලන් දියණිය දෙස රවා බැලුවාය. මුදිතලා හොයන්නේ ගුණවත් චරිතවත් ලේලියකි. මේ කෙල්ල සංකර වැඩිය.

"බනී.. අයියා අහනදේට උත්තර දෙන්න.."

හෙලන් සැර කළාය. සංකේත් සිනාසුණා මිසක නැවත කතා කිරීමට උත්සුක නොවුණාය. බණ්ඩි මැණිකා සාදා තිබුණ කඩේ ගොඩේ කෑමට භුවනි එතරම් ආසා කළ බවක් පෙනුණේ නැත.

"අනේ දාගෙන කන්න දුව.."

මුදිතා කිරි කොස් හැන්දක් ඇයට බෙදුවාය.

"අනේ එපා ආන්ටි.. මං ටිකක් ලයිට් ඩයට් එකක්නේ ගන්නෙ.."

"ඔය මහන්සෙයි කියලා තියෙන බයට මුදිතා.. මොන කරුම වෙන්ජ් එකක්ද මේ මීල් එක.."



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

"රසයි තමයි මමා.. ඒ වුණාට.."

"ඉඳලා හිටලා කොස් ටිකක් කෑවට මහත්වෙන්නෙ නෑ.. අනිකා කටුවහල්ල වාගෙ ඉන්නෙ නැතිව ටිකක් මහතට ඉන්න ඕන.."

හෙලන් එසේ කියමින් මිරිස් මාළු ටිකක් තම පිඟානට බෙදා ගත්තේ මුදිතාගේ හිත නරක්වනු ඇතැයි බියෙනි.

"අපේ බණ්ඩි මැණිකලා දන්නෙ ඉතිං ඔය පොලොස් ඇඹුලට, මාළු ඇඹුල් ටිකක්.. තිබ්බටු මැල්ලුමක් වාගේ දෙයක් හදන්න තමයි.. මං දුවට රට ස්පෙෂල් මොනවා හරි හදලා දෙන්නම්කො.."

මුදිතා, බනීගේ හිස අතගාමින් කීවාය. 'මෙයත් අපේ එකා වගේම නුරතලේට හැදිලා.. කසාද බැඳලා වගකීම් දරනකොට.. ඔවා නැතිවෙලා යනවා..'

ඇය තනිවම සිතුවාය. 'දැන් හැදෙන කෙල්ලන්ගෙත් විශාකාවන්, සීතාවන් බලාපොරොත්තු වෙන්න බෑ.. දැන් හැමදේම වෙනස්.. පිටරට ගිහින් හැදුණාම ඔහොම තමයි..'

"අපේ එක්කෙනා කන්නෙ ඉතිං කොස් තියෙන දවසට කොස්ම තමයි.. මොන රට රාජ්ජේ ගිහින් ආවත්.. බණ්ඩි මැණිකා ගාපු පොල් කටුවට තැම්බෙන කොස් ටිකක් බාද්දිම දාලා දුන්නොත්.. හායි හුයි කිය කියා කනවා.."

රවී කීවේ මුදිතාව බේරා ගැනීමටය. මුදිතා මෙවැනි කෑම හදන්නට කියන්නට ඇත්තේ නගරයේ කෑම ඔවුන්ට එපාවී ඇති නිසා යයි සිතා වන්නට ඇත. දැන් ඉතිං රට විකත් ෆයිඩ්රයිස් වැනි දෙයක් කෑමට හැකිවනු ඇත.





"අපේ බනීත් ආසයි.. මේ පුරුදු නැතිකමනේ.."

හෙලන් ඇන්ටි.. භුවනී බේරා ගැනීමට උත්සාහ කරමින් කීවාය.

* * * * * * *

"මෙහෙමයි මචං.. මේ ප්ලෑන් එකේ හැටියට අපට එකපාරම මේක බිල්ඩ් අප් කරන්න බෑ.."

පංකජ් පැවසුවේය. ඔහු යම් දෙයක් ගැන සාමාන්‍යයෙන් දුරට හිතයි. වාස්තු විද්‍යාඥයා දළ වශයෙන් ඇඳි කටුසටහන බැලූ පංකජ් කියයි.

"අංක එක ඉඩම ගන්න එක.."

"ඒක හරි.."

"දෙක.. මේ ප්ලෑන් එක පාස් කරගෙන.. හොඳ විශ්වාසවන්ත බිල්ඩින් කන්ට්‍රැක්ෂන් එකකට වැඩේ බාරදෙන එක.."

"තුන..?"

"තුන පබ්ලිසිටි දීලා.. හොඳ මැනේජර් කෙනෙක් දාලා වැඩේ පටන් ගන්න එක.. එතකොට.. එතකොට ගුරුවරු හොයන්නෙ.. ළමයි කන්ට්‍රෝල් කරන්නෙ එතකොට එතන ටොයිලට් හෝදවන්නෙ.. ඒ දේවල් කරවන්නෙ මැනේජර් මිසක් උඹ නෙමෙයි.."

පංකජ් එසේ කීවේ වැඩක් කිරීමට ගිය විට සංකේත් ලෝකයේම කරදර ඔළුවට දාගන්නා නිසාය.



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

"එහෙනම් ඉතිං ඒ පෝස්ට් එක හොඳ උඹටම තමයි.."

"උඹේ මැනේජර් වෙනවට වැඩිය හොඳයි බං.. හරක් පට්ටියක් බලාගන්න එක.. උඹේ කුණු බැනුම් අහගෙන මැනේජර් කෙනෙක් ඉඳියි ඒ මාසෙ පඩිය ගන්නකං විතරක්.."

"ඒකම තමයි ගොනෝ කිව්වෙ.. ඒ පෝස්ට් එකට හොඳ උඹ කියලා.."

පංකජ ඔලුවේ අත ගසා ගත්තේය. දැන් ඉතිං වගකීම බාරගත්තා හා සමානය. එතනදී සංකේත්ට සර් කියා කතා කළ යුතු වෙයි. අමාරුම වැඩේ ද එයයි.

"හරි.. හරි.. හෙට යන්න ලෑස්තිවෙයං.."

පංකජ එසේ කියමින් එළියට බහින විට ඔන්චිල්ලාවක පැද්දෙමින් උන් යුවතිය දුටුවේය. 'කවුද යකෝ මේ.. මීට කලින් දැකලා නැනේ මෙහෙම ඩයල් එකක් මේ ගෙදර ඉන්නවා.. හොල්මනක්වත්ද..? මූණ නම් එම්බාම් කරලා වගේ..' පංකජ දෑස පිස දමා බැලුවේය. ඒ හොල්මනක් නොවේ. බණ්ඩි මැණිකා ඇය වෙත බීම වීදුරුවක් රැගෙන යන හැටි ඔහු දුටුවේය. මෙවන් ඥාති සොහොයුරියක්වත් සංකේත්ට හිටියා යයි පංකජට මතක නැත.

"යකෝ.. ඇන්ටිලා මේකට මගුලක්වත් කතා කරලද දන්නෑ.. බලපල්ලකො ඇගේ සයිස් එක.. ඉරටුවක් වගේ.."

පංකජ එසේ කියමින් තම මෝටර් සයිකලයට නැග එය පණ ගැන්වුවේය.

* * * * * * *



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/



"අනුත්තරා... කාලෙකින් දැක්කෙ.. කොහොමද දුවේ ඉතිං..?"

පුංචි අම්මා අසයි. පුංචි අම්මා දැන් හොඳටම වයසය.

"බලන්ඩ එන්ඩ විදිහක් තිබුණෙ නෑ පුංචි අම්මෙ.. මේ ළමයින්ගෙ වැඩත් එක්ක.."

ගේ හොඳටම පාළුය. දිරාපත්වෙමින් පවතී. කහ පාට ගැ බැත්තිවල ලා කොළ පාටට දිය සෙවල බැඳී ඇත. ගේ පුරාම මකුළුදැල්ය. පුංචි අම්මාට දැන් ගෙවල් සුද්ද පවිත්‍ර කරන්නට හිතක් නැතුවා විය හැක. පුංචි අම්මාට දැන් අවුරුදු හැට පහකට වැඩි යයි අනුත්තරා සිතුවාය. අනුත්තරාට සංතුෂි ලැබෙන විට වයස විසි පහකි. ඒ කාලයේ පුංචි අම්මා කොතරම් තරුණද..?

"ඉතිං.. ඉතිං.. මං තේකක් හදාගෙන එන්නංකො.."

"යං.. මාත් එන්නං කුස්සියට.."

තමා අවුරුදු දෙක තුනකින් පුංචි අම්මා බැලීමට නොපැමිණීම මහත් වරදක් යයි ඇයට සිතුණි. පුංචි අම්මාද ගුරුවරියකි. ඇය අවුරුදු පනස් පහෙන් විශ්‍රාම ගත්තාය. දැන් ඇය ජීවත්වන්නේ පැන්ෂන් පඩියෙනි.

"මං පුංචි අම්මට ඒ දවස්වලම කතා කරා ගිහින් මාත් එක්ක ඉමු කියලා.."

"මේ ගෙවල් දොරවල් දාලා මට ගිහින් ඔවාගේ කුඩුවෙලා ඉන්ඩ බෑ අනුත්තරා.. මට නිදහසේ අතපය දිග ඇරලා ඉන්ඩ ඕන.."

එය නම් ඇත්තකි. පන්නිපිටියේ කුලී නිවසේ ඇත්තේ ද කාමර දෙකකි. එක කාමරයක් සංතුසීගේ චිත්‍ර ඇඳීමටත්, ඩිනලිගේ පාඩම් කිරීමටත් වෙන්ව ඇත. තුන්දෙනාම නිදාගත්තේ අනෙක් කාමරයෙහිය.

"උඹට මොකක් හරි කරදරයක්ද අනුත්තරා..?"

පුංචි අම්මා තේ එක හදන ගමන් ඇසීය. දැන් ඉතින් තියෙන්නේ තමාගේ කතාව කියන්නටය. අලුත් නිවසකට ඇඩ්වාන්ස් ගෙවන්නට තරම්වත් මුදලක් ඉතුරු කරගෙන නැත. පන්තිය කරන්නට නොහැකි වුවහොත් ජීවත්වීමට ආදායමක් සොයාගත නොහැක. තමා වැටෙන්නට යන්නේ විශාල කරදරයකය. ජාතික පාසලක ඉගෙන ගන්නා ඩිනලිට පාසල අහිමි කිරීමට නොහැක. මේ අහිංසකයන් දෙදෙනා කරපින්නා ගෙන තමන් තව කොපමණ දුරක් දුක ගෙවාගෙන යන්නද..?

"මට කියන්ඩ තියෙන්නෙ මෙච්චරයි අනුත්තරා.. මිත වෙලාවක ළමයි දෙන්නත් අරගෙන ඇවිල්ලා නතරවෙයන්.. මේ ගේ කාමර පාළුවට ගිහින් තියෙන්නෙ.."

අනුත්තරාට එය සැනසීමට වදනක් විය. එහෙත් ඩිනලි මොන තරම් අපහසුවකට පත්වනු ඇද්ද..? ඇය ලබන අවුරුද්දේ ඕලෙවල් විභාගයට පෙනී සිටින නිසා පන්ති හතරකට පමණ සහභාගී වෙයි. සංතුසිටත් දිනපතා බස්රියේ හෝ කෝච්චියේ යාමට සිදුවෙයි.

"මේ හරියෙ මට පන්ති කරගන්න බැරිවෙයි.."

"උඹට ඉතිං ගෙවල් කුලියක් නෑ.. කන බොන වියදමත්





එච්චර යන්නෙත් නෑ.. වත්තෙ පිටියෙ එළවළු පලා කොස් දෙල් හැදෙනවා.. අර පුරුද්දට නොකර ඉන්න බැරි නම්.. ඔය පන්තියක් හිමින් සීරුවේ පටන් ගන්න බැරියැ.."

වෙලාවේ හැටියට පුංචි අම්මා දේවතාවියකි. ලොවේ යම් කිසි ප්‍රශ්නයක් වේ නම් කොතැනක හෝ එයට පිළිතුරක් තිබේ. අනුත්තරා මේ ජීවිත ගමනේ ප්‍රශ්නවලට උත්තර දීමෙන්ම හෙම්බත්වී සිටියාය. සංතුසී හොඳ ගුණවත් කෙනෙකුට විවාහ කර දීම ඇගේ බලාපොරොත්තුවයි. එය හැම අම්මෙකුගේම හදවතේ තලියන බලාපොරොත්තුවකි. ජීවත්වුණා ඇති යයි සිතන්නට දැන් නොහැකි දරුවන් නිසාය.

"මම ලොක්කිත් එක්ක කතාකරලා බලන්නම් පුංචි අම්මෙ.."

"ආයෙ ඕක හිත හිතා ඉන්ඩ දෙයක් නෑ.. ලොක්කිට කැඩට යන්ඩයි, පොඩ්ඩිට ඉස්කෝලෙ යන්ඩයි එක බස්සෙක.. පාරට කිලෝ මීටර් බාගයක් විතර ඇවිදගෙන යන්න තියෙනවා.. එච්චරයි.."

අනුත්තරා කුස්සිය අස්පස් කර.. පිටුපස ගසෙන් පොලොස් ගෙඩියක් කඩා ඇඹුලක් හැදුවාය. බත් මුට්ටිය ලිප තබා කරවල හොද්දක්ද තිබ්බටු හා කොස් ඇට දමා මැල්ලුමක්ද හැදුවාය.

"රෑට කන්ඩ බත් එකක් ඔතාන පලයං.."

පුංචි අම්මා එදා බත් කෑවේ සතුටිනි. කිච්චන් වාගේ කන්නට බොන්නට මහ ලොකු වියදමක් නැත. තැඹිලි, දොඩම්, අඹ, ගස්ලබු, අලිපේර වැනි ගස් හැම තැනමය. එළවළු ටිකක්



The Reader's Place http://e-pusthakalaya.blogspot.com/

වචා ගත හැක. එහෙත් පුංචි අම්මාට මෙසේ කරදරයක් විය නොහැක.

අනුත්තරා කෙසල් කොළයක් තවා බත් මුලක් බැඳ ගත්තාය. තවමත් ඉඳී නැති කෝලි කුට්ටු ඇවරියක් හා දොඩම් ගෙඩි ටිකක් පුංචි අම්මා බෑගයකට දමා දුන්නාය.

"අද හෙටම වරෙල්ලා.."

පුංචි අම්මා එසේ කීවද අනුත්තරාට සිත එකහ කර ගැනීමට හැකියාවක් තිබුණේ නැත. එකම දරුවා වූ අභීත් මල්ලි ඉන්නේ එංගලන්තයේය. පුංචි අම්මා එහේ යන්නට තියා අනුත්තරා සමඟ පන්නිපිටියේ නිවසට එන්නටවත් කැමැත්තක් තිබුණේ නැත.

The Reader's Place

පැය එකහමාරකට වඩා බස්රිය කොට කොටා පැමිණියේය. ඇය පන්නිපිටියෙන් බැහැ ගත්තේ හෙම්බත්වූ ගතින් හා සිතිනි. එහෙත් යාන්තමට සැනසීමක් සිතේ නොතිබුණාමත් නොවේ.

http://e-pusthakalaya.blogspot.com/

චිනලී ගෙදර ඒමට පෙර අනුත්තරා ආවත් හවස පන්තියට ඒ වනවිටත් පැමිණි ළමුන් මිදුලේ එක්රොක් වී උන්හ. වහ වහා ගෙට ගොස් ඇඳුම් මාරු කරගත් අනුත්තරා.. වතුර වීදුරුවක් බී පන්තියට පැමිණියාය.

* * * * * * *

කාර්යාලයේ වැඩ කරන සුනෙත් නම් මිතුරා රිය අනතුරකින් අසනීපව සිටියේය. සුනෙත්ගේ දෙමාපියන් ඔහුට ඉක්මන් සුවය පතා බෝධි පූජාවක් පැවැත්වීමට කටයුතු කර තිබුණි. සංකුසී





ද එයට සහභාගී වීමට සිතුවාය. කාගේ හෝ කරදරයකදී සංකුසීගේ සිත උණුවෙයි. තමා ද දැන් කරදරයට පත්වී ඉන්නා බැවින් එවැනි දෙයකට සහභාගී වීම හොඳ යයි ඇය සිතුවාය.

"ඇයි සංකු...?"

කෙත්මි ඇසුවාය. සිත බෝධි පූජාවේ නොතිබුණු බව සංකුසීට අවබෝධ විය.

"උඹ කොහෙද මේ අනිමිස ලෝචන පූජා කියලා බැලුවෙ.."

කෙත්මි එසේ කියමින් සංකුසීගේ දෑස රැඳි ඉසව්ව සෙව්වාය. ඇයගේ දෑස නැවතී තිබුණේ ලස්සන, කඩවසම් තරුණයෙකු වෙතය. එය අදහන්නටවත් බැරි සංකුසී කිසිම පිරිමියෙකුට කැමැත්තක් නැති නිසාය. ඒ තරුණයා දෙව්රම් විහාරයේ බෝමළුවේ පහනක් දල්වමින් සිටියේය. ඔහුගේ මුහුණ බෝසත් [illegible]ය.

"සංකු.. කොහෙද හිත තියෙන්නෙ..?"

"හිත නෙමේ ඇස්.."

"අර කොල්ලා ළඟ.."

"මං ඒ කොල්ලට ලව් කරන්න නෙමේ ඒ දිහා බලන්නෙ... ආට් එකකට ගන්න පුළුවන්ද බලන්න.."

කෙත්මි මිතුරියගේ සිත මනාව අඳුනයි. සංකුසීගේ පළමු චිත්‍ර ප්‍රදර්ශනයට නව සිතුවම් කිහිපයක අඩුවක් ඇත. මේ දිනවල තම කුලී නිවස ගැන ප්‍රශ්නයකට මුහුණ පා ඇති නිසා

සංකුසී ඉන්නේ හිතේ කරදරෙනි. බෝධි පූජාව අහවර වන විට ඒ ලස්සන පිරිමි රුව අතුරුදහන්ව තිබිණි.

සංකේත් දෙවිරම විහාරයට පැමිණියේ පළමුවරටය. මීට පෙර මේ විහාරය ගැන අසා තිබුණත් කොළඹ හා ඒ අවට සමග තිබුණ සම්බන්ධකම් ඉතා විරළ විය. අද තමා ඉඩම මිලදී ගත් නිසා.. හිත කරමක් කලබල වී තිබුණි. ඔහුගේ හිත කලබල වූ එක් කාරණාවක් තිබුණි. ගුණසිංහ කී පරිදි කුලී නිවසේ සිටින ගැහැනියත් දරුවන් දෙදෙනාත් තවම නිවාසයක් සොයාගෙන නැත. නමුත්.. තමාගේ සැලසුම අනුව නම් එම නිවස කඩා දමන්නට සිදුවේ. එම නිවසේ ලොකු වටිනාකමක් නැත. එතැන ඉංග්‍රීසි පන්තියක් පැවැත්වෙන බව ගුණසිංහ කීවේය.

"ගස් කපනකොට කුරුළු කූඩු කැඩෙනවා.. හාවුන්ට, තලගොයින්ට ගෝනුන්නට ඉන්න තැන් නැතිව යනවා.. ඒ වාගෙ තමයි මහත්තයෝ.. හරි ගුණයහපත් නෝනා.. ළමයි දෙන්නත් එහෙමයි.."

ගුණසිංහ කීවේය. නමුත් ව්‍යාපාර කරන විට.. අනුන්ට අනුකම්පා කළ නොහැකි බව පංකජ්ගේ අදහසයි.

"එහෙනම් ඉතිං.. ෆවුන්ඩේෂන් දාන්න පස් කපන්න එපා.. හොඳ ගුණ යහපත් ගැඩවිල්ලො, පණුවො එහෙම කැපිලා යනවා.."

පංකජ් කියන්නේ ඇත්ත වග සංකේත්ට සිතුණි.

ආපසු කාරෙක එලවාගෙන මාතලේ යන්නට තරම් සත්තුන්



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/



හිතක් ඔහු සතු නොවීය. පන්නිපිටියේම වූ රෙස්ට් ඉන් එකක මිතුරන් දෙදෙනාම නතර වූහ. පංකජ් කාමරයට ගිය වේලේ සිටම නිදා ගත්තේය. සංකේත් නාගෙන වාහනයේ තිබුණු සුදු කමිසයක් ඩෙනිම් කලිසමක් ඇඳගත්තේ පන්සලට යාමටය. සංකේත් මුල සිටම හැදුණේ ආගමික පරිසරයකය. එබැවින් කුමන වැඩකට අත ගැසුවත් ඔහුට පන්සලට ගොස් බුදුන් වැඳ ගැනීම අත්‍යාවශ්‍ය දෙයක් විය.

"නිකමට ඒ ගෙට ගොඩවැදිලා යන්න ඕන.."

ආපසු යනගමනේ සංකේත්ට හිතුණි.

සංකුසී ගෙට ගොඩවූයේ තරමක මහන්සියෙනි. සංකුසීට තේ එකක් සෑදීමට අනුත්තරා කේතලය ලිපේ තැබුවාය. දිය රෙද්ද දවටා ගත් ඇය කුස්සියට ආවේ.. කුස්සියේ සිටම තේ එක බොන ගමන් අම්මා සමග කතා කිරීමේ පුරුද්දටය.

"අම්මට අද හුඟාක් මහන්සියි වගේ.."

"මං උදේ පුංචි ආච්චි බලන්න ගියා.. ඒ ගිහින් එනකොට හවස පන්තියට ළමයි ඇවිත්.. එක හුස්මට පන්තියත් කරා.."

සංකුසීට අම්මා ගැන දුක හිතුණි. ඇය පුංචි ආච්චි බලන්නට යන්නට ඇත්තේ විශේෂ උවමනාවකට වන්නට ඇත. ඒ බොහෝ විට මේ අසරණ තත්වය මත වෙන්නට පුළුවන.

"හවස මං දැක්කා ජීප් එකකින් මිනිස්සු වගයක් ඇවිත් එන්න බලනවා.. මගෙ හිතේ තාප්පෙ හදන්න කන්ට්‍රැක්ට් දීලා ඇති.."

අනුත්තරා කීවාය. ඒ සමගම ගේ ඉදිරිපිට කාරයක් නවත්වන හඬ දෙදෙනාටම ඇසුණි.

"කවුද ආවා.."

"බී.එම්.ඩබ්. එකක් අම්මා.. ගිහින් බලන්න.. ගිහින් බලන්න.."

සංතුසි එසේ කියමින් ගොප් දමමින් තිබුණ කෝතලය ලිපෙන් බෑවාය. අම්මා කාත් සමගදෝ කතා කරන හඬ ඇසුණි. අනුත්තරා වහා නැවත කුස්සියට ආවාය.

"ලොකු පුතේ.. තේ එකක් හදලා ගන්න.. වත්ත ගත්ත මහත්තයා.."

එසේ කියූ අනුත්තරා නැවතත් කලබලයෙන් ඉදිරියට දිව ගියාය. සංතුසී තවම ඒ මහත්තයා දැක නැත. දිය රෙද්ද පිටින් ඉදිරියට යන්නටවත් නොහැක. ඈය.. අම්මාටත් තමාටත් අමුත්තාටත් තේ තුනක් පිළියෙල කළාය. අමුත්තාගේ තේ එක පෝසිලේන් සුදු අඩු කෝප්පයක තබා සිල්වර් පැහැති බන්දේසියේ ඉදිරියට ගෙන ගිය ඇය එය කෑම මේසය මත තබා ආපසු හැරුණාය. අම්මා අවුත් තේ එක ගෙන යනු ඇත. ඉතා ඉක්මනින් ඇඟ සෝදාගෙන ඇඳට වැටීමේ අවශ්‍යතාවය සංතුසීට තිබුණි.

"මහත්තයා.. බොන්න තේ එකක්.."

අනුත්තරා දියණිය විසින් සෑදූ තේ එක.. ඔහුට පිළි ගැන්වූවාය.

"මටත් දුකයි ආන්ටි.. ඒත් මෙතන බිල්ඩින් එකක් ගහන්න යන නිසා.. මේ ගේ ප්ලැට් කරන්න වෙනවා.."





සංකේත් කරුණු අවධාරණය කළේය. මේ කාන්තාව වැදගත් පාටය. තරුණ කාලයේ ඇය ඉතා ලස්සනට ඉන්නට ඇත. ඇගේ බැල්මට තවම අවුරුදු පනහ පසු කර නැතුවා විය හැක.

"බොන්න මහත්තයා.."

තේ එක බොන්නට ඔහුට හිතක් නැත. කොහොම හදලද දන්නෑ.. බණ්ඩි මැණිකා වාගේ දෙතුන් සැරයක් කුස්සියට යවන්න වෙයිද දන්නෑ. එහෙත් තේ එක වැනිලා සුවඳය. ඔහු උගුරක් බිව්වේය. පුදුමය. මෙතරම් රසට කොහෙන්වත් තේ කෝප්පයක් බිව් බව ඔහුට මතක නැත.

"තේක නම් හරි රසයි.. කොහෙන් ගේන තේකොළද ආන්ටි..?"

මෙතරම් ප්‍රශ්න තිබියදී මේ තරුණයා කතා කරන්නේ තේ කොළ ගැනය. සැප උඩම හැදුණු දරුවෙකු විය යුතුය. සංතුසීගේ අම්මා උන්නා නම්.. තමාගේ දරුවනුත් ධන කුවේරයන්ය.

"අනේ මහත්තයා.. ඔය කඩේ තේ කොළනේ.."

"හරි රසයි.."

ඔහු තේ එක ගැන වර්ණනා කරනවා නම් තේ බීමේ රුසියෙකුම විය යුතුය.

"ගෙයක් තාම හොයාගත්තෙ නැද්ද..?"

"නෑ මහත්තයා.. අපි ගෙයක් බලලා තියෙන්නෙ.."

අනුත්තරා වුවද කාගේවත් අනුකම්පාවට බඳුන්වීමට කැමති නැත. බොරුවක් කීමට සිතුවේ එබැවිනි.



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

"එහෙම නම් ඉතිං ප්‍රශ්නයක් නැහේ නේද ආන්ටි.."

"ම්.. ප්‍රශ්නයක් නැත්තෙමත් නෑ මහත්තයා.. මෙතන ඉතිං ළමයින්ට පුරුදු තැනනේ.. එයාලට ඉස්කෝලෙ යන්න පන්ති යන්න එහෙම ඉතිං පහසුයි.. ඒත් එහෙම කියලත් බෑ..නේ.. ගේ ඕන නම් අපි දෙන්න ඕන.."

"මට කණගාටුයි.."

"මහත්තයා ඒ ගැන හිතන්න එපා.. මහත්තයා ඉඩම ගත්තෙ ගෙවල් රෙන්ට්අවුට් කරන්න නෙමේ.. වෙන වැඩකට අත ගහන්නනෙ.."

පංකජ හිටියා නම් තමාට බනිනු ඇත. ගුණසිංහ කියූ තරමට අසරණ පාටකුත් පෙනෙන්නට නැත.

"එහෙනම් මං යන්නං ආන්ටි.."

"ආ.. මහත්තයා.."

ඇය නැවත කතා කළාය.

"පුළුවන් නම් අපි තව මාස දෙකක් විතර ඉන්නද..?"

සංතුෂීට අම්මාගේ කටහඬ ඇසේ. දිය රෙද්ද ඇඳගෙන උන් නිසා ඉදිරියට යන්නට නොහැකිය. අම්මා ඕනෑවට වඩා ඒ මිනිහාට බාල්දු වෙන්නට යන වග සංතුෂීට පෙනෙයි.

"මං මගේ මැනේජර්ගෙන් අහලා ඉන්නම්.. ප්ලෑනින් තියෙන්නෙ එයාට.."





ඒ අහංකාර මිනිහාගේ කටහඬ.. ඉදිරියට ගොස් හොඳවයින් දෙකක් කතාකරන්නට හිතුණත් සංතුෂී කරබා ගත්තාය. කාරය පිටවී යන හඬ ඇසුණු පසු සංතුෂී ඉදිරියට ආවාය. තවමත් චිත්තය දවටාගෙන ඉන්නා ලොකු දුව කෙරේ ඇගේ හිත තුළ කෝන්තියක්ද ඇතිවිය.

"මොකටද අම්මා ඒ මිනිහට බාල්දු වෙන්න ගියේ..?"

සංතුෂී ඇසුවේ සැරෙනි. මෙයාටත් පිහිටලා තියෙන්නෙ අප්පච්චිගෙ පවුලේ අයගෙ මාන්නක්කාර ගතිගුණ වග අනුත්තරාට සිතුණි.

"ඒ මහත්තයා.. මේ පැලට ආවෙ මනුස්සකමට.. නැත්තං මේ ගේ ප්ලෑට් කරලා දාන්න අපෙන් අහන්න ඕනද..? ගුණසිංහ අංකල් එක්ක ගැහුව කන්ට්‍රැක්ට් ඉවරවෙලා හුඟාක් කල්.."

"එයා එන්න ඇත්තේ අපට අනුකම්පා කරන්න.."

දියණිය අනුකම්පාව හිහාකෑමට කැමති නැත. මේවා අප්පච්චිගේ ජන්මයෙන් ලද ගතිගුණය.

"අපි අද හෙටම ගියාම ඉවරයිනේ.. මොකටද කාගෙවත් අනුකම්පාවක්.."

"අපි කොහාටද යන්නෙ..?"

ගැටලුව ඇත්තේ ඉන්පසුවය. යන්නට තැනක් නැත.

"අපිට යන්න තියෙන්නෙ පුංචි ආච්චිලාගේ දිහාට විතරයි.. කවද හරි පුංචි ආච්චි මැරෙනකම්ම අපට එතන ඉන්න පුළුවන්..



The Reader's Place http://e-pusthakalaya.blogspot.com/

ඊට පස්සෙ ඉතිං අහීත් මාමාත් ඔය ඉඩකඩම් ගෙවල් දොරවල් විකුණලා දාවි.."

සංකුසීගේ මුහුණ ඇඹුල් වෙන හැටි අනුත්තරා ද දුටුවාය.

"ඊට පස්සෙ..?"

"අනාගතේ මෙහෙම වෙයි කියලා කාටද කියන්න පුළුවන් ලොකු පුතේ.. නංගිට උගන්නා ගන්න ඕන.. ඔයාගෙ වෙඩින් එක ගන්න ඕන.."

"ඔන්න ඔය මනස්ගාත හිතල තමයි අම්මා ලෙඩවෙන්නෙ.."

සංකුසී කේන්තියෙන් යුතුව කීවාය. වෙඩින් ගන්නත්.. යන්න එකෙක් ඉන්න එපායැ.. ආදරේ කරන්නත් හොඳ පවුලක් තියෙන මිනිහෙක් හම්බවෙන්න ඕන.. සල්ලි තිබුණත් ලස්සන තිබුණත් කුහකයෙකුට සංකුසී කැමති නැත.

සංකුසී ඇඳගෙනම චිත්‍ර අඳින කාමරයට ආවාය. මේ කාමරයේ සිට චිත්‍ර කීයක් නම් අඳින්නට ඇද්ද..? දැන් මේ අඳින්නට පටන් ගන්නේ.. අවසාන චිත්‍රයයි.

තමාගේ හිතේ නිදන් වූ පිරිමි රුවක් තිබුණි. ඒ රුව මෙහෙම යැයි පැහැදිලිවම චිත්‍රයක් නොතිබුණත් අඳ දුටුව ඒ රුව.. කොහේ හෝ මතකයක තිබිණි. එය හිතේ ඇඳුණේ එනිසාය.

දෙවරම් විහාරයේ බෝමලුවේ පහනක් දල්වමින් උන් ඒ රුව සිතුවමට නැගුණේ එය පසුවේ ඇඳගත් විලසින්මය. ඔහුගේ රුව මෙතුවක් කල් කොහේ හෝ පසුවේ ගැඹුරුතම තැනක





සැඟවී තිබෙන්නට ඇතැයි සංකුසීට සිතුණි. වරක් දුටු පමණින් කෙනෙකුගේ රුවක් සිතුවමට ගැනීම පහසු නැත.

වරෙක වෙලාව බලද්දී.. රෑ එකය. අනුත්තරා.. අවදි වී තේ කෝප්පයක් වත්කර දියණියට දුන්නාය.

"දැන් ඇති.. හෙට ඔපිස් යන්නෙ නැද්ද.. ලොකු පුතේ නිදාගන්නකො.."

"අම්මා ගිහින් නිදාගන්නකො.. තව ටිකයි.."

අනුත්තරා නැවතත් ගොස් ඔිනලි ළඟින් ඇලවුණාය. පොඩි එකීට නම් පාඩම් කෙරිල්ලක් නැත. තවමත් සිත සෙල්ලමටය. ලොක්කි මෙතරම් රෑ වෙනතුරු චිත්‍ර අඳින්නේ නැත. තාත්තෙක් නැති නිසා මොන තරම් පාලුවෙන් පිරී ඇද්ද..? අනේ තාම කෙල්ලට හරියන කොල්ලෙක්වත් හම්බවෙලා නෑ.. ඒ ගැන කතා කරපුහාමත් කේන්ති යනවා.. එහෙම හොඳ කොල්ලෙක්වත් හම්බවෙනවා නම් එකත් හිතට සැනසීමකි. ඒත් ආදරේ නිසා තමන් වින්ද වගේ වේදනාවක් නම් මේ ලෝකෙ කාටවත් විඳින්න සිද්ධවෙන්න එපා..

* * * * * * *

හැන්දෑවේ ඒ දුප්පත් ගෙදරින් බිව් තේ කෝප්පයේ රස.. තවමත් කටේ රැඳී පවතී. ඒ රස මැකීයාදෝ සිතින් සංකේත් රෑ කෑම පවා ප්‍රතික්ෂේප කළේය. ඒ ගෙදරින් ඒ තරම් රස තේ එකක් බොන්නට යළිත් ආසා සිතෙයි. තේ එක සැදුවේ නම් ඉංග්‍රීසි ටීචර් නොවේ. වෙන කවුරුන් හෝ විය යුතුය. තමා සිතූ



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

තරම් ඔවුන් අසරණ නැත. ඔවුන් වෙන ගෙයක් සොයාගෙන ඇති බව කීවා මතකය. එසේ ගියහොත්..

"පංකජ්.. නැගිටපං මචං.. මේ බලපං.."

පංකජ සිහින් බැණ බැණ නැගිට්ටේය. කිව්වොත් කිව්වාමය.

"අපට මේ ගේ ඉතුරුවෙන්න මේ බිල්ඩින් එක හදන්න බැරිද..?"

"ඒ මොකද.. දේවාලයක් හදන්නද එතන..?"

"පව් බං ඒ ගෙදර කට්ටිය.."

"එහෙමනං.. ඒ කට්ටිය එක්ක ගිහින් උඹේ මාතලේ මහගෙදර ලියලා දීපං.."

පංකජ් සමග කතා කිරීමෙන් වැඩක් නැත. 'මහබඹා මුව හදනකොට මුගේ පපුව ඇතුළට අනුකම්පාව දාලා නෑ.. තව කෙනෙක් වෙනුවෙන් පපුව උණුවෙන්නෙ නෑ..'

ඒ ගැහැනියගේ මුහුණ ප්‍රියමනාප වූ නමුත් ඇස් දෙකේ සැඟවුණු විශාල දුක් කන්දරාවක් ඇතැයි ඔහුට සිතුණි. ඇස් දෙකේ දුකක් නැති ගැහැනියක මේ ලෝකයේ නැතැයි ඔහුට වරෙක සිතුණි. ගැහැනු බලාපොරොත්තු මලුය. එක බලාපොරොත්තුවක් බිඳුණ හොත් ඔවුන්ගේ සියලුම බලාපොරොත්තු බිඳුණා වෙයි.

සැලසුම වේගයෙන් ඉදිරිය යුතු සැලසුමකි. ව්‍යාපාරයක් යනු.. ප්‍රවේශමෙන් අත ගැසිය යුතු සිතා මතා තීරණ ගත යුතු දෙයකි. ව්‍යාපාරයක් ආවාට ගියාට කරන්නට නොහැකිය. ඉතාම සැලසුම් සහගතව යන ගමනේ මග දිගට ඇතිවන බාධක නොසලකා හැරිය යුතු වෙයි.





"අනේ ප්ලීස් සංකේත්.. මට මේ වැඩ ටික ගානට කරගෙන යන්න ඉඩදීලා.. උඹ මාතලේ පලයං.. දැන් අර ගිනි කිකිළිත් බලාගෙන ඇති උඹ එනකං.."

මිතුරා කියන්නේ බනී ගැනය. බනී හෙවත් භුවනී ගැනය.

"ඇත්තට මෙච්චාම කර කර ඉඳලා හරියන්නෙ නෑ.. එහෙම එහෙකටත් ට්‍රයි කරපං.. මනුස්ස පරාණයක්නෙ බං උඹත්.."

සංකේත් තමා මනුස්ස පරාණයක් වග විශ්වාස කළ නමුත් ආදරය සම්බන්ධයෙන් ඔහුට අත්දැකීම් නැත. ඔහු ආදරය කරන්නට යුවතියක් සෙව්වේ නැත. ඔහු පසුපස ඔහුගේ ආදරය පතමින් ආ යුවතියන් දෙස ඔහු බැලුවේවත් නැත.

"අඩුගානෙ පොඩි ආතල් එකක් ගනිං.."

මිතුරන් උපදෙස් දුන්හ. එහෙත් ඔහුට එවැනි පොඩි ආතල් ගැනීමට යුවතියක පාවිච්චි කිරීමට සිතුවේ නැත. එවැනි නොහොබිනාකම්.. යුවතියකට කළ යුතු නොවේ.

සංකේත් නැවත මාතලේ ගියේ සියලුම වගකීම් මිතුරාට පැවරීමෙනි. ඉඩම ගැනීමටත් බැංකු ණය නිකුත් කළ බැංකුවෙන්ම ඔහුගේ ව්‍යාපෘතිය සඳහා ද ණය නිකුත් කිරීමට සූදානම්ව සිටියේය. බැංකු වැඩ හා නීතිමය වැඩ කීපයක් සඳහා ඔහු මාතලේට පිටව් ගියේය.

* * * * * * *

රැය එළිවෙන විට සංතුෂි චිත්‍රය නිමවා තිබුණි. නැගණිය විසින් එයට කුමක් හෝ කියනු ඇතැයි සිතා සංතුෂි එම චිත්‍රයට ආවරණයක් යොදා ප්‍රවේශමෙන් තැබුවාය.

"ලොකු පුතේ.. නිදාගත්තෙ නෑ නේද ඊයෙ රෑ.."

"නෑ අම්මා... එක දිගටම වැඩ කරා.. මහන්සියක් දැනුණේ නෑ.."

"ඒ වුණාට ඔය ඇස් දෙක පියවෙනවා ළමයෝ.. ඔෆිස් යන්නෙ කොහොමද..?"

අම්මා ගෙනත් දුන් කිරි එක බිව් කළ.. සංතුෂිට තවත් නිදිමත දැනුණි.

"අද ලීව් එකක් දානවා.."

ඇයගේ හිතටත් විවේකයක් අවශ්‍යව තිබුණි. එක දිගට වැඩ කරනවිට සිත විඩාවට පත්වෙයි. විඩාපත් වූ සිතට විවේකය තරම් බෙහෙතක් නැත. නිවාඩුවකින් පසුව අලුත්ම මිනිසුන් නිර්මාණය වනු ඇත.

"එහෙනම් ටිකක් නිදාගන්න.."

අනුත්තරා කිව්වේ ගැඹුරු කටහඬකිනි. අවුරුදු ගණනාවක් ජීවත්වූ මේ කුඩා නිවහන දමා යන්නට සිදුවනු ඇත. දුවගේ ප්‍රථම චිත්‍ර ප්‍රදර්ශනය ද ඇත්තේ ලබන මාසයේය. අඩුම ගණනේ එය නිමවනතුරුවත් මේ නිවසේ රැඳී සිටින්නට තිබුණා නම්..

ඩිනාලී පාසල් ගිය පසු අනුත්තරා කරේ.. ගෙදර සියලුම





පරණ බඩු, රෙදි, පත්තර ආදිය ඉවත් කිරීමයි. අද හෙටම අවශ්‍ය බඩු ටික පමණක් අරගෙන යා යුතුවෙයි. අවුරුදු ගණනාවක් ජීවත් වුවද මහා බඩු පොදියක් එකතුවී නැත. කරේ දරුවන් ලොකු මහත් කිරීමත්, හම්බ කරන හැම සතයක්ම දූනගේ අධ්‍යාපනයට වියදම් කිරීමත් පමණි. පරණ ලට්ට ලොට්ට එකතු කර ගිනි තැබූ අනුත්තරා.. ගින්න දෙස බලා සිටියාය.

කවුදෝ මහත්වරු කිහිප දෙනෙක් වත්තට ඇතුළු වී යමක් කතාබහ කරනු ඇය දුටුවාය. ඒ එක මහත්තයෙක් තමා වෙත පැමිණෙන අයුරු දුටු අනුත්තරාට සිහින් තැති ගැන්මක් ඇතිවිය.

"එක්ස්කියුස් මී ආන්ටි.. අපි මේ වත්තෙ වැඩ පටන් ගන්නයි යන්නෙ.. පාඩම් කරන ළමයි එහෙම ඉන්නව නම් සද්ද බද්ද ටිකකින් කරදරවෙයි.."

පංකජ කියා සිටියේය. පංකජ්ගේ මෙතන නැති එක ලොකු දෙයකි. ඔහු සිටියා නම් කුඹි ගුලක් කැඩී ගියත් 'පව්' යයි කියනු ඇත.

"මොනවා කරනන්ද පුතා.. පුතාලගෙ වැඩ කරගෙන යන්න.. අපි කොහොමත් යන්න ආපු මිනිස්සුනේ.."

ඇය කී වචනයේ ලොකු අරුතක් ඇතැයි පංකජට සිතුණි.

"මේ.. ආන්ටි මෙතන ක්ලාස් එකක් කරනවා කියලා තිබුණා.."

"මම ක්ලාස් එක නතර කළා.."



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

දැන් පංකජට අවශ්‍ය මේ ගේ පොඩ්ඩ අස්පස් කර දෙන්නේ කවදාද යන්නය. එය ඇයට තේරුණා විය යුතුය.

"මම අද හෙටම යනවා.. පුතාලා වැඩ කරගෙන යන්න.."

එසේ කියූ ඇය අත තිබ් ඉදලෙන් ගිහිගොඩ ඇවිස්සුවාය.

සියල්ල පුච්චා දමා මේ ලෝකයෙන් චුත වී ධම්ම ඉන්නා ඉසව්වක් සොයාගෙන යන්නට ඇත්නම් යයි ඇයට සිතුණි. පංකජ ආපසු ආවේ කුමක්දෝ පරාජයක් සිත් තැවුලක් තුරුළු කරගෙනය. 'ඒ ගෑනි ටිකක් ආඩම්බරකාරි.. සමහර මිනිස්සු ඉන්නවා... ඇඳගන්ඩ වස්තරේ නැති වුණත් අහංකාරකම ඉහට උඩින්.. කාටවත් යටත්වෙන්න බාල්දුවෙන්න කැමති නෑ.. ඇය තමාට කතා කළේ පුතා කියාය. ඒ ආමන්ත්‍රණයේ ඇත්තේ ආදරයයි.. අම්මාවත් තමාට 'පුතා' කියූ කාලයක් පංකජ්ගේ මතකයේ නැත.'

අදම ගේ පුද්ද පවිත්‍ර කර අනුත්තරා කුස්සියට ආවාය. අදම පිටවී යා යුතු යයි ඇයට සිතුණි. ඇය හාල් ටිකක් සෝදා රයිස් කුකරයට තැබුවේ මේ නිවසේදී කන අවසාන වේල මෙය යයි සිතමිනි. ඩිනලිට අද පන්ති නැත. එනිසා උදේ මුංඇට තම්බා ඇය අරගෙන ගියාය. ගෙදර එන්නේ බත් පිගාන බලාගෙනය. සංතුෂී තවම නිදිය. නමුත් ඇයට ඇහැරවා දැන්මම තමාගේ තීරණය කිව යුතුය. ඊට පෙර.. බත් කන්නට මොනවා හෝ දෙකක් සැදිය යුතුය. ශීතකරණයේ තිබුණ තක්කාලි ගෙඩි කිහිපයෙන් හොද්දක් හැදූ ඇය අල ගෙඩියක් තෙල් දැම්මාය. මේ ගෙදර කිසිවෙක් කෑම රස නැතැයි රණ්ඩු සරුවල් කරන්නේ නැත.





"බඩගිනියි අම්මා.."

සංතුෂී ඇඳෙන් නැගිට පැමිණීම අනුත්තරාට සහනයක් විය. ඇය වහා.. ඉදෙන බත් ටිකක් පිගානට දමා එයට තක්කාලි ව්‍යංජනය දැමුවාය.

"අල ටිකකුත් දාන්නද..?"

"හා.."

"බිත්තරයක් හදල දෙන්නද..?"

"එපා.."

හැමදෙයම ඉතා සරලය. හැම දෙයම සරල වූ තරමට ජීවත්වීම පහසුය.

"ලොකු පුතේ.. අර මිනිස්සු වැඩ පටන් අරන්.."

බුල්ඩෝසරයක ශබ්දය ඇසෙද්දි සංතුෂී හැරී බැලුවාය.

"අපි දැන් බලෙන් ඉන්නවා වගේ නේද අම්මා..?"

"ඒකම තමයි මාත් මේ හිතුවෙ.."

"අනේ අපට යන්ඩ අපේ කියල තැනක් නැනේ.."

සංතුෂීට නිකම්ම කියවුණි. මේ ලෝකය තුළ තමා කෙතරම් අසරණදැයි ඇය සිතුවාය.

"පුතේ.. අපි පුංචි ආච්චිලගේ දිහා යමු.. පස්සෙ වෙන තැනක් හොයා ගන්නකං.."



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

සංතුෂී නිහඬවම එයට එකඟ වූවාය. ගෙන යන්නට ඇයත් එක්රැස් කළ දෙයක් නැත. තිබුණේ ඇගේ පොත්පත් ටිකත් චිත්‍ර ටිකත් පමණි.

ඇය කෙත්මිට කතා කර කෑම පැයේදී කෙත්මිව ගෙන්වා ගත්තාය. කෙත්මි.. ඇගේ කාර්යාලයේම පරිගණක නිලධාරිනිය වූවාය.

"ආන්ටි මේ හදිසියේ මෙහෙම ඩිසිෂන් එකක් ගත්තෙ.. කිව්ව නම් රෙන්ට් එකට ගෙයක් බලනවනේ.."

කෙත්මි ගෙට ගොඩවෙමින්ම කීවාය.

"කරන්න දෙයක් නෑ දුව.. හදිසියෙ වුණත් හරි තීරණේ ගන්න ඕනැනේ.."

"ඩිනලි ඉස්කෝලෙ යන්නෙ..?"

කාටත් තිබුණ ගැටළුව එය විය. එයටත් කොහේ හෝ විසඳුමක් ඇතැයි අනුත්තරා සිතුවාය. සංතුසිට තිබුණ ප්‍රධාන ගැටලුව වූයේ චිත්‍ර ටික ප්‍රවේශම් කර ගැනීමයි. කෙත්මිගේ නිවස තිබුණේ නුගේගොඩ නිසා ඇය චිත්‍ර ටික ප්‍රවේශමට ඇගේ ගෙදර තබා ගන්නට පොරොන්දු වූවාය.

"අදම යනවද ඉතිං සංතු..?"

"අම්මගෙ ඩිසිෂන් එහෙම තමයි.. හිතුවොත් හිතුවා.. ඔය ඉස්සර අපේ අප්පච්චිගෙ අම්මලා මාව හදාගන්න ඉල්ලලා.."

"ඉතිං..?"





"අම්මා මාව දීලා නෑ කෙත්මි.. අපට නැන්දෙක් ඉන්නවා.. අප්පච්චිගෙ අක්කා.. එයා මාව හදාගන්නම් කීවලු.. දේපලත් ලියලා දෙන්නම් කීවලු.."

"අහ්.. ඒවා තිබුණා නම්.. මේ වත්තම ගන්න තිබුණානේ.."

"මං හිතන්නෙ ඊටත් එහා.. අප්පච්චි හුඟාක් පොහොසත් කෙනෙක්.."

"මට හරි පුදුමයි ආන්ටි ගැන.."

"අම්මා අප්පච්චිට ආදරේ කරා මිසක් අප්පච්චිගේ දේපලවලටවත් සල්ලිවලටවත් ආදරේ කරලා නෑ.."

"උඹත් ඒ වගේ තමයි.."

කෙත්මි කියා සිටියේ සංතුසීගේ ගතිගුණ දන්නා නිසාය.

"ඒ කියන්නෙ යන එක ෂුවර්.."

"මං බොස්ට කියලා ඔෆිස් වෙහිකල් එක ගෙන්නා ගන්නං.. ඒක අරන් යං චිත්‍ර ටික.."

ගෙදර බඩු පටවන්න ලොරියක් සොයාගත යුතුවෙයි. එය නම් අපහසු නොවනු ඇත. මහරගමත් කොට්ටාවෙත් ඕන තරම් ලොරි තිබේ. බඩු පැටවීමටත් ත්‍රීවීලර් පාක් එකේ කොල්ලන් දෙදෙනෙකු අඬගසා ගත හැක. කරන්නට බැරි මෙතනින් වෙන්ව යාමයි. කාලයක් ජීවත්වූ තැන අතහැර යාමේදී දුක දැනෙයි.

එහෙත්.. මේ කිසිවක් බදාගෙන ජීවත්විය නොහැක. දිනයක සියල්ල අතහැර යා යුතුම වෙයි. කාමරයට ආ සංතුසී ටියේ



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

රාත්‍රියේ නිම කළ චිත්‍රය දිග ඇර බැලුවාය. ඔහුගේ රුව ජීවමාන යැයි ඇයට සිතුණි.

"සංකූ.. මේ අර කොල්ලා නේද..?"

කෙත්මි කාමරයට ආවාය. ඊයේ දෙව්රම් විහාරයේදී යෙහෙළිය නොකු දල්වාගෙන බලාගෙන උන්නේ මේ තරුණයාගේ රුව දෙසය. පහන දල්වද්දී මුහුණේ ඇති ශාන්තිය.. මනාව පිළිඹිබු වෙයි.

"ඊයෙ රෑම ඇන්දද..? මාරයි සංකු උඹ නම්.."

"රෑ එළිවෙනකම්ම.. තව ෆිනිෂ් කරේ නෑ.. පොඩි පොඩි වැඩ ටිකක් තියෙනවා.."

"ඒ කොල්ලා මේක දැක්කොත් එහෙම.."

"රූපෙ එයාගෙ වුණාට චිත්‍රෙ මගෙනේ.."

"ඔන්නම් පන්දාහක් දීලා ගන්න කියනවද..?"

කෙත්මි ඇසූ ප්‍රශ්නයට පිළිතුරක් දිය හැකිදැයි සංකුසී කල්පනා කළාය. සමහර චිත්‍ර මාස ගණනක් අඳින්නට සිදුවෙයි. සමහර චිත්‍ර අවුරුද්දකින්වත් නිමා කරගත නොහැක. එම තරුණයාම අවුත් ඉල්ලුවත් මේ චිත්‍රය පන්දාහකට.. පහළොස් දාහකට.. පනස්දාහකට.. නැත.. එය ලක්ෂ පනහකටවත් දිය නොහැකිය. එය තමා හදවතින් අඳින ලද චිත්‍රයකැයි ඇයට සිතුණි. මේ මුහුණ කොහේ හෝ මතකයක ඇත. අම්මා ළඟ තාත්තාගේ තරුණ කාලයේ ඡායාරූපයක් තිබේ. ඒ තාත්තාගේ.. මුහුණත් මේ වැනි යැයි.. සංකුසීට නිකමට මෙන් සිතුණි.



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/



සමහරවිට මේ රුව.. ඒ තරම් හුරුපුරුදු විදිහට දැනුණේ එනිසා වන්නට පුළුවන.

"ඒක නම් ඒ තරම් හරියන දෙයක් නෙමේ වගේ.. ඒ කොල්ලා හරියට ගෞතම සිද්ධාර්ථ එකේ ඉන්න සිද්ධාර්ථ වගේ.. ජීවස් හරි ලස්සනයි.."

"ඔය ඉතින් බලලා තියෙන්නෙ මම නෙමේ.. උඹනේ.."

සංකුසී මිතුරියට පහරක් ගසා සිනාසෙන්නට යත් දැරුවේ සිනාසෙන්නට උවමනා නිසා නොවේ. තමාගේ සිතැඟි සඟවා ගැනීමටය.

"ඒ වුණාට.. සීනිබෝල පාටකුත් තියෙනවා.."


තරුණයාගේ පාට.. දීප්තිමත් තඹ පාටය. හරියටම ඉන්දියන් නළුවෙකු මෙනි. ඔහු බෝධි පූජාවට උන් හැටි හරිම පුදුම සහගතය. එතරම් තේජවන්ත පෞරුෂයක් හිමි ඔහුට හිතේ සැනසීම නැතුවාවත්ද..? බෝධි පූජා තබන්නට එන බොහෝ දෙනෙකු හිතේ සැනසීම බිඳගත් අය වෙති. බලාපොරොත්තු ඉටු නොවුණු හෝ බලාපොරොත්තු සිඳගත් අය වෙති. එතරම් උත්තුංග දේහයක් ඇති කඩවසම් කොල්ලෙකුගේ සිත බිඳෙන්නට හේතු වූ කාරණාව කුමක්ද..?

"තාමත් ඒ ගැන කල්පනාව.. මේ සංකූ.. අන්න වැන් එක ආවා.. පිස්සු නැතිව චිත්‍ර ටික දාපං වැන් එකට.."

කෙත්මි කෑගැසුවාය. සංකුසී වහා කල්පනා සිතුවිල්ලෙන් මිදී එළියට දිව්වාය.

* * * * * * *

# 03



සංකේත්ගේ හිතට නිදහසක් නොවීය. කුමක් හෝ බරපතල කාර්යයක් කරන්නට යනවිට හිත දෙපැත්තට වැනෙන ගතියක් තිබේ. ඔහු බිත්තියේ වූ පාළු චිත්‍රය දෙස බැලුවේය. විඩාපත් හිතට සුවය දෙන බෙහෙතක් එහි අඩංගුව ඇති වග සංකේත් දනී.

"සංකේත් අයියා.. මොනාද ඔයා අනේ.. ගෙදර කොල්ලෙක් ඉන්නවද නැද්ද නෑ.."

තමාගේ සිල්ගත් හිත ඇය බිඳ දැම්මා වැනිය. මේ වැටර් බොක්ස් එක, මළ වදේ.. මේ නිවසින් පිටව යන්නේ කවදාදැයි ඔහු සිතුවේය. පන්නිපිටියේ නවාතැන් ගත් කාමරයේම උන්නා නම් හොඳය. එහෙත් පංකජට නිදහසේ වැඩ කරන්නට මිනෑ නිසා තමා නැවතත් මාකලේට එව්වේ ඔහු විසින්මය.

"මං ටිකක් නිදාගන්නයි හැදුවෙ භුවනි..."





"අයියෝ මේ මහ දවාලේ කම්මැලි පූසෙක් වාගෙ නිදියන්නද හදන්නෙ..? ඒවා කොහෙද මාත් එක්ක.. මිහ්.. එන්න.. නැගිටලා එන්න.."

භුවනි ඔහුගේ අතින් අදින්නට වූවාය. තේ එකක් රැගෙන කාමරයට ආ මුදිතාට හිනා ගියේය. භුවනි හැසිරෙන්නේ පොඩි ළමයෙකු විලසින් යයි මුදිතාට සිතුණි. 'ඒකත් හොඳයි.. අපේ එකා ආත් බාත් කරන්න පණ්ඩිත කොල්ලෙකුට බෑ..'

"අයියෝ බලන්න ආන්ටි.. මෙයා නිදි.. මහ දවාලෙත්.."

"ඒ ඉතින් හැටි.. පුතා මේ තේක බීලා ඉන්න.."

සංකේත් ඈනුමක් ඇර තේක අතට ගත්තාය.

"කවුද හැදුවෙ..?"

"මමමයි හැදුවෙ.. බණ්ඩි මැණිකාට බෑ කිව්වා.. ඇයි අඩුපාඩු තියෙනවද..?"

එදා අර ගෙදරින් බිව් තේ එක තරම් රසවත් තේ කෝප්පයක් කොහෙන්වත් ලැබෙන්නේ නැතැයි ඔහුට සිතුණි. සියල්ලටම ප්‍රථම ඉංග්‍රීසි ටීචර්ගේ කෙල්ල ගෙනැවිත් බණ්ඩි මැණිකාට තේ හදන හැටි ඉගැන්විය යුතුය. එසේත් නැත්නම් කෙල්ල ගෙනැවිත් මෙහි නවත්වාගත යුතුය. සංකේත් උදේ අවදිවන විට රසපිරි තේ කෝප්පයක් අවශ්‍යය.

"ඔයාට මහාමාලියක් බලද්දි පළවෙනි කොලිපිකේෂන් එකට ටී ටෙස්ට් එකක් කරන්න වෙනවා.. උයන්න බැරි වුණත් කමක් නෑ.. මෙයා කැමති විදිහට තේ හදන්න පුළුවන් නම් ඇති.."



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

මුදිතා සිනාසෙමින් සංකේත්ගේ හිස අතගෑවාය. මේ තරුණ වයසට කෙල්ලෙකුගේ අවශ්‍යතාවය ආදරය නොදැනෙනවා නම් පුදුමය. එහෙත් සංකේත් ගැන එහෙම පලහිලව්වක්වත් අසන්නට නැත. ඒකත් හරි භයානක වැඩේ.. හිහන්නියකට හරි හිත ගියොත් එහෙනම් ගේන්න වෙනවා.. එහෙම නැත්තං දිගටම මෙහෙමම ඉඳීවි.. මේ භුවනි ඇවිල්ලත් දැන් කොච්චර දවස්ද..? නිකංවත් ඒ කෙල්ල දිහා බලන්නෙවත් නැතෙ.

"එහෙනම් අම්මා.. ඉස්සරවෙලා බලන්න ටී ටෙස්ට් එක කරලා.. මනමාලි බලන්න මං ලෑස්ති වෙන්නං.."

සංකේත් එසේ කියද්දි භුවනිට බය සිතුණි. අම්මා තමාව මෙහේට ගෙනත් ඇරලුවේ යම් හිතේ බලාපොරොත්තුවක් ඇතිව වග භුවනි දනියි. පල්ලි කන්දක්. කොහොම හරි අල්ලා ගන්නොත් පරම්පරාවම ගොඩ. තාත්තාට කා ෂේල් එක.. සංකේත්ට වෙනම බිස්නස්.. ඒ හැමදේම කරන්න මෙයාට ඉතිං ගානට කොලිටියට තේ එක බීලා ඉන්න එපායැ. කුකරි ක්ලාස් ගියා.. තේක් ක්ලාස් ගියා.. ඒ වැඩ හිතට.. ඒ වගේ ඉතිං තේ හදන්න ඉගැන්නුවෙ නෑ.

"හරි.. හරි.. දැන් ඉතිං මේ භුවනිගෙ පාලුව යන්නත් එක්ක ඔන්න ඔය කොහේ හරි ගිහිල්ලා එන්න පුතා.."

"අනේ මං නිදාගන්න හැදුවෙ අම්මා.."

භුවනිගේ මුහුණ අඳුන්නට ඔන්න මෙන්නය. මේ කොල්ලාට කෙල්ල ගැන කිසිවගක් නැත. භුවනි ටිකක් හුරතලේට හැදිලා.. කොළඹ හින්ද වෙස්ටන් ටයිප් එකට අඳින්නෙ.. කතාව, කන්නෙ බොන්නෙ ඔක්කොම.. ඒවා ඉතිං හදාගන්න පුළුවන්. එහෙම





නැතුව ඉතිං කොහෙ හරි යන හිහන්නියකට කර ගැහුවොත් එහෙම.. මේ ජේරම ඉවරනෙ.. ඉන්නෙ එකයි.. ඒකයි මේ ඇහැ වගේ පරෙස්සම් කරන්නෙ..

"අනේ ආන්ටි.. මං ආපහු කොළඹ යනවා.. මට මෙහේ පාලුයිනේ.."

භුවනි මුදිතාගේ ඇහේ එල්ලුණාය. ඒ බොරු හුරතලය සංකේත්ට පෙන්නන්නට බැරිය. කෙල්ලක් වුණාම පොඩි වගකීමක් තියෙන්නෙ ඕන.. ටිකක් රෙස්පෙක්ටබල් වෙන්න ඕන.. කවද හරි කසාද බඳින මිනිහටත් වඩාගෙන හුරතල් කර කර ඉන්න වෙයි.

"අයියගෙ හැටි දුව.. එයාට මේ ගෙදර කවුරුවත් හිටියත් එකයි නැතත් එකයි.. ඔයා අඬන්නෙ නැතිව ඉන්න.. යන්න නම් එපා මටත් පාලුයි.."

අම්මා කියනු සංකේත්ට ඇසේ. අම්මාටත් දැන් අවශ්‍ය මේ ගෙදර කළඑළි කරන ලේලියකි. අඩුම ගනනේ නංගියෙක්වත් උන්නා නම් තමාට මේ කන්කරච්චලයෙන් බේරී සිටීමට හැකිව තිබුණි. එයටත් පිනක් නැත. ඒ ජේරටම හරියන්නට ගේ දෙවනත් කරන්නට අම්මා දැන් භුවනිව ගෙන්වාගෙන තිබේ. සංකේත් බලාගෙන ඉන්නේ මේ කරච්චලේ ආපහු යන දිනයක් ගැනය.

සංකේත් ඇඳේ දිගා වුණේ චිත්‍රය දෙස බලාගෙනමය. ඕනෑම හිතේ දුකක් කලබල ගතියක් නිවාලන්නට එම සාමකාමී චිත්‍රයට හැකියාවක් ඇතැයි ඔහුට සිතුණි. සංතුසී.. එවිටම එම චිත්‍ර ශිල්පිනිය මොන තරම් නිවුණු හිතක් ඇති කෙනෙකු විය යුතුය. සංතුසී යනු සංතෝෂය යන අරුත විය යුතුය. එම යුවතිය



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

පැත්තට දැක්කා මිස එදා මුහුණ දැක්කේ නැත. ඊට පසුත්.. එතැනින් කිහිප වරක් ගිය නමුත් ඒ චිත්‍ර විකුණන යුවතිය උන්නේ නැත. ඇය හමුවීමේ, ඇය හා කතාබහ කිරීමේ ආසාවක්ද ඔහු සතු නොවුණා නොවේ. ජීවිතයේ හැම දෙයකටම ආදරණීය කෙනෙක් ළඟ සිටිය යුතුවෙයි. ආදරණීය හැඟීම් ගැන කතාබහ කළ යුතුවෙයි. ජීවත්වීමට දැන් ආදරණීය හදවතක ආදරය අත්‍යාවශ්‍ය වග සංකේත්ට දැනෙයි.

"මුට මෙච්චර කේන්ති යන්නෙ තාම කෙල්ලෙක් නැති හින්දා.. විසේ බස්සාගන්න වෙන ක්‍රමයක් නෑනේ.."

මිතුරන් ඔහුට විහිළු කළහ. හැම මිතුරෙකුටම පෙම්වතියක් උන්හ. එහෙත් සංකේත්ට නම් කෙල්ලන් දිරවූයේ නැත. නිකමට, ජොලියට මිතුරන්ගේ භාෂාවෙන් කියනවා නම් ආතල් එකකට කෙල්ලෙක් ආශ්‍රය කිරීමට ඔහු හිතුවේත් නැත.

'මගෙ හිත මට වද දෙනවා.. ඒ මිනිස්සු පව්.. හස්බන්ඩ් කෙනෙකුත් නැතිව, පුංචි කෙල්ලො දෙන්නෙකුත් එක්ක.. ගුණසිංහ අංකල් කිව්ව විදිහට දෙවෙනි ළමයා හම්බවෙන්න ඉද්දිදිම ඉංග්‍රීසි ටීචර්ගෙ මහත්තයා මැරුණෙ.. ගුණයහපත් නෝනා කෙනෙක්ලු..' සංකේත්ගේ හදවත උණු වුණේය. 'හෙට උදයේම කොළඹ ගොස්.. සියල්ල වෙනස් කළ යුතු යයි ඔහුට සිතුණි. කුලී ගේ කඩන්නේ නැතිව ඒකෙම ඉන්න දෙනවා ඒ මිනිස්සුන්ට.. බිල්ඩින් එක හදපුහාම ඉංග්ලිෂ් ක්ලාසස් කරන්න ඒ ටීචර්ටම බාරදෙන්න පුළුවන්.. ඔය එන්නෙ හොඳ අයිඩියාස්.. අර රස තේ එකත් නිතරම ලැබෙයිනේ එතකොට...'

* * * * * * *





"මං හිතාගෙන හිටියෙ පොඩි රෙපෙයාර් එකක් කරන්න කියලා.. කෝ මේ බාස්ලා අල්ලගන්න ලේසි නෑ.."

පුංචි ආච්චී.. ඩිනලිගේ හිස අතගාමින් පැවසුවාය. ඩිනලිට මහන්සියටම නින්ද ගොස් තිබිණි. ගේ ටිකක් අලුත්වැඩියා කරා නම් හොඳ නමුත් සියල්ල සිද්ධ වුණේ හදිසියේය.

"මම හෙට ගේ ටිකක් සුද්ධ පවිත්‍ර කරලා දාන්නම් පුංචි අම්මෙ.."

අනුත්තරා කිව්වේ හිතේ ඇතිවූ තෝන්තුවාවෙන්ය. කැවායින් නොකැවායින් සංකුසීත් ඇඳට වැටී සිටියාය. මේ ප්‍රදේශය ඉතාම සුන්දරය. රබර් මෙන්ම තේ ද වැවේ. නිවස පිහිටියේ ද රබර් වත්තක් මැද්දට වෙන්නය. අනුත්තරාගේ හිත මොකාක්දෝ පාළු ශෝකයකින් බරව තිබිණි. පන්තිය නැවැත්වීමට සිදුවීමත් ඇයට දරන්නට නොහැකි පාළුවක් මෙන්ම පාඩුවක්ද විය. හැරයාම දරන්නට නොහැකිය. නමුත්.. ජීවිතයේ ඇත්තේ හිමිවීම හා අහිමිවීම පමණක්ය යන සත්‍ය අනුත්තරා නම් අවබෝධ කරගෙන උන්නාය. නමුත් ඒ සත්‍යය මේ හිරිමල් වියේ සිටි කෙල්ලන් දෙදෙනාටම අවබෝධ කර දෙන්නේ කෙසේද..? ජීවිතය පිළිබඳ කලින් සාදා ගත් න්‍යායය පත්‍රයක් නැත. එය දැන උන්නා නම්.. අවාසනාවන්ත සිදුවීම දිගින් දිගටම සිදුවන්නේ නැත. අද රාත්‍රිය නම් පුදුම රාත්‍රියකි. වෙහෙස මහන්සිය දැනුණද නින්ද අහලකවත් නැත. සංකුසී ද ඇඳේ එහාට මෙහාට පෙරළෙයි. කෙල්ලන්ගේ හිතේ.. ආගන්තුක හැඟීමක් පෙරළි කරනවා විය හැකිය.

"අපේ අම්මාගෙනුයි අප්පච්චිගෙනුයි නම් අපට සමාවක් නෑ අනූ.."

ධම්මගේ කටහඬ ඇයට ඇසෙයි. ඔවුන් අනුත්තරාට කැමති නැත. කෙදිනකවත් ලේලියක වශයෙන් ඇය පිළිගන්නට දෙදෙනාගේ කැමැත්තක් නොවූහ. එහෙත් ධම්මට අනුත්තරාට වූ පොරොන්දුව කඩ කිරීමට නොහැකි විය. ධම්ම අනුත්තරාව විවාහ කර ගත්තේය. ඒ අමරණීය මොහොත අනුත්තරා සිහින් මෙනෙහි කළාය. කසාදයට ඇගේ පැත්තෙන් අත්සන් කළේ පොලොන්නරුවේ පාසලේ විදුහල්පතිනියයි. ධම්මගේ පැත්තෙන් ඔහුගේ මිතුරෙකි. ගෙවල්වල කිසිවෙක් ඔවුනු විවාහ වූ බව නොදත්හ. ඒ කාලය කෙතරම් සුන්දරදැයි අනුත්තරා මෙනෙහි කළාය. සංතුසී බඩට ආවේ එම දිනවලය.

"බබා ලැබුණම අපේ ගෙදර යමු.."

ධම්ම යෝජනා කළේය. දරුවාගේ වාසනාවට හෝ ධම්මගේ දෙමාපියන් තමාට කැමති වනු ඇතැයි අනුත්තරා සිතුවාය. එහෙත් එවැනි වාසනාවක් උදාවූයේ නැත. ධම්මත්.. අනුත්තරාත් වෙන් කරවීමට දෙමහල්ලන් ක්‍රියා කළහ. ඔවුහු ධම්මට වෙන වෙන උසස් තැන්වලින් කටයුතු සෙවූහ. මේ සියල්ලක් මැද අනුත්තරා කල් ගෙව්වේ වේදනාවෙනි. කුමන ආකාරයකින් හෝ ධම්ම තමාට නැතිවෙන බව ඇයට දැනුණි.

"අම්මා.."

සංතුසීගේ හඬින් අනුත්තරාට දැනුණේ තමා පාන්දර වනතුරුම නිදිවර්ජිතව උන් බවය.





"ඔෆිස් යන්නෝන.. තේ හදනවද..?"

"කීයද වෙලාව ලොකු පුතේ..?"

"හතර හමාරයි.."

අනුත්තරා සයනයෙන් නැගී සිටියාය.

"නංගි..ත් ඉස්කෝලෙ යනවද..?"

"අද සෙනසුරාදානේ පුතේ.."

අනුත්තරා.. ඇයට මතක් කර සිටියාය. සංතුසිත් සිටින්නේ සිත් තැවුලෙන් වග අනුත්තරා තේරුම් ගත්තාය.

"හයට බස් එකේ නැග්ගොත් ඇති අම්මා.."

"මං මොනවා හරි උයන්නං.."

"එපා.. අද හාෆ්ඩේනෙ.. ඔය මොනවා හරි කන්න බැරියැ.."

"සල්ලි තියෙනවද අනේ.."

"දාහක් විතර තියෙනවා.. අතිද්දා සැලරි එක හම්බ වෙනවනේ.."

අනුත්තරාට දියණිය ගැන දැනුණේ විශාල අනුකම්පාවකි. මේ වයසට ගැහැනු ළමයෙකු මොන තරමේ සැහැල්ලුවකින් විඳවිය යුතුද..? ඇගේ තුරුණු වයසට ඇත්තේ මහ ගැනියකගේ වගකීමය.

පුංචි අම්මාගේ කළු දුම්රොටු කුස්සියට වැදුණු ඇය කේතලය



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

ලිප නැඹුවාය. මේ සියල්ලම සුද්ද පවිත්‍ර කර දැමිය යුතුය. පිහන් කෝප්ප පවා කාලයකින් මැද නැතිවා සේය. ගෙනාපු බඩු මුට්ටුත් අස්පස් කරගෙන පිළිවෙලක් වීමට නව සතියක්වත් යනු ඇත. නිවසේ තීන්ත ටිකක් නම් ගෑ යුතුය. පුංචි අම්මාට මේවාගේ වගක් නැත්තේ ඇගේ මහළු වයසට.. ලස්සනට පිළිවෙලට ජීවත්වීමේ උවමනාවක් නැති නිසාය.

"මං අද එද්දි ටිකක් පරක්කු වෙයි අම්මා.."

සංකුසී කීවේ යන්නට පිටත්වෙද්දිය. අනුත්තරාද ටෝච් එකත් රැගෙන ඇයට බස් රියට ඇරලීමට පැමිණියාය. හයට වුවද රබර් වත්ත මැද්ද කරුවලය.

"අම්මා ඉන්ඩ.. මං තනියම යන්නං.."

සංකුසී සිතට දිරිය ගෙන උන්නාය. රබර් වත්ත මැදින් මීටර් දෙසීයක පමණ දුරක් ඉදිරියට ඇවිදගෙන යා යුතුවෙයි. බස් නවත්වන තැනට තවත් මීටර් දෙසියක් පමණ යායුතු වෙයි. අම්මාට ඉතින් හැමදාම මේ කෙරුවාව කරන්නට බැරි වග සංකුසී දනියි.

"නෑ.. නෑ.. මේ පැත්ත ඔයාට හුරු නෑ ලොකු පුතේ.. යං.. යං.."

"මේ පාන්දර පින්නෙ ගිහින් අම්මාත් ලෙඩ වෙයි.."

"ලෙඩ මොනවද ඉතින්..?"

අනුත්තරා සංකුසීගේ අවවාද තැකුවේ නැත. රූමත් තරුණියකට තියා නාකි ආච්චි කෙනෙකුටවත් අද පාරේ බැස



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/



යන්නට නොහැකි බව අනුත්තරා දනී. කවදා හෝ හොඳ කොල්ලෙකුට විවාහ කර දෙනතුරු කෙල්ල ආරක්ෂා කර ගත යුතුය.

"ඔන්න බස් එකක් එනවා පුතේ.."

"අම්මා පරිස්සමට යන්න.."

එසේ කියමින් සංකුසී බසයට ගොඩවූවාය. අනුත්තරා සැනසුම් සුසුමක් හෙලා ආපසු හැරුණාය.

* * * * * * *

සංකේත් පන්නිපිටියට ආවේ හඹාගෙනත මෙන්ය. කාරය වීමෙන් වෙනදා මෙන් ඔහුට මහන්සියක් නොවීය. එහෙත් හොඳ වෙලාවට එනවිට කුඩා ගෙය කඩා තිබුණේ නැත. එය කඩන්නට පිරිස සූදානමින් උන්හ.

"කෝ මේ ගෙදර හිටිය මිනිස්සු.."

සංකේත් කෑගසා ඇසුවේය. සංකේත්ගේ හඬට පංකජ් ද තරමක් ගැස්සුණි. මිතුරා මෙතරම් කෝප වූ දවසක් පංකජ්ට මතක නැත.

"ඒ මිනිස්සු බඩුත් පටවාගෙන ගිහින් මචං.."

"උඹලා යන්ඩ කීවද..?"

"ඒ මොකද මචං මේ.. ඇයි උඹ ඒ මිනිස්සුන්ට ඉන්ඩ කීවද..?"

තමා ඔවුන්ට එසේ කතාවක් නොකී බව සිහිවී සංකේත් සන්සුන් විය.

"උඹත් එක්ක නම් වැඩ කරන්ඩ බෑ සංකේත්.. මොකටද උඹ දැන් ආවෙ..?"

"ගේ ප්ලෑට් කරන්න එපා.. ඒ මිනිස්සු කොහාටද ගියේ..?"

"හොඳ ගෙයක් හම්බවෙලා යන්න ඇති මචං.. අපි දන්නෑ.. අපි උදේ එනකොට මෙතන හිස් කරලා දොරේ යතුර තියලා ගිහින් තිබුණා.."

සංකේත් ගේ ඇතුළට පිය මැන්නේ ඔවුන් ගියේ කොහාටදැයි හෝඩුවාවක්වත් සොයාගනු රිසියෙනි. නමුත් පරණ වලං මුට්ටි කිහිපයක් ඇරෙන්න ඒ ගෙදර මිනිසුන් උන් බවට කිසිදු සාක්ෂියක් ඉතිරි නොකරම ඔවුහු යන්නට ගොස් තිබුණි.

"මොකක්ද මචං උඹට හදිස්සියෙ ඇතිවෙච්ච භූමිකාම්පාව.."

"ඒත් මිනිස්සුනෙ බං.. තනිවෙච්ච ගෑනු කෙනෙක් කෙල්ලො දෙන්නෙකුත් එක්ක.."

"මේක අවුරුදු තිහක් යුද්ධයක් තිබ්බ් රටක් මචං.. චුට්ටක් අනුරාධපුරෙන් එහාට ගිහින් බලපං මිනිස්සු මැරිච්ච ගෑනු කොච්චර ඉන්නවද කියලා.. ළමයි හතර පස් දෙනා එක්ක.. මං කියන්ඩද.. මේ බිල්ඩිම හදන එක නවත්තලා.. මේක පර්චස් හය ගානේ කඩලා.. ඒ පවුල්වලට බෙදලා දීපං.."

පංකජ් කීවේ කේන්තියෙනි. ඔහුගේ කතාව ඇත්තය. ඉංග්‍රීසි ටීචර් ඒ තරමටම අසරණ වූ කාන්තාවක් යැයි කිව නොහැක.





"ඒ මිනිස්සු ගෙයක් අරගෙන යන්ඩ ඇති.."

"ඒ මිනිස්සු මෙතන අවුරුදු දහයකට වැඩිය ඉඳලා තියෙනවා.. එහෙම වුණාම ඒ මිනිස්සුන්ට අයිතියක් තියෙනවා මේ ඉඩමට අයිතිවාසිකම් කියන්න.. එහෙම නීතියක් තියෙනවා.."

"නඩු කියාගෙන ආවෙ නෑනේ.."

"නඩු කියාගෙන ආවා නම් අපට අකුලාගෙන යන්න වෙනවා.. ඒ ටීචර්ට ඒ ගැන තේරුමක් නැතිව ඇති.. කොහොම වුණත්.. ගේ ප්ලෑට් කරන්න එපා.. ප්ලෑන් වෙනස් කරල හදපල්ලා.."

"පිස්සෙක් මචං උඹ නම්.. අපරාදෙ.. පර්චස් තුනක විතර [illegible].. මෙතනනේ ඔෆිස් රූම් එක හදන්න හිටියෙ.. දැන් හැමදේම වෙනස් කරන්න ඕන.."

පංකජ් බැණ වැදුණේය. දැන් සංකේත්ගේ අරමුණ.. ඇය දිගාවී සේවිකාවය. ඇය අසරණ අම්මා කෙනෙකි. ඇය දකින්නට පෙර තමාත් ඇයත් අතර කුමන ගණුදෙනුවක්වත් තිබී නොමැති නමුත්.. කොහේදී හෝ එම මුහුණ දැක ඇතැයි ඔහුට මතකයක් තිබුණි. ඇය තමාගේ කෙනෙක් වග කතා කළ පළමු මොහොතේදීම ඔහුට දැනිනි. දැන් ඔහුට දැනෙන්නේ තමාගේ අම්මා තම ඉඩමෙන් පැන්නුවා වැනි හැඟීමකි.

"ගුණසිංහ දන්නවා ඇති ඒ මිනිස්සු කොහාටද ගියේ කියලා.."

"ඇයි ඉන්න තැනකින් ගෙන්නගෙන ආයෙත් මෙතන බින්න බස්සවා ගන්නද..?"



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

පංකජ නම් දිගටම පසුවූයේ කෝන්තියෙනි. එනිසා.. සංකේත් නිහඬ වූවේය. පාන්දරම ආ නිසා හොඳටම මහන්සියක් හා නිදිමතක් ඔහුට දැනිණි. හෝටලයට ගොස් මොනවා හෝ කා ටිකක් නිදා ගත යුතු යයි ඔහුට සිතුණි.

* * * * * * *

"අද කෑම ගෙනාවෙ නැද්ද..?"

කෙත්මි ඇසුවාය. යෙහෙළිය අද කාර්යාලයට එමත් පුදුම සහගතය. ඊයේ ඇයත් පුදුම තරමේ මහන්සියක් වූවාය.

"කඩෙන් මොනවා හරි ගෙන්නා ගමු.. හාල්මැස්සෝ.."

"හාල්වෙ කියලා බඩත් හාල් පුරවලා හරියන්නෙ නෑ.. මං ඔවර් කරන්නං.."

කාර්යාලයට කෑම ගෙන්වූයේ ළඟ නිවසකිනි. ඔවුනු ඇයව හැඳින්වූයේ ක්‍රිශාන්ති අක්කා යනුවෙනි. ඇය කොහොමටත් දහවලට බත් පැකට් පනහක් පමණ තනිවම සූදානම් කරයි.

"පව් නේද ඒ අක්කා.."

කාර්යාලයේ සැවොම කතා වෙති. ඇගේත් සැමියා නැත. නැත්නම් දරු දෙදෙනෙකුත් සමග අනාථ වී ඇත. සංතුසිට නම් මේවා දකිද්දී ඇතිවන්නේ අප්‍රමාණ කලකිරීමකි. අප්පච්චිගේ මතකය ඇයට යාන්තමින් තිබේ. කඳු සහිත පෙදෙසක අප්පච්චි මතකය ඇයට යාන්තමින් තිබේ. කඳු සහිත පෙදෙසක අප්පච්චි, තමාව වඩා හුමදන් කරන අවස්ථාව ඇයට හොඳින් මතකය. තමාව වඩා ගන්නට හැදූ සුදු නැන්දා.. ඇගේ මතකයේ යාන්තම් ඇත. සුදු නැන්දාගේ ඇඟේ එල්ලී සිටි අයියා කෙනෙක්ද ඇයට මතකය.





"මේ කෙල්ල මට දෙන්න අනුත්තරා.."

ඇය තමාව ඉල්ලූ හැටිත් අම්මා තමාව තරයේ තුරුළු කරගත් හැටිත් සංතුසී සිහිපත් කළාය. ඒ සුදු නැන්දාගේ සුදු අයියාවත් ඉන්පසු හමුවුණේ නැතත්.. තමාගේ පියාගේ දෙමව්පියන් තමාව හදා ගන්නට ඉල්ලා සිටි හැටි ඇයට මතකය. අම්මා පන්නිපිටිය පැත්තේ පදිංචියට ආවේ ඉන් පසුවය. පන්නිපිටිය කුඩා නිවසේ පදිංචියට යන විට.. අම්මාගේ දැනට වුවි නංගියෙක් සිරවී සිටියාය. ඒ දවස්වල අම්මාගේ සහායට හිටියේ අවිස්සාවේල්ලේ පුංචි ආච්චිය. ඒ දිනවල.. මේ තරමට ප්‍රදේශය කලඑළි වී තිබුණේ නැත. හැම තැනම තිබුණේ කැලෑවය. ඒ පුංචි නිවසේ නංගියා ටිකක් ලොකු වෙනතුරු පුංචි ආච්චි රැඳී සිටියාය.

ඒ නිවසට තමා කොතරම් ඇලුම් කළාදැයි සංතුසිට දැනගන්නේ දැන්ය. අවිස්සාවේල්ලේ සිට එනවිට එන්නේ ඒ ගෙවල පසු කරගෙනය. එහෙත් සංතුසිට ඒ පැත්ත බලන්නට සිතෙන්නේ නැත.

"ආ.. ආ.. කෑම උණු උණුවෙ තියෙනවා.."

කාර්යාලයේ රියදුරෙකු වූ මහින්ද අංකල් කෑම පාර්සල් බෙදාගෙන යන ගමන් කීවේය. මහින්ද අංකලුත් අවුදින් ඊයේ බඩු පටවන්නට උදව් කළේය.

"අද සංතුසී මිස්ට කෑමත් නෑ නේද..?"

"අමමට උයන්ඩ බෑ.. මහන්සියිනේ අංකල්.."



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

"ඒ පැත්ත හරි ෂෝක් පැත්ත මිස්.. අන්න ඒ වගේ පැත්තකින් සෙට්ල් වෙන්ඩ.."

මහින්ද එසේ කියාගෙන කාර්යාලයේ අනිත් අයටත් බත් බෙදමින් යන්නට ගියේය. බත් එක උණුය. ඒ සුවඳට බඩගිනි දැනේ. සංතුසී කෙත්මිත් සමග විවේක කාමරයට ගොස් බත් එක දිග ඇර ගත්තාය.

"ඇයි..?"

"අම්මා උයන්ඩ නම් ඇති පුංචි ආවච්ච් එක්ක කයියක් ගහගෙන.."

"උඹ කාපං සංතු.. ආන්ටිලා කාලා ඇති.."

ඒ අහක් අම්මා අද කන්නේ ඉතා අඩුවෙන් වග සංතුසී දනී. එහෙත් අම්මා අද කන්නේ ඉතා අඩුවෙන් වග සංතුසී දනී.



ඩිනලිට වයිනීස් බත් එකක් ගෙනිහින් දුන් කාලයක් මතක නැත. උදේ තිබුණු රුපියල් දාහෙත් දැන් තිබෙන්නේ අටසිය ගණනකි.

"චිත්‍ර ප්‍රදර්ශනේට ඉතුරු වැඩ ටික කරන්න ඕන නේද..?"

කෙත්මි සංතුසීගේ හිත ඇය කැමතිම පැත්තට හරවන්නට උත්සාහ කළාය. සංතුසී ඉන්නේ බඩගින්නේ වග කෙත්මි දනියි. කතා කරන ගමන්ම ඈය නොදැනුවත්වම බත් මුලම කනු ඇත. බත්මුලේ ඇති අඹ මාලුවෙහි සුවඳ දැනේ. ගැහැනියක් මේ සුවඳ නිර්මාණය කරන්නට කෙතරම් දුක් කඳුළු වගුරනවාදැයි සංතුසී නිකමට හිතුවාය. ඒ දුප්පත් ගැහැණුය. මේ රටේ ප්‍රභූවරුන්ගේ, දේශපාලඥයින්ගේ.. ව්‍යාපාරිකයන්ගේ බිරින්දෑවරුන් මොන තරම් සැප විඳිනවාද..? ඇත්තෙන්ම දුක සැප දෙක අතරේ ඇත්තේ





[කෙ]තරම් වෙනසක්ද..? ඒ වෙනස සිතුවමකට නගන්නට හැකි නම්...

"කෙත්මි.."

"මහ්.."

"හවස මං උඹලගේ දිහා එනවා.. අර චිත්‍රෙ ෆිනිෂ් කරන්න ඕන.."

"ඉතිං යං උඹ ගිහින් වොෂ් එකක් දාගෙන.. මගෙ ගවුමකුත් ඇඳගෙන උඹ චිත්‍රෙ ඇඳපං.. මං ටිකක් නිදාගන්න හිතුවෙ.."

මිතුරියටත් මහන්සි ඇතැයි සංතුසීට සිතුණි. කෙසේ හෝ [ඇගේ] ජීවිතය ජයගත යුතුය. තමා කරනුයේ කුමන කාර්යයක් [වු]වද ඒ කාර්යය හොඳින් කළ යුතු වගට ඉස්සර අම්මා උපදෙස් [දෙ]යි. අම්මා දන්නේ ඉගැන්වීමටය. රස්සාව අහිමි වුවද අම්මාගේ [illegible] සෙනඟ ඇදී ආවේ එහෙයිනි. එහෙත් ඒය ව්‍යාපාරයක් [ක]රගන්නට අම්මා සිතුවේ නැත. නිවෙස්වලට පැමිණ [උ]ගන්වන්නට කෙතරම් ආරාධනා ලැබුණද අනුත්තරා ඒවාට [ගි]යේ නැත. ඇය අය කළේ ද සාධාරණ මුදලකි. අම්මා මෙතුවක් [කා]ලයකට තමාත් නංගීත් ජීවත් කළේ එම මුදලිනි. දැන් ඉතින් අම්මාට ඒ ආදායමත් අහිමිය.

"මට හිතයි දෙව්රම් විහාරේ පන්සලට යන්න ආයෙත්.."

සංතුසීට කියැවුණේ කෙත්මිගේ නිවසෙහිදීය. මේ පින්තූරයෙහි [මො]නවා හෝ අඩුවක් ඇතැයි සංතුසීට සිතිණි. ඔහු ඉඳහිට [හෝ] පන්සලට එන්නට බැරි නැත. යළිත් වරක් ඒ රුව දැක [ග]න්නට සංතුසී ආසා කළාය.



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

"පන්සලට යන්න හිතුවෙ වඳින්නද..? බෝධි පූජා තියන්නද..? නැත්තං මේ කොල්ලා අදත් පන්සලේ ඉඳියි කියලා හිතලද..?"

කෙත්මි දිගටම ප්‍රශ්න කළාය.

ජීවිතයේ බොහෝමයක් දේ ගැන අත්දැකීම් තමාට නැතත් අම්මා තමුන් ජීවත් කරවීමට කරන නිහඬ අරගලය ලෙහෙසි නැත. ඒ බව සිහියට නැගෙද්දී සංවේදී කඳුලක් සිතේ නලියයි. කෙත්මිගේ නිවසින් ඇය පිටවූයේ හවස පහට පමණය. පන්සලට යා යුතුම යයි සිත බල කළ නිසා.. ඇය මහරගමට අවුදින් පන්සල ළඟින් යන බස් රියකට ගොඩවූවාය. මේ ප්‍රදේශය තමාට හුරු ප්‍රදේශයයි. ලාබෙට ඇඳුම් ගන්නා පමුණුව පොළ, ලාබෙට එළවළු ගන්නා දෙල් කඳ පොළ.. මාසෙට බඩු ගෙනෙන සිල්ලර කඩ.. මේ සියල්ල වසර ගණනාවක් තිස්සේ හුරු වූ දේවල්ය. අම්මාට වුවද ජීවිතයේ පාළුව නොදැනෙන්නට ඇත්තේ හවසට පිරෙනා ළමුන් නිසාය. උගන්වන්නට ගෙයි සාලය ඉඩමදි තරම්ය. දැන් අර රබර් වත්ත මධ්‍යයේ පාළු ගරා වැටුණු නිවසේ පාළු ජීවිතයට හුරු විය යුතුය.

සංතුෂී පන්සල ළඟ හන්දියෙන් බැස ගුරු පාර දිගේ ඇවිදගෙන ආවාය. සුමංගල හාමුදුරුවන්ගේ මිහිරි බණක් කාලයකින් අහන්නට නොහැකි විය. දැන් ඉතිං හැන්දෑවට හැන්දෑවට මේ පන්සලට එන්නට වෙන්නේ නැත.

'මොනවා කරන්නද.. ජීවිතේ වෙනස් කරගන්න කොච්චර උත්සාහ කරත් සමහර වෙලාවට.. තියෙන තැනමයි කැරකෙන්නෙ..'

ඇය කෙඳිරුවේ ඇයත් සමග ගමන් කළ මල් සුවඳ මුසු මඳ සුළඟටය.





සංකේත් පන්සල ළඟ සිය රිය නවතාගෙන බලාගෙන උන්නේය. ඔහු ආවේ පන්සලට යන්නටය. එහෙත් හිත මොකාක්දෝ බැරි බැරියාවකින් පිරී ගොසිනි. තමා අතින් තම අම්මාව එළියට ඇද දැම්මාක් වැනිහැඟීමක් නිතර නිතර ඔහුට දැනෙන්නට විය. ඔහු පන්සලට ආවේ බෝමලුවට වී හිත හදාගන්නටය.

"ම.. මේ කවුද..?"

ඈතින් එන සුදු යුවතිය ඔහුගේ නෙත ගැටුණි. ඇය පැහැයෙන් සුදු නෙළුම් මලේ පැහැයට සමානය. එතරම් ලස්සන සැහැපත් යුවතියක තමා කෙදිනකවත් දැක නැ නේදැයි ඔහුට සිතුණි.

"ලෝටස්.."

ඔහුට නිකමට කියවුණි. ඇයගේ නම ලෝටස් විය හැකිද..? කෙසේ වෙතත් ඇය සුදු නෙළුමක් බඳුය. ඇය ආවේ පන්සලේ සිටය. ක්ෂණයකින් ඇගේ රුව පන්සලෙන් පිටවූ සුදු ඇඳගත් උපාසකම්මලා ගොඩේ බොඳවී ගිය හැටි ඔහුට මතකය. එක්කෝ.. පාරේ ආ ත්‍රීවිලරයකට ඇය ගොඩ වුණාය. නැත්තං අන්තර්ධාන වූවාය.

"ලෝටස්.."

ඔහු නැවතත් මිමිණුවේය. 'නෙලුම් මලක් වාගේ සුදු නංගියෙක්.. කොහේ හරි දැකලා තියෙනවා වාගෙ පුරුද්දකුත් තියෙනවා..'

* * * * * * *



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

භුවනි සිටියේ දුකෙනි. සංකේත් තමාව ගණනකටවත් ගන්නේ නැත. කෙසේ හෝ සංකේත්ව වසඟයට ගතහොත් මේ සියල්ල තමාගේය. මුදිතා ඇන්ටිගේ අකමැත්තක් නැත. අංකල් කැමති ද අකමැති ද කියා පෙනෙන්නේ නැත. සංකේත් තමාව ගණන් නොගන්නේ සංකේත්ට කෙල්ලෙක් ඇති නිසා යයි සිතන්නටද නොහැකිය. කෙල්ලක සිටිනවා නම් එය අනිවාර්යයෙන්ම මුදිතා ඇන්ටි විසින් දැනගත යුතු ද වෙයි.

"භුවනී.. කම්මැලිද ළමයෝ..?"

මුදිතා ආවේ එසේ අසාගෙනය. කෙල්ල මෙහෙ ඉන්නේ කම්මැලිකමටය. සංකේත්ගේ හිත ගන්නට මේ කෙල්ල දන්නේ නැත. සංකේත්ට එපා නම් ඉතිං මොනවා කරන්නද...?

"මමා කෝල් කරාද ළමයො..?"

"ඔව්.. මමා කිව්වා එයා එනකං කම්මැලි නම් මට ගෙදර ගිහින් ඉන්න කියලා.."

"ගෙදර කවුරුත් නැති හින්දනෙ හෙලන් මෙහෙ නැවැත්තුවෙ.."

"සර්වන්ට් ඉන්නවා.."

"සර්වන්ට්ස්ලත් එක්ක ඉන්න ආරක්ෂාවක් තියෙනවද භුවනි..?"

මුදිතාට කෙල්ල ගැන දුකය. නුරතලයට හැදී තිබුණත් ගැහැනු ළමයෙකු මීට වඩා සංවරශීලී විය යුතු යයි ඇයට හැඟෙයි. අඳින්නේ කොට කලිසම් සහ ස්කිනි වැනි ඇඳුම්ය. සංකේත් මෙවැනි දේට කැමති නැත.





"මට පාලුයි ආන්ටි.. මේ කඳුවලින් වටවුණු ගමට ඇවිත්.. අනේ පාලුවේ ඉන්නවා.. කොළඹ ඉන්නව නම් කොච්චර දේවල් කරන්න තියෙනවද..?"

"මේ කොළඹ නෙමෙයි.. මානලේ.. ඉතිං.. වවුලගෙ මඟුල් ගෙදර ගියාම එල්ලිලා ඉන්න එපායැ.. ඒ වගේ තමයි.."

මුදිතා සිනාසෙමින් කීවාය. 'මේ ෆැමිලි එක මහ ගොඩේ ෆැමිලි එකක්.. හිතන්නෙත් ඒ විදිහටමයි..' භුවනිට එසේ සිතුණා මිස ඇය කීවේ නැත. අයියා පිටරට ඉගෙන ගත්තත් ගිහින් එයාගේ ඇඳේ වාඩි වුණත් එයාට හීන් දාඩිය දානවා.. පිස්සෙක්.. කසාද බැඳලා හනිමූන් ගිය දවසක.. සිහිය නැතිව වැටෙයි.

"අනේ මන්දා ආන්ටි.. අයියට කියන්නකො ඔය කලම්බෝ යන ගමනක මාවත් ගිහින් බස්සගෙන යන්න කියලා.."

"එච්චරම යන්න දඟලන්නෙ මෙහෙ හිතට අල්ලන්නෙ නැති හින්දද..? හෙලන් නම් කිව්වෙ චේන්ජ් එකකටත් එක්ක ඉන්න කියලා දුව.. මම අපේ කොල්ලට ටිකක් අවවාද කරන්නම්.."

මුදිතා කීවාය. භුවනි ආපසු ගියහොත් ඇගේ බලාපොරොත්තු ද සුන්වේ. පුතුගේ මේ වයසට කෙල්ලක සිටිය යුතුමය. නැතිනම් නරක ආශ්‍රයට යොමුවන්නට පුළුවන. භුවනි හදාගත හැකි තරුණියකි. කොළඹ තාලයට විච්චූර්ණ කළ ද ගමට ආ විට කාලයත් සමඟම ගමේකමත් හුරුවනු ඇත. පුතාත් ව්‍යාපාර කටයුතු කරගෙන යන්නේ කොළඹ නිසා.. භුවනිට කොළඹ සිටින්නටත්, ගමේ සිටින්නටත් පුළුවන. ප්‍රධානම ගැටළුව වී ඇත්තේ සංකේත් භුවනි ගැනවත් ප්‍රියතාවයක් නොමැති නිසාය.



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

සංකේත්ගේ ප්‍රියතාවයක් නැත්නම් භුවනි මෙසේ තියාගෙන ඇයට කරන්නේ අසාධාරණයකි.

"ඕක මුදිතා.. නිකම්ම සිද්ධ වෙනවා.."

සැමියා කීවේ එසේය. එසේ කියා පුතුට මනාලියක සෙවීමේ කාර්යයෙන් ඔහු නිකම්ම නිදහස් වෙයි. තව දරුවන් දෙතුන් දෙනෙක්වත් සිටියා නම් හොඳ යයි මුදිතාට නිකම්ම සිතෙයි. තමාට කියා මේ ලෝකයේ ඉන්නේ සැමියාත් පුතාත් පමණි. සහෝදරයාත් ජීවතුන් අතර නැත. ලස්සන ගුණ යහපත් දුවෙක් මේ නිවස අතපත ගානවා දකින්නට මුදිතා කැමතිය. හිතේ ඉන්නා ඒ ආදරණීය දුවගේ රුව භුවනීට නම් කෙසේවත් සමාන නැත. එහෙත් දැන්.. ඒ හිතේ ඉන්නා රුව සොයා සොයා ඉන්නටත් වෙලාවක් නැත. මේ වයසේ තරුණයෙකු බලා කියා ගැනීමට අම්මලාට නොහැකිය. ඉස්කෝලේ හෝඩියේ පන්තියට බාරදෙන විට අම්මාගේ තුරුලෙන් බිමට පනින දරුවා එදා පටන්ම තුරතලයට අකැපය. දැන් ඉතිං මේ ඉලන්දාරියාව ආන්බාන් කළ හැක්කේ ඔහුගේ හිත ගත් යුවතියකට පමණි.

* * * * * * *

සංකේත්ගේ දැඩි නියෝගය මත සැලසුම් වෙනස් කරන්නට සිදුවීම ගැන පංකජ සිටියේ කෝන්තියෙනි. ඒත් ඉතින් කරන්නට දෙයක් නැත. ලොක්කා කිව්වොත් කිව්වාමය. එය වෙනස් කිරීමට ජිනීවා නුවර බලධාරීන්ටවත් නොහැකිය.

"මචං.."





සංකේත් වැඩබිමට ආවේ පංකජ සොයාගෙනය. දැන් ඔහු එනවාටවත් පංකජ කැමති නැත.

"ඇයි මොකද.. උඹට තව මේකෙ අහලක් හරි වෙනස් කරන්න ඕන වුණොත්.. දාලා ගහලා යනවා යන්න.. වෙන කෙනෙක් ගනිං පඩියට.."

ඔහු කඩාපනින්නට පෙර හේතු නොවිමසාම පංකජ කඩා පැන්නේය.

"එහෙමත් හිතෙනවා වෙලාවකට.. එතකොට උඹ පඩියට වැඩ කරන හින්දා මං කියන එක එහෙයි සර් කියලා කරනවා.. නෝ එහෙමද..?"

පංකජ්ට හිනා ගියේය. ඔහු මිතුරාගේ පිටට තට්ටුවක් දැම්මේය.

"මොකක්ද කේස් එක..?"

"නෑ මචං.. මේක මේ... මේකට අදාළ දෙයක් නෙමේ.."

"එහෙනම් ක්ලුවර් එකට අර සරුංගලේ ගැන අයිඩියා එකක්වත් හිතට ආවද..?"

"භුවනි.. ඒකි මට හරියන්නෑ මචං.. මට අයිඩියල් නෑ.."

"එහෙනං..?"

"මං පන්සල ළඟදි කෙල්ලෙක් දැක්කා.."

පංකජ හිස කැසුවේය. පන්සල ළඟදි හිත ගිය කෙල්ලක

දුටුවා නම් අඩු ගණනේ තම කාඩ්පතවත් ඇයට දිය යුතුය. මේ ගොනා ඒ කිසිවක් නොකර.. ඔහේ කෙල්ල යන දිහා බලා ඉඳින්නට ඇත. දැන් ඇවිත් ඇත්තේ එක්කෝ පන්සල මුර කරන්නට යමු යයි කියන්නට හෝ.. ලංකාවම පීරා හෝ කෙල්ල කෙසේ හෝ සොයා ගනිමුයි කියන්නට වන්නට ඇත.

"මහ්.. ඉතින්..?"

"මචං.. ලස්සන සුදු හා පැටියෙක් වගේ කෙල්ලෙක්.."

"උඹ ෆලෝ කරාද..?"

"නෑ මචං.. ටික වෙලාවක් බලාගෙන ඉන්නකොට අර උපාසකම්මලා ගොඩේ එහා මෙහා වුණා.. ඊකිත් සුදු ඇඳලා හිටියෙ.. ත්‍රීවීල් එකක් දෙකක් එහාට මෙහාට ගියා.. ඒ බලලා මේ බලනකොට කෙල්ල නෑ.."

"හොල්මනක්වත් ද දන්නෙ නෑ.."

"හොල්මනක් වුණත් මට දැන් ඊකිව හොයලා ඕනෑ.. මට ඊකිව ඉන්ටරෙස්ටින්.."

"කොහෙ යන මළ වාතයක්ද දන්නෙත් නෑ.. දැන් ඉතිං මං මේ වැඩේ දාලා ඒ වැඩේ කරන්න ඕන.."

"බිල්ඩින් ප්‍රොජෙක්ට් එකට නම් උඹ කිව්වා වගේ පඩියට මැනේජර් කෙනෙක් දාන්න පුළුවන්.."

"මං මේකම කරන්නම්.. උඹ ඔය වැඩේට පඩියට මැනේජර් කෙනෙක් දාගනිංකො.."





"නරියා.. හැන්දෑවට යමං පන්සලට.."

සංකේත් එතනින් පිටවුණේ පංකජ්ට වැරෙන් පහරක් ගසමිනි. පංකජ්ටත් පුදුම සහගතය. කිසිම කෙල්ලකට ප්‍රිය නොවූ මිතුරාගේ සිත පන්සල ළඟදී වෙනස් කළේ කවුද..? සුදු ඇඳගෙන පන්සලට ආ සුදු කෙල්ලව දැන් ඉතින් සොයන්නේ කෙසේද..?

"ෂහ්.. අර ටීචර් හිටියා නම් රසට තේ එකක් බොන්න තිබුණා.."

නිවස ළඟට යද්දි සංකේත්ට සිතුණි. මේ සුන්දර කුඩා නිවහන තුළ.. පන්සල ළඟදි දුටු සුදු යුවතියත් සමඟ.. පවුලක් වී ඉන්නට ඇත්නම්.. සිත දුර ගියා වැඩිය. ඇය දුටුවා පමණය. ඇය කාගේ කවුදැයි ඉන්නේ කොහේදැයි දන්නේ නැත. එවැනි සුන්දර ලස්සන යුවතියකට පෙම්වතෙක් නැතැයි සිතන්නේ කොහොමද..?

The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

දැන් සංකේත්ගේ හිත තෝන්තුවාවෙනි. ලෝකයේ තිබෙන සියලුම දේ තම දෙපා මුලට ලැබුණත්.. යුවතියකගේ සෙනෙහස නොමැතිව ජීවිතය කෙතරම් පාළු දැයි සංකේත්ට සිතෙන්නේ දැන්ය. මෙතුවක් කාලයකට යුවතියක නැති අඩුව ඔහුගේ ජීවිතය දැනී නැත. නමුත් ඇය දුටු මොහොතේ පටන්.. ජීවිතයේ විශාල ආගාධයක්, අඳුරු ඇතැයි ඔහුට සිතේ. ඒ අඳුර නවතින්නට නම් ඇය මිනි පහනක් වී තම ජීවිතයට වැඩම කළ යුතුය. තමාට ඇයව අවශ්‍යය. ආදරය තුමක්දැයි සංකේත්ට නොතේරේ. නමුත් මේ සියලු ව්‍යාපාර නවතා දමා ඇගේ සුදු මුදු අත අල්ලාගෙන මං මාවත් දිගේ ඔහේ ඇවිදගෙන යාමේ කෙළිලොල්

බොළඳ සිතක් සංකේත්ට පහල වී තිබුණි. පෙම්වතෙක් වන විට තරුණ හිත මොන තරම් වෙනස් වෙනවාද..?

"සංකේත්.."

පංකජගේ හඬ නැවත ඇසුණේය. ඔහු මෙතෙක් වේලා ගත කළේ කුඩා නිවස ඉදිරිපස අඹ ගහ යට ඇති ලී බංකුවේය.

"මනෝ ලෝකෙ කෙල්ලත් එක්ක ලව් කර කර හිටියට.. දැන් බඩගිනි එහෙම නැද්ද..?"

පංකජ ආවේ කෑම පාර්සල් දෙකක්ද අතැතිවය. ඇත්තෙන්ම සංකේත්ට බඩගින්නක් නැත.

"කොහෙන්ද කෑම ගේන්නෙ..?"

"පන්නිපිටියෙ හංදියේ තැනක් තියෙනවා.. කෑම පිරිසිදුයි.. බාස්ලට එතනින් කෑම ගෙන්නනවා.."

"මට බඩගිනි නෑ.."

සංකේත් එසේ කිව් විට බංකුවේ දෙපැත්තට කකුල් දෙක යවා ඉඳගෙන පංකජ කෑම පාර්සලය ලිහා ගත්තේය. ඉන් හමන්නේ හොඳ සුවඳකි. එහෙත්.. කන්නට හිතක් නැත.

"කෑම එක රසයි මචං.. කාපං.."

ඇඹරැල්ලා මාළුවක සුවඳ දැනෙයි. එහෙත් කන්නට හිතක් නැත.

"ගිනි රස්නෙයි මචං.. කන්ඩ බෑ.. උඹ කාලා.. කාට හරි





කියලා මෙන්න මේ ගෙට පුටු දෙක තුනක් ගෙනත් දාපං.. හාන්සිවෙලා ඉන්ඩ.."

"හොටෙල් එකකට පලයං.. ගිහින් මොනා හරි බීලා නිදාගනිං ටිකක්.. ගිනි කාෂ්ටක අව්ව මෙහේ.. මොකට ඇවිත් දුක් විඳිනවද මංදා.."

පංකජ කීවේ දුකෙනි. මේ ඉන්නේ සිටුවරයෙකි. ඔහුට තියෙන්නේ වැඩ සොයා බැලීම නොව.. මුදල් වියදම් කිරීම පමණි. මිතුරා මේ විඳවන්නේ ප්‍රේමයයි.

"හැන්දෑවෙ පන්සල ළඟට යන්න මං එන්නං.."

ඒ වචනය තුළ සංකේත්ට සහනයක් දැනිණි. නමුත්.. ඇය නැතිවේවිද..? ඇය එදා පමණක් ආ කෙල්ලක්ද..? ජීවිතයේ පළමුවරට ඇයව දැක්කේ එදා වුවද.. ඇ කොහේදී හෝ දැක ඇති මතකයක් තිබේ. අනේ ඒ සුදු නංගා යළිත් හමුවේවිද..?

* * * * * * *

චිත්‍ර ප්‍රදර්ශනයට දැන් සියල්ල සූදානම් නමුත් සංකුසීගේ අතේ සතේ නැත. ගන්නා මුළු වේතනයම මහ මගටත් නංගීගේ ටියුෂන්වලටත්, ත්‍රීවීලර් ගාස්තුවලටත් වියදම් වෙයි. චිත්‍ර ප්‍රදර්ශනයේ මූලික වියදම් ටික පියවා ගැනීමටවත් විදිහක් නැත. පන්නිපිටියේ උන්නා නම් සංකුසීගේ පඩිය ඉතුරු වෙයි. ඒ අම්මාට ඉංග්‍රීසි පන්තියෙන් ලැබෙන ආදායම නිසාය. දැන් ඒකත් නැත. තියෙන මොනවා හෝ කොස්, පොළොස්, කැලෑ කොළ ජාතියක් තම්බාගෙන කා ඔහේ ජීවත්වෙයි. ජීවිතයේ [illegible] බව දැන් ඇයට හොඳින් දැනේ. ජීවිතය බෙදා ගැනීමට



The Reader's Place http://e-pusthakalaya.blogspot.com/

කවුරුන් හෝ සිටියා නම්.. එහෙත් තමා වැනි දුප්පත්, ඉන්න හිටින්නට තැනක් නැති කෙල්ලක විවාහ කර ගන්නට කැමති කවුරුන්ද..?

"ලොකු පුතේ.."

අම්මා සංකුසි ළඟට ආවේ කුඩා මංජුසාවක්ද රැගෙනය.

"ඇයි අම්මා..?"

"මේ.. මේක..."

"අම්මගෙ මාලෙ නේද..?"

"ඔව්.. අපි බැන්ද දවසෙ අප්පච්චි අරන් දුන්නෙ.."

"අම්මා මේක දාලා ඉන්නවා මං කවදාවත් දැකලා නෑ.."

"අප්පච්චි නැති වුණාට පස්සෙ මං ඔක බැන්දෙ නෑ පුතේ.."

ඇත්තය.. අම්මා දාන්නේ කණට කුඩා කරාබු දෙකක් පමණි. ඇය ඇන්දේ ද සුදු හා සුදට හුරු වාම් සාරිය.

"මේ මාලෙ බැංකුවෙ තියලා එක්සිබිෂන් එකට ඕන කරන සල්ලි ටික ගම්මු.."

සංකුසිගේ පපුව පත්තු විණි. ගැහැනුන් රත්තරංවලට මොන තරම් ආදරය කරනවාද..? ඒත් අම්මා රත්තරන් පළඳින්නේ නැත.

"මේක තිබුණෙ කවද හරි ඔය දෙන්නටම දෙන්න තමයි..





දැන් ඉතිං මේක ලොකු පුතේ.. ඔයාගේ ජීවිතේ ස්පෙෂල් ඉවෙන්ට් එකක්නේ.. පස්සෙ බේරගමු.."

"මගෙ හිතට හරි මදි.."

"කාට හරි ණය වෙනවට වැඩිය මේක නමබුයිනේ.. ගන්න.."

අනුත්තරා මංජුසාව ඇගේ අතේ තැබුවාය.

"ඔය තමයි අප්පච්චිගෙ බ්ලෙසිං එක.. අප්පච්චි ආශිර්වාද කරනවා හැමදේම සාර්ථක වෙන්න.."

අම්මා එසේ කියන්නේ හිත හදා ගැනීමට වග සංකුසී දනී.

"අනේ මේ වෙලාවෙ උදව් කරන්න හොඳ කොල්ලෙක් අපට හිටිය නම්.."

අනුත්තරාට කියැවිණි. සංකුසීගේ මේ වයසට ඇයට ආදරය කරන පෙම්වතෙක් උන්නා නම් ඇයට ජීවිතය ඔහු බෙදා ගන්නට තිබිණි. අම්මයි නංගියි එක්ක කියන්න බැරි ගොඩක් දේවල් කෙල්ලගේ හිතේ තියෙන්නට බැරි නැත. නමුත් මේ කාලයේ ඉන්නේ ආදරය නොදන්නා පාපතරයින්ය. කෙල්ලව අමාරුවේ දා පැන ගන්නට බලන අවස්ථාවාදීන්ය. එහෙම දුකක් නම් වන්නට එපා. උපන්දා සිටම මේ විදි දුක් හොඳටෝම ඇතිය. ධම්ම වුණත් අනාගතේ ගැන බොහෝ දුරට කල්පනා කළේ නැත. ජීවත් වන්නට ක්වාටර්ස් තිබිණි. ඔවුන් සමඟ පොලොන්නරුවේ ගත කළ ජීවිතය මොන තරම් සුන්දරද..? 'අනේ ධම්ම ඔයා යන්න යනකොට තවත් අයිතිකාරයෙක් අපි අතරට ඇවිත් කියලා නොදැනයි යන්න ගියේ..'



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

"අම්මා අඬනවා නේද..?"

සංතුසී අනුත්තරාගේ අත අල්ලා ගත්තාය. 'එක අතකින් පන්නිපිටියේ සිටියා නම් අම්මට අඬන්න වෙලාවක් නෑ. හැම දවසෙම ක්ලාසස්.. ඊට පස්සෙ ඊට උයනවා.. කනවා.. දවස ගෙවෙනවා.. දැන් පුංචි ආච්චිත් එක්ක එකතුවෙලා කියව කියවා අඬනවා..'

"මටත් පාලුයි පුතේ වැඩක් නැතිව.. ටික දවසකින් පුරුදුවෙයි.."

අනුත්තරා කඳුල පිස නැඟී සිටියාය. උයනවා.. කනවා. අතුපතු ගානවා, මල්වලට වතුර දමනවා ආදී ගෘහස්ථ වැඩ ඇරෙන්නට ඇත්තටම වෙන කළ යුතු දෙයක් නිවසේ නැත. පුංචි ආච්චිගේ වැඩේම කෙල්ලන් දෙදෙනාටම මොනවා හෝ කටට රසට හැදීමය. උයන්නට කියා ගියත් වැඩි වැඩක් නැත. පුංචි අම්මා ඉතා සිරුවට කුස්සියේ වැඩ ටික කරයි. අනුත්තරා කයියක් ගහගෙන පුංචි අම්මාට පොල් ටික ගා මිරිකා දී.. පුළුං උදව් කරයි. එහෙත් මෙහි සිටිද්දි ධම්මව වැඩි වැඩියෙන් මතක් වෙයි. ධම්මගේ දේපල කන්දරාවෙන් එක බිංදුවක් මේ අහිංසක දරුවන්ට දෙන්නට ඒ දෙමාපියන්ගේ හදවත උණු වූයේ නැත. එහෙම එක බිම් අඟලක් දුන්නා නම් ධම්මගේ දරුවන් අද මෙහෙම දුක් විඳින්නේ නැත. ඔවුන් තමාව පහත් කොට සැලකූහ. ධම්ම තමා විවාහ කරගත් බව ආරංචි වූ විට.. ඔහු මැරුණා යයි කියමින් ඔහුගේ අප්පච්චි දානයක් දුන් බව ධම්ම පැවසුවේ වේදනාවෙනි.

"මම ඔයාට නොගැළපෙන දුප්පත් ගැනියෙක්නෙ ධම්ම..





ඔයාට වගේ වලව් පෙලපතක් මට නෑ.. මම මේවා ඔයාට මුලින්ම කිව්වා.."

අනුත්තරා නිර්දෝෂී වන්නට හැදුවා නොවේ. එහෙත් වෙන කරන්නට දෙයක් නොවීය. ධම්ම දෙමව්පියන්ට දැඩි සේ ආදරය කරයි. අනුත්තරාට ද ඒ තරමට ආදරය කළේය. ඔහුගේ අරමුණ වූයේ අනුත්තරාත් සංතුසීත් රැගෙන.. කවදා හෝ දෙමාපියන්ගෙන් සමාව ලැබ.. ඒ සෙවණේ හිඳින්නටය. අනුත්තරා සුසුමක් හෙලමින් අතීතයෙන් මිදුණාය.

"අප්පච්චි.. අපට සමාවෙන්න.. අපි හුඟාක් අසරණ වෙලා.. අම්මා දුන්නු ලස්සන තෑග්ග.. ඒත්.. මේ වෙලාවෙ අපට වෙන කරන්න විකල්පයක් ඇත්තෙම නෑ.."

සංතුසී.. අනුත්තරාගේ රන් තැල්ල පපුවට තුරුළු කර ගත්තාය. ඒ දෙන්නා කොච්චර ආදරෙන් ඉන්න ඇද්ද..? අම්මා තාමත් සුදු රෙද්ද පොරවාගෙන ඉන්නේ ඒ ආදරේ නාමෙන්.

* * * * * * *



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

# 04



බිම්මට කරුවල පාත්වනතුරුත් පංකජත් සංකේතුත් දෙන්නා පන්සල් ගේට්ටුව මුර කළහ. සුදු කෙල්ලන් කිහිප දෙනෙකුම පන්සලට ගිය නමුත්.. ඒ එක් අයෙකුවත් සංකේත් දුටු සුදු සුරඟන නොවීය.

"වාටර් වුණාට පොඩි ආතල් එහෙකුත් තියනෙවා.. වීස් වීස් වාගෙ කෙල්ලො.. කියක් නම් ගියාද..?"

"ඒ උඹටනෙ.."

"ඇපල් කියලා.. ඉතින් ඇපල් නැත්තං.. පැපොල්වත් කමු.."

"පැපොල් බැරි නම වට්ටක්කා හරි කාපං.. උඹට ඕන නම්.. විටමින් A තේ කෝකෙත් තියෙන්නෙ.."

එසේ කියමින් සංකේත් වාහනය පණ ගැන්වූවේ බලාපොරොත්තු සුන් කරගෙනය.





"කිව්වත් වගේ.. පොත්තයි රසයි හැඩෙයි වෙනස් වුණාට.. ඔක්කොගෙම විටමින් A තමයි.. මචං අන්න ඒ වගේ මොඩල් එක වෙනස් වුණාට.. කොයි කෙල්ලගෙ වුණත් ඇතුළෙ තියෙන්නෙ එකම දේ.."

මිතුරා දෙසන බණ ඇත්තක් බව සංකේත් මෙතෙක් කල්ම සිතා සිටියේ නැත. ඇය දුටු මොහොතේ පටන් සියල්ල වෙනස් වී තිබේ. කෙසේ හෝ ඇය අයිතිකර ගැනීමේ ආත්මාර්ථකාමී සිතුවිල්ල රජ කරන්නේ.. ඇය තමාගේම ආත්ම සහකාරිය වග සිතට හැඟුණ නිසාය. පිටරට ඉද්දි කෙල්ලන් ආශ්‍රයට මොන තරම් ඉඩ ලැබුණාද..? ඒ එක් අයෙකුටවත් විශේෂ කැමැත්තක් ඉපදුණේ නැත.

"සමහර විට මචං.. බෝධි පූජා තියන්න සෙම්බුර දවස්වලට එනවද දන්නෑ.."

සංකේත්.. තරමක් බලාපොරොත්තු ඇතිව කීවේය.

"එයා බදාදානේ.. එහෙනම් සෙනසුරාදාට බලමුද..?"

"කෝකටත් හෙටයි අනිද්දා දෙකත් බලමු... ඒත් මං මාතලේ යන්නත් ඕන.. මගෙ වැඩ ටිකක් තියෙනවා.. උඹට බැරිද ඇවිත් බලන්න.."

පංකජ හඬ නගා හිනැහුණේය. ප්‍රේමය හමුවේ මිතුරාගේ මොළෙත් අවුල්වී ඇති වග ඔහුට සිතුණි.

"උඹේ හිතේ තියෙන රූපේ ඒ විදිහටම ගිහින් කියපං අර.. පාරේ චිත්‍ර විකුණන කෙල්ලට.. කවුද.. අර සංතුසිද චංගුම් ද.. අර උඹේ හිත තිවෙන චිත්‍ර අඳින කෙල්ල.."



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

සැබවින්ම මිතුරා කියන්නේ ඇත්තකි. මිතුරා පන්සල ළඟ රැකගෙන ඉඳ.. කුමන කෙල්ලක් සොයා ගනීදැයි කවුරු දන්නවද..?

"ඒ කෙල්ල හොයන්නත් වෙනම ඔපරේෂන් එකක් කරන්න වෙනවා.. ඒකෙන් මේකෙන් කමක් නෑ.. උඹ හෙටයි අනිද්දයි අනේ මචං.. හවසට ඇවිත් බලපං.. කෙල්ල ලස්සනයි.. පුදුයි.. ගමන නම් හරි ක්වික්.. කස බස ගාලා ඇවිදිනවා.."

"අනේ මංදා.. උඹත් අදින කේස්.."

පංකජ් බෑ කියන්නට බැරිකමට ඒ වැඩයත් බාර ගත්තේය.

"මාතලේ යන්නම වෙනවා.. තාත්තගෙ වැඩ වගේකුත් තියෙනවා.. උඹ මේ වැඩ දෙක තුනම බලපන්.."

සංකේත් හෝටලයට එන ගමන් කීවේය. හෝටලයක නතරවී සිටීම අධික වියදම් කටයුත්තක් වුවද සංකේත්ට ඒවා ගණනක් නැත. ඔහු අත ගසන කුමන කටයුත්තකින් වුවද මුදල් ගලාගෙන එයි. අර කුඩා නිවස කඩන්නට නොදී ඉතුරු කර ගත්තේ ඒ මිනිසුන් නැවත පැමිණියහොත් දෙන්නටය. සංකේත්ගේ පපුවේ එවැනි මනුස්සකම් පිරී තිබේ. ඔහුටම හරියන සහකාරී හම්බවුණොතින් හොඳය. අහිංසක වුණත් සමහර කෙල්ලන් විශ්වාස කිරීමට බැරිය. නමුත් ආන්ටිලා හිතාගෙන ඉන්නේ භුවනීව ඔහුට ජෝඩු කිරීමට වග පංකජට නම් වැටහෙයි.

* * * * * * *

"අනේ.. අනේ.. පත්තරේ බල බලා ඉන්නවා.. මට හරි කම්මැලියි සංකේත් අයියා.."





භුවනී සංකේත්ගේ උරහිසට උඩින් එබුණාය. සංකේත් අත තිබුණේ දිනපතා පලවන ප්‍රවෘත්ති පත්‍රයකි. සංකේත්ගේ පියා කියෙව්වත් නොකියෙව්වත් දිනපතාම පත්තර මිලට ගනී.

"පොඩ්ඩක් ඉන්නවකො වද නොදී.."

"අනේ.. කතා කරන හැටි.. ආන්ටි මෙයාට කතා කරන්නවත් උගන්නලා නෑ.. වී විතරක් ගොඩයා.."

"හරි.. හරි.. ඔක ඉතින් අම්මට කියන්ඩ යන්ඩ ඕනෙ නෑ.. පොඩ්ඩක් ඉන්නවකො.. මම මේ පත්තරේ බලනකං.."

"එහෙනං මාව කොහෙ හරි එක්ක යනවද..?"

"කොහෙද..?"

"කොහේ හරි.."

"හරි.. හරි.. අම්මා දානෙට බඩු ගන්න වවුන් යන්නෝන කිව්වා.. යං.."

"එහෙම නෙමේ.. අපි දෙන්නා විතරක්.."

"ඉතිං අපි දෙන්නා ගිහින් බඩු ටික ගේමු.."

"මෝඩයා.."

"හරි.. හරි.. දැන් ගිහින් මට තේ එකක් හදන් එනවකෝ.. අයියට මාක්ස් දෙන්න පුළුවන්ද බලන්න.."

එසේ කියමින් සංකේත්ගේ දෙනෙත් යළිත් පුවත්පතට යොමු කළේය.



The Reader's Place http://e-pusthakalaya.blogspot.com/

"සංතුසීගේ ප්‍රථම චිත්‍ර දැක්ම කලාභවනේදී.."

එක් ලිපියක වූයේ එම ප්‍රකාශයක් සමගය. සංකේත් වහ වහා එය කියවූයේය.

"නව පරපුරේ චිත්‍ර ශිල්පිනියක වන.. සංතුසී සරණාගේ ප්‍රථම චිත්‍ර දැක්ම කලාභවනේදී පැවැත්වේ.."

ඒ විස්තරයත් ඇය විසින් ඇඳි චිත්‍ර දෙකක් ඇරෙන්නට එහි විස්තරයක් නොවීය. චිත්‍ර ප්‍රදර්ශනය පැවැත්වෙන්නේ සෙනසුරාදාත් ඉරිදාත් වග එහි සඳහන්ව තිබිණි. සෙනසුරාදා පන්සල මුර කරන්නට තමා එහි යායුතුම වන්නේ කෙම්මුර දිනයටවත් තමන්ගේ සුදු සුරඟන පැමිණෝවිදැයි බලන්නටය. නමුත් චිත්‍ර ප්‍රදර්ශනය බලන්නටත් යා යුතුය. හොඳ චිත්‍ර කීපයක් තම ආයතනය වෙනුවෙන් මිලට ගත යුතු යයි ඔහුට සිතුණි. මනස දැන් කැඳ හැලිය මෙනි. ඉංග්‍රීසි ටීචර්ට උත් හිටි තැන් අහිමි කිරීම පිළිබඳ හිත කලකිරී ඇත. ජීවිතයේ අවුරුදු විසි හතක් පමණ ගෙවා දමද්දි හිත ගිය යුවතිය ඇස් ඉදිරිපිට පෙනී බොඳවී ගියේය.

"සංකේත්තයියා.."

භුවනී නැවතත් පැමිණය. ඇය අත ඇත්තේ දොඩම් වීදුරුවකි.

"මං ඉල්ලුවෙ තේකක්.."

"අයියෝ.. බණ්ඩි මැණිකා කිව්වා තේ හැදුවොත් මාර්ක්ස් බිංදුවයි කියලා.."

සංකේත් සිනාසී කීම වීදුරුව අතට ගත්තේය.





"ඔන්නොනේ බොන්න අයියා.."

"බොන්නං.. හැබැයි මාක්ස් නෑ.."

"වැඩේමයි.. ඔයාගෙ මාක්ස්.. ඒක නෙමේ.. රවුමක් ගෙනියනවද..?"

"හ්ම්.."

කරදරයෙන් බේරෙන්නටම බැරි තැන ඔහු එකඟ වූවේය.

"මෙහෙ ආවත් හරි මට පේෂල් එකක් කරගන්නවත් බැරි වුණා.. කොණ්ඩෙ හදාගන්නත් බැරිවුණා.. පර්ම් කරගන්න එපා.."

"ටවුන් එකේ සැලෝන් එකක් තියෙනවා.. යං මාත් එක්ක.. මගෙ පන්තියෙ හිටපු කෙල්ලෙක් කරන්නේ.."

"අයියෝ.. මෙහේ ගොඩේ ඒවා හරියන්නෙ නෑ.."

සංකේත් ඇගේ මුහුණට එබුණේය.

"එතකොට මේ ගොඩයා.. ගොඩයා හරියන්නෙත් නෑ නේද..?"

ඔහු ඇගේ දෑසින් ඇසුවේය. ඇය හිස ගස්සා ඉවත බැලුවාය. ඇගේ ආදරය තමාට නොව තමාව බබලවන ධනයටත්, කීර්තියටත් වග සංකේත් නොදන්නවා නොවේ. අම්මා කියන්නේ භුවනිගේ සුළු සුළු වැරදි හදාගත හැකි බවය. තමාගේ හිත ගියා නම් ඇය කුමන වැරදි තිබුණත් හදාගත හැකිය.



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

"අනේ.. ඔයා කොළඹ යනකොට මාවත් දාගෙන යන්නකෝ.. මට මඩෙල් එකට යන්නත් තියෙනවා.. මගෙ ලැප් එක ගේන්න හිටියා ඒකත් බැරිවුණා.."

"නව.. නව මොනවද..?"

"එම් සී පැත්තෙ යන්න හිටියා.."

"නමුසොව බඳින මිනිහගෙ පඩියම ඉවරවෙයි ඔය ෆැෂන්වලට.."

"අයියෝ.. මං බඳින්නෙ හොඳ සල්ලිකාරයෙක්.. ඇහට පතට නොදැනී වියදම් කරන.. සුද්දා වගේ කොල්ලෙක්.."

සංකේත් සිනාසී ඇගේ නහය මිරිකුවේය.

"අනේ හොඳ කොල්ලා වගේ මාව එක්ක යනවද..?"

"බලමු.. බලමු.. දැන් යනවා මෙතනින්.. මං පත්තරේ බලනවා.."

භුවනි එතනින් ඉවත්ව ගියේ සතුටිනි. කෙසේ හෝ ඔහු සමග විවාහ වී කොළඹ පදිංචි විය යුතුය. එවිට ගොඩයා හොඳ ජෙන්ට්ල්මන් කෙනෙක් කිරීමට හැකිය. ලන්ඩන්, නිව්යෝර්ක්, පැරිස්.. ලෝක වටා රවුමක් ඔහුත් සමග යන්නට හැකිය. ඒ හීනයෙන් නම් ඇයට ලෙහෙසියෙන් අවදිවීමට නොහැක. කෙසේ හෝ මේ මෝඩයාව රවටා ගත යුතුවෙයි.

* * * * * * *

පංකජ්, සංකේත් නැති දින දෙකෙහිම පන්සල ළඟට ආවේය. සංකේත්ගේ කියමනේ හැටියට නම් කෙල්ලට ඇත්තේ දීප්තිමත්





සුදකි. අයිනට රෝද තියා ජීරූ කොණ්ඩය නම් නවීන විලාසිතාවකට සකසන ලද්දකි. සාමාන්‍ය උසකි. ඇවිදීම වේගවත්ය.

"ආ.. ඔය එන්නෙ එකාක්.."

පංකජ් පන්සලට ඇතුළු වන හැම කෙල්ලෙක් දිහාම බැලුවේ එකම අරමුණකිනි. දැන් ඉතින් කළු කෙල්ලොත් අරක මේක ගා සුදු වී ඇති නිසා හැම කෙල්ලෙක්ම සුදුය.

මල් වට්ටියක්ද රැගෙන තවත් ආච්චි කෙනෙක්ද සමග මේ එන කෙල්ලට නම් ඇත්තේ දිස්නේ ගහන සුදකි.

"හරියට හරි.. කොණ්ඩෙ අයිනට රෝද තියලා.. හැබැයි පෝනිටේල් දාලා.. කෙල්ල ලස්සනයි.. ඒත් ඉතිං මේකිටද මේ පැරෙන්ඩ හදන්නෙ.. මෙහෙම එවුන් දැන් පනහක් විතර ගියා.."

පංකජ් සිනුවේය. ඔවුන් පසුපසින්ම පංකජ් ද පන්සලට ගමන් කළේය. කෙල්ල ඇවිත් තිබුණේ ආච්චි සමඟ බෝධි පූජාවක් තැබීමටය. ගාථා සියල්ලම කියා වැඳ ඉවර වීමටත් පැන්කලය රැගෙන හත් වරක් බෝධිය වටා පැකුණු කරන තුරු පංකජ්ට ද බෝධි පූජාවක් තැබීමට සිදුවිය. ඔහුත් කලයකට වතුර පුරවාගෙන ඉතිපිසෝ ගාථාව කියමින් බෝධිය වටා පැදකුණු කළේය. ගාථා කියා අහවර වී ආච්චි නැගී සිටියාය. කෙල්ල සමග කතා කරනවාට වඩා.. ආච්චි සමග කතා කරන එක හොඳය.

"මේ.. ආච්චි.. මන්තෙගොඩට යන්නෙ කොහොමද.. මෙතන ඉඳන්..?"



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

පංකජ.. තවත් පොතක් පෙරලුවේය. මේ වැඩේ කර නොදුන්නොතින් සංකේත් තම ඔළුව කන බව බව පංකජ දන්නේය. 'ච්ත්.. මෙහෙම යාළුවෝ.. මූං එක්ක ඉන්න අපටයි ගහන්න ඕන..'

"මොකක්ද පුතේ ඇහැව්වෙ..?"

"මන්නෙගොඩට යන්නෙ කොහොමද..?"

"හා පුතේ.. මේ.. ඔතන පන්නිපිටියෙ හංදියෙන්ම මන්නෙගොඩට බස් එක ගන්නැහැකි.. මන්නෙගොඩ කොහාටද..?"

මන්නෙගොඩ කොහාටදැයි කියන්නට පංකජ දන්නේ නැත. මාතලේ ඉපදී හැදී වැඩුණු ඔහු කොළඹ ප්‍රදේශයේ ගම් නගර ගැන දන්නා දෙයක් නැත. වැඩ කරන එක බාස් කෙනෙක් මන්නෙගොඩය. ඔහු ඉන්නේ පන්සල පාරේ යයි කියනවා මතකය.

"මෙ.. ප.. පන්සල පාරේ..."

"මං නම් දන්නෙ නෑ.. අපේ ගීතා දන්නවා.. ඉන්ඩ පුතේ.. මං කතා කරන්න.. මේ කෙල්ලට අපල කාලයක්නෙ මේ.."

එසේ කියමින් ආච්චි මිණීපිරිය වෙත ගියාය. 'ගීතා.. ඒ නම නම් සංකේත්ට හරියන්නේ නැත. ලස්සන නමුත්.. කියන්නට තරම් විශේෂ ලස්සනකුත් නෑ.. සමහර විට ගෙදරට කියන නමද දන්නෑ.. ගීතා කියන්නෙ.. ආච්චිලා ඔය ලේසියට ප්‍රනාවුන්ද් වෙන වචන දාගන්නවනේ හදිස්සියට කතා කරන්න.. අපල නම් ඇති.. සංකේත් කෙල්ලෙකුට ලව් කරනවා කියන්නෙ ඉතිං ඒ කෙල්ලට අපලම තමයි.. ඔය එන්නෙ ගීතා.. අනේ උඹ අරන් දැන් මාතලේට යන්ඩ ඇත්තං..'



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/



"කොහේද අයියෙ..?"

"මන්නෙගොඩ පන්සල පාර.."

"ආ.. අයියා බස් එක අන්තිමටම නවත්තන තැනින් බහින්ඩ.. එතන ජන්ක්ෂන් එක.. බැහැල ඔය ත්‍රීවීලර් එහෙකින් අහන්ඩකො.."

ගීතා නැලවෙමින් කීවාය. 'මූණේ කුරුළෑ දෙක තුනක්ද ඇත. කෙල්ල පුදේ සුදුය. ඒත් ඉතිං මීට වැඩිය සුදු ලස්සන කෙල්ලො මාතලේ අළු විහාරෙනුත් පෝයදාට හැටක් හැත්තෑවක් හොයා ගන්නැහැකි. මේ මෝඩයා මේකිගේ කොහේ තියෙන විශේෂත්වයක් දැක්කද මංදා..'

"ඇයි අයියෙ..?"

"නෑ ගීතා.. මං මේ කල්පනා කළේ ත්‍රීවීලර් එක කතා කරයිද කියලා.."

"ආනේ.."

ඇය කොක් හඬලා සිනාසුණාය. ගැහැනියෙක් වුණාම පහසුවෙන් සිනාසෙන, කේන්ති නොයන ගැහැනියක විය යුතුය. ඒ අතින් කෙල්ලට ලකුණු පහක් පමණ දිය හැකිය.

"ඔයාලා කොහෙද..?"

"අපි කොට්ටාවෙ.."

"කොට්ටාවෙ කොහෙද..?"

පුරුද්දට වාගෙ එහෙම ඇහුවට කොට්ටාව ගැන දන්න ඉටිගෙඩියකුත් නෑ.

"අපි අයියා කොට්ටාවෙ පිං හේන හරියෙ.. අපිට පරක්කු වෙනවනෙ.. අපි යන්නම් එහෙනම්.."

ගීතා එහෙම කියල සමුගන්නට සූදානම් වූවාය. 'දැන් ඉතිං යාළුවා වෙනුවෙන් කොට්ටාවෙ පිංහේනට පාලෝ කරපංකො.. යන්නම් එහෙන් මෙහෙන් වැරදුණොත් කකුල් දෙකට පිං දිදී දුවන්ඩ වෙනවා..'

පංකජ් එළියට අවුදින් ත්‍රීවීලරයක් ගත්තේය. ගීතාත්, ආච්චිත් බස් එකේ නගින්නට පෙර යා යුතුය. 'මෙහෙම බස් එකේ යන්නෙ... අනාගත කෝටිපතිනියක්නේ ඔය.. අප්පා.. එතකොටනේ අපට මෙයාගෙ රෙස්පෙක්ට් බලන්න වෙන්නෙ.. දැන් නම් අනේයියා කියලා කතා කරනකොට නිකං ලේනෙක් චිං චිං ගානවා වගේ..'

"ආච්චි... මං නුගේගොඩට යන්නෙ.. මේතෙන්ම යන්න පුළුවන්.."

ආච්චියි ගීතයි ළඟින් ත්‍රීවීලරය නතර කර පංකජ් කතා කළේය. දැන් ඉතින් කොහොම හරි ගේ බලාගතහොත් මේ කාර්යය ඉතාම සාර්ථක වෙයි. මිතුරා වෙනුවෙන් මීටත් වඩා යමක් කළ හැකිද..?

"මගේ දණ හිස් අමාරුවකුත් තියෙනවා.. යං.. යං පුතේ.."

ගීතා තරමක් අදිමදි කර ලැජ්ජාවෙන් ඇඹරෙද්දී ආච්චි වහා ක්‍රියාත්මක වූවාය.

"අනේ පුතේ පිං සිද්ධ වෙනවා.."





ආච්චි ත්‍රීවීලරයට නැග්ගේ ද එසේ කියමිනි. ගීතා ලැජ්ජාවෙන් මෙන් බිම බලාගෙන උන්නාය. මේකිගෙ හිතේ ඇති මං මේකිට ලව් කියලා.

* * * * * * *

සංතුසීගේ චිත්‍ර ප්‍රදර්ශනය විවෘත වූයේ සුබ මොහොතිනි. එය විවෘත කිරීම සඳහා පැමිණියේ ලංකාවේ ප්‍රකට චිත්‍ර ශිල්පියෙකි. අනුත්තරා දැසේ කඳුළු පුරෝගෙන බලා සිටියාය. දුවගේ මෙවන් මොහොතකට සුබ පතන්නට ඇගේ පියා නැති හැටි. ඒ විතරක්ද.. තමන්ගේ කියා නෑදෑයෙක්වත් නැති මේ අසරණ කෙල්ලගේ ඉරණම්කරුවා අද හෝ හෙට එනවා නම් හොඳය. කර මාලය උකස් කළේ වෙන කරන්නට දෙයක් නැති නිසාය.

චිත්‍රලෝලීන් සංතුසීව වට කරගෙන උන්හ. සංතුසී සතුටෙන් උන්නත් ඇය වඩාත් වෙහෙසට පත්වී උන්නාය. ඇගේ චිත්‍ර සංහෝමයක් ඉතා ඉක්මනින් විකිණෙමින් තිබිණි. ප්‍රධානත්වය ගෙන වැඩ කළේ කෙත්මි හා සුනෙත්‍රා ය. විනාලිට පන්තියක් තිබූ නිසා ඇය ද උදේ උත්සවයට සහභාගී වී පසුව අනුත්තරා සමඟ නුගේගොඩට ගියාය.

"සංතුසී.. මේ.. අර එන බෝයි බලපන්.."

කෙත්මි සෙනග අතරින් සංතුසීට යමක් පෙන්වූවාය. දෙවියනේ.. මේ එන්නේ කවුද..?

"මේ.. අර පන්සලේදී දැක්ක බෝයිනේ.. දැන්.. අර චිත්‍රේ ගනියි.."

සංතුසීට බියක් දැනිණි.



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

"අර කවුද අර නැට්ටිච්චි..?"

කෙත්මි කතා කළේ කෝපයෙනි. තවත් මොඩ් කෙල්ලක ඔහුගේ අතේ එල්ලී සිටියාය. ඒ ඔහුගේ පෙම්වතිය බවට කිසිදු සැකයක් නැත.

"උඹට ඊර්ෂ්‍යයි නේද..?"

"පිස්සු කරන්න එපා කෙත්මි.."

සංතුෂී එසේ කීවත් ඇගේ හිත සැලුණි. තමා නොදැනුවත්වම ඒ ආගන්තුක තරුණයා තම හිතේ නවාතැන්ගෙන උන් බව ඇයට පසක් වූයේ ඒ මොහොතේය. නමුත් තම හිතේ උන් ඒ සිහින කුමාරයා.. වෙන යුවතියකගේ පෙම්වතෙකි. හිත වඩාත් රිදුණේ කුළුඳුලේ හිතේ පිදුන ආදර මල එකවරම පරව ගිය බැවිනි.

"සංතු.. උඹට අප්සට්ද..?"

'ඔව්' යයි කියන්නට නොහැකි නමුත් සංතුෂී ඇතුළු කාමරයට ගියාය. කෙත්මිට සංතුෂී පසුපස යාමට වෙලාවක් නැත. ඇය චිත්‍ර විස්තර කිරීමේත්, පුනෙත් චිත්‍ර විකිණීමේ කාර්යයේ නිරතව උන්හ. උදව්වක් කිරීමට වෙන කිසිවෙක් උන්නේ නැත. පිනලිත් අම්මාත් නැවත එන්නේ හවසය.

සංකේත් සමග චිත්‍ර ප්‍රදර්ශනය නැරඹීමට භුවනී ද බැස්සාය. ඇය බලෙන් මෙන් සංකේත්ගේ අතේ එල්ලුණාය. පුදුම නරඹේ හැඟීම්බර චිත්‍ර.. එකක් බලන්නට, තේරුම් ගන්නට විනාඩි විස්සක්වත් ගත කරන්නට වෙයි. මේ සියලුම චිත්‍ර නරඹන්නට





නම් දවසක්වත් ගත කළ යුතුවෙයි. මේ මල කරච්චලෙත් කරේ එල්ලාගෙන දවසම ගත කරන්නේ කෙසේද..? සංකේත්ගේ ජංගම දුරකථනය නාද වුණේ එවිටය.

"යර්ස් මචං.."

ඔහු කතා කළේය. පංකජ මේ වෙලාවේ කතා කරන්නේ වැදගත් වැඩකට විය යුතුය. නොඑසේ නම් ඔහුගේ දුරකථන ඇමතුම් ලැබෙන්නේ රෑට ය.

"සංකේත්.. අර වැඩේ හරි.."

"නෑ.. කෙල්ල ඇවිත් හිටියද..?"

"මං ගේත් හොයාගත්තා.."

"මචං.. යමුද එහෙනම්.. මං දැන් එනවා.."

සංකේත්ට භුවනි ළඟ සිටින බවද අමතක වුවේය.

"මොකද ඔය දඟලන්නෙ සංකේත්තයියා.."

"පොඩි වැඩක් භුවනි.. මං දැන් යන්නෝන.."

"එතකොට මං..?"

ඔහු මොහොතකට කල්පනා කළේය.

"මට බාස් කෙනෙක් හොයන්න යන්න වෙලා.."

"අයියෝ.. කන්ට්‍රැක්ට් දීලා නෙමෙයිද කරන්නෙ..?"



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

"නෑ.. නෑ.. එහෙම තමයි.. ඒත් මේ බාස් වෙන වැඩකට.. මං කියන්නද..? මෙන්න මේ සල්ලි ටික ගන්න.."

ඔහු රුපියල් පන්දාහේ නෝට්ටු මිටියක් පර්ස් එකෙන් ඉවතට ගත්තේය.

"හොඳ චිත්‍ර දෙක තුනක් ගන්න.. සංතුසීගේ කොයි චිත්‍රෙත් ලස්සනයි.. මම තව පැය දෙකකින් ඔයාව ගන්න එනවා.."

"මට මෙතන ඉන්න බෑ.. මං ලිබර්ටි ප්ලාසා යනවා.. ඔයා එහෙට එන්න.."

"හා.."

සංකේත් දෙවියන්නට පිං දෙමින් වහා අවුදින් කාරයට නැංගේය. ට්‍රැෆික් එකට කාලය නාස්ති වෙද්දි ඔහුට වාහනයකාරයින්ගේත්, දේශපාලනඥයින්ගේත් දෙමව්පියන් සිහිපත් විය. 'ෂහ්.. කොළඹ ඉඳල කොට්ටාවට හයිවේ එකක් හදනවා නම්.. වැඩි ඈතක නොව.. කෙල්ල ඉන්නේ කොට්ටාවේ බව පංකජ විනාඩියට වාර්තා කලේය. මේ දැන්ම ඇය බලන්නට යා යුතුය.

පංකජ උන්නේ වැඩ බිමෙහිය. ගොඩනැගිල්ලේ අත්තිවාරම හා කණු ඉදිවී ඇත. සතුටක් දැනෙයි. ඊටත් වඩා අමුතුම සතුටක් ඔහුට දැනෙයි. සංතුසී හමුවී වචනයක් දෙකක් ඇගේ චිත්‍ර ගැන කතා කරන්නට ඔහු සිතා සිටියේය. ඇගේ කුඩා නැගණියවත් අද පෙනෙන්නට හිටියේ නැත.

"නැගපං.. නැගපං මචං.."





මිතුරා කාරය දෙසට එද්දිම සංකේත් නැගැනුවේය.

"මචං.. එහෙම ළඟරෙක් කොටුවට පනිනවා වාගෙ කෙල්ලෙක් බලන්න යනවද..? ඒකිට උඹව එපාවෙයි.."

මිතුරා කියන්නේ ඇත්තකි. ටිකක් ලස්සනට ඇඳ පැළඳගෙන හොඳ සැර පිරිමි සෙන්ට් එකක් දාගෙන ඇයට තෑගි බෝගත් රැගෙන යා යුතුය. මේ කලාව ඉතා හොඳින් ප්‍රගුණ කර ඇත්තේ පංකජ නිසා ඔහුගේ උපදෙස් අනුව කටයුතු කරන්නට සංකේත් සිතා ගත්තේය.

"පව් මචං.. කෙල්ල ටිකක් දුප්පත්.. ඒත් ඉතිං උඹට සෙට් වෙනවා කියන්නෙ පුරුවෙ පිනක් එල දෙනවා කියන එකනේ.."

පංකජට බොහෝ දේ කියන්නට තිබුණි. හිත ගිය තැන මාලිගාවෙ ඉදිවෙයි.. ඒ කෙල්ලගේ ඇති වරදක් නැත. දිස්නෙන සුදට මූ පිස්සු වැටෙන්න ඇති..

"කෙල්ල මොන්ටිසෝරි එකක් කරනවා.."

පංකජ ත්‍රීවීලරයේ ගොස් ඔවුන් බස්සවා.. හරවාගෙන ආ හැටි විස්තර කලේය. ඒ සමගම ඔහුට භුවනී මතක් විය. ඇය මේ වෙනතුරුත් චිත්‍ර ප්‍රදර්ශනයේ නැත්නම් ලිබර්ටි ප්ලාසා එකේ විය යුතුය.

"මං හදිසියට පැනගෙන ආවේ මචං.. දැන් භුවනි අරං [illegible]රන් ලිබර්ටි ගිහින්.. භුවනිටත් අදට අපි ඉන්න තැනම රූම් එකක් බුක් කරපං.."

මිතුරාගේ අණය. ඒවා ඒ විදිහට කළ යුතුය. 'අනේ සාදු..



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

මේකා බැන්දයින් පස්සෙ මං මේවගෙන් නිදහස්නෙ.. මොන රිලවියක් වුණත් කමක් නෑ.. කසාද බඳිනව නම් මං බොක්කෙන් සපෝට් එක දෙනවා..'

එසේ කියමින් පංකජ මිතුරාගෙන් කාරයේ යතුර අතට ගත්තේය. එහෙත් අද හවස ගීතා බලන්නට යනවා නම්.. භුවනී නවත්වන්නේ කොසේද..? ඒ සියලු ක්‍රම සහ විධි කල්පනා කළ යුත්තේ තමාය. 'සංකේත් සල්ලිකාරයා.. මොළේ හයර් කරන්න පුළුවන් නම් උෟ ඒකත් කරයි..' මිතුරාව හෝටලයෙන් බැස්සවූ පංකජ, භුවනී වෙනුවෙන්ද කාමරයක් වෙන් කළේය. 'භුවනිත් මාර ට්‍රයි එකක් දෙනවා සංකේත්ට. මූං මේකගෙ මොනවට වහ වැටිලද මං දන්නෑ.. මං හිටියෙ නැත්තං මෙලහට ගෑනු ටික මේකව උස්සාගෙන ගිහින්..'

* * * * * * *

සංතුසී ඇතුළු කාමරයෙන් පිටතට පැමිණියේ ඇයව හමුවීමට කිහිප දෙනෙකු බලාපොරොත්තුවෙන් සිටින නිසාය. සමහරුන් පුවත්පත් මාධ්‍යවේදීන් වූහ. මෙවන් වැදගත් අමරණීය මොහොතක තම සිත නොසන්සුන්වීම ගැන ඇය දුක්වූවාය.

"සංතු.. ආ යූ ඕකේ.."

කෙත්මි ඇසුවාය.

"අම්මා ආපුහාම ගෙදර යන්න හිතෙනවා.."

"උඹ හොඳටම අප්සට් වෙලා සංතු... ඒ බෝයි.. කෝල් එකක් ඇවිදින් ගියා.. අර කෙල්ලව දාලා.. කෙල්ල චිත්‍ර හතරක් ගත්තා.."





"මන්.."

"අර.. පේන්ටින් එකත් ගත්තා..."

සංතුසී ඒක මිල කිරීමට සිතුවේ නැත. එය හැමදාටම තමා සතුව තියා ගැනීමට ඇය සිතුවාය.

"මං කිව්වනෙ කෙත්මි මං ඒක විකුණන්නෙ නෑ කියලා.. මං ආසම ආර්ට් එක.."

සංතුසීට දැනුණේ කවුරුන් හෝ මුදල් දී තම හදවත ගෙනගිය බවකි.

"ඒක බලාගෙන හුල්ලනවට වැඩිය දීලා දාන එක හොඳයි.."

සංතුසී සුසුමක් හෙළුවාය. අහිමි දේ අහිමිමමය. කුඩා කළ මුළු තමාට උරුමව තිබුණේ අහිමිවීම් පමණි. ඒ තරම් කොහොමවත්ත වී තමා මේ ලෝකයට කුමට නම් උපත ලැබුවාදැයි ඇයට සිතුණි.

"අර සිත්මිණ පත්තරේ ජර්නලිස්ට් කෙනෙක් කතා කරා ආර්ටිකල් එකකට.. එයා මෙතනින් පේන්ටින් ටිකක් සිලෙක්ට් කරගෙන ෆොටෝස් ගත්තා.. ඒ ජර්නලිස්ට්ට මං එපොයිමන්ට්ස් දුන්නා හතරට.."

කෙත්මි කියාගෙන ගියාය. යළිත් පිරිස සංතුසීව වට කරගත් නිසා කෙත්මි ඉවතට ගියාය.

"ඇයි කෙත්මි.. සංතුට අප්සට්ද..?"

පුනෙත් ඇසුවාය.



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

"මින්.. පෙන්නන්නෙ නෑ.. ඒත් මූණෙන් පේනවා.."

"සංතුගෙ එෆෙයාර් එකක් තිබුණෙ නැතේ.."

"නෑ සුනෙත්.. කාටවත් කැමති වුණේ නැතේ.. ඔයා හොස්පිට්ල් ඉද්දි අපි දෙන්නා ගියානෙ බෝධි පූජා තියන්න.. ඔය කොල්ලා පන්සලේදී දැක්කා.. එච්චරයි.."

"සීරියස් හිතට අරගෙන වගේ.. පව් කෙල්ල.."

"මටත් දුකයි.. අනුත්තරාන්ට් දැනගත්තොත් එහෙම තවත් දුක්වෙයි.. කොයි තරම් කරදර වින්දද මේ දවස්වල.."

සුනෙත්ටත් කෙත්මිටත් යෙහෙළිය ගැන දුකය. පෙම් කරන්නට හිතාගෙන ඇත්තේ අනුත්ගේ කොල්ලෙකුටය. ඒ චිත්‍රය මිලදී ගත්තේ ඒ කොල්ලාගේ පෙම්වතිය බව.. ඇයට කිව යුතු නැත. ඉර්දාන් චිත්‍ර ප්‍රදර්ශනය පැවැත්වෙයි. සංතුසීගේ මානසිකත්වය යහපත් මට්ටමක තබා ගත යුතුය.

"සංතුසී දවල්ට කෑවද...?"

"නෑ සුනෙත්.."

"අර පාක් එක ඉස්සරහා ඩිමෝ බට්ටෙක් තියෙන්නෙ.. කෑම විකුණනවා.. මොනව හරි ගෙනත් දෙන්න.. හොඳ ප්ලේන්ටි එකකුත් එක්ක.."

"ඒකෙන් ගම්මු.. දිරියෙන් දිනන මිනිසුන් වෙනුවෙන්නේ ඩිමෝ බට්ටා තියෙන්නෙ.."

කෙත්මි එසේ කියාගෙනම පාරෙන් එහා පැත්තේ විහාරමහා





දේවී උද්‍යානය අසල නවතා ඇති ජංගම රථය වෙත ගියාය. එහි බොහෝ විට විකුණන්නට තිබුණේ ගමේ කෑමය. කිහිප දෙනෙක්ම කැමිබු මස්සොක්කා රැගෙන ගියහ. කැන්ද කොළයක ඔතන ලද මස්සොක්කාවලත් ලුණුමිරිසේත් සුවඳ මුසුව කෙත්මි තුළද බඩගින්නක් ඇතිවිය. ඇය තුන්දෙනාට පාර්සල් තුනක් මිලට ගත්තාය.

"මේ.. සුවඳයි.. කාමරේට ගිහින් කාලා ඉන්න.."

කෙත්මි සංතුසීගේ නැහැයට මස්සොක්කා පාර්සලය ළං කළාය. නමුත් සංතුසී එය අතට ගත්තේ නැත. ඔහේ දෑස දල්වාගෙන බලා උන්නාය. මුළු චිත්‍ර ප්‍රදර්ශනයම පාළු යයි ඇයට සිතුණේ.. තමාගේ ප්‍රියතම චිත්‍රය නැති නිසාය.

"නම් සංතුසී වුණාට හිතේ නම් කිසිම සංතෝසයක් නෑ.."

සුනෙත්ට කියැවිණි. යෙහෙළිය හදවතින් දුක් විඳින වග සුනෙත් තේරුම් ගත්තේය.

* * * * * * *

භුවනී සිටියේ තද කෝන්තියෙනි. 'කවුද මේ සංතුසී කියන කෙල්ල.. ඒකිට මොකක්ද තියෙන අමාරුව සංකේත්ගේ චිත්‍ර අඳින්න.. යමංකො අද..'

භුවනී පංකජ් පදවාගෙන ආ කාරයට නැගුණේ එසේ සිතමිනි. සංකේත් ගැන අයිතියක් ඇත්තේ තමාටය. කොහේවත් යන චිත්‍රකාරියකට ඔහු අයිතිවීමට දිය නොහැක. 'මෙයත් චිත්‍ර [illegible]යනේ.. නුවර් එකට දෙන්නගෙ එෆෙයාර් එකක් ඇති.. අපරාදෙ මට අහන්න තිබ්බෙ.. ඒකිගෙන්..'

"මොකද වෙව්ලන්නෙ.. සීතද..?"

පංකජ එසේ අසද්දී භුවනි කේන්තියෙන් ඔහු දෙස බැලුවේ තවත් වෙව්ලමිනි. 'මෙයත් සපෝට් ඇති මේ ලව් එකට.. අතිජාත මිත්‍රයනේ.. මං සංකේත්ව බඳිනකං විතරයි ඔය යාළුකම..'

"ඇයි... සීත නම් මොනව කරන්නද..?"

"ඒ සී ඕෆ් කරන්නං..."

"විකාර නොකර යං.. කෝ දැන් සංකේත්..?"

"එයා රූම් එකේ නිදි.. ඔයාටත් රූම් එකක් බුක් කරා.. රෑට ආපහු මාතලේ යයි.."

භුවනි හිතාගෙන හිටියේ දවසම සංකේත් සමග එහෙ මෙහෙ ඇවිදීමටය. නමුත් දැන් සිද්ධ වී ඇත්තේ වෙනමම දෙයකි. 'හොඳයි මං බලාගන්නංකෝ.. දෙන්න හොඳ නෑ ඒ විත්‍රෙ.. හංගලා තියන්න ඕන..'

"අපරාදෙනේ.. ඇයි මට වෙනමම රූම් එකක් බුක් කරේ.."

"එහෙම නොකළත් ගාණක් නෑ.. බය නැතිව ඔයාව සංකේත් ළඟ තියන්න පුළුවන්.. සංකේත් ඔයාට අතවත් තියන්නෙ නෑ කියලා මං දන්නවා.."

"දන්නව බම්බුව.."

භුවනි නැවතත් දත්මිටි කෑවාය. 'නටාගෙන වරෙංකෝ තව ටික දවසක්..'





"මේ.. පංකජ් අයියෙ.. සංකේත්ගෙ හැටි දන්නෙ එයත් එක්ක එකට කාලෙ ගත කරන, එකට කන බොන මම..."

"දැන් කාලෙ එකට නිදාගත්තත් මිනිස්සු අඳුරගන්න බෑ නංගි.."

පංකජ තමාට සමච්චල් කරනවා යයි භුවනීට සිතුණි. 'මොනවා කරන්නද.. ඉවසනවා මිසක්.. මික්.. මාසයක් විතරම සංකේත්ලගෙ ගෙදර ඉඳලත් එෆෙයාර් එකක් ඇති කරගන්න බැරි වුණානෙ.. මම්මා මාව කයි දැන්.. මේ සල්ලි ගහ හොලවගන්න බැරි වුණොත් වැඩක් නෑ..'

"මේ ඔයාගෙ රූම් එකේ යතුර.."

"සංකේත්..?"

"සංකේත් නිදි මහත්තයායි කියලා.."

'මේ මිනිහත් එක්ක මොකවත් කරගන්න බෑ.. අඩුම ගානෙ.. මෙහෙදි නිදහස තියෙනවනේ.. ඒකටත් ඉඩක් නෑ මේ මිනිහා හින්දා..'

"මගෙ බඩු ටික කා එකේ.."

"ආ යතුර.. බඩු අරගෙන යතුර රිසෙප්ෂන් එකට දෙන්න.. මං ආපහු සයිට් එකට යනවා.."

එසේ කියමින් පංකජ යතුර භුවනි අත තැබුවාය.

"ආ.. චිත්‍ර ටික බලන්න ඕන කියලා.. එයාගෙ කාමරෙන් තියන්න කිව්වා.."



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

"මං බලලා තියන්නං.."

භුවනි කෝන්තිගෙන කීවාය. සේවකයෙකු චිත්‍ර ටික ඇයට කාමරය වෙත ගෙනත් දුන්නේය. භුවනි ඇඟ සෝදාගෙන ඇඳට වෙන්නට හදනවිටම සේවකයෙකු ඇයට කුල් බීමක් ගෙනාවේය. 'කවුරු මේවා ඕඩර් කරනවද මංදා.. සංකේතව දැක්කෙවත් නෑ.. රූම් නම්බර් එකවත් අහගන්න බැරිවුණා..'

* * * * * * *

සංකේත්.. දිය නාගෙන ඇඳුම් බෑගයේ තිබී වට්නාම එමරල්ඩ් අත්කොට කමිසය ඇඳ ගත්තේය. එයට හරියන්නට කළු ඩෙනිම් කලිසම හැඳගත් ඔහු.. සුවඳ විලවුන් බෝතලය ගෙන කිහිලියටත් කොලරයටත් තවරා ගත්තේය. පංකජ් කාමරයට ඇතුළු වුණේ එවිටය.

"භුවනි ආවද..?"

"ආවා.. ආවා.. කාමරේටම දැම්මා.."

"චිත්‍ර අරගෙනද..?"

"එයා ඒවා කාමරේට අරන් ගියා.. තුන හතරක් අරගෙන.. ඊට එහා කරත්තෙකට වාගෙ බඩු පැටෙව්වා ලිබර්ටි ප්ලාසා එකෙන්..."

"කෙල්ලට ඉතින් කොළඹනේ අල්ලන්නෙ.."

"එහෙම නම් ඉතිං කොළඹින්ම කොල්ලෙක් අල්ලාගන්න කියපං.. උඹ වගේ හද්දා ගොඩේ මාතලේ.. පොරක් අල්ලාගන්නැතිව.."



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/



පංකජ් කෝන්තිගෙන ඇතැයි සංකේත්ට සිතුණි.

"දැන් ඉතිං යමං.."

"මනමාලයා වගේ.."

"උඹ මහොමද යන්නෙ..?"

"මචං.. උඹ මේක පුළුවන් නම් තනියම ගිහින් කරගනිං.. මට හිතෙන්නෙ කෙල්ල දැනටමත් මට ලව්.."

"මම උඹ මරනවා.."

"හරි.. හරි.. යං.."

'මේ යන්නේ සුබ ගමනකි. තම අනාගත සහකාරිය මුණ ගැසීමටය. එහෙත් හදවත පැකිලෙයි. ඇය හා කතා කරන්නේ කොහොමද..? ගෙදරින් ගුටි කාගෙන එන්නට වෙයිද..?' මොන මොන පෞරුෂත්වයකින් යුතු කෝටිපති ව්‍යාපාරිකයෙකු වුවද... සංකේත්ගේ හදවත සැලෙයි.

"මචං.. නිකම්ම යන්නත් බෑනේ නේද..? මොනව හරි ගෙනියන්න වෙයි.. මොන වගේ දෙයක්ද හොඳ..?"

"චීනි තේ කොළ.. හාල් පරිප්පු ටිකක් එහෙම.."

"උඹ ඔය රට හැම තැනම කෙල්ලො බලන්න යද්දි ඔය මහාධාර මල්ලත් එල්ලගෙනද ගියේ..?"

මිතුරාට මේ විෂයය වැටහෙන්නේ නැත. එයට එක්ස්පීරියන්ස් අවශ්‍යය. තෑගි බෝග දීමට පෙර කෙල්ල තමුන්ට කැමතිදැයි දැනගත යුතුය. භුවනිට නොකියා යහළුවන් දෙදෙනාම හෝටලයෙන් පැන ගත්හ.

විනාඩි දහයක් පමණ ඇතුළත ඔවුහු.. නියමිත නිවසට ළඟා වූහ.. රිය පැදවූයේ පංකජය. ගෙදරකට නිකම්ම ගොඩවන්නට බැරි නිසා.. සංකේත් පෙරේරා ඇන්ඩ් සන්ස් එකෙන් කේක් ගෙඩියක් මිලට ගත්තේය.

"කවුද මහත්තයෝ මේ.. ආ. දුවේ.. දුවේ.. මේ අර එනවයි කීව මහත්තයා වෙන්න ඇති.."

මිදුලේ අතු ගගා උන් ආච්චි කෙනෙක් සංකේත් දකිද්දිම කතා කළාය. මොන්ටිසෝරියක් පවත්වාගෙන යන බව පෙනෙයි.

"ඉඳගන්ඩ මහත්තයෝ.. දුව නාන්ඩ ගියා විතරයි.."

ඇය කවුරුන් හෝ බලාපොරොත්තුවෙන් සිටින වග.. සංකේත්ට වැටහුණි. ටික වෙලාවකින් නාගෙන කොණ්ඩය තුවායක ඔතාගෙන ඉදිරියට පැමිණියේ සුන්දර යුවතියක වුවත්.. ඔහුට හීන් දාඩිය දැම්මේය. පුටුවෙන් නැගිට්ටවුණේ ඉබේමය. 'මුව මරන්න එපායැ.. මේ ඒ කෙල්ල නොමෙයිනෙ..'

"වාඩිවෙන්න මිස්ටර්... කෝ බබා එක්ක ආවෙ නැද්ද..?"

ඇය එසේ කියද්දි සංකේත්ට යළිත් ඉන්දවිණි.

"න්.. නෑ.."

"බබාගෙ වයස කීයද..?"

දැන් ඉතින් කුමක් කියන්නද..? මේ අසන්නේ මොන්ටිසෝරි බබෙක් ගැන විය යුතුය.

"ම්.. මේ.. පහයි.."





"පහයි.. අවුරුදු පහෙන් බබාලා ඉස්කෝලෙ යනවනේ.. මිස්ටර්.."

"නෑ.. මං හිතන්නෙ හතරක්ද කොහෙද...?"

ඇය හඬ නගා සිනාසුණාය.

'මේකව අල්ලලා පොළොවේ ගහන්න එපායැ.. මේකව මේ මොන්ටිසෝරි ටීච ළඟ.. ඩේකෙයා එකේ ඉඳලා දාන්න ඕන ඇදිලා එන්න.. ගල් ඉබ්බා.. මාව දාපු අමාරුවක්..'

"බබාගෙ අම්මා..?"

"එයා ඉන්නවා.. එයා ඔෆිස්..."

"අම්මව එක්ක ආවා නම් හරි.."

"මම මිස්.. එහෙනම් එයාව එක්කරගෙන එන්නම්.. යන්නම්.."

එසේ කියමින් යාන්තං අසුනින් නැගිටගත් හේ.. වේගයෙන් කාර්ය දෙසට ගමන් කළේය.

"ඒ මනුස්සයට පිස්සුද මන්දාච්චි.."

ඇය කියනු යාන්තමට සංකේත්ට ඇසුණි. 'අද නම් පංකජයව මම ගහනවා.. අපරාදෙ.. අර අරන් ගිය කේක් එක එක්දාස් ගාණක්..'

* * * * * * *

"සංකේත් අයියා... මොකද මේ අප්සට් එකේ.."



The Reader's Place
http://e-busthakalaya.blogspot.com/

හුවනි ඇසුවාය. සිද්ධ වුණ අටමගල ඇයට කෙසේ කියන්නද..?

"නෑ.. මේ මුකුත් නෑ.."

සංකේත් එසේ කියමින් ප්‍රශ්නයෙන් මග ඇරියේය. පංකජ ද උන්නේ හිතේ අමාරුවෙනි.

"මිගොල්ලො මාව දාලා රවුම් ගහන්න යනවා මදිවට.. ඉන්ඩකෝ.. මං දන්නවා ගියේ අර සංතුසී කියන කෙල්ල හොයාගෙන කියලා.."

"ගියේ නම් කෙල්ලෙක් හොයාගෙන තමයි.. හැබැයි.. ඒ ඔය සංතුසී නම් නෙමෙයි.."

"එහෙනම් මොකක්ද ඔයයි ඒ කෙල්ලයි අතරේ තියෙන එෆෙයාර් එක.."

"මගෙයි සංතුසියි අතරේ.. පිස්සුද.. මං ඒ කෙල්ලව දැකලත් නෑ.."

සංකේත් මේ කියන දෙය පිළිගන්නේ කෙසේද..? එසේ නම් ඒ කෙල්ල මෙයාගේ මේ චිත්‍රය ඇන්දේ කෙසේද..? ඒ කෙසේ වෙතත් ඒ චිත්‍රය නම් කිසිම විටෙක සංකේත්ට නොපෙන්විය යුතුය. සංතුසී ලස්සන වැක්කෙරෙන කෙල්ලකි. ඇඳගෙන උන්නේ ද සුදු කුර්තා ඇඳුමකි. හරියට ඉන්දියන් ගර්ල් කෙනෙක් වගේ. දැකලා නැත්නං හොඳයි.. දැක්කොත් පිස්සු වැටෙයි.

"හුවනි.. මං යනවා කාමරේට.. හයට විතර ආපහු යන්න ලැස්ති වෙන්න.."





"අනේ මට නව කරගන්න වැඩ ගොඩක් තියෙනවා.. සංකේත්තයියා.. කොණ්ඩෙ කපා ගන්න ඕන.. ක්ලීනප් එකක් කරගන්න ඕන.. අයිබ්‍රෝස් හදන්න ඕන.."

"කරන කෙහෙල්මලක් පංකජත් එක්ක යන්ඩ.. ඕන්න යතුර.."

සංකේත් කාරයේ යතුර හුවනී වෙත යොමු කරමන් තම කාමරයට ගියේය. පංකජ සිද්ධ වෙච්ච් අත්වැරැද්ද ගැන කම්පාවට පත්වෙමින් උන්නේය. 'ෂිහ්.. මදැයි ලකුණු දාගන්න හිටියා.. ඇත්තට ඉතින් මේකගේ හිතේ තියෙන රූපෙ කොහෙන් හොයන්නද..? ඒ කෙල්ලත් අයිනට රොද තියලා පීරලා කොණ්ඩෙ දෙපැත්තෙන් චුට්ටක් ඉස්සරහට දාලා.. දිස්නෙ දෙන සුදු.. කමක් නෑ.. ටික වෙලාවකින් සංකේත් කූල් ඩවුන් වෙයි.. එක්කො ෆොටෝ එකක් පෙන්නුව නම් මං රට පීරලා කෙල්ල හොයනවා..'

සංකේත් ඇඳේ දිගාවී උන්නේය. 'ඒ සුරංගනාවී කොහෙන් හොයන්නද..? පන්සල ළඟම රැකගෙන ඉන්න පුළුවන්ද..? ඒ සංසාරයේ පතාගෙන ආ රුවක් බව ඔහුට දැන් පැහැදිලිය. ඇස් දෙක ඉදිරියේ පෙනිලා නොපෙනී ගියා.. පංකජයා කියන්නා වාගේ හොල්මනක්ද මන්දා..'

"මචං.. එක්ස්ට්‍රීම්ලි සොරි මචං.."

පංකජ කාමරයට ඇතුළු වුණේ එසේ කියාගෙනය. මෙය දවසක මතක් කර සිනාසිය හැකි හොඳ විහිලුවක් වුවද.. දැන් නම් සංකේත් ඉන්නේ කේන්තියෙනි.

"එක අතකින් මගෙ හිතේ තියෙන රූපෙ කොහොම උඹට



The Reader's Place http://e-pusthakalaya.blogspot.com/

එක්ස්ප්‍රස් කරන්නද..? භුවනිගෙන් අර චිත්‍ර ටික ඉල්ලාගෙන වරෙන්.. ඒ මල සමයම දැන් මට තවත් පදයක් හැදලනේ.. මං ඔය ආර්ටිස්ට් එක්ක යාළුයි කියලා.."

"මං ගේන්නම්.."

පංකජ යළිත් භුවනිගේ කාමරයට ගොස් පේන්ටින් තුනක් රැගෙන ආවේ මිතුරාගේ හිත සනසනු වස්ය.

"මෙච්චරද අරන් තියෙන්නෙ..?"

"එකක් කවර් කරගෙන ඉන්නවා.. එයා ඒක ගත්තෙ යාලුවෙකුට ප්‍රසන්ට් කරන්නලු.."

චිත්‍ර පුදුම තරමේ හැඟීම්බරය. හිතේ ඇතිවූ මේ නොසන්සුන් තාවය මෙල්ල කිරීමට මෙම චිත්‍ර ශිල්පිනියට ඇත්තේ පුදුමාකාර හැකියාවකි. ඇත්තටම පන්සල ළඟ දුටු කෙල්ල ම වැනි යයි ඇයට කියා අන්දවා ගත හැකි නම්.. සංතුසී.. සංතුසී කියන්නෙ හිතේ සන්තෝෂෙට.. මේ පංකජයා වලිගෙ පාගාගෙන කෝල් කළේ නැත්තං සංතුසීව මුණ ගැහෙන්න තිබ්බා..

භුවනී සාමාන්‍යයෙන් චිත්‍ර ප්‍රිය කරන්නියක නොවේ. අම්මා බලෙන්ම මෙන් අද කාරෙකේ භුවනීව තමා සමග එව්වාය. අම්මාගේ බලාපොරොත්තුව කුමක්දැයි දැන් පංකේජ්ට වැටහේ. එහෙත් ඔහුගේ ලෝකයේ භුවනිට ඉඩක් නැත. ඒ පුදු කෙල්ල කවදා හෝ නොලැබුණහොත්... තමා මේ තරමම සංවේදී චරිතයක් වූ එක ගැන පංකේජ්ට තරහක්ද ඇතිවිය. කොහොමද ඩාලිං ඔයාව හොයාගන්නෙ..? නැවතත් පංකජට එවැනි වැඩක්



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/



භාරදෙන්නට නොහැකිය. ඒත් අර මොන්ටිසෝරි ටීචර් ගීතා බලන්න මූ පන්සල ළඟ පදිංචි වෙන්නත් බැරි නෑ..

✹ ✹ ✹ ✹ ✹ ✹ ✹

අනුත්තරා රෑ මැදියම අවදි වූවාය. සංතුසී මෙතෙක් වෙලාම උන්නේ ඇහැරගෙනය. අද වැනි ජීවිතයේ වැදගත්ම දවසකවත් ඇගේ හිතේ සතුටක් නැත. චිත්‍ර බොහෝමයක් විකිණී තිබුණි. හෙට දවසේ ප්‍රදර්ශනයට ඇත්තේ චිත්‍ර පනහක් පමණය. පන්නිපිටියේ ගේ තිබුණා නම් මේ වැඩවලට පහසුය. එහෙත්.. සියල්ල සිදුවූයේ නපුරු කලටය.

"ඇත්තටම අපිට නෑයො කවුරුවත්ම නැද්දම්මා.. අප්පච්චිගේ පැත්තෙ නැන්දා කෙනෙක් හිටියාලු නේද..? අර මාව හදාගන්න ඉල්ලුව කියන්නෙ..?"

සංතුසී ඇසුවේ අද උදේය.

"අප්පච්චිගෙ පැත්තෙ නෑයො ඉන්නවා.. ඒත් මං ඒ ගැන දන්නෑ ලොකු පුතේ.. මං කොහොම හරි ඔයාලා දෙන්නාව හදා ගත්තනේ.. එදා නැති නෑයො දැන් ඉතිං නෑ වගේ තමයි.."

අනුත්තරාට කියැවිණි. ඒ වේදනාව පපුවට තවම දැනෙයි. අම්මාගේ දේහය බදාගෙන වැළපෙන විට ඔවුන් තමාව පන්නා ගත් හැටි ඇයට මතකය. ඒ අතීතය ඉතා හොඳින් ඇගේ මතකයේ තැන්පත්ව තියේ.

"අම්මා.. අපි ඒ නැන්දව බලන්න යමුකො.."

"මේ හදිසියෙම මොකද එහෙම කල්පනාවක් ආවෙ.. මට වතාම්බු කරපු මිනිස්සු ගෙට මට යන්න බෑ.."

"එහෙනම් මාව ඉල්ලුව..?"

"ඒ එයාලගේ ලේ නෑ ඔයාට තියෙන්නෙ.."

තම ලෙය සොයා යා යුතු යයි සංතුෂීට නිකමට මෙන් සිතුණි. අප්පච්චිගේ මතකය.. ඇයට යාන්තමින් ඇත. අප්පච්චි තමාව කරේ තියාගෙන ගිය හැටි.. තමාව කර උඩ තියාගෙන ගත විශාල ජලාශයක බැස නාපු හැටි.. වැනි මතකයන් ඇගේ මතකයෙන් අවදි වී තිබුණි. මෙවැනි මොහොතක දියණිය වඩාත් සංවේදී වූවා යයි අනුත්තරාට හැඟුණි.

'මෙයා හොයාගත්තෙ නැත්තං කාට හරි හොඳ දරුවෙක් හොයන්න ඕන.. තමන්ගෙ පවුලක් හැදෙනකොට ඔය සාංකාව නැතිව යයි..'

අනුත්තරා සිතුවාය. තමාට ඇත්තේ පුදුම තරමේ අභියෝගයන්ය. පුංචි අම්මා සමග නිවාඩුවේ සංතුෂී ගැන තනා කළ යුතු යයි අනුත්තරා සිතුවාය.

* * * * * * *







# 05

සංතුෂීට නින්ද ගියේම නැත. මහා එපා කරපු හෝන්දු වියක් මුළු හිතම අරක්ගෙන ඇත. ඉතාම මහන්සියෙන් කළ ප්‍රදර්ශනය සාර්ථක වී ඇත. එහෙත් හිතට සතුටක් නැත්තේ ඇයි..? තම හිතේ සතුට හොරා ගත්තේ කවුද..? ඒ අන්සතු හදවත ගැන තමා මෙතරම් දුක්වෙන්නේ ඇයිදැයි ඇය සිතුවාය. ඒ ප්‍රේමයද..? ආදරයද..? හිත කොහේවත් ආදරයක නොපැටලුණේ තමාටම හිමිවූ හදවතක්.- මේ ලෝකයේ තිබෙන බව ඇය ප්‍රර්ථනා දැන උන් හෙයිනි. ඒ හදවත හිමි කුමාරයා කෙදිනක හෝ තමාව හොයාගෙන එන බව ඇය විශ්වාස කළාය. තන්සාළෙදී දුටුවේ ඒ හදවතේ ඇදි රූපයයි. නමුත්.. ඒ හදවත තමාට හිමි නැත. ඒ චිත්‍රයත් චිත්‍ර ලෝලියෙකු විසින් මිලදීගෙන ඇත. තමාට ඒ සුන්දර සිහිවටනයවත් අයිති නැති වග ම තේරුම් ගත්තාය.

මුළු ජීවිතයම පාළු බව ඇයට දැනිණි. ආදරවන්තයා හදවතෙන් ඇත් වූ විට.. මුළු ජීවිතයේ සියලුම සිහිනත් රැගෙන යයි. ඉන්පසු ඉතුරු වන්නේ හිත නැති කයක් පමණි.



The Reader's Place http://e-pusthakalaya.blogspot.com/

"ලොකු පුතේ.."

අම්මාත් නිදි නැත. තමා සමගම අම්මාත් දුක් විඳින වග සංතුසී තේරුම් ගත්තාය.

"නිදි නෑ නේද.. තේ ටිකක් ගේන්නද..?"

"කීයද වෙලාව..?"

"හතරයි පුතේ.. දැන් ඉතින් නිදියන්න වෙලාවකුත් නැතේ.."

අනුත්තරා නැගිට කුස්සියට ගියාය. පාන්දරම පිටත් විය යුතුය. ප්‍රදර්ශනය පටන් ගන්නේ නවයට වුවද උදේම පොනග ඇදී එයි. පුනෙත්ගේ මැදිහත්වීමෙන් පුවත්පත් කිහිපයකටද විස්තර ගන්නා ලදී. එක් මාධ්‍යවේදිනියක් චිත්‍ර සමූහයක ඡායාරූපයත් ගත්තාය. තමාගේ විවිධ ඉරියව්වලින් ඡායාරූප කිහිපයක්ද ගත්තාය. චිත්‍ර ප්‍රසිද්ධියට සංතුසී තුළ එතරම් කැමැත්තක් නොවුණද චිත්‍ර ශිල්පිනියකට සැඟවී සිටිය නොහැක. දක්ෂකම් සඟවාගත නොහැක.

"ආ පුතේ.. කෝපි එකක් හැදුවා.. පුංචි ආවචිටත් අද ටිකක් සනීප නෑ වගේ.."

"අම්මා ඉන්න එහෙනම්.."

"ඒත් උදව්වට කෙනෙක් නැතේ.."

"අපට කොළඹ කිට්ටුවෙන් තැනක් තිබ්බ නම් ලේසියි නේදම්මා...?"

"කොහොම ගෙවල් ගන්නද..?"





අනුත්තරා සුසුම් ලෑවාය. ඇත්තටම මේ මිනිස්සුන්ට ධම්මගෙ දුව ගැන හිතලා.. එක බිම් අහලක් දෙන්න තිබුණා.. එහෙම පුතා නම් කෙල්ලො දෙන්නා මෙහෙම දුක් විඳින්නෙ නෑ..

"අම්මා.."

"මහ්.. ඇයි..?"

"නැන්දා ඇයි මාව ඉල්ලුවෙ..?"

"එයාටත් පුතෙක් හිටියා.. එතකොට එයාට අවුරුදු දහයක් විතර.. ලස්සන සුදු කොල්ලෙක්.. එයාගෙ තනියටත් එක්ක ඉන්නැති.."

"එහෙනම් අපට මස්සිනෙක් ඉන්නවා.. අපේම අයියෙක්.."

අනුත්තරා සුසුමක් හෙලුවාය. තමන්ගේ උත්පත්තියේ වත්කම යාන දරුවා ගැන අනුත්තරාට දැනුණේ දුකකි.. වේදනාවකි. තමා හැමදාම ජීවත්වූයේ වේදනාව හදවතේ සඟවාගෙන බව අනුත්තරාට කල්පනා විණි. ගැහැණු එහෙමය. සියල්ල හදවතේ සඟවාගෙන රහසේ දුක් විඳිති. ඒ දුකෙහි දිග පළලක් කවම කවදාවත් පිටත ලෝකයා තේරුම් ගන්නේ නැත. ගැහැනියකට සදාකාලිකවම දුක් විඳින්නට සිදුව ඇත්තේ ඒ හේතුව නිසාය.

"ලොකු පුතේ.. මං මේ කියන්න හිටියෙ.."

අනුත්තරා.. හිතේ තිබුණ කතාව වචනවලට පෙරළන්නට ගත්තේ හැමදාම මේ කතාව හිතේම තියාගෙන ඉන්නට බැරි නිසාය.

"මොකක්ද‍ම්මා..?"

"අපි හොඳ දරුවෙක් බලමු..?"

"මොකටද...? හදාගන්නද..?"

ඇය මඳ සිනහා ඇතිව සංතුසීගේ හිස සිප ගත්තාය. අදටත් ඇගේ හිසින් හමා එන්නේ ධම්මගේ හිසින් හමා ආ සුවඳමය.

"දරුවෙක් කිව්වෙ.. ඔයාට හොඳ මහත්තයෙක්.."

"හොඳ මහත්තුරු හොයන එක තමයි වැඩේ.. කොහෙද ඉන්නෙ අම්මා එහෙම මහත්තුරු.."

කෙල්ල කියන්නේ ඇත්තය. අද ඉන්නෙ තරමක් ඉන්නේ හොරුය. ඒත් මේ වැඩේ කල් දාන්නට හොඳ නැත. තමා තනි ගැහැනියකි. කෙල්ලන්ට දෙන්නට ඇවැදි නැත. වයස අඩුවෙන් වුවද.. හොඳ තැනකට දෙන්නට හැකි නම් එය වාසනාවකි.

"මං පුංචි ආච්චිටත් කියන්නම්.. බැලුවම මොකද.. කාලෙ යනවා තේරෙන්නෙම නෑ.."

"අම්මා ඉංග්‍රීසි පන්ති නැවැත්තුව හින්දා.. කරන්න වැඩක් නැතිව ගියාම ඔළුවට ඔය විකාර එනවා.."

"මේවා විකාර නෙමෙයි පුතේ.."

දරුවාට මේවා මේ පාන්දර පහදා දිය නොහැක. 'අනේ එයාගෙ හිතට හරියන හොඳ පුතෙක් හම්බවෙනවා නම්..' විසි



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/



එක විසි දෙක හොඳ වයසයි.. විසි පහ පහුවූ විට තිහ පහුවෙනවා දැනෙන්නේවත් නැත.

"එහෙම නම් ඉතිං තමුන්ට ගැළපෙන කෙනෙක් හොයා ගන්නට වැරැද්දක් නෑ.."

**"නියත විවරණ ලැබෙන තුරු..**
**පමා වුණෙම් මවි තුම්යනි..."**

සංතුසී රහ දක්වමින් හිස් කළ තේ කෝප්පය අනුත්තරා අත තැබුවාය. ඩිනලි ඔළුව උස්සා බලා නැවත නිදාගන්නට ඇඳුණ කොට්ටයේ ඔබා ගත්තාය.

"මහ්.. මහ්.. පොඩි උන්නාන්සෙ නැගිට්ටිනවා.. මාත් එක්ක ගන්න.. පරක්කු වෙන්න බෑ.."

සංතුසී ඩිනලිගේ පස්සට දෙකක් ගසා.. තුවායත් රැගෙන කාමරයෙන් පිට වූවාය.

"එයාට මොකක්දෝ පිස්සුවක් හැදිලා.."

ඩිනලි එසේ කියමින් ඇඳ උඩට නැග විදුලි පහන නිවා දමා යළිත් ඇඳේ වකුටු වූවාය.

✹ ✹ ✹ ✹ ✹ ✹ ✹

"මම බොරුවට මෙහෙ ඉන්නෙ ආන්ටි.. සංකේත්යියා.. අර විතු අඳින කෙල්ලත් එක්ක එෆෙයාර් එකක් තියෙනවා.."

භුවනි කුස්සියට අවුත් කීවාය. මුදිතා උන්නේ සංකේත්ට තේ හදමිනි.

"එෆෙයාර් එකක් තියෙනවා..?"

"ඔව්.."

"පුතා මට එහෙම එකක් කියලා නැනේ.."

මුදිතාට යම් කිසි අස්වැසිල්ලක් දැනුණි. කවුරුන් හෝ කමක් නැත. පුතා තමන්ට නොගැළපෙන කෙල්ලකට කරගහන්නේ නැත. එහෙත් දැන් තමා හෙලන්ට උත්තර බඳින්නේ කෙසේද..?

"ඕවා කිය කියා කරනවාද ආන්ටී.. ඔය සයිලන්ස් පුසෝ තමයි ඩබල් ගේම් ගහන්නෙ.."

"ඊයේ ගියේ ඒ චිත්‍ර ප්‍රදර්ශනේ බලන්නද..?"

"ඔව්.."

"ඕයා කොහොමද කියන්නෙ හුවනි.. අර චිත්‍රයක් ඇඳ ළඟම ගහගෙන ඕක දිහා බලා ඉන්නවා නම් මම දැකලා තියෙනවා.. සංතුසී කියන්නෙ ඒ ළමයටද..?"

"මිහ්.. සංතුසී තමයි.."

ඒ නම හුරුබුහුටි නමකි. සංතුසී. ඒ නම ගැන කොහේ හෝ මතකයක් තිබේ. යෙහෙළියකගේ දුවක්ද..?

"සංකේත් චිත්‍රවලට ආසයිනේ.. අඳින්න බැරි වුණාට.. පුදුම ආසාවක්.. ඒ කාලෙන් එහෙමයි.."

"ආන්ටී එන්න බඩුවක් පෙන්නන්න.."

හුවනි තම කාමරයට මුදිතාව රැගෙන ආවාය. අල්මාරියේ



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/



තබා තිබුණ චිත්‍රය එළියට ගත්තේය. මුදිතාට තම දැස් අදහාගත නොහැකි විය. මේ.. මේ තම පුතාද නැත්නම්.. මියගිය තම සහෝදරයාද..?

"ආන්ටී අඬන්නෙ ඇයි..?"

මුදිතා තම දෑසේ රැඳි කඳුළු බිංදුව පිසගන්නට වෙර දැරුවේ නැත. තම ආදරණීය සහෝදරයා අකාලයේ මියගිය හැටි ඕ සිහිපත් කළාය. මේ ඔහුගේ තරුණ රුවක්.. තම පුතුගේ රුවත් සංකලනය වූ අපූරුතම නිර්මාණයකි.

"මං අහන්නම්කො.."

"අහලා..? මං යනවාන්ටී කොළඹ.. මට මම් එනකං තනියම ඉන්න පුළුවන්.."

මුදිතාට දැන් සියල්ල පැටලී ඇත. හෙලන් හුවනීව මෙහි ගෙනත් දමා රට ගියේ හේතු කිහිපයක්ද ඇතිවය. එකක් හුවනිගේ ආරක්ෂවයි. අනෙක හුවනීත් සංකේතුත් අතරේ ප්‍රේම සම්බන්ධයක් ඇති කිරීමේ බලාපොරොත්තුවෙනි. මුදිතා තුළත් ඒ බලාපොරොත්තුව තිබුණි. එහෙත් මේ කොල්ලා හුවනි දෙස එවැනි හැඟීමකින් බලන්නේවත් නැත.

"හුවනිට මේක ඕනද..? අනේ මට දෙන්න.."

"හැබැයි සංකේත්ට පෙන්වන්න එපා.."

"නෑ.. නෑ.. එයාට පෙන්නන්නෙ නෑ.."

මුදිතා චිත්‍රය රැගෙන තම කාමරයට ගියේ හඬමිනි. පපුවේ වේදනාව අලුතෙන් දැනෙන්. සංතුසී.. මේ දරුවා මේ චිත්‍රය නිර්මාණය කළේ කෙසේද..? අද තම සහෝදරයා උන්නා නම් පුතාට ආදරණීය පුංචි මාමාය. පුංචි මාමා ගැන ඔහුගේ මතකය කොමෙන් කොමෙන් ඉවත්වී ඇතැයි ඇයට සිතුණි.

තම දෙමව්පියන් මොන තරම් ආඩම්බර පුහු මාන්නක්කාරයෙන් ඔළුව උදුම්මා ගත් මිනිසුන්දැයි මුදිතා කල්පනා කළාය. ඔවුන් පුංචි මල්ලිට සමාව දුන්නා නම් අදටත්.. ඔහු ජීවතුන් අතරය. ඒ අතීතය වඩාත්ම කටුකය. සංතුසී.. ඒ අසාමාන්‍ය චිත්‍ර ශිල්පිනිය තම අතීතය අවදි කළාය. ඇයත් තම පුතුත් අතරේ සම්බන්ධයක් තිබේද..?

"ආන්ටි ඉම්ඩියට් ඇක්ෂන් එකක් ගන්න.. නැත්තං මං යනවා.."

කුමක් කියන්නද කියා මුදිතාට තේරෙන්නේ නැත. මේ ගැන සංකේත් සමග කතා කළ යුතුය. සැමියාට මේවායේ ගණනක් නැත.

"අනේ භුවනි.. මාත් මේ වෙලාවෙ හරි අසරණයි දුව.. පුංචි ළමයෙක් නම් ගුටියක් දීලා හදනවා.."

"මටත් ප්‍රපෝසල් ඕන තරම් එනවා.."

"නැතුව.. නැතුව.. මේ වගේ ඇහැට කණට පේන කෙල්ලෙකුට ප්‍රපෝසල් නැත්තෙ මොන රටේද..? ඔයා බලන්න දුව සංකේත්ගෙ හිත නම්මගන්න.. ඒක කරන්න පුළුවන් ඔයාට.. මට නෙමේ.."





මුදිතා ඒ ටික කියුවේ තරමක් නොමනාපයෙන් යැයි ඇයටම සිතේ. ඇත්තට මේ දරුවා පිළිවෙලක් වෙන්නේ කවදාද..?

* * * * * * *

"උඹ කොහේද ඉන්නෙ..? සයිට් එකේ නෙමෙයිද..?"

සංකේත් කතා කරන්නේ පංකජ සමගය. දැන් පැය දෙකක් තිස්සේ ඔහුගේ දුරකථනය ක්‍රියා විරහිතය.

"ආ මචං.. නෑ දැන් නම් සයිට් එකේ නෙමෙයි.."

"එහෙනම්..?"

"පන්සලේ මචං.."

මිතුරාගේ එම හඬේ තිබුණේ වරදක් කර අහුවුණා වැනි හැඟීමක් යයි සංකේත්ට සිතුණි.

"පන්සලේ.. මහණ වෙන්නද..?"

"නෑ මචං.. අර ළමයා අදවත් එයිද බලන්න.."

"කවුද උඹේ අර මොන්ටිසෝරි ටීචර්ද..?"

"තියන්නම් මචං.. එයා එනවා.."

පංකජ් කලබලයේ ඇමතුම විසන්ධි කළේය. ඒ සමඟ මුදිතා සංකේත්ගේ කාමරයට ආවාය.

"පුතා.. අද මොනවද කරන්නෙ..?"

"අද ගෙදර.."



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

"ආ ඒක හොඳයි.. මේ ගෙදර පාලුවෙන් පිරිලා.."

"ඇයි අර භුවනි ගෙනත් තියාගෙන ඉන්නෙ අම්මගෙ පාලු මකන්න නෙමෙයිද..? එයා ඒ ඩියුටිය හරියට කරන්නෙ නැද්ද..?"

මුදිතා සිනාසී ඇඳෙහි වාඩි වුණාය. කාමරය හැම තැනම චිත්‍ර ගසාගෙනය. මේ කාරණාව කතා කරන්නට මීට වඩා හොඳ වෙලාවක් එන්නේත් නැත.

"මේ චිත්‍ර හරිම ලස්සනයිනේ.. ඔයා මට අඩ ගැහුවෙ නැනෙ ඔය එක්සිබිෂන් එක බලන්න යන්න.."

"අම්මා ඉතින් චිත්‍ර ඉන්ටරෙස්ට් නැනේ.. මල් වැවිල්ලයි, කුකරි වැඩයි මිස.."

"ඒවත් ඉතින් තියෙන්න එපායැ.. ඇත්තට මට ආසයි ඔය චිත්‍ර අඳින ළමයා දකින්න.."

සංකේත්ට සියල්ල පැහැදිලි විය. 'අර විස බෝම්බෙ අම්මගෙ ඔළුවටත් අයිඩියා එක දාලා.. දෙයියනේ මං ඔය සංතුෂී කියන කෙල්ල දැකලවත් නෑ.. ඒක කොහොම කියලා දෙන්නද..?'

"මං අම්මට එයාව මුණ ගස්වන්නම්.."

මුදිතාගේ දෑස් උඩ ඉන්දිනි. 'මේ ළමයා ඔක්කොම හංගගෙන ඉඳලා.. එහෙම දෙයක් තියෙනව නම් කියන්න එපායැ..'

"කවදද..?"

"මාත් තාම දැකලා නෑ.."





"දැකලා නෑ.. එහෙනම් කීවෙ මුණ ගස්සන්නම් කියලා.. විහිලු කරනවද..?"

"විහිලු නෙමේ.. මටත් තියෙනවා එයාට කියලා චිත්‍රයක් අන්දගන්න.. ඒ ළමයගෙ ෆෝන් නම්බර් එකක්වත් නෑ.. මේ භුවනිගෙ කරදරේ හින්දා එක්සිබිෂන් එකට ගිය වෙලාවෙත්.. ඒ ළමයව මීට් වෙන්න බැරිව ගියා.."

"එහෙමද..?"

මුදිතා සුසුමක් හෙලුවාය. භුවනි කියා ඇත්තේ බොරුවක් බව විශ්වාස කරන්නත් නොහැක. එසේ නම් ඒ ළමයා පුතාගේ රුව සිතුවමට නගන්නේ කෙසේද..? හරියට ළඟ තියාගෙන ඇන්දා වගේනෙ..

"පුතා.. ඔය පන්නිපිටියෙ පැත්තේ යනකොට පන්සල් එහෙම ගියාද..?"

සංකේත් ගැස්සිණි. 'අම්මා කොහොමද ඒවා දන්නෙ..? ඒවා.. වා.. වා.. වැඩේ ලීක් වුණේ කොහොමද..?'

"අම්මට භුවනි මොනවත් කීවද..?"

"නෑ.. ඒ දරුවා ඊයෙ ආව වෙලාවෙ ඉඳලම නිදි.. අප්සට් එකක් වගේ ඉන්නෙ.."

"එහෙනම් පංකජ් කතා කරාද..?"

"නෑ පුතා.. ඇයි මං ඇහුවෙ පන්සල් ගියාද කියලා.."

"ඔව්.. මේ වැඩේ පටන් ගන්න ඉස්සර පන්නිපිටියෙ දෙවිරම්



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

විහාරෙට ගිහින් භාරයක් වෙන්න කියලා හැමෝම කිව්වා.. ඉතිං ගියා.."

ඒ කතාව ඇත්ත විය යුතුය. දැන් මෙයත් එහාට මෙහාට කරකව කරකවා බොරු කියන්න පුරුදු වෙලා.

"ඒ පන්සල හරි ලස්සනයිලු නේද..? මං අහලා තියෙනවා.."

"දවසක අම්මව එක්ක යන්නම්.. එතනම චූටි ගෙයක් තියෙනවා.. ඒක රෙපෙයාර් කරලා ගන්න ඕන..."

"මට නම් ඔය කොහෙ හරි ඉන්න බැරියැ.. මාත් ආසයි වැඩ කෙරෙන දිහා බලන්නත්.."

"මං අම්මා එක්ක යන්නම්කො.."

මුදිතා කාමරයෙන් පිටවී ආවාය. පුතා සංතුෂ්ට දැක නැතත් සංතුසි කියන දැරිවිය පුතා දැක ඇත. නොඑසේ නම් තම මලණුවන්ගේ ඡායාරූපයක් හෝ දැක ඇත. වහාම එම දැරිවිය මුණ ගැසිය යුතුය. තම දෙමව්පියන් අතින් ගෙවා නිම කළ නොහැකි පාපයක් කර ඇත. මල්ලිගේ ලෙයින් උපන් දරු දෙදෙනෙකුන් අරගෙන ඒ අසරණිය පාරක් පාරක් ගානේ ඇවිද්දාදැයි දන්නේ නැත. ඇය ගැන ඉන්පසු කිසිවෙක් සොයා බැලූවේත් නැත. අයිතීන් ඉල්ලාගෙන ඇය පැමිණියේත් නැත. පව්.. මොන තරම් බේදවාචකයක්ද..? සැබෑ ආදරයකින් බැඳුණු දෙදෙනෙක් වෙන් කරන්නට නොහැකිය. මරණයෙන්වත් එවැනි ආදරයක් නිමාවන්නේ නැත. පුතාත් කවදා හෝ මල්ලි මෙන්ම නොමියෙන ආදරයකින් බැඳෙනු ඇත. ඔහු මේ තරම් පමා වන්නේ ඒ ආදරය එනතුරුය. එයට විකල්පයක් ලෙස භුවනී





පවත්වාගෙන තමා කරනුයේ මෝඩකමක් වග මුදිතා තේරුම් ගත්තාය.

* * * * * * *

මාස දෙක තුනක් ගෙවී ගියද සංකේත්ට පන්සල ළඟදී දුටු යුවතිය අතරමඟකදීවත් මුණ ගැසුණේ නැත. නිතර නිතර දෙවරම විහාරයට යාම ඔහු පුරුද්දක් කරගත්තේ ඇය ඒ පන්සලේ කොහේදී හෝ හමුවනු ඇතැයි සිතාය. නමුත් ඇය හමුවූයේ නැත. ඒ රූපය තමාගේ හිතේ ඇඳි රූපයක් පමණක් වනු ඇද්ද..? තවම කවදාවත් ඇය මුණ නොගැසෙනු ඇද්ද..?

"උඹ දුකින් නේද මචං..?"

පංකජ් විමසුවේය.

"මගෙ මුළු ජීවිතේම පාලු වෙලා යයි මචං.. මට ඒ කෙල්ල [illegible] වුණේ නෑනේ කවදාවත්.."

'දැන් ඉතින් මොනවා කරන්නද..? රාජ් කුමාරයාට හිත ගියේ සින්ඩරෙල්ලාටය. ඔහු ඇගේ සපත්තුව ගෙන ගෙයක් ගෙයක් ගානේ රාජපුරුෂයින් යවා ඒ සපත්තුවේ අයිතිකාරිය වූ ඇය සොයා ගත්තේය. ඒ විදිහට මුව අරන් කෙල්ලො ඉන්න ගෙයක් ගෙයක් ගානෙ යන්නද ඉතින්..?'

"මං නිකමට ගීතාගෙන් අහල බලන්නද..?"

"උඹට ඒකි මීට් වෙනවද..?"



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

"පන්සලට නම් දෙතුන් වතාවක් ආවා.. බෝධි පූජා තියන්න.."

"උඹ එහෙනම් ගීතා නගා බලන්න පන්සල ගාඩ් කරන්න ඇති.. ඒකිට සෙවලයා වාගෙ කෙල හලාගෙන ඉන්න ඇති.."

"මං ගීතාට කිව්වා වෙච්ච දේ.."

"ආ.. එහෙනම් මට කඩේ යන ගමන් උඹ බඩු ගත්තා.. දාපං අත.."

"පිස්සුද බං.. ඒකි හරි ෆ්‍රෙන්ඩ්ලි.. ටීචර්නේ.. මුලින් ටිකක් ලැජ්ජයි.. පස්සෙ හොඳට කතා කරා.."

පංකජ තමාට වඩා දුර යන වග සංකේත් දැන උන්නේය. 'එහෙත් කෙල්ලො.. මෙහෙත් කෙල්ලෝ.. මේ හැල ගෙම්බගෙ මොනවට කෙල්ලො මේ තරම් වශී වෙනවද දන්නෑ..'

"එයා කවදාවත් හම්බවෙන එකක් නැතිවෙයි.."

සංකේත්ට කියැවිණි. ඒ කියැවුණේ හදවත පතුලේ සැඟවුණ සත්‍ය වග පංකජ වටහා ගත්තේය. මිතුරාව මේ මානසික ව්‍යාධියෙන් බේරා ගැනීමට නම් ඔහුගේ සිත වෙනතකට යොමු කළ යුතුය. නිමාවීගෙන එන ගොඩනැගිල්ල ගැන ඔහුට වගේ වගක් නැත. කැමක් බීමක් හරියට ගන්නේ ද නැත. මේ දුෂ්කර ක්‍රියාව තව කොපමණ කාලයක් අරගෙන යන්නද..?

"අර සංතුසී ගැන ආරංචියක් නෑ නේද..? අපේ අම්මත් සංතුසීව හම්බවෙන්න ඕන කියලා කියනවා.."





"මං බැලුවා.. පාස් එක ළඟත් නෑ.. කොහේ ඉන්නවද කියලා කවුද දන්නෙ.. ඒත් මචං.. අම්මා මොකටද ඒ කෙල්ල හම්බවෙන්න ඕන කියන්නෙ.."

"ඇයි අර මළ වාගෙ ගිහින් කියලනේ සංතුසිගෙයි මගෙයි එෆෙයාර් එකක් තියෙනවා කියලා.. අපේ අම්මට මට වඩා විශ්වාසයි භුවනිව.."

මිතුරා කරදර ගොඩක පැටලී ඇත. භුවනි තාම ඉන්නේ මාතලේ ගෙදරය. යනවා යනවා කියමින් සංකේත්ගේ ආදරය බලාපොරොත්තුවෙන් ඇය තවම එහි ඉඳියි. එහෙත් භුවනි ආදරය කරන්නේ සංකේත්ගේ සල්ලිවලටය. කොළඹ ඔවුනට ඇති අක්කමක් නැති වග පංකජ් දැන ගත්තේය.

"දැන් අම්මා මොකද කියන්නෙ උඹට..?"

"අම්මා මගේ බලාගෙන ඉන්නවා.. අම්මගෙ හිතේ මොකක්දෝ ලොකු පසුතැවීමක් දුකක් වගේ දෙයක් තියෙනවා.. ඒක මට පේනවා.."

"ආන්ටි උඹ ගැන හිතනවා.."

"අම්මා හිතන්නෙ මගෙ මැරේජ් එක ගැන නම් අම්මා දන්නවා මම බඳින්නෙ භුවනි නෙවෙයි කියන එක.."

"එහෙම නම් භුවනි මොකද තවත් තියාගෙන ඉන්නෙ.?"

"එයා යන්නෙ නෑ මචං.. හෙලන් ආන්ටි එනකං ඉන්නවා.. ඒත් අම්මා අද උදෙත් කීවා සංතුසීව හොයලා මීට් කරවන්න කියලා.."



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

ඇය සංතුෂී සොයන්නේ ඇයි..? මිතුරා ඔය කියන කෙල්ල දැක නැති වග පංකජට විශ්වාසය. සංතුසීව යාන්තමට හෝ දැක්කේ තමාය. නමුත් මිතුරා මේ පණ දාගෙන සොයන්නේ පන්සල ළඟ දුටු කෙල්ල පමණි. ඉන් එහාට දිව්‍යාංගනාවක පෙන්වුවද මිතුරා ඊට කැමති නොවනු ඇත. මුදිතාන්ටි සංතුෂී සොයන්නේ කුමන කාරණයකටද..? ඇයත් සංකේත් නිසා දුක් විදියි. සංකේත් කියන්නේ අම්මාගේ සිතේ වෙන යම් දුකක් කැකෑරෙන වගයි.

"මචං දෛවය කියලා දේකුත් තියෙනවනේ.. කොහොම් හරි කැරකිලා ඒ කෙල්ල උඹටම හම්බවෙයි.."

"නිකං සුරංගනා කතා නොකියා හිටපං.."

"උඹමනෙ පන්සල ළඟ හොල්මනක් දැකලා සුරංගනා කතාවක් ගෙතුවේ.. ඒකෙන් වුණේ මාව අමාරුවේ වැටුණු එක.."

"ඒ කොහොමද ඒකෙන් උඹ අමාරුවෙ වැටුණේ..?"

"මං ඒක උඹට පස්සෙ කියන්නම් පහදලා.. මිහ්.. මං යනවා සයිට් එකට.. උඹත් වරෙං.. අර ගේ පොඩ්ඩක් රෙපෙයාර් කරලා තියෙන්නෙ.."

සංකේත්ට දැඩි දුකක් දැනිණි. ඒ මිනිසුන් කොහේ ගියාදැයි දන්නේ නැත. ඒ මිනිසුන් ගිය දිහාවක් ගුණසිංහ අංකල්වත් දැන උන්නේ නැත. තමා පව්කාරකමක් කරගත්තා යැයි ඔහුට නිකමට සිතුණි. ඒ ඉංග්‍රීසි ඊවගේ රුව නම්.. පෙර ආත්මයකදී හෝ දැක ඇති රුවකි.





"උඹ දැන් මොනවද කරන්නෙ..?"

"මං ටිකක් නිදාගන්නවා.."

"හීන බලන්න වෙන්නැති.."

"හැබැහින් ඔබ මට නොලැබේ නම්......"

සංකේත් තාලයට ගැයුවේය. පංකජ ගොඩනැගිල්ල හදන තැනට පිටවී ගියේ සෑහෙන වැඩ කොටසක් තවමත් ඉතුරුව ඇති බැවිනි.

* * * * * * *

මුදිතා කොළඹ ආවේ තනිවමය. කොළඹට අවුදින් ඇය සංකේත්ට කතා කළාය.

"අපරාදෙ.. අම්මට මාත් එක්කම එන්න තිබුණා.. ඇයි මේ හදිස්සියෙ..?"

සංකේත් විමසුවේ කොටුවේ දුම්රිය ස්ථානයෙන් අම්මාව ගෙදරයට නංග්ගා ගන්නා ගමන්ය.

"මම මැරෙන්න ඉස්සර මට යුතුකමක් ඉෂ්ට කරන්න තියෙනවා.."

සංකේත්ගේ හදවත කලබල විය. අම්මා ළඟකදී සිට කියන්නේ මෙවැනි කතාය. තමා විවාහ නොවන එක ගැන අම්මා දුක්වෙයි. යෝජනා කීපයක්ම ආවත් තමා ඒවා ප්‍රතික්ෂේප කළේ ඒ එකම කෙල්ලක සමඟවත් විවාහ ජීවිතයක් ගෙවන්නට තමාට නොහැකි නිසාය. නමුත් අම්මා දුක්වන්නේ එනිසාය. අම්මා භුවනිව



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

ගෙදර නවත්වා ගත්තේ ද තමාට කෙල්ලක ගැන ආසාවක් ඇතිවෙනු ඇතැයි සිතා වන්නට පිළිවන.

"ඒ මොකක්ද අම්මා.. ලෙහකදී ඉඳලා මැරෙන කතාමයිනෙ කියන්නෙ.."

"අපි කවුරුත් මැරෙනවා.. ඒ දැන දැනමයි මේ ආසා පොදි බඳින්නෙ.."

සංකේත්ට යම් පසුතැවිල්ලක් ඇතිවිය. අම්මාට අවශ්‍ය තමා ධනවත් ව්‍යාපාරිකයෙකු කිරීම නොව යහපත් මිනිසෙක් කිරීමටය. නමුත් තාත්තාගේ අරමුණ අම්මාගේ අරමුණට වඩා සංකීර්ණය. සංකේත් හැමදාම දුක් වින්දේ මේ පැටලැවිලි මධ්‍යයේය. දෙදෙනාම එකම කාරණයකදී එකඟය. ඒ භුවනි සමඟ විවාහයයි. නමුත් තමා භුවනිට කැමති නැති වග කෙතරම් ඇයට පවසා ඇද්ද..? නමුත් ඇයද එය තේරුම් ගත්තේ නැත.

The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

"අම්මා.. සයිට් එකේ පොඩි ගෙයක් තියෙනවා.. රෙපයාර් කරලා තියෙන්නෙ.. අම්මට ඒකෙ ඉන්නත් පුළුවන්.. මං හවස දෙව්රම් විහාරෙට එක්ක යන්නම්.."

"මට ඕන වුණේ අර සංතුසී කියන ළමයා හොයාගන්න.."

"අපි දන්නැනෙ අම්මෙ.. ඉන්න තැනක්.."

"ඒ ළමයා චිත්‍ර ප්‍රදර්ශනේ තිබ්බෙ කලාභවනෙනේ.. එතන හෝල් බුක් කරනකොට එඩ්‍රස් එකක් දීලා ඇති.."

"මට ඕක කල්පනා වුණේ නැනේ අම්මා.."





සංකේත්ට නිකම්ම කියැවුණි. එහෙත් අම්මා සංතුසීව හොයන්නේ ඇයි කියන පැනයට නම් ඔහුට පිළිතුරක් තිබුණේ නැත.

"අම්මා අර භුවනි කිව්ව ගොං කතාව විශ්වාස කළා.."

"මොන ගොං කතාවද..?"

"මායි සංතුසියි යාලුයි කියල.. මං ඔය කෙල්ල දැකලවත් නෑ.."

"නෑ පුතේ.. ඒකට නෙමේ.. මට වෙන කාරණේකට ඒ ළමයා හම්බවෙන්න ඕන.."

කාරණාව කුමක්දැයි කිවයුතු නම් අම්මා කියනු ඇත. ඉන්පසු ඔහු නිහඬවම කලාභවනට රථය පැදවූයේය. එතන කාර්ය මණ්ඩලයට ඇය හමුවීමට අවශ්‍ය බව කී විට ඇගේ ලිපිනය ලබා ගත හැකිවිය.

"මේ.. පන්නිපිටියෙම ළමයෙක්නෙ.. මේ තියෙන්නෙ අංක 10, පන්සල පටුමග.. හයිලෙවල් පාර, පන්නිපිටියෙ කියලා.."

අම්මා ලියා ගත් ලිපිනය සංකේත්ට දුන්නාය. ඔහුට උතුර දකුණ මාරු නොවුණා පමණි. 'මේ තමා ගොඩනැගිල්ල ඉදි කරන තැන ලිපිනයයි. මේක වෙන්න බෑ..'

"ඇයි පුතා පුදුමෙන් වගේ.. ඔයා දන්නවද..?"

"නෑම්මා.. මේ.. මේ.. අපි ගන්න තැන එඩ්‍රස් එකනේ.."

"අර චූටි ගේක කුලියට මිනිස්සු වගයක් හිටියා නීවා නේද..? අපි චූට්ටක් අවටින් අහල බලමු.."

සංකේත්ගේ හිත කකියැවේය. සංතුසි යනු අර ඉංග්‍රීසි ටීචර්ගේ දියණියද..? අර එදා තමාට රසට රස තේ එකක් සාදා දුන්නේ සංතුසිද..? මෙය නම් මහා පුදුමයකි. තමා උන් හිටි තැන් අහිමි කළේ ඒ ප්‍රතිභා පූර්ණ කලාශිල්පිණියටද..? අර පුංචි කෙට්ටු කෙලි පොඩ්ඩටද..? ඒ බව අම්මාට කිව යුතු නැත. එහෙත් තමා.. මුළු සැලසුමම වෙනස් කර ඒ ගෙය ඉතුරු කළේ ඔවුන් වෙනුවෙනි. ඔවුන් ගිය දිහාවක් කිසිවෙක් දැන උන්නේ නැත. පංකජ කොච්චර හෙව්වාද..?

"අනේ පුතා.. මට ඒ ළමයා මුණ ගස්සන්න..."

"බලමු අම්මෙ.. අද හවස ඉඳලා හොයන්නම්.. ඒත් මට හිතාගන්න බැරි අම්මා මොකටද ඒ ගෑනු ළමයා හොයන්නෙ කියලා.."

"ඒක පුතාට අදාළ නෑ.."

"අම්..මේ..න්.. එහෙනම් කමක් නෑ.. මං හිතුවා ඒ කෙල්ල හොයලා මට කසාද බන්දලවත් දෙන්නද කියලා.."

මුදිතා මඳ සිනා ඇතිව පුතු දෙස බැලුවාය. ඔහු හොඳ නිරෝගී ශක්තිමත් තරුණයෙකි. මේ තරුණ ජීවිතයට ආශාවන් නැතැයි කිව හැකිද..? තාත්තා කියන්නා වාගේ කොහේ හරි යන බැඳපු ගැනියෙකුටවත් අහුවුණොත් ගලවා ගන්න අමාරුයි.. එහෙම කොල්ලො ඕන තරම් නාස්තිවෙලා තියෙනවා..





සංකේත් වැටුණේ හරි අමාරුවකය. සංතුසි සොයා ගන්නේ කොහොමද..? ඒ වැඩෙත් පංකජට තමයි බාර දෙන්න ඕන.. ඒකෙන් සිද්ධ වෙන්නෙ අර ගීත නගා අමාරුවෙ වැටෙන එක.

* * * * * * *

සංකේත් බැංකුවට ගියේ මිතුරු කළමණාකරු හමුවී ණය මුදලේ ඊළඟ පියවර ගැන කතා කර ගැනීමටයි. ඔහු බැංකුවට ඇතුළු වී කළමණාකරු සමග කතා කරමින් සිටියදීම ඇය ඇතුළුවේය. ගිය කාරණාව පසෙක තැබූ ඔහු කලබල වී ඇය පසුපස දිව්වේය:

"සංකේත් ඇයි..?"

"නෑ චරිත්.. මං අඳුරන ළමයෙක්.. ටක් ගාලා හම්බවෙලා එන්නම්.."

බැංකුවෙන් පිටතට පැමිණි යුවතිය බස් හෝල්ට් එකෙන් ක්ෂණිකව බස් රියක නැගුණාය. සංකේත් වහා සිය රිය පණ ගන්වා බස් රිය පිටුපසින් පදවන්නට විය. 'යනවා යනවා ඉවරයක් නෑ.. මේ කෙල්ල බහින්නෙත් නෑ.. මේ පාර නම් ඉවර්.. මේ පන්සල ළඟ දැක්ක කෙල්ලම තමයි..'

සංතුසි බැංකුවට ගියේ අම්මාගේ රන් තැල්ල බේරා ගැනීමටය. ඒ සඳහා ප්‍රමාණවත් ආදායමක් ඇයට ලැබී තිබුණි. බැංකුවෙන් එළියට එනවාත් සමඟම යම් පුද්ගලයෙක් තමා පසුපස එනු දුටු ඇය වහා බසයට නැගුණාය. ගැට කපන්නන් බහුල මේ සමයෙහි ඇයට බියක් නොදැනුණා නොවේ. පුද්ගලයා කවුදැයි හැරීවත් නොබලාම ඇය බස් රියට ගොඩවුවාය.

රබර් වත්ත හංදියට බස් රිය ළඟා වීමට පැය එක හමාරකට වඩා ගතවිය. හංදියෙන් බැස රබර් වත්තට හැරෙන්නට බස් රිය ගිය අතටම මීටර් පනහක් පමණ ඇවිද යා යුතුය. තමා ඉදිරියට ගිය කාරයක් නැවැත්වූ හැටි දුටු ඇයට බියක් සිතුණි. එහෙත් ඉන් බැස්ස පුද්ගලයා දුටු විට සංතුසීගේ පපුව වේගයෙන් ගැහෙන්නට විය. ගැහැනු ළමයා බියපත් වූ බව සංකේත් වටහා ගත්තේය.

"බබා.. බයවෙන්න එපා.."

ඔහු කතා කළ ආකාරයට සංතුසීගේ බිය තුරන් විය. බැංකුවේ සිට තමා පසුපස ආවේ ඔහු බව ඇයට තේරුම් ගත්තාය. වහාම ඔහුව මගහැර දුවන්නට ඇය සැරසුණාය.

"ළමයෝ.. මට ඔයත් එක්ක ටිකක් කතා කරන්න ඕන.. මම හුඟ කාලයක් තිස්සෙ ඔයාව හොයනවා.."

ඔහු තමාව සොයන්නේ කුමකටද..? ඔහුගේ සිතුවම ඇඳි බව දැනගෙන විය යුතුය. එය මිලට ගන්නට ඇත්තේ ඔහුගේ පෙම්වතිය විය යුතුය. තමා මේ කොල්ලා දුටු මොහොතේ පටන් ඔහුට හිතින් කොපමණ ආදරය කළාද..? ඒ ආදරය හදවතේ තවමත් පිරී පවතී. සංතුසීට ඉකි ගැසුණි. ඇගේ කඳුළු පිරුණු රෝස පැහැ මුහුණ දුටු සංකේත්ගේ පපුව හිරවුණි. ආදරය.. ඇත්තටම මේ ආදරයමයි.

"මගෙ නම සංකේත්.. මම මාතලේ.."

ඇය හා ඇගේ වේගයට ඇවිදින ගමන් සංකේත් කියුවේය. ඔහුගේ රුව මෙන්ම හඬ ද තමාට පුරුදුය. එහෙත් වචනයක්





බිව නොහැකි ලෙස ඇගේ උගුර හිරවී තිබිණි. මෙය සිහිනයක්ද..? තමා සිහිනින් ආදරය කළ මේ ආදරණීය යෞවනයාට නම ආදරය දැනුණේ කෙසේද..?

"මම ඔයාව දැක්කා බබා.. දෙව්රම් විහාරෙදි.. ඒ දැක්කදා ඉඳලා.. මම ඔයාව හොයනවා.. අද අහම්බෙන් දැක්කෙ.."

මෙය ඇයට ඇදහිය නොහැක. තමා ඔහුව දුටුවේත් දෙව්රම් විහාරයේදීය. එහෙත් ඔහුගේ පෙම්වතිය..

"ඔයා කොහෙද ඉන්නෙ.. කතා කරන්නකො.. බබා.. කතා කරන්න බැරිද..?"

සංකේත්ගේ ඉවසීමේ සීමාව ඉක්ම ගොසිනි. ඇය කතා නොකරයි. දෑස කඳුළින් පිරී ඇත. පපුව උස් පහත්වෙයි. කතා කර වැඩක් නොමැති බව පවසන්නට මෙන් හිසම සැලුවාය. ඇගේ අසුර ගලා එයි.

"ඔයාගෙ නම කියන්නකො බබා.."

ඔහු තමා චිත්‍ර ශිල්පිනියක වගවත් තමාගේ නම සංතුසී වගවත් නොදනී. එසේ නම් චිත්‍ර මිලදී ගත්තේ කුමකටද..? බැලූ බැල්මට නම් කොල්ලා අවංක පාටය. තමා මේ කොල්ලාගේ චිත්‍රයක් ඇන්ද බව ඔහු නොදනී.

"නම කියන්නෙ නැද්ද..?"

ඔහු ඇගේ සුදු අතකින් අල්ලා ගත්තේය.

"මට යන්න දෙන්න.."



The Reader 's Place
http://e-pusthakalaya.blogspot.com/

ඇය කටහඬ අවදි කළාය.

"ඒක කරන්න බෑ.. මාත් එක්ක යන්න.."

ඇය හිස සැලුවාය. දෙනෙතින් මේ තරමට කඳුළු ගලන්නේ කාගේ කවුදැයි නොදත් කෙනෙකුට රහසේ ආදරය කළ නිසාය. දැන් ඉතින් තම හදවත හොඳටම තුවාල වී ඇති වග ඇයට දැනෙයි.

"මං පස්සෙන් එන්න එපා.. මට කරදර කරන්න එපා.. මං පොලීසියට කියනවා.."

ඇය තමාව බිය ගන්වන්නට හදන්නේ තමාට කියෙන්ය.

"යං පොලීසියට එහෙනං.."

"පිස්සා.."

"මොකක්ද කිව්වෙ..?"

"අනාරින්න මගෙ අත.. මං කෑගහනවා ඔන්න.."

"ඉතිං කෑගහන්න.. වටේ පිටේ මිනිස්සු එකතුවෙලා මට ගහයි.. මාව හිරේ වැටෙයි රේප් කරන්න හැදුවා කියලා.. ඔයාටයි අඬන්න වෙන්නෙ.."

ඔහු තවම කතා කරන්නේ ඇගේ අත අල්ලාගෙනය. අනාරින පාටක් නැත.

"හරි.. මොකටද මාව හෙව්වෙ..?"



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/



ඔහු ළඟ පුරුදු සුවඳක් දැනෙයි. පුරුදු බවක් දැනෙයි.

"ඔයාට ආදරෙයි කියන්න.."

"පිස්සා.."

"මං පිස්සෙක් වෙලා හිටියෙ ඔයා දැක්ක දා ඉඳන්.. අනාරින්නෙ නම් නෑ.."

සංකේත් තවත් තදින් ඇගේ අත අල්ලා ගත්තේය. ඇගේ මුහුණ සිප ගන්නට සිතෙයි. මේ සුදු නෙළුම සිඹ කිළිටි කරන්නටත් ලෝබ සිතෙයි.

"මං ඔයාව පස්සෙ හම්බවෙන්නම් සංකේත්.."

ඇය මෘදු හඬින් කීවේ ඔහුගෙන් ගැලවීමටය. ඇත්තටම ඔහුගෙන් ඉවත්ව යන්නේ කෙසේද..? ඒ ආදරණීය පපුවට හිස තබාගෙන ආදරය විඳින්නට ඇයට සිත්වෙයි.

"මම ඔයා හොයාගෙන එනවා.. කවදද හම්බවෙන්නෙ.. හෙට.. කොහෙදිද හම්බවෙන්නෙ.. පන්සලට එනවද.. උදේන්ම.."

ප්‍රශ්න අහන්නේත් උත්තර දෙන්නේත් ඔහුය. නමුදු ඔහු තව යුවතියකගේ පෙම්වතෙකි.

"ප්ලීස්.. ප්ලීස්.. දැන් අපේ අයියා එනවා.. ඔයා යන්න.. මට ගුටි කන්න වෙනවා.."

"හෙට එනවද උදේම බබා.."

"හා.."

"නම කියලා යන්න.."

ඔහු ඇගේ අත, අතහැරියේය.

"බබා තමයි.."

එසේ කියූ සංතුසී දහකාර ලෙසින් රබර් වත්ත මැදින් දිව ගියාය. ඇය දිව යන අයුරු ඔහු බලා සිටියේ අපූර්වතම වූ හැඟීමකිනි. ඇය කවුද..? කාගේ කවුද.. කවුරු වුණත් ඇය අහිංසක යැයි ඔහුට සිතුණි. තමා දුටු විට ඇය දෑසේ කඳුළු පුරවා ගත්තාය. ඒ කඳුළු හැඟීම්බරය. 'අනේ බබා.. ඔයා මට නමවත් කීවේ නැනේ..'

* * * * * * *

The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

"ලොකු පුතේ.. මේ මොකද..?"

ඇගේ මුහුණින් තලාවී දියණිය හඬයි. ආ ගමන්ම ඇය බෑංකුවේ තබා තේරා ගත්තා ලද රත් තැල්ල තමා වෙතට දුන්නාය.

"පුතේ.. දැන් ඔහොම්මම නින්ද යයි ඔයාට.. කැකුළු බත් හදලා සම්බෝල හදලා තියෙනවා.. කාලා නිදාගන්න.."

අනුත්තරා කීවාය. කැකුළු බත්, සම්බෝල සමග හාල්මැස්සන් තෙල් දමා තිබිණි. සංතුසී ගෙට ගොඩවන්නේ වෙනදා නම් බඩගිනියි කියමිනි. අද මේ වෙනස කුමක්ද..?

"මහන්සියි අම්මා.."

"ඊ වෙන්ඩ ඉස්සර ළිඳට ගිහින් එන්ඩ.."





"හා.. හා.. වුට්ටක් ඉන්ඩකො.."

අනුත්තරා දරුවාගේ නළලට අත තබා බැලුවාය. යාන්තම් රස්නයක් තිබේ. දරුවාට උණ ගැනීගෙනවත් එනවාද..?

"වතුර ටිකක් උණු කරන්නම් පුතේ.."

"එදවෙන්නෙපාම්මා.."

"ළිපේ ගින්දර.. ඒ උඩින් වතුර මුට්ටියක් තියන එක වදයක්ද..?"

අනුත්තරා කාමරයෙන් පිටව ගියේ එසේ කියාගෙනය. සංතුසී කුමන හෝ හේතුවක් නිසා දුකෙන් සිටිනා වග ඇයට පැහැදිලිය. දුක්වෙන්නට තරම් කාරණා කොපමණ සිදුවුණත් ඇය තමාටත් ධෛර්යය දී හිත හදා ගත්තාය. ඒ දිරිය දියණිය අද මේ තෝන්තුවාවෙන් ඉන්නේ ඇයි..?

සංතුසීට ඇය් අරින්නට සිතුණේම නැත. ඇත්තටම එය නම් පුදුමයෙනුත් පුදුමයකි. හිතේ ජීවත්වූ සිහින කුමාරයා තමා සොයාගෙන අවුදිනි. එහෙත් එය තමාට හිමි සෙනෙහසක් නොවේ. ඔහුට ආදරය කරන්නට තමාට පුළුවන් නමුත් ඔහු තමාට හිමි කර ගැනීමට නොහැකි මහහු සම්පතකි. නමුත්.. ඒ ආදරය වෙනුවෙන් බොහෝ ඉවසීමට ඇයට පුළුවන. තම කුළුඳුල් ආදරය.. මේ වනතුරුත් පුවේශම් කරගෙන උන්නේ අයිතිකාරයාටම දෙන්නටය. දැන් ඉතින් අයිතිකාරයා අවුදිනි. ඔහු කාගේ කවුරුන් වුවද කම් නැත. තමා ආදරය කරන්නේ ඔහුටම වග සංතුසීට තේරුම් ගත්තාය.

"ලොකු පුතේ.."

සංතුසී උණුදිය නාගෙන තුවාය හැඳගෙන කාමරයට යද්දී අනුත්තරා කතා කළාය.

"ඔහොම්ම ගිහින් ඇඳට වැටෙන්න එපා.. මේ බත් බෙදනවා.."

චූටි කාලයේ සිට ආශා කළ බෙලෙක් පිහාතේ රතු මල් වාටිය තවමත් පැහැදිලිය. තැනින් තැන බෙලෙක් පතුරු ගැලවී දුඹුරු පැහැ ගැන්වී ඇත. සුන්දර ළමා වියක මතකයක් නොතිබිණි. අප්පච්චිගේ මරණය තවමත් ඇගේ හිත රිදවයි. ඉන්පසු අම්මාත් තමාත් තනිවූ හැටි.. අම්මා නිදි නැති රැයවල් කීයක් තමා තුරුළු කරගෙන ඉකි ගැසුවාද..? ඒ ආදරය නිසාමය.

කෙමෙන් යොවුන් වියට පත්වෙද්දී තමාට ආදරය කළ යුත්තේ මැණිකක් සේ තමාව රැක ගත්තා අප්පච්චිගේ ගතිගුණ ඇති.. අප්පච්චිගේ රුව ඇති.. සුන්දර ආදරවන්තයෙකු වියයුතු යැයි ඇය නිගමනය කළාය. අද ඇස් ඉදිරිපිට මැවුණේ ඒ රත්තරන් රූපයමය. එදා පන්සලේදී දැක.. සිතුවමට නැඟුවේ ඒ රත්තරන් රුවමය. 'සංකේත්.. මම ඔයාට ආදරෙයි රත්තරනේ..' ඇය සිහින් මිමිණුවාය.

"අනුත්තරා.. මොකද කෙල්ලට..?"

කැතරින් විමසුවාය. අනුත්තරා රෑ මැද කුස්සියේ මොනවා කරන්නේදැයි බලන්නට කැතරින් කුස්සියට පැමිණියාය.





"පුංචි අම්මා නිදාගන්ඩ ගිහින්.. දරුවට හවස ඇඟ රස්නෙ තිබ්බා.. දැන් ගිනි කබල වාගෙ උණ.."

සංතුසී අසනීප වූ අවස්ථාවක් අනුත්තරාටත් මතක නැත.

"පුංචි අම්මෙ.. මට පේන්නෙ දරුවා ලොකු හිතේ අමාරුවකින් ඉන්නවා.."

"අපි අර යෝජනාව ගැන ගිහින් කතා කරමුද..? හොඳ වැදගත් මහත්තයෙක්නෙ.."

"අනේ ඔව් පුංචි අම්මෙ.. මට මේ කෙල්ලගෙන් නිදහස් වෙන්ඩ ඕන.."

අනුත්තරා උතුරන කොත්තමල්ලි මුට්ටිය අස් රෙදිකඩකින් දෙපැත්තෙන් අල්ලා.. ලිපෙන් ඉවතට ගත්තාය. ඉන්පසු ටිකක් නිවෙන්නට හැර කෝප්පයකට පෙරා වත්කර ගත්තාය.

"අපි හෙටම ගිහිල්ලා අහමුද..?"

"ඔව් පුංචි අම්මෙ.. කල් දාන්නෙ මොකටද..?"

මීට ඉහතදී කැතරින් තම යහළු ගුරුවරියකගේ ඥාති පුතුයෙක් වූ ඉංජිනේරුවරයෙකු ගැන කියා තිබේ. පැන්ෂන් පඩි ගන්නට ගිය විටෙකදී අනුලා.. කැතරින්ගෙන් විමසා සිටියේ හොඳ යහපත් ගතිගුණ ඇති ගැහැණු ළමයෙකු පිළිබඳවය. දෑවැදි බලාපොරොත්තු නොවන බව ද ඇය කියා තිබිණි. නමුත් අනුත්තරා ඒ ගැන වැඩි උනන්දුවක් නොවුණේ සංතුසීගේ චිත්‍ර ප්‍රදර්ශනය ඉවර වෙනතුරුය. දැන් ඉතින් ඒක ඉවරය. ඒ

පැත්ත බලා මේ පැත්ත බලන විට ගැහැණු ළමුන්ගේ වයස ගෙවෙයි. 'අනේ ධම්ම හිටිය නම් මට මේ කෙල්ලො දෙන්නා බරක් නෙමෙයි..'

උදෑසන සංකුසී නැගිට ගත්තේ කාර්යාලයට යනවාද පන්සලට යනවාද යන අරමුණක් නොමැතිවය. නමුත් කොහේ යන්නද..? ඇගට වාරු නැත.

"ලොකු පුතේ.. අද ඔපිස් යන්ට බැනෙ.. දැන් පරක්කු වෙලා.. ගිහින් බෙහෙත් ටිකක් ගම්මු.."

"එහෙමට අමාරුවක් නෑම්මා.."

සංකුසී කවදත් බෙහෙත් ගන්නට හොරය. ඇගේ ඕනෑම ලෙඩක් එක කොත්තමල්ලි වීදුරුවෙන් සනීපය.

"එහෙනම් තව කොත්තමල්ලි වීදුරුවක් ගේන්නම්.. මායි පුංචි ආච්චියි පොඩි ගමනක් ගිහින් එන්න කියලා.."

"කොහෙද..?"

"මේ ලෙඩෙක් බලල එන්න.."

"ඒ කොහේද..?"

සංකුසීට හැම විස්තරයක්ම අවශ්‍යය. යන එන හැම තැනම ඇයට කියා යා යුතුය.

"පුංචි ආච්චිගෙ ඒ කාලෙ යාළුවෙක්.. මාලඹෙ පැත්තෙ.. ඔයාගෙ තනියට හේමාලිට ඇවිත් ඉන්න කියන්නම්.."





"මින්නෑ අම්මෙ.. දොර වහන් යන්න.. මට නිදාගන්න ඕන.."

සංකුසී නැවත ඇස් පියා ගත්තාය. ඇයට උවමනා වුණේ නිදානොගෙන සිහින බලන්නටය. ඒ ආදරණීය සිහිනයේ හැසිරෙන්නටය. ඒත් මේ කරුම උණක් අදම හැදුණ හැටි.

සිත නහනම් කලාපයක පියාඹන්නට හදන හැටි සංකුසීට දැනෙයි. තම සිත තමාටම අකීකරුකම් පා මුරණ්ඩු වන හැටි ඇයටම දැනෙයි. සංකේත්.. හරි පුදුමයකි. ඔහු තමා සොයාගෙන ආවේ තමා චිත්‍ර ශිල්පිනියක හෝ සංකුසී බව නොදැනය. ඇ ඔහු පන්සල ළඟ තමා එනතුරු බලා සිටිනවා විය හැක. හිත හදා ගත යුතුය. නහනම් ආදරයක පැටලී නැති ප්‍රශ්න හදා ගත යුතු නැත. ඔහුට ගැළපුණා හෝ නොගැලපුණා හෝ තවත් කෙල්ලෙකුට හින්දරක් දෙන්නටද නොහැකිය.

අම්මා උදේට කන්නට ලැවරියා තම්බා ඇත. ඒ සංකුසීගේ ප්‍රියතම කෑමක් වන හෙයිනි. දවල්ට උයා තියා ගොස් නැත්තේ මළගෙකට ගොස් එන නිසා වන්නට ඇත. ලැවරියා දෙකක් කා තේ උගුරක් බී සංකුසී නැවතත් කාමරයට ආවාය. ජනෙල් කම්බි කූරු අතරින් රබර් වත්තේ සිට නිවසට ඒමට ඇති අඩිපාර දිස්වෙයි. තවම උදෑසන නවයටවත් නැත.

රබර් වත්ත දිගේ මේ පැමිණෙන කාරය කුමක්ද...? 'දෙයියනේ.. එයා මාව හොයාගෙන එනවා.. ඊයෙ දැක්කනෙ.. මට රබර් වත්ත දිගේ දුවගෙන එනවා.. කෙලින්ම තියෙන්නෙ අපේ ගෙදර.. එක පාරටම මාව හොයාගෙන ගෙදරටම එන හැටි..'



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

සංතුසී ඇදේ සිටම උත්සාහ කළේ ජනෙල් පියන්පත් වැසීමටය. ජනේලයක එක කොක්කක් අමාරුවෙන් දමන විට කාරය අඹ ගහ යට නවත්වා හමාරය.

"ඒයි.. තාම නිදිද..?"

ඔහු කාරයේ වීදුරුව පාත් කරමින් ඇසුවාය. ඇය තවම උන්නේ රෑ ගවුම පිටිනි. කෙස් අවුල්වී ඇත. ඇඳුමක් මාරු කරගන්නටද නැගිටගන්නට නොහැකි තරම් අමාරුය. ඇය මේ සැරසුණේ පැනඩෝල් පෙත්තක් බී නිදාගන්නටය.

ඇය ඇදේ එලෙසම වාඩිවූවාය. දුහුලු රෑ ඇඳුමේ පටි කඩා හැලී තිබුණි. ඇය කොට්ටයක් ගෙන පපුවට තුරුළු කර ගත්තාය.

"බබා.."

සංකේත් කතා කළේය. උදෑසන හතේ සිට පුරා පැයක් ඔහු ඇය එනතුරු බලා සිට බැරිම තැන.. මේ සැතපුම් ගණනාවක් දුර සොයාගෙන ආවේය.

"ඔයා ආවෙ නෑ.."

ඇයගේ නිදන කාමරයෙන් මෙසේ එබී කතා කිරීම පුදුම නැත. එහෙත් කතා කරන්නට විදියක් ද නැත.

"අම්මට කතා කරන්න.."

"අම්මා නෑ.."

සංතුසී උත්තර දෙන්නේ ඉවත බලාගෙනය. යුවතිය අසනීපයෙන් සිටින වග ඔහුට දැනෙයි.



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/



"තාත්තා..?"

"තාත්තත් නෑ.."

"කවුරුවත්ම නැද්ද..?"

"නෑ.."

සංකේත්ට දැන් කරනා දෙයක් සිතාගත නොහැකිය. ඇය එළියට එන්නේත් නැත. ඉන්නේත් නයිටිය පිටිනි. කොට්ටයක් පපුවට තුරුළු කරගෙන සිටින්නේ සුදු ලැම වසා ගන්නටය.

"ඔයා දැන් මෙතනින් යන්න.."

සංතුසී සිට දිරිගෙන කිවාය. සංකේත්ගේ හදවත බිඳී ගියේය. ඇය සොයා ගත්තේ කොපමණ අමාරුවෙන්ද..?

"මාව බලන්න එන්න එපා.. මං ඔයාට අයිති නෑ.."

එවර ඇය කොට්ටය තුරුළු කරගෙනම ඉදිරිපස හැරුණාය. ඇස් දෙකේ කඳුළු පුරෝගෙනය. සුදු සුරංගනාවිය හඬන්නේ ඇයි..?

"ඔයාට සනීප නෑ නේද..? බේත් ටිකක් ගන්න යමු.."

"යන්න සංකේත්.. දැන් අම්මා එයි.. යන්න අනේ.. මාව බලන්න ආයෙ නම් එන්න එපා.. ප්ලීස්.."

ඔහුට තවත් ඇය හඬවන්නට බැරිය.

උදෑසන ගිය ගමන හරි ගියේ නැත. පුංචි අම්මාගේ යහළුවරිය නිවසේ උන්නේ නැති නිසා ඔවුන් ආපසු හැරුණාහ.

පුංචි අම්මාට ටවුමට යා යුතු බැවින් ඕ බස් රියේ දිගටම ගමන් ගත් අතර අනුත්තරා රබර් වත්ත හංදියෙන් බැස ගත්තාය.

මඩේ එරී එරී වාහනයක් ගේ දෙසට ගිය ලකුණු තියේ. වාහනයකින් නිවසට ආවේ කවුදැයි බලන්නට අනුත්තරා පය ඉක්මන් කළාය. කෙල්ලට උණ වැඩිවී කවුරුන් හෝ ඉස්පිරිතාලේවත් ගෙන ගියාද..? නිවසට පල්ලෙහායින් ඇත්තේ වත්තේ වැඩ කරන සේවකයෙක් වූ අබරන් අප්පුගේ නිවසය. හේමාලි ඔහුගේ දුවයි. තනි නොතනියට අඩ ගසා ගන්නට ඉන්නේත් ඒ කෙල්ල පමණි.

"හත් දෙයියනේ.."

අනුත්තරාගේ පපුව හිරි වැටුණි. නිවසේ අඹ ගහයට කාරයක් නවතා ඇත. මේ අර.. ඉඩම ගන්න මහත්තයාය. මේ කෙල්ල ජනේලයෙන් එබීගෙන කතා කර කර ඉන්න හැටි. සංතුසී කොහොමද ඒ මහත්තයව අඳුරන්නෙ..? ඔහු ඇගේ අත අල්ලාගෙන කතා කරන හැටි අනුත්තරා ඉවසීමෙන් යුතුව බලා සිටියාය. ඔහු ධනපතියෙකි. සිටුවරයෙකි. මේ කෙල්ල සමග සම්බන්ධකමක් කොහොම ඇති කර ගත්තාද..?

අනුත්තරා අසල වූ ගඩොල් පෝරණුවට මුවා වූවාය. කාරය යන්නට හදයි. කාරය පිටවී ගිය පසුත් ටික වෙලාවක් අනුත්තරා එතැනම රැඳී සිටියේ සිද්ධවෙච්චි කිසි දෙයක් අදහාගත නොහැකිවය.

විනාඩි දහයක පහලොවක ඇවෑමෙන් ඕ කිසිත් නොදන්නියක සේ ගෙට ගොඩ වූවාය. ගෙතුළ කිසිම හැල හොල්මනක් නැත.





"ලොකු පුතේ.."

ඇය කාමරයට එබුණාය. සංතුසී ඇස් පියාගෙනම සිටී. මුහුණ රතුවී ඇත්තේ හැඬීමෙනි. දියණියට හඬන්නට තරම් හේතු වූ කාරණාව කුමක්ද..? දුවක මවට නොකියන ප්‍රථම රහස ප්‍රථම ප්‍රේමයයි. ඒ මහත්තයා සමග සම්බන්ධයක් ඇති බව තමා දැන සිටියේ නැත.

"තව ටිකක් උණ.. හවසට අඩුවුණේ නැත්තං ඩොක්ටර් ළඟට යමු.."

එසේ කියමින් අනුත්තරා කුස්සියට ගියේ බලවත් පීඩාවකින් යුතුවය. සංතුසී තමාට කිසිවක්ම කියන්නේ නැත. දැන් මේ අපේ යෝජනා බලන්න යන වැඩේ තේරුමක් තියේවිද..? අත් අල්ලාගෙන හඬමින් කතා කරන්නට තරම්.. ඇති සම්බන්ධය ගැඹුරු සම්බන්ධතාවයකම විය යුතුය.

* * * * * * *



The Reader's Place http://e-pusthakalaya.blogspot.com/

# 06

**සංතුසී** උන්නේ හිතේ දෙගිඩියාවෙනි. ඔහු තමාට ඒ තරම්ම පිස්සුවෙන් මෙන් ආදරය කරනවා නම් ඔහුගේ පෙම්වතිය.. එය විමසන්නට නොහැකිය. හැසිරීමෙන් නම් පෙනුණේ ඒ ඔහුට පෙම්වතියක නැත.. තමා හැර අනෙක් කෙල්ලක ගැන පෙම් සිතක්වත් නොමැති බවය. තම සිත ආදරයෙන් මුසපත් වේදනා දෙන වග සංතුසීට දැනෙයි. ආදරය ඒ තරමටම හැඟීමක් වූ අපූර්වජනක වූත් දෙයකි. ප්‍රේමය නම් මේ යැයි කිසිවෙකුටත් පහදා දිය නොහැකිය. සංතුසීගේ හිත මේ දවන්නේ ඒ හැඟීමයි. ඔහුගේ ඇස් දෙකේ පිරී ඇති ආදරය ප්‍රතික්ෂේප කරන්නේ කෙසේද..? ඒ මුහුණ දෝතින්ම වැළඳගෙන තම පිරිසිදු පපුවට තුරුළු කරගෙන වරුවක්ම වුව ඉන්නට ඇත්නම්.. මේ ලෝකයේ වෙනත් කිසිම කෙනෙකු වෙනුවෙන් තම ලයේ සෙනෙහස නූපදින බව ඇයට දැන් සහතිකය. සංකේත්.. මං ඔයාට ආදරෙයි.. හැමදාටම.. මේ සසර පුරාවටම ආදරෙයි.. හරියට අම්මා මගෙ අප්පච්චි වෙනුවෙන්ම ඉන්නවා වගේ.. මං ඔයා වෙනුවෙන් ඉන්නවා සංකේත්.. ජීවිතයේ අපරිමිත වූත්, පාරිශුද්ධ වූත් මෙවැනි





හැඟීමක් ඇයට මීට පෙර දැනී නැත. 'එයා ඇත්තටම මට ආදරෙයි..'

* * * * * * *

යුවතියකගේ ජීවිතයට ලංසු තැබිය නොහැක. එහෙත් හරියන්නට හෝ වරදින්නට දැන් කළ යුත්තේ හුවනීව සංකේත්ට විවාහ කරදීම වග මුදිතාට වැටහෙයි. හුවනී ඕනෑම දෙයකට ඔට්ටුවූය. කොළඹ හා පිටරට හැදුණු නිසා අඳින්නේ පළඳින්නේ බටහිර සංස්කෘතියටය. සමහර අදහසුත් ඒ වගේය. ඉන් එහා ඇති වරදක් නැත.

"ආන්ටි.. මට නම් දැන් එපා වෙලා.."

හුවනී, මුදිතා අසලට ආවේ එසේ කියාගෙනය.

"ඇයි මොකද..?"

"සංතුසී නොවෙයිනං එයාට වෙන කෙල්ලෙක් ඉන්නවා.. ඒක මට ෂුවර්.."

මුදිතාට ද ඒ බව දැනෙයි. ඔහු ඉන්නේ වෙනමම ලෝකයකය. කතා කළාට ඇහෙන්නේත්.. ඇහේ හැප්පුණත් දැනෙන්නේත් නැත. පුතාගේ හිත ආදරයෙන් ප්‍රේමයෙන් මුසපත් කළ යුවතියක සිටීද..?

"අම්මා.."

සංකේත් සූදානම් වී ආවේය.

"කොහෙ යන්වද..?"



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

"ඇයි.. කොළඹ යන්ඩ.."

"කොළඹ කෙල්ලෙක්වත් ඉන්නවද ඔය හැටි කොළඹ දුවන්නෙ..?"

"ඇයි මගෙ සංතුසී..?"

සංකේත් ඒ ටික කීවේ භුවනීගේ මුහුණට එබෙන ගමන්ය. ඇය සෝන්තියෙන් ඉවත බලා ගත්තාය.

"නිකං අපිව රවට්ටන්න එපා පුතා.."

භුවනී මුදිතාගේ කරට වාරු වූවාය. තමා.. ඇයට බොහෝ ආදරය කරන වග ඇයට පෙන්වන්නට උවමනා වූවා සේය.

"රවට්ටන්නෙ නෑ.. රවට්ටන්නෙ මොකටද.. අම්මට සුදු ලස්සන ලේලි කෙනෙක් ඉන්නවා.. සුදුම සුදුයි.. නෙළුම් මලක් වාගෙ.."

"මොකක්ද නම..?"

"නාම එයා මට නමවත් කිවෙ නෑ.."

භුවනි ඔකස් ගා හිනැහුණේ හිතේ තිබුණ වේදනාව පිටමං කරමිනි.

"මාත් එන්න ඕනෑ මගෙ ලේලි බලන්න.."

"පස්සෙ බලමු අම්මා.. දැන් යන්නෙ සයිට් එකට.."

සංකේත් පහත් වී මුදිතාට වැන්දේය. 'හැමදේම මාත් එක්ක තාත්තත් එක්ක වාදයක් නෑ.. තාත්තා ඕන එහෙකට ඔට්ටුයිනෙ..'



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/



සංකේත් යළිත් කාමරයට යනවිට භුවනි ඔහු පසුපසින් ආවාය. ඇය එකවරම සංකේත්ගේ පපුවට තුරුළු වූවාය.

"මේ මොකද මේ..?"

ඔහු වහා භුවනිගෙන් මෑත් වෙන ගමන් ඇසුවේය.

"මාත් ඔයාට ආදරෙයි සංකේත්තයියා.. ඇයි මට මෙහෙම කරන්නෙ..?"

"භුවනි.. නිකං ප්‍රශ්න ඇති කරගන්න එපා නංගි.."

ඔහු ප්‍රථම වරට 'නංගි' යයි තමාට කතා කළ ප්‍රථම වචනය.

"අනික.. මේ.. ආදරයක් කියන්නෙ දෙන්නෙක්ගෙ කැමැත්තක් කියන එක.."

"ඇයි ඔයා මට කැමති නැද්ද..? මං කොටට අඳින හින්දද.. කොණ්ඩෙ පාට කරන හින්දද.. ඒක කියන්න..?"

සංකේත්ට සිනහා නොවී බැරිවිය. මේ මෝඩ කෙල්ල ආදරේ කියන්නේ කුමක්දැයි දන්නේත් නැත. ඇය ආදරය කරනුයේ ඔහුගේ වෙනත් දෙයකටය.

"මෙහෙයි නංගි.. මට ඔයා ගැන ආදරයක් ඇතිවෙන්නෙ නෑ.. ඉතිං එහෙම කියාගෙන අපි බැඳලා කොහොමද ජීවත් වෙන්නෙ..?"

භුවනි අඬන්නට ඔන්න මෙන්නය.

"අනික මට ගෑනු ළමයෙක් ඉන්නවා.. දැන් හුඟාක් කල් තිස්සෙ.."

ඇත්තය. ඔහුගේ හදවතේ රැඳි ඒ රුව තම සිතේ ජීවමාන වන්නේ බොහෝ කාලයක සිටය. මෙතුවක් කල්ම ඇය තම දෑස ඉදිරිපිට දර්ශනය වූයේ නැත. ඇය දුටු දා පටන් තමා පිස්සුවෙන් මෙන් ඇය සොයන්නට පටන් ගත් හැටි මේ කෙල්ලට කෙසේ කියන්නද..?

"ඇයි මාව රැවැට්ටුවෙ එහෙනම්..?"

හුවනි අසන දෙයට පිළිතුර දෙන්නට නොහැකිය.

"අනේ ඩාලිං.. මං ඔයාව රැවැට්ටුවද..? මං ඔයාට පොරොන්දු දුන්නද..? අඩුම ගානෙ ඔයාව කිස් කරලවත් තියෙනවද..? එහෙම වැඩ බැරි එකෙක් ගැනද ඔයා හෝප්ස් තියාගත්තෙ..?"

හුවනි අඬන්නට වූවාය. මුදිතා කාමරයට ආවේ ඒ ඇසිල්ලේය. කෙල්ල හොඳටම හඬයි. තමාගේ යෙහෙළියත් තරහා වන වැඩකි මේ.

"හුවනි මෙහාට එන්න.. යන දිහාක ගිහින් ආපුදෙන්.."

හුවනි තම කාමරයට ගොස් හොඳටම අඬන්නට වූවාය. සංකේත්ගේ හිත ද පෑරී තිබුණි.

"අර ළමයා අඬනවා පුතා.."

"අම්මට තේරෙන්නෙ නැද්ද..? අම්මට දුවෙක් හිටිය නම් අම්මා මෙහෙම යවනවද කොල්ලෙක් ඉන්න ගෙදරකට.."





සංකේත් ඇසූ දෙයින් මුදිතාගේ ඉහ මොළ රත්විණි. ඒ බව ඇයට මීට කලින් නොදැනුණා නොවේ. එහෙත් සංකේත් මෙසේ අසනතුරුම මුදිතාට එය බරට දැනුණේ නැත.

සංකේත්ගෙන් පසු ගැබ නිස්විය. අවුරුදු දහයක් යනතුරුත් බලාපොරොත්තු තබාගෙන උන්නත් ගැබ යළි එල දැරුවේ නැත. මල්ලිගේ දරුවා තමාට ලැබුණා නම් අද මේ තරම් කණස්සල්ලක් තමාට නැත. දේපල මහා කන්දරාවක් ඇත. සංකේත් කිසි දිනයක කසාද නොබැන්දොත් සිදුවන්නේ මේ දේපල අනාථ නිවාසයකට දෙන්නටය. නමුත් මල්ලිගේ දරුවන් දෙදෙනා සොයා ගත හැකි වුවහොත්.. ඇයට මේ ආත්මයේදීම නිවන් ලැබුණා හා සමාන වෙයි.

"පුතා යන ගමනක් ගිහින් පරෙස්සමින් එන්න.. අද එනවද..?"

"අද සමහරවිට.. මං කෝල් කරන්නම්.."

සංකේත් කාරයට නැඟී පිටවුණි. තමාට ගැහැනු ළමයෙක් ඉන්නවා යයි ඔහු කියන්නේ බොරුවක් විය හැකිද..? සැමියාට ව්‍යාපාරික ලෝකයෙන් තොර දෙයක් නැත. මේ කොල්ලාගේ ප්‍රශ්න තනියෙන් මට විසඳන්න පුළුවන්ද..?

* * * * * * *

සංතුෂී පසුවදා කාර්යාලයට ගියාය. අනුත්තරාගේ සිත තවමත් ගැහෙයි. මේ කෙල්ල කොහොමද ඒ මහත්තයාත් එක්ක ආදරෙන් බැඳුණේ.. එදා ගෙදරට ආපු දවසෙ හිටියෙත් නාන්න ලෑස්ති වෙලා හින්දා තේක හදලා දුන්නා මිසක්.. එළියටවත් ආවෙ නෑ...'

සංතුසීගේත්, ධිනලිගේත් කාමරය අස් කරද්දි මේසය මත තිබි සංතුසීගේ දිනපොත වැටුණේ අනුත්තරාගේ පය පාමුලටය. එයින් එළියට විසි වුණ කාඩ්පත ඇය ඇහිඳ ගත්තාය.

සංකේත් රණබාහු වික්‍රමසූරිය.. එහි සඳහන් වී තිබිණි. රණබාහු.. ධම්ම රණබාහු.. මුදිතා රණබාහු.. සංතුසී රණබාහු.. ධිනලි රණබාහු.. අනුත්තරාට මතක විදියට මුදිතක්කා කසාද බැඳ සිටියේ රවී වික්‍රමසූරියයි. ධම්ම ඔහුව හැඳින්වූයේ වික්‍රමයියා යනුවෙනි. රණබාහු වික්‍රමසූරිය.. යන නම් දෙකම එකට යෙදී ඇත්නම් ඒ සැමියාගේ අක්කාගේ පුතා වීමට ඇති ඉඩකඩ වැඩිය. දැන් අනුත්තරාගේ පපුව වේගයෙන් ගැහෙයි. දෙපා අප්‍රාණිකය. ඇය කොස්ස අල්ලාගෙනම ඇඳෙහි ඇලවුවාය.

* * * * * * *

මුදිතා, භුවනි සමඟම කොළඹ ආවාය.

"හෙලන් දිගටම හිටියෙ මේ ගෙදරද දුව..?"

එය ඉතා කුඩා නිවසකි. නමුත් රට බඩුවලින් නම් නිවස පිරී තිබුණි. භුවනි ඉදිරිපත් වූ රූප රාජිනී තරඟවල පින්තූර හැම තැනම විය. 'ලස්සනයි තමයි... ඒත් කොල්ලා කැමති නෑනේ..'

"නෑ.. අපේ රත්නපුර ගෙදර.. මේක මේ කොළඹ ආවාම නවතින්න තැනක් නැති හින්ද ගත්තෙ.. පස්සෙ පස්සෙ.. අපේ වැඩවලට දිගටම නැවතුණා.."





කෙල්ල කියන්නේ බොරුය. රත්නපුර නිවසක් තිබුණත් ඒ නිවස ද විකුණා දැමූ බව හෙලන් ඒ කාලයේම කීවාය.

"මං මොනවා කරන්නද දුව.. සංකේත් ඔයාට කැමති නැත්නං.."

"සංකේත් මට කැමති නැති වුණාට ආන්ටි.. මට ප්‍රපෝසල් එන්නෙ කෝටිපතියන්ගෙන්.."

ඇය පැවසුවේ අහංකාර විලසිනි. තමාට එසේ නම් හෙලන් කෙල්ලව බාරදී ගියේ ආරක්ෂාවට පමණමද..? නැත.. කෙල්ලව කොල්ලාට දීමට ඇයටද හිතක් තිබුණි..

"මෙහෙ කවුරුත් නැණේ භුවනි.."

"සර්වන්ට් හිටියා.. නිවාඩු ඇරියා.. තනියම තියන්න බෑ.. හොරකම් කරනවා.."

"උඩ කාමරේ කවුරු හරි ඉන්නවා.."

"ඒක රෙන්ටවුට් කරලා තියෙන්නෙ.. පාලුවට යන හින්දා.."

භුවනීත් මොණරියක මෙනි. මොණරා පිල් විදහා නැටුවත් පස්ස හෙලුවෙනි. කෙල්ල තුළ වැදගත්කමක් නැතැයි මුදිතාට සිතෙයි. යෙහෙළියකගේ දුවක උනත් ඉන්නේ විලිබිය නොමැති පරිද්දෙනි.

"දුව හොඳ රස්සාවක් කරන්නකො.. මේ ආර්ථික ප්‍රශ්න විසඳෙනවානෙ.. සංකේත් ඇකඩමි එක ඕපන් කරයි ළඟදිම.."

භුවනිට ඉහිලුම් දෙන්නේ නැත. තමා වැටුණේ මිරිඟුවකටය.



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

කවදාවත් තමාට සංකේත් හානු කර ගත නොහැක. ඊයේ තම මව කතා කර කර තමාට බැණ වැදුණ හැටි භුවනිට මතක් වෙයි.

"මොනවද බනී උඹ මෙච්චර කල් කළේ.. කොල්ලෙක්ව දැලේ දාගන්න විදිහ උඹට මං කියල දෙන්න ඕනද..? සංකේත්ට පුදුම දේපලක් තියෙන්නෙ.. කොහොම හරි අල්ලගනිං.."

"මම්.. මේ ගේ ඇතුළෙ එහෙම බෑ.. මුදිතාන්ටි හරි බණ්ඩි මැණිකා හරි මගෙ පස්සෙන්.."

"ඔය සංකේත් කොළඹ එන වෙලාවක ගෙදරට හරි අඩගහගනින්.."

ඒ අම්මා දුවට උපදෙස් දුන් හැටිය. එහෙත් දුවට ඒ සෙල්ලම් කිරීමට සංකේත්ගෙන් යන පහක තරමේ අනුබලයක් ලැබුණේ නැත. 'මොන නපුංසකයෙක්ද මංදා..' භුවනීට සමහර වෙලාවට එසේ සිතුණි.

"මම නිකං සවුත්තු වුණා.. මම් මට කිව්වෙ.. සංකේත් අයියාට ආන්ටි මං ගැන ඇහුවයි කියලා.. චී.. චී.. මං කවදාවත් මෙහෙම සවුත්තු වෙලා නෑ.."

භුවනි කීවාය. මුදිතාගේ හිත ඉන් රිදිණි. භුවනි ගැන ඇගේ කැමැත්තක් තිබුණි. එහෙත් සංකේත් අකමැති නම් බලෙන් කරේ එල්ලන්නේ කොහොමද..?

කවදාක හෝ නරක නාමයක් සංකේත් කරා ඒමටද පුළුවන. මුදිතාගේ හිත විවිධාකාර හේතු නිසා දුකට පත්වී තිබුණි.





"අපි දෙන්නා පන්නිපිටියෙ සයිට් එකට ගිහින්.. පන්සලටත් ගිහින් එමු.. අද මම ඔයත් එක්ක ඉන්නම්.."

හෙලන් පැමිණෙන්නේ රෑ දෙකටය. ඇයව ගුවන් තොටුපලෙන් ගැනීමට පංකජ යන්නට පොරොන්දු වී තිබුණි. නමුත් භුවනීට උවමනා වූයේ එම ගමන සංකේත් සමග යාමටයි. තමා සිතූ පරිදි සංකේත්ව රවට්ටා ගත නොහැකි බව දැන් භුවනීට අවබෝධ වී තිබේ. එනිසා එම අභිප්‍රාය අත හැරීමට සිදුව තිබේ.

* * * * * * *

අනුත්තරා පන්සලට ආවේ හිත නිවා ගනු පිණිසය. සංතුෂ්ටිය අපල කාලයක් වන්නට ඇතැයි ඇයට සිතුණි. දරුවාගේ නරක කාලයත් ඇයට ඉවෙන් මෙන් දැනෙනවා මිසක ඇය කිසිදා හඳහන් බලවන්නට නම් නොගියාය. පන්සලට වී බුදු ගුණ සිහිපත් කර දරුවන්ට සෙත් ශාන්තිය ප්‍රාර්ථනා කිරීම ඇගේ පුරුද්දක් විය. අනුත්තරා බෝධිය ළඟ ඉඳ නැගිට්ටාය. ඒ මොහොතේ තමන් දෙසට එන තරුණයා ඇයට දැක ගත හැකි විය. මේ.. ඉඩම ගත් මහත්තයාය. සංකේත් ඔහු විය යුතුය.

"ආන්ටි.. ආන්ටී.."

තමා ඔහුව නොදැක්කා සේ ඉවතට හැරෙන්නට හිතුවා පමණි.

"ආන්ටිලා කොහේද ගියේ.. මං හැම තැනම හෙව්වා.. ගුණසිංහ අංකල්වත් දැනගෙන හිටියෙ නෑ ගිය දිහාවක්.."



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

මේ දරුවා නම් හදවතේ තෙතමනය ඇති දරුවෙකි.

"ඒ ගේ කැඩුවෙ නෑ ආන්ටි.. ආන්ටිලා නිකමට හරි ඒ පැත්තෙ ආවොත් ඒ ගේ දෙන්න කියලා මං කියලා තිබුණා.. දැන් කොහෙද ඉන්නෙ ආන්ටි..?"

ඔහු දිගටම ප්‍රශ්න අසයි. එතකොට මේ දරුවා.. සංතුෂි ආශ්‍රය කරන්නේ මගෙ දුව කියලා නොදැනද..?

"කතා කරන්නකො ආන්ටි.. මං හින්දා ලොකු කරදරේක නේද වැටුණේ..?"

"ආ.. නෑ පුතා.. අපි ටිකක් ඈතට ගියා.. ඒක ප්‍රශ්නයක් නෑ.."

"ආන්ටිගෙ ටියුෂන් ක්ලාසස්.."

"ඒවා නැවැත්තුවා.."

"එතකොට..?"

"එතකොට නේද..? කන්නෙ බොන්නෙ.. ජීවත්වෙන්නෙ.. ඒකනෙ පුතාගෙ ප්‍රශ්නෙ..?"

"මට සමාවෙන්න.. සංතුෂි කියන්නෙ ආන්ටිගෙ දුවනේ.. එයාට සල්ලි ඇතිනේ.."

"සමාව ඉල්ලන්න පුතා කිසිම වරදක් කරලා නෑ.. අපි එතන හිටියෙ කුලියට.. කවද හරි යන්න වෙන බව දැනගෙන.. පුතා දැන් මේ පන්සලට එනවද නිතර..?"





ඇය මාතෘකාව වෙනස් කරන්නට හිතාගෙන ඇසුවාය.

"අම්මාව එක්කරගෙන ආවා.. අම්මා හරි ආසයි මේ පන්සලට.."

"කෝ අම්මා..?"

"අර ඉන්නෙ.. ස්වාමීන් වහන්සෙත් එක්ක කතා කර කර.."

සංකේත් අම්මා උන් දිහාට අත දිගු කළාය. අනුත්තරා විමනාවෙන් එදෙස බැලුවාය. ඇය දැක ඇත්තේ ජීවිතයට දෙපාරකි. එහෙත් තම නෑනණ්ඩිය මුදිතා අඳුනා ගැනීමට ඇයට වැඩි වේලාවක් ගියේ නැත. අවුරුදු දාසයකට, දාහතකට පමණ උඩදී දුටු ඇයගේ රූප සොබාවේ නම් ඒ තරම් වෙනසක් නැත. මේ ඉන්නේ.. ධම්මගේ අක්කාගේ පුතුය.

"අනේ පුතේ.. මට.. ටිකක්.."

අනුත්තරාට කියා ගත හැකි වූයේ එපමණකි.

අනුත්තරාගේ මුහුණට දිය බිඳු වැටෙන විට ඇය් ඇස් ඇරියාය. තමා මේ සිටින්නේ කාගේ උකුල උඩදැයි ඇය විමසිලිමත් වූවාය. තමාට පවන් සලමින් උන්නේ නිළියක තරමට ලස්සන [illegible] සංකර පාට යුවතියකි.

"මට ටිකක් කලන්තෙ වාගෙ ආවා පුතා.. දැන් හරි.."

ඇය නැගිටින්නට වෙර දැරුවේ සාරිපටින් මුහුණ ආවරණය කර ගනිමිනි. මුදිතා තමාව හඳුනා ගැනීදෝයි ඇය බිය වූවාය.



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

"ආන්ටි.. කාලත් නැතිව ඇති.. අපි ගිහින් මොනව හරි කමු.. යමු.. කාරෙක ගෙනාවා.."

සංකේත් තමා උත් බණ මඩුව ළඟටම කාරය ගෙන ඇවිත් තිබිණි.

"ඕන් නෑ පුතේ.."

"යමු.. යමු.. ගිහින් මොනවා හරි කාලම යමු.. ඉන්න තැනකට පුතා ගිහින් දායි.."

මුදිතා කීවේ කරුණාවෙන් යුතුවය. සංකේත් අම්මා කුමක්දෝ කියනු අනුත්තරා දුටුවාය. මෙතන මොකාක් හෝ පැටලැවිල්ලක් තිබේ. නිවසට ඇරලන්නට ආවොත් කරදරයි. ඊටත් එහා මුදිතා යමක් දැනගතහොත්.. තවත් කරදරයක් සිද්ධවනු ඇත.

"එපා පුතේ.. මං මේ ත්‍රීවීලර් එහෙක නැගලා යන්නං.. මට චූටි දුවගෙ ඉස්කෝලෙට යන්නත් ඕන.. අද පේරන්ට්ස් මීටින් එකක්.."

"අපෙ අම්මට සංතුසීව හම්බවෙන්න ඕන කියනවා.. ආන්ටි ඉන්න තැනක් කියන්නකෝ.."

දැන් නම් තමාගේ නිගමනය හරිය. තම දියණිය සංතුසී බව සංකේත් දැනගෙන ඇත. එහෙත් මුදිතා සංතුසීව සොයන්නේ ඇයි..?

"අනේ පුතේ.. දුව මේ දවස්වල ට්‍රේනින් එහෙකට ඉන්ඩියා ගිහිල්ලා.. එයා ආවම එක්ක එන්නම්.."





එසේ කියමින් අනුත්තරා.. එතනින් ඉවත් වූවාය.

"දුවටත් හුභාක් පිං.. පුතාටයි අම්මටයි දෙන්නටත් පිං.. උදව් කළාට.."

ඇය පිටවූයේ එසේ කියාගෙනය.

"හරි අහංකාර ගෑනියෙක් වගේ.."

භුවනි කීවාය.

"නැත්නං.. කාරෙකින් ගිහින් බස්සන්න හදද්දි එපා කියයිද..?"

"දුප්පත් බව ඇත්ත භුවනි.. ඒත් කාගෙවත් උදව් ගන්න කැමති නැති, කාගෙවත් පස්සෙ යන්න කැමති නැති මිනිස්සු ඉන්නවා.."

සංකේත් කීවේ සෝන්තියෙනි.

"ආ.. සංතුසීගේ අම්මා හින්දා වෙන්නැති ඒ පැත්තට අදින්නෙ.."

"මට කාගෙවත් පැත්තක් ඕන නෑ.. සංතුසීගෙ අම්මා වුණත් නැන්දම්මා වුණත් මට ඒකෙන් වැඩකුත් නෑ.. මං කරන්න ඇදුවෙ උදව්වක්.. අනික අපේ සයිට් එකේ කුලියට හිටපු මිනිස්සු.."

මුදිතා මේ සියල්ල සාවධානයෙන් යුතුව අසාගෙන උන්නාය. ඒ ගැහැනිය සංතුසීගේ අම්මා යයි පුතා කියයි. ඇගේ මුහුණ මුදිතාට කොහේදී හෝ දැක පුරුද්දක් තිබේ. ඒ කොහේදීදැයි ඇය කල්පනා කළාය. නමුත් මතකයක් හිතට ආවේ නැත.



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

සංතුෂී.. කොහොම හෝ පුතාව දකින්නට ඇත. ඒ දැකීමෙන් ඇය චිත්‍රය අඳින්නට ඇතැයි ඇය සිතුවාය. නමුත්.. ඒ රුව තුළින් ප්‍රධාන ලෙසම ඉස්මතු වූයේ තම සහෝදරයාගේ රුවයි.

"දැන් මොකද කරන්නෙ අම්මා..? සංතුෂී ඉන්දියා ගිහින්ලු.."

"කමක් නෑ.. ආව දවසක හම්බවෙන්න පුළුවන්.."

භුවනි ශාන්තියෙන් යුතුව ඉවත බලා ගත්තාය.

* * * * * * *

අනුත්තරා ගෙදර ආවේ හෝන්තුවාවෙන් මෙනි. සිද්ධ වූයේ නොසිතූ දෙයකි. තම දියණිය ප්‍රවේශම් කරගත යුතුය. සංකේත් හදන්නේ තම කෙල්ල සමග සෙල්ලම් කිරීමට යැයි ඇයට සිතේ. අර ඇගේ ගෑවී ගෑවී හිටිය ලස්සන කෙල්ල.. සංකේත් බඳින්න ඉන්න කෙල්ල විය යුතුය. මේය නම් කෙසේවත් නොකෙරෙන මගුලකි. මුදිතා වෙනස් වී නොමැත. යම් කිසි හෙයකින් තම දරුවා හා සංකේත් සම්බන්ධයක් පවත්වන බව දැනගතහොත්.. එයට කොහොත්ම ඉඩ නොදෙනු ඇත. තමාගේත් ධම්මගේත් විවාහයට ඔවුන් කෙතරම් අකුල් හෙළුවාද..? ඒ බාධකය තම දියණියට එල්ල නොකරාවිද..? ඊටත් නෑනා මස්සිනා මැරේජ් හොඳත් නෑ.. ඔය ඩොක්ටර්ස්ලා කියන්නෙ.. ආවදෙන්කො මෙයා අද ගෙදර...

"අනුත්තරා.."

කැතරින් කතා කළාය. අනුත්තරා කොහේදෝ ගිහින් ආගමන තවම සාරිය පිටිනි.





"පුංචි අම්මෙ.."

"මොකද වෙලා තියෙන්නෙ..?"

"වෙලා තියෙන්නෙ වහ කන්න තමයි පුංචි අම්මෙ.."

"ඒ ඇයි..?"

"සංතුෂී පටලැවිල්ලක් හදාගෙන.."

කැතරින් හිසේ අත ගසා ගත්තාය. යහළු ගුරුවරියගේ දොනි පුතුට දැන් මගුල් අසා ඇත. ඒ මිනිසුන් මනමාලිය බැලීමට දිනයක් අසති. මේවා තමා අනුත්තරාට කියා ඇත.

"නොගැළපෙන පටලැවිල්ලක්ද..?"

"මීත්.."

"අම්මා වාගෙම නැතැයි ඉතින්.."

කැතරින් කීවාය. ඉතිරි ටිකත් කිවහොත් පුංචි අම්මා තවත් කලබල වනු ඇත.

"මට දැන් පිස්සු වාගෙ පුංචි අම්මෙ.. මට කෙල්ල බේරා ගන්න ඕන.."

"ඒතරමට නොගැළපෙන එකෙක්ද..? කුඩුකාරයෙක්ද..? මංකොල්ලකාරයෙක්ද.. පල් හොරෙක්ද..?"

"නෑ පුංචි අම්මෙ නෑ.. අපි අර හිටපු ඉඩම ගත්තු මහත්තයත් එක්ක මේ පලහිලව්ව.."



The Reader's Place http://e-pusthakalaya.blogspot.com/

සැබවින්ම කැතරින් මවිත වූවාය. මේ කෙල්ල විශ්වාස කරන්නේ කොහොමද..? ඒ මහත්තයාට බැන්න බැනිලි.. එහෙව් මිනිහත් එක්කද මේ ආදරේ කරන්නෙ..?

"කොහොමද සම්බන්ධෙ දැනගත්තෙ..?"

"මං දැක්කා මග යනවා.."

අනුත්තරා බොරුවක් කීවාය. දියණියගේ ආත්ම ගරුත්වයේ දැලි ගෑවෙන වැඩකි මේ.

"මේක කොහොම හරි කඩන්න ඕන.."

කැතරින් සිනාසුණාය. ඒ සිනාසුණේ තමාටම යැයි අනුත්තරා විශ්වාස කළාය. පණ සේ ධම්මට ආදරය කළ තමා තවම අඳින්නේ සුදු සාරිය. එසේ පිළිවෙත් රකිමින් දියණියගේ ප්‍රේම සම්බන්ධය කඩන්නට හදයි. එහෙත් තමා මේ සම්බන්ධය නොකැඩුවහොත්.. එය මුදිතා විසින් කඩනු ඇත.

"මේවා මේ විදිහටම සිද්ධවෙනවා.. ඒකනෙ අරුමෙ.. පුංචි අම්මෙ.."

"එහෙනං අර මඟුලවත් ඉස්සර කරමු.."

"එහෙම කීවත් අනේ මිටේ කීයක්වත් නැතිව.. කෙල්ලෙක් ගැන කතා කරන්නෙ කොහොමද පුංචි අම්මෙ..?"

එතනත් ප්‍රශ්නයකි.

"දැන් ධම්මට කසාද බැන්දෙ අතේ මිටේ සල්ලි තියාගෙනද..?"



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/



"අපි ආදරේ කරලනෙ.."

"සංකුසීව දැක්කම ඕන කොල්ලෙක් ඔන්න ඔය කියාපු එක හොරයි.."

කැතරින් එසේ කියමින් කණ්ණාඩිය දාගෙන පුවත්පතට ඇස යොමු කළාය. අනුත්තරාගේ හදවත තවමත් ගිනිගෙන දුවේ. 'අනේ ධම්ම.. මේ ප්‍රශ්නෙ විසඳන්න ධම්ම.. රණබාහුලා.. අපට පුත්තු දෙන්නෙ නෑ.. අපි දෙන්නට වුණෙත් ඒකනෙ..'

* * * * * * *

සංකුසී උන්නේ තෝන්තුවාවෙනි. තම ආදරය ඉල්ලා පැමිණි ඔහු ඉන්පසු ආවේ නැත. නමුත් ඔහුගේ කාඩ්පත එදා ...න්ලයෙන් දමා ගියේ නැවත හමුවීමට අපේක්ෂාවෙනි. එයා අංකේත් රණබාහු වික්‍රමසූරිය.. මං සංකුසී සරණ්‍යා රණබාහු.. අංකේත්, සංකුසී.. අපි දෙන්නගෙ නම් එක වගෙයි. සංකුසී කාඩ්පත සිප ගත්තේය. එයාව හම්බවෙන්න හිත ආසයි.. ඒත්..

"මොනවද කල්පනා කරන්නෙ මේ ළඟකදි ඉඳන්..?"

අනුත්තරා කාමරයට ආවේ එසේ අසාගෙනය. සංකුසී තිගැස්සුණාය. මෙතුවක් කාලයකට නම් අම්මාට සැඟවූ කිසිම රහසක් නැත.

"න්.. නෑ.. මුකුත් නෑම්මා.."

"එහෙනම්.. හෙට ගෙදර ඉන්න.. හවසට එනවා කට්ටියක්.."

"ඒ කවුද.. අපට නෑයො නෑ කියලනෙ අම්මා කිව්වෙ.."

"නැයො කරගන්න පුළුවන්ද බලමු.. ඔයාට ප්‍රපෝසල් එකක්.."

"මේ මට..?"

"නැතුව ඉතින් මේ මටයැ.. නැත්තං නංගිටයැ.. අර හෙට අනිද්දට වල පල්ලට යන්න බලාගෙන ඉන්න පුංචි ආච්චිටයැ.. ඔයාටම තමයි.."

අද අම්මා කතා කරන විදිහ හරි නැතැයි සංතුසීට සිතුණි.

"අම්මා මගෙන් ඇහුවෙවත් නෑ.."

"මේක අහ අහා ඉන්න කාලයක් නෙවේ ලොකු පුතේ.. හැමෝටම ලව් එපෙයාර්ස් හරියන්නෙ නෑ.. ප්‍රපෝසල් එකකින් අඳුරගන්නත් ළඟින් ආශ්‍රය කරන්න පුළුවන්.."

The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

"අම්මට මොකක් වෙලාද මන්දා.."

"ඔයාගෙ අප්පච්චි මන්තෙම නැතිලා මට වෙලා තියෙන දේ පේනවනේ.."

අම්මා කතා කරන්නේ යමක් දැනගෙනය. මේ හිත තම් සංකේත්ට පමණමැයි දැඩිව කියන්නට සිතේ. එහෙත් ආදරය වෙනුවෙන් දුක් වින්ද අම්මා තමාත් නංගීත් හදා ගන්නට දුක් වින්දාය. ඇයට තව දුක දිය නොහැක.

"අම්මගෙ කැමැත්තක්.."

අවසානයේ සංතුසී කීවාය. අනුත්තරාට කෑගසා හඬන්නට සිත්විය.





"මම තරහකට නෙමේ ලොකු පුතේ මේ කියන්නෙ.. ඒත් ඔය හිතාගෙන ඉන්න දේවල්.. කවදාවත් සිද්ධවෙන්නෙ නෑ.."

ආයේ කතා දෙකක් නැත. අම්මාට සංකේත් ගැන ආරංචි වී ඇත. ඉදින් දැන් සංකේත්ට කතා කිරීමෙන්, ඔහු හමුවීමෙන් සිසිම ප්‍රතිඵලයක් නැත. මෙපමණ කාලයක් සිතෙහි පෙරළි කළ සිහින ආදරය තම දැස් ඉදිරියේ සැබෑ වුවද එය සත්‍යයක් ලෙසින් දෝත පා පිළිගන්නට පුළුවන්කමක් නැත.

"පුතේ.. මං කියන එක ඔයාට තේරෙනවද..? අප්පච්චි ඇක්සිඩන්ට් වුණේ එයාලගෙ මහ ගෙදර ඉඳන් එන ගමන්.. ඒ මායි ඔයයි මාවනැල්ලෙ වලව්වට එක්ක එන්නද කියල පර්මිෂන් ගන්න ගිහින්.. ඒ තරමට අපිට ඔයාගෙ අත්තයි, අත්තම්මයි, නැන්දයි විරුද්ධ වුණා.. එදා අප්පච්චි ඒ ගමන නොගියා නම්.."

අනුත්තරාගේ වචන සිහින ඇඳුමක් බවට පරිවර්තනය වෙමින් තිබිණි.

"අදටත් ජීවතුන් අතර ඉන්නවා පුතේ.."

සංතුසී අම්මාව බදා ගත්තාය. හිතට වහල් වී කරන ආදරයෙන් කී දෙනෙකු හානියට පත් වෙනවාද..? අම්මාගේ හිතට දුකක් නොදෙන්නට ඇය සිතා ගත්තාය. ඔහු ධනවතෙකු බව පෙනේ. එවැනි ධන කුවේරයෙකු ඉන්නට හිටින්නට පැලක්වත් නැති තමාව.. රජගෙයට කැන්දන් යයි යන්න සිතන්නවත් නොහැක. අම්මා මේ පෙන්වා දෙන්නේ දුක් විඳින්නට පුරම.. ආදරය නැමති දුකෙන් මිදෙන්නටය. පිරිමියෙකුට නම් ආදරයක්

වෙනුවෙන් තනිකඩව ජීවත්විය හැක. එහෙත් මේ සමාජයේ පිරිමියෙකුගේ හම්භරණය නොමැතිව ගැහැනියකට ජීවත්විය නොහැක්කේ පිරිමින් නිසාමය. ඔවුනු තනිකඩ ගැහැනියකට පාඩුවේ ඉන්නට නොදෙති.

"ඒ හින්දා.. අද එන මහත්තයා.. හොඳද කියල බලමු.. ආවාට ගියාට කතා කරන දෙයක් නෙමේ.. හොඳට හිතල බලලයි ගන්නන්නෙ.."

ඒ ටික කියාගත් අනුත්තරා කාමරයෙන් පිටවී ගියාය.

"මොකද කියන්නෙ..?"

කැතරින් ඇසුවේ කුස්සියේදීය. මේ පුංචි පවුලේ පලහිලව් නිසා ඇයට දැන් තම ජීවිතයට පාලුවක් නැත.

"අම්මගෙ කැමැත්තක් කියලා කිව්වෙ.. හිතකින් නම් නෙමෙයි එහෙම කිව්වෙ.."

"මට ලැජ්ජා කරන්න එහෙම ලෑස්ති වෙනව නෙමේ.. යාලුකනුත් ඉවරයි.. කමලා ටීචර්ගෙ අයියගෙ පුතා.."

"ඒක තමයි පුංචි අම්මෙ.. ඒ නැතත් ඔය සංකේත් නම් අපේ කෙල්ල හොයාගෙන මෙහෙට එයි.. මොකද කරන්නෙ.. අපිට යන්න වෙන තැනකුත් නෑ.."

"කුලියාපිටියෙ තමයි.. ඒ ගේ කුලියට දීලා තියෙන්නෙ.. දැන් ගරා වැටිලා.. ඒත් ඉතිං එහෙ ගිහිල්ලා මෙහෙ රස්සා කරන්නෙ.. පොඩි එකීට උගන්නන්නෙ කොහොමද..?"





පුංචි අම්මා කියන්නේ ඇත්තය. සංකේත්ට ඇත්තම පහදා දෙනවා මිසක.. ගෙවල් මාරු කිරීම හිසරදයට කොට්ට මාරු කිරීමකි.

"හා.. හා. මං අර වැලිතලප ටික කපලා.. තියලා ඉන්නං.."

පුංචි අම්මා මෙවා කරන්නේ සතුටිනි. 'අනේ දෙයියනේ මේ මඟුල මෙහෙම්මම හරියනව නම්.. ඊට පස්සෙ ඔය ටියුෂන් ක්ලාස් එකක් හරි කරගෙන පොඩි කෙල්ලගෙ වියදම් පිරිමහගන්නැකි..'

✵ ✵ ✵ ✵ ✵ ✵ ✵

සංකේත්ගේ ඉවසීමේ සීමාව දැන් ඉක්ම ගොසිනි. එදා හෝටලයෙන් තම කාඩ්පත් ඇගේ ඇඳ මතට දමා ආ හැටි සිහිපත් කලේය. 'තියෙන අහංකාරකමට ඒක දෙනකොට ගත්තෙවත් නෑ.. ඒත් පුදුමාකාර හැඟීමක්.. ඒ වාගේම බැඳීමක් එයාගෙ හිතේ තිබුණා. ඒ ඇස් දෙකේ බැල්ම.. ඒක දරාගන්න බෑ.. හරියට මං එනකං කාලයක් තිස්සෙ බලාගෙන හිටියා වගේ..'

"එයා මට කෝල් කරන්නෙ නැත්තං.. මං යනවා එයා බලන්න.."

ඔහු නිගමනයකට ආවේය. හිතට වද දුන් ප්‍රශ්න බොහෝමයක් මග ඇරෙමින් තිබිණි. තාම ඒ කෙල්ලගෙ නමවත් දන්නෙ නෑ. සංකේත් පැයක පමණ ගමනකින් පසු රබර් වත්ත පාරට පැමිණියේය. කාරය වත්තට හරවාගෙන ටික දුරක් යද්දී



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

වත්තේ නාවින පන්නයේ කාරයක් නවත්වා තිබෙන හැටි දුටුවේය. නිවසට කවුරුන් හෝ ඇවිදිනි. සාරි ඇඳගත් කාන්තාවන් දෙදෙනෙක් එහෙ මෙහෙ මිදුලේ සක්මන් කරමින් උන්හ. මේ අවස්ථාවේදී නිවසට යන එක හොඳ නැති හෙයින් සංකේත් කාරය ආපසු හරවාගෙන පාර අයිනට කර නැවැත්තුවේය. පැයක් ගෙවිණි. පැය දෙක් ගෙවිණි. දැන් හැන්දෑවේ හතටත් ආසන්නය. ඒ කාරය යන පාටක් නැද්ද..?

සංතුසී දැකීමෙන්ම මනමාලයාගේ මවගේ හිත සන්තෝෂයට පත්වුණි. 'ආර්ටිස්ට් කෙනෙක්.. දක්ෂ චිත්‍ර ශිල්පිනියක්..'

"දුව ඉතින් පුතත් එක්ක ටිකක් කතා කරන්නකො.. එයා අර එළියෙ ඉන්නෙ දුව එනකං.."

"ඒක තමයි.. දුව යං මාත් එක්ක.."

ඉදිරිපත් වූයේ මනමාලයා වූ උමේෂ්ගේ තාත්තාය. සංතුසීට ඒ ආරාධනාව ප්‍රතික්ෂේප කිරීමට නොහැකි විය. 'මෙයාගෙ මූණෙ සංතෝසයක් නම් නෑ නම සංතුසී වුණාට.. උමේෂ්ට සිතුණි. ඒ වුණත් කෙල්ල ලස්සනයි.. වීස් කැල්ලක් වගේ.. දැක්කම කන්න හිතෙනවා.. ප්‍රපෝසල් එකක් කිව්වට.. මං හිතුවේ අම්මලා නිකං බර කරන්නයක් කතා කරලා කියලා..'

"ඔන්න... පුතයි දුවයි කතා කර කර ඉන්න.. කීය වෙනකං හරි කමක් නෑ.."

උමේෂ්ගේ තාත්තා සංතුසීට වාඩිවෙන්න ඇර ආපසු ගියේය.

"ඔයා හරි ලැජ්ජයිනෙ.. ඉතින්.. ඉතින් සංතුසී..?"





උමේෂ්ගේ කතාබහ තියා රූපයවත් සංතුසීගේ හිත ගත්තේ නැත. තම හිතේ ඇඳී සංකේත් ගේ රුව මිස.. වෙන කිසිම කෙනෙක් තම හිතට ගැළපෙන්නේ නැත.

"ඉතින්.. කොහොමද සංතුසී..?"

ඔහු පුරුවෙන්නට මෙන් නම උච්ඡාරණය කරයි.

"ම්හු.. කතා කරන්නෙ මං විතරද.. සංතුසී කිව්වට නමේ අර්ථය මූණෙ නෑ.."

ඔහු එසේ කියන විට සංතුසී මඳ සිනහවකින් ඔහුට සංග්‍රහ කළාය. එහෙත් මේ තම දෛවය නම් එය පිළිගත යුතුය.

"මම ඉතින් මොනවා කතා කරන්නද..?"

එතනින් එහාට සංතුසී කතා කරේ නැත. 'කෙල්ල නිහඬ චරිතයක් වගේ. ඒකත් හොඳයි.. කණක් ඇහිලා හිටියහැකි..'

සංකේත් වාහනය පාරේ නවතා.. රබර් වත්ත දිගේ ආවේය. ගේ ජේන නොපෙනන මනයට පැමිණි විට දුටු දසුනින් ඔහුගේ හිත හිරි වැටුණි. කෙල්ල කොල්ලෙකු හා කතා කරමින් සිටියි. 'දෙයියනේ බබා.. ඔයා මගෙ නෙමෙයිද..? එහෙම වෙන්න බෑනේ..' ඇහිවූ දැඩි කලකිරීම නිසා සංකේත් ආපසු අවුත් කාරයට නැග්ගේ පිස්සෙකු මෙනි. ඔහුට යමක් වැටහිණි. කෙල්ල තමාට නමවත් කීවේ නැත.

"ප්ලීස්.. ප්ලීස්.. ඔයා යන්න.. දැන් අයියා එනවා.. මට ගුටි කන්න වෙනවා.."



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

ඇය පසුපස හඹා ආ පළමු දිනයෙහි.. ඇය කිව් හැටි සංකේත්ට මතක්වෙයි. අයියා කිව්වේ මේ පුද්ගලයාට විය යුතුය. එයා නොකියා කිව්ව දේ තේරුම් ගන්න බැරි මං ගොනා..

"මාව බලන්න එන්න එපා.. මං ඔයාට අයිති නෑ.."

ඇය එසේ කීවාය. එසේ නම් හා පුරා කියා ඉව කරන්නට ගොස් ඇත්තේ අන් සතු මලකි.

"සීතල යඳ එළියේ
පිපුණා සුවඳ මලේ..
නැඹුල් සුවය පැතූ..
බඹරෝ නුඹ නාඩන්..
බඹරෝ නුඹ නාඩන්.."

කැසට් යන්ත්‍රයේ එම ගීතය ප්‍රචාරය වෙයි. සංකේත්ට හිතුණේ ගායකයා තමාට ඔච්චම් කරන විලසය. කැසට් යන්ත්‍රයේ ස්විචය ඕෆ් කළ ඔහු රථයේ වේගය වැඩි කළේය.

* * * * * * *

"ඇයි උඹ උමේෂ්ට කැමති නැත්තෙ..?"

සෙන්මි විමසුවාය. සංකේත් තමාට කිසි දිනෙක හිමිවන වස්තුවක් නොවන බව ඇය සෙන්මිට ද කියා තිබුණි.

"මගෙ මුළු හිතේම ඉන්නෙ සංකේත්.. ඒක නම් කවදාවත් වෙනස් වෙන්නෙ නැතිවෙයි.."





"ඉතින් ඒ වෙනුවෙන් හැමදාම බලාගෙන ඉන්නද සංතු.. කාලයත් එක්ක වෙනස් වෙයි.."

"එහෙම වෙන්නෙ නෑ.. ඕන මිනිහෙක් බැඳලා ඔහේ පොල් කොටයක් වගේ ඉන්න නම් පුළුවන්.. දෙන වදයක් දෙන්නෙ ශරීරෙරටනේ.."

සෙන්මිට පුදුම සිතුණි. විවාහය ගැන ඇය සිතන්නේ ශාරීරික වදයක් ලෙසය. එය සුන්දර රමණීය බැඳීමක් ලෙසින් දැනෙන්නට නම්.. ඇයට ප්‍රබල ලෙසම හදවතට දැනෙන ලෙස ආදරය කරන ප්‍රේමවන්තයෙකු විය යුතු වෙයි. ඉදින් එවන් කෙනෙකු පුවත්පත් දැන්වීමකින් හොයන්නද..? සංකේත්ටම ඇය විවාහ කර නොදුන්නොත් ඇගේ ජීවිතයත් සංකේත්ගේ ජීවිතයත් දෙකම අඳුරුවන බව නම් සෙන්මි වටහා ගත්තාය.

"දැන් එතකොට උමේෂ්..?"

"මම අම්මට පොරොන්දු වුණා අම්මා කියන එකකට කැමති වෙනවා කියලා.. උමේෂ් නැතිව වෙන එකෙක් බඳින්න කිව්වත් එච්චරයි.. ඕන එකෙක්.. ඕන එකෙකුට මං කැමතියි.."

මිතුරිය කතා කරන්නේ වේදනාවෙනි. එදා සංකේත්ගේ චිත්‍රය මිලදී ගත් සංකර රුවැති යුවතිය සෙන්මිට මතක් විය. එවෙලෙහි සෙන්මි එම සිතුවම විකුණුවේ එය විකුණන්නේ නැති බව දැන දැනමය. එසේ කළේ සංතුසීගේ මනස පාලනය කිරීමටය. ඇයට නැවත එම චිත්‍රය ඇඳිය නොහැකිය. ඒ වෙනුවෙන් සංතුසී බොහෝ දුක් වූවාය.



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

"සංකේත් ඊට පස්සෙ ආවෙ නැද්ද..?"

"නෑ.. මං කෝල් කරෙත් නෑ.."

"කෝල් එකක් දෙනකං බලාගෙන ඇති.."

"එයා එනකං මාත් බලාගෙන ඉන්න බව එයාට දැනෙන්න ඕන.."

මෙය නම් අරුම පුදුම ආදරයකි. අහම්බෙන් දැකපු කොල්ලෙක්ව චිත්‍රයක් ඇන්දා.. ඊට පස්සෙ කෙල්ල කවුද කියල දන්නෙවත් නැතිව ඒ කොල්ලා මේ කෙල්ලව හොයාගෙන ඇවිත්.

"සංකේත් උඹව බඳින්න කැමති නම්.."

"අම්මා කියන්නෙ අම්මට වගේ වෙයි කියලා.."

"එහෙම කොහොමද සාස්තර කියන්නෙ..?"

"අම්මා සත්ත කරලම කියනවා.. ඒ මිස සංකේත් ගැන දන්න වගක්වත් කියන්නෙ නෑ.. හිතේ තියෙන දේ හරියන්නෑ කියනවා.."

* * * * * * *

අනුත්තරා වඩාත් බිය වූයේ මුදිතා සංතුසීව හොයන්නේ කුමකටද කියාය. දැන් කුමන වේලාවක හෝ සංකේත් මෙම නිවසට පැමිණියහොත් සියලුම තිත්ත සත්‍යය කතාව ඔහුට දැනගන්නට ලැබෙනු ඇත. ඒ නිසා උමේෂ් සමග විවාහය ඉක්මන් කළ යුතු යයි සිතූ ඇය සති අන්තයේ දහවල් කෑමට





උමේෂ්ට ආරාධනා කරන්නට සිතා ගත්තාය. දෙමව්පියන්ද සංතුසීට කැමති විය. තමා හඳුනන විශ්වාස නොකළත් ඔවුහු සංතුසීගේ උපන් වේලාව රැගෙන ගියහ.

"අද ක්ලාස්ද අනුත්තරා..?"

කැතරින් සාලයට එන ගමන් ඇසුවාය.

"ඔව් පුංචි අම්මෙ.. කඩුවෙල ක්ලාස් එකයි.. හංවැල්ලෙ එකයි.. හවස එනවා.."

ඇය දැන් ගෙවල්වලට ගිහින් ඉගැන්වීමට පටන් අරගෙනය. එසේ කළේ දරු දෙදෙනා වෙනුවෙන් කෙසේ හෝ ආර්ථිකය නගාගත යුතු බැවිනි.

"මං කල්පනා කළේ පුංචි අම්මෙ.. ඉරිදට උමේෂ් පුතාට එන්න කියන්න.. ලන්ච් වලට.."

"ඒක කරන්න ඕන සංතුසී.."

"එයා නම් කවදාවත් කරන එකක් නෙමෙයි..."

"අන්න ඒකනෙ අනුත්තරා.. කෙල්ල හැසිරෙන්නෙ නිකං මල මිනියක් ගානට.. අන්තිමට අපටත් දොස් අහන්න වෙයි.."

"තෝකටත් අපි එන්න කියමු.. මට දවසේ ෆීස් හම්බවෙනවා.. මං බඩු ටිකක් ගේන්නං.."

කැතරින්ටත් වැඩි ආදායමක් නැත. ඇත්තේ පැන්ෂන් පඩියත්, වත්තෙන් ලැබෙන සුළු ආදායමත් පමණි. ලේලිය වත්තේ ආදායම



The Reader's Place http://e-pusthakalaya.blogspot.com/

ගානට මිම්මට ඉල්ලන්නීය. නුදුරු දිනයක තමාටත් මේ නිවසින් එළියට බැසීමට සිදුවන බැව් කැතරින් දන්නීය.

* * * * * * *

"ඇයි පුතා මේ කොළඹ ඉඳලා ආවත් හරි.. නිකං තෝන්තුවාවෙන් වගේ.. රැවුල වැව්ලා.. කන්නෙ බොන්නෙත් නෑ.."

මුදිතා කාමරයට ආවේ එසේ කියාගෙනය. සංකේත්ට එය ඇහුණාදැයි දන්නේත් නැත. මේ තරම් සසර කලකිරීමට හේතුව කුමක්ද..?

"පුතා.."

"මහ්.."

"පංකජ් හුඟ සැරයක් ගත්තලු අර මොකක්ද අහන්න.. ආන්සර් කරන්නැද්ද..?"

"මගෙන් අහන්න දෙයක් නෑ.. පංකජ්ට ඕන විදිහට වැඩ කරගන්න කියලා මං තියෙන්නෙ.. මෝඩයට ඒක තේරෙන්නෙ නෑ.."

"එහෙම තමන්ගෙ දෙයක් අනුන්ට පවරලා පුළුවන්ද පුතා..?"

සංකේත් එයට උත්තර දුන්නේ නැත.

"ඔයා මුලින්ම හරි ආසාවෙන් පටන් ගත්තේ ඔය ඇකඩමි එක හදන්න.. ඇත්තටම ඔයාට උදව් කරන්න සහෝදරයෙක්වත් නෑනෙ.."





ඒ ගැන දැන් නම් දුක්වෙලා වැඩක් නෑ අම්මේ යයි සංකේත්ට කියන්නට සිතුණි.

"එහෙම එකේ.. ඔයා දැන් මැරි කරන්න ඕන පුතා.. එතකොට දෙන්නෙක් ඉන්නවා එකම ජීවිතේ.."

අම්මා එසේ කියද්දී ඔහුට ඩබාගේ මුහුණ මැවී පෙනුණි. 'අනේ එයත් එක්ක ජීවිතේ බෙදා ගන්න තරම් වාසනාවන්තයෙක් නොමේ මං..'

"එහෙම කෙනෙක් ඉන්නව නම් කියන්න.."

ඔහුගේ නිහඬතාවය උපුලනු බැරිව මුදිතා කීවාය.

"අම්මා.. මං කියන කෙනාට කැමතිද..?"

"අපට නොගැළපෙන කෙනෙක් නෙමෙයිනේ.. පෙන්නන්න මට පුතා.. එහෙම කෙනෙක් ඉන්නව නේද..? ඒක මට ඇනුණා.."

සංකේත් යළිත් නිහඬ විය.

"පුතා අර සංකුසී නාම ඇවිත් නැද්ද..?"

"නැතිව ඇති.. ආවත් මං හිතන්නෑ ඒ ආන්ටි දුව අරගෙන එයි කියලා.."

"හරී ආඩම්බරයි වගේ නේද..?"

"එහෙම තමයි මිනිස්සු ඉතිං තුලී ගෙවල්වල හිටියට මොකද.."

"මට නම් එහෙම දෙයක් පෙනුණෙ නෑම්මා.. එදා එයා අසනීපෙන් හිටිය හින්ද වෙන්නැති.."



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

"එහෙමද..?"

"අම්මා මොකටද ඔය සංතුසී හොයන්නෙ කියන්නකෝ.. මොනවා වුණත් ඒ කෙල්ලට රසට තේ හදන්නත් පුළුවන්.."

"ඔයා දැකලා නෑ කිව්වෙ..?"

"දැක්කෙ නෑ.. තේ එක හැදුවෙ ඒ කෙල්ල.. ඒ ආන්ටි ඇතුළට ගිහින් තේක ගෙනාවා.."

පුතා කියන්නේ ඇත්තක් බව දැන් මුදිතාට වැටහෙයි. ඔහු චිත්‍රවලට කැමතිය. සංතුසීට චිත්‍ර අඳින්නත් රසට තේ හදන්නත් පුළුවන් නම්.. ඇය දුටුවහොත් සංකේත් ඇයට කැමති වීමට බැරිකමක් නැත. එහෙත් දැන් ඔහු වෙන යම් පටලැවිල්ලක සිටින බව පැහැදිලිය. එහෙත් ඔහු කසාද බඳිනවා නම් ඒ කෙල්ල වැදගත් පවුල් පසුබිමක උගත්, බුද්ධිමත් රූමත් යුවතියක විය යුතුය. සංතුසීගේ මව වැන්දඹු ගැහැනියක වග මුදිතාට ආරංචි වී තිබුණි. මව ලස්සන නිසා දුවද ලස්සන විය හැකිය. එහෙත් එවැනි ගැහැනියකගේ දුවට නම් කැමති විය නොහැක.

"කෙල්ල නිකමට මට කෝල් එකක් දුන්නෑ.."

ඔහු සිතුවේය. 'එයා මට ලැබෙන්නෙ නෑ.. එයා ඒක මට කීවා. අනුන්ගෙ කෙල්ලෙක් මොකටද බලෙන් අත්පත් කරගන්නෙ.. ආදරේ බලෙන් ගන්නත් බෑ..'

මේ හිත හදා ගන්නේ කෙලෙසදැයි ඔහු සිතුවේය. අධ්‍යාපන ආයතනයේ වැඩ නිමවෙමින් පවතී. පංකජ එහි සියලු වැඩ



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/



ක්‍රමානුකූලව නිම කර ඇත. තමා සිටියා හෝ නැතා හෝ ඒ වැඩ නියමිත දිනට ප්‍රමිතියට කෙරෙයි.

බලවත් චිත්ත පීඩාවක් ඔහුගෙන් මනස හා සටන් කරමින් සිටියේය. එය ඔහුට නිරන්තර අපහසුවක් ගෙන දුන් අතර ආදරය හා ආදරය නොලැබීම අතරේ වෙනස කෙතරම්දැයි ඔහු වටහා ගත්තේය. තමාට ඒ ආදරය නොලැබී ගියහොත් තමා ජීවත්වන්නේ කෙසේද..? ඔහු පංකජ්ට දුරකතන ඇමතුමක් ගත්තේය.

"මචං.."

"සංකේත් උඹ මොනවද ෆෝන් ආන්සර් කරන්නැතිව ඉන්නෙ.. බලපං.."

"මට ඕවා කියන්න එපා.. උඹට බාර දීලා තියෙන්නෙ.."

"මට මේ සේරම තනියම කරන්න පුළුවන්ද..?"

"ඇයි උඹේ ගීත නගා.."

සංකේත්ට නිකම්ම කියවුණි. පංකජ්ට වඩාත් කෝන්ති ගියේය. ඔහුට මේ කිසි දෙයක වගකීමක් නැත්තේ ඇයි..? ඔහුගේ ආදරය ඔහුට හිමි නොවූ නිසා වන්නට ඇත.

"මං කතා කරේ.. මගේ ඩිසිෂන් එක උඹට කියන්න.."

"මොකක්ද..?"

"මං.. ටික කාලෙකට ඉන්ග්ලන්ඩ් යනවා.."

"ඇයි..?"

"විස්තර අහන්න එපා.."

"ඉන්ග්ලන්ඩ් ගියාට වැඩක් නෑ මචං.. දැන් ලෝකෙ පුංචි වෙලා.. එහෙම නම් උඹ අහහරු වාගේ ලෝකෙකටවත් යන්න බලපං.."

එසේ කියූ පංකජ් දුරකතන අතරුව තැබුවේය. පංකජ් සිතුවේ එය මිතුරා කටට ආවාට කී දෙයක් විදිහටය. නමුත් සංකේත් එය කීවේ සැබෑවටමය.

✹ ✹ ✹ ✹ ✹ ✹ ✹

උමේෂ්ගේ පැමිණීම සංතුසිට මහත්ම වදයක් විය. සංකේත් එනු ඇතැයි ඇය බලා සිටියාය. නමුත් ඔහු ආවේ නැත. දැන් මාසයක් පමණ ගෙවුණත් ඔහු ආවේ නැත. සංකේත් ගැන අම්මා මොනවා හෝ දන්නවා යයි ඇයට සිතුණි. එහෙත්.. දැන් සිද්ධ වන්නේ මේ ආගන්තුක මිනිසා හා විවාහවීමටය.

"මොනවද ඔයා ඔය හැටි කල්පනා කරන්නෙ..?"

උමේෂ් ඇසීය. ඔහු වෘත්තියෙන් ඉංජිනේරුවරයෙකු, උගත්, වැදගත් මහත්මයෙකු වුවත් සංතුසිට ඔහුගේ ගතිගුණ ඇල්ලුවේ නැත.

"නෑ.. මම පේන්ටින් එකක් කර කර හිටියෙ.."

"ඔයා කැමති නැද්ද මැනේජ්මන්ට් වාගෙ කෝස් එකක් කරලා.. ජොබ් එකකට යන්ට.. ඔය පින්සලෙන් චිත්‍ර කුරුටු ගගා.. කොහොමද සල්ලි හොයන්නෙ..?"

සංතුසීගේ පපුව වේදනා දෙන්නට විය. චිත්‍ර ඇඳීම තමාගේ ආත්මයයි. ලේඛකයෙකුට ලිවීම, නළු නිළියන්ට රඟපෑම, නැටුම් ශිල්පියෙකුට නර්තනය, ගායකයෙකුට ගායනය සේම.. චිත්‍ර ශිල්පිනියකගේ හද ගැහෙන ආත්මය ඇඳීම හා බද්ධ වී පවතින බව ඔහුට හඳුනා ගත නොහැකිද..? තමා ජීවිත කාලයක් එකට ඉන්න යන්නේ මොහු සමඟද..? ජීවිතය හුවමාරු කරගන්නට පපුවේ ආදරය ඇති.. තමාව තේරුම් ගැනීමට හැකි මිනිසෙකු අවශ්‍ය වෙයි.

"සල්ලි.. ඉතිං ජීවත්වෙන්න ඕන තමයි.. ඒත් අපි සල්ලි පස්සෙ නම් දිව්වෙ නෑ.. ලැබෙන විදිහට ජීවත්වුණා.."

"ඒක හරියන්නෑ සංතුසී.. ජීවිතේ සක්සස් එකක් තියෙන්නෙ ඕන.."

"මම සක්සස් එක හොයන්නෙ සල්ලි හම්බ කරලා නෙමේ.. මගෙ හිතේ සතුට තමයි මගෙ සක්සස් එක.."

සංතුසී උමේෂ් හා වාද කරන හැටි අනුත්තරා අසා සිටියාය. දෙදෙනා අතර මානුෂීය සම්බන්ධයක් ගොඩ නැගෙන්නේ නැත. ඇය පපුව අල්ලා ගත්තාය. තමා දියණියගේ ජීවිතයට හානියක් කරන්නට යනවාද..? තමා පෙන්නන ඕනෑම හිතන්නෙකු හා වුවද විවාහයට ඇය කැමති බව කියයි. තමාත් ඒ දිනවල එසේය. හැමෝගේම අකමැත්ත මැද ධම්ම හා විවාහ වූ හැටි ඇයට සිහිපත් වෙයි. මේ දරුවගෙ ජීවිතෙත් සතුට ඈත්වෙලා යයිද..?





The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

"අපේ ඔෆිස් එකේ ඉන්න ගර්ල්ස්ලා.. ලක්ෂ එක හමාරක් විතර පඩි ගන්නවා. ඔයාගෙ සැලරි එක කීයද..?"

"විසි දාහයි.."

"අන්න ඒකනේ සංතුසී මං කියන්නෙ.. ඔය චිත්‍ර ඇඳිල්ල නවත්තලා.. වෙන දේකට යොමුවෙන්න කියලා.."

"සුසන්තිකා දුවන්නෙ නැතුව මොනවා කරන්නද..? නිරෝෂා විරාජිනී සිංදු කියන්නෙ නැතිව මොනවා කරන්නද..? ඒ අය හදන්න බෑ.. බිහිවෙන්න ඕන.. යම් දක්ෂතාවයක් වෙනුවෙන් එයාලා බිහිවෙලා තියෙනවා.. එයාලා පවතින්නෙ ඒ හැකියාවෙන්.. අන්න ඒ වගේ.."

"ම්.. ඇති.. ඇති.. අති පණ්ඩිතයි ඔයා.."

උමේෂ් ගැහැනුන් මෙසේ කියනවාට කැමති නැත. නිවසේ නායකත්වය ඇත්තේ උමේෂ් ළඟය. 'උඹ ඔහොම ටිකක් නටපංකො.. මැරි කරනකං.. ඊට පස්සෙ මං උඹව ගානට හදල ගන්නං..'

"හරි.. හරි.. ඉට්ස් ඕකේ.. දැන් වෙඩින් එකට ලෑස්තිද..?"

"විශේෂ ලෑස්තියක් නෑ ඉතිං.. වෙඩින් එකකට නෙමේ.. ඔයාව මැරි කරන්න ලෑස්තියි.."

"වෙඩින් නැතිව මැරි කරන්නෙ කොහොමද..?"

"අපි දෙන්නගෙ අදහස් එකට යන්නෙ නෑ නේද..?"



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/



"ඕවා ගානට හරියනවා.."

උමේෂ් එසේ කියමින් සිනාසුණේය. ඔහුට සංතුසී අත ඇරීමට හිතක් නැත. 'කාර්යාලයේ ෂෙවෝනි, අම්මා කතා කරලා තියෙන අජිත් ප්‍රපෝසල් එක.. ඩොක්ටර් දිල්හානි.. ඒ ඔක්කොටම වඩා.. මේ පුදු කෙල්ල ගති.. දැවැද්ද සත පහක් නැතුවත් කමක් නෑ.. ගෙදර ගෙනිහින් බල බලා හිටියත් ඇති. දැනුත් කොහෙ හරි යං කියන්ඩ හිතෙනවා.. දැක්කම හැඟීම් පාලනය කර ගන්ඩ අමාරුයි.. ඒත් වවුමට යං කීවත් බෑ කියන කෙල්ල එහෙම එන්නෙ නෑ...'

✵ ✵ ✵ ✵ ✵ ✵ ✵

# 07

අනුත්තරා ඉංග්‍රීසි ටියුෂන් සඳහා පුවත්පත් දැන්වීමක් දැම්මාය. ඒ අනුව ඇයට දින හතටම පන්ති සකසා ගත හැකිවිය. සෙනසුරාදා, ඉරිදා මුළු දවසම ගෙයින් එළියට මාරු වෙවී පංති කිරීම තරමක් දුෂ්කර කාර්යයක් විය. නිවසට යනවිට බොහෝ විට රෑ බෝවෙයි. ධීනලීගේ විභාගයත් ළඟ නිසා ඇගේ අවශ්‍යතා සොයා බැලීමටවත් අනුත්තරාට අවකාශයක් නොවීය. ඇය මෙතරම් මහන්සි වූයේ සිටුවරයෙකුට වුව කෙල්ල නිකම්ම දෙන්නට බැරි නිසාය. රත්තරන් බඩුවක්වත් සාදවා දිය යුතුය.

"ආන්ටි.. ආන්ටි.. කොහෙද මේ යන්නෙ...?"

කොට්ටාවේ පංතියක් නිමවී යනවිට ත්‍රීවීලර් එකක ගමන් කළ තරුණයෙක් තමාට කතා කළ නිසා අනුත්තරා හැරී බැලුවාය.

"ආ.. මේ පුතානේ.."





"මං ආන්ටිව හෙව්වා.. වැදගත් වැඩකට.. නගින්න.. නගින්න.."

පංකජ.. ඇය කොහෙ යන්නේදවත් නොවිමසා.. ඇයගේ අතින් ඇද ත්‍රීවීලර් එකට නග්ගවා ගත්තාය.

"අනේ පුතා.. කොහෙද මේ යන්නෙ.. මට මහරගම ක්ලාස් එකක් තියෙනවා.. හතරට.."

"මං ක්ලාස් එක ළඟින් ඔන් ටයිම් බස්සවන්නම් ආන්ටි.. මේක.. මේක වෙරි ස්පෙෂල් ඇන්ඩ් ඉම්පෝටන්ට්.."

අනුත්තරා සිනාසුණාය. විශේකාර වයසට කඩියා වගේ වැඩ. ත්‍රීවීලරය නැවතුණේ තට්ටු තුනේ ඉතාම අලංකාර ගොඩනැගිල්ලක් ඉදිරිපිටය. එහි වැඩ තවම නිමවී නැත. තමා උන් ඉඩමේ පරිසරයටද හානියක් නැතිව.. ලස්සනට මේ ගොඩනැගිල්ල ඉදිකළේ කවුද..?

"ඇයි ආන්ටි.. පුදුමයිද..?"

"න්.. නෑ.. සංකේත් පුතා ඉන්නවද..?"

"සංකේත්.. ඉන්ග්ලන්ඩ් ගියා.. කවදා එයිද දන්නෙ නෑ.. යමුකො ඇතුළට.."

එසේ කියමින් ඔහු ඇයව රැගෙන ගියේ හිටපු නිවසටමය. එය අලුත්වැඩියා කර නිවසක් ලෙස සකසා ඇත.

"වාඩිවෙන්න ආන්ටි.. මේකයි වැඩේ.. අපේ බොස් රට ගියානේ.."



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

"කොච්චර කාලෙකටද පුතේ..?"

"දෙයියො තමා ඒක දන්නෙ.. ආන්ටිට හින්දා කියන්නම්.. මේ කෙල්ලෙකුගෙ ප්‍රශ්නයක් නිසා.. ඒ කෙල්ලගෙ නමවත් දන්නෙ නෑ.. දවස් දෙකයි තුනයි දැකලා තියෙන්නෙ.. ඉතිං.. ඒ කෙල්ලට මිනිහා ලව් බොක්කෙන්ම.. වැඩේ කියන්නෙ කෙල්ලට බඳින්න කොල්ලෙක් ඉන්නවා.."

අනුත්තරාගේ පපුව දැවෙන්නට විය. රට හැර යන්නට තරම් ඔහු තම දියණියට ආදරය කළාද..? ලංකාවේ සිටියා නම් ඔහු කෙල්ලව කෙසේ හෝ අයිතිකර ගනු ඇත. නැනා මස්සිනා විවාහ.. හරියන්නේද නැත. කෙල්ල ලොකු අපලයකින් ගැලවුණා යයි ඇයට සිතුණි. ඒ සැහැල්ලුවත් සමග ආපිට හදවත බර වූයේය. මේ තරුණ හදවත් දෙක මොන තරම් වේදනාවක් විඳිනවා ඇද්ද..? එහෙත් සත්‍ය පිළිගැනීමට ඔවුන් කැමති නොවනු ඇත. සංතුසීට මේ සත්‍යය පහදා දෙන්නට ඇත්නම්.. එහෙත්.. මුදිතා සංතුසී සොයන්නේ කුමකටද..?

"ආන්ටි වෙන ලෝකෙකට ගියා.."

"අනේ නෑ.. මට දුක හිතුණා.. මටත් ඔහොම කාලයක් තිබුණනේ.."

පංකජ සිනාසුණේය. අම්මලා මෙහෙම ඉන්නවා නම් කොච්චර හොඳද..?

"මේකයි ආන්ටි.. මෙතන අපි ඇකඩමි එකක් කරන්නෙ.. ඉංග්‍රීසි, ප්‍රංශ, ජැපෑන්, කොරියා වගේ භාෂා.. ඒත් එක්ක මියුසික්



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/



ආර්ට් ඩාන්සින් වාගෙ දේවල්.. මං හිතුවෙ ආන්ටි කැමති නම් ඉංග්ලිෂ් උගන්වන්න.. සංතුසීව චිත්‍රවලට දාන්න.."

අනුත්තරාට මෙය අදහාගත නොහැක. එහෙත් අයිතිකරුවා සංකේත් නිසා සිද්ධවන්නේ යහපතට වඩා අයහපතකි. සංකේත් පැටලී ඇත්තේ තම දියණිය සංතුසී සමග වග මේ අඹ යාළුවාද නොදන්නා කරුණකි.

"අනේ පුතා.. ඔය වගකීම් දරන්න බෑ.. මං තනි ගෑනිනේ.. ඉන්පිව්පුවල් පහසුයි.. ඒකයි මේ.."

"මෙතන හොඳ සැලරිස් ගෙවනවා.. ආන්ටිට සම්පූර්ණයෙන්ම ඉංග්ලිෂ් සෙක්ෂන් එක භාරදෙන්නම්.. සංතුසී එක්කත් කතා කරලා බලන්නකො.."

ඊට උත්තරයක් දෙන්නට අනුත්තරා පමා වූවාය. පුවත්පතක චිත්‍ර ශිල්පිනියකට වඩා චිත්‍ර ගුරුවරියක ලෙස සේවය කිරීමෙහි වරදක් නැත. සංතුසී තම රැකියාවෙන් ඉමහත් සතුටක් ලබන බව ඇය දනී.

"සංතුසීගෙන් අහනවද..?"

"මං අහන්නං.."

"ඒ කියන්නෙ එයා ඉන්දියා ගිහිල්ලා ඇවිල්ලනේ.. මුදිතාන්ටිට.. ඒ කියන්නෙ සංකේත්ගෙ අම්මට සංතුසීව හම්බවෙන්නම ඕන කියනවා.."

අනුත්තරාට කටඋත්තර නැතිවිය. සංසේත් පිටරටක හිටියාට මුදිතා ඉන්නේ ලංකාවේ බව අනුත්තරාට අමතක වී තිබුණි.

"මොකටද ඒ මැඩම් මගෙ දුව හොයන්නෙ..?"

"සමහරවිට චිත්‍රයක් අන්දගන්න වෙන්නැති.. සංකේත් හරි ආසයිනෙ චිත්‍රවලට.."

"මං එහෙනම් යන්නද පුතා..?"

"මට හෙටම උත්තරයක් දෙන්න ආන්ටි.. අපිට ඇඩ්වර්ටයිස් කරන්න ඕන.."

"අනේ.. මං බලන්නම් පුතේ.. සංතුෂී නම් කැමතිවෙයිද දන්නැ.. මේ ගෙයින් අපට යන්න කිව්වා කියලා සංතුෂී සංකේත් පුතත් එක්ක හිත හොඳ නෑ.. තරහෙන් ඉන්නෙ.."

"හෝ.. හෝ.. එහෙමද..?"

පංකජ් හඬ නගා සිනාසුණේය. නමුත් භුවනි කතාව ගෙතුවේ සංතුෂී හා සංකේත් අතර සම්බන්ධයක් ඇති බවය. හෙලන් ආන්ටි ලංකාවට පැමිණියත් භුවනි සංකේත්ගේ නිවසෙහි රැඳී සිටියාය. ඔහු රට ගිය පසු.. භුවනී යළිත් කොළඹට ආවේ යථාර්ථය තේරුම් අරගෙන විය යුතුය.

"ආන්ටි.. ක්ලාස් එකට යන්න ත්‍රීවීලර් එකේම.. ඒක අපේ එකක්.."

පංකජ් ඇයට ත්‍රීවීලර් රථය වෙත ඇරලුවේය. පංකජ්ගේ හිත දැන් නිදහස්ය. මෙහි කලා අංශය සංතුෂී යටතේත් ඉංග්‍රීසි අංශය.. ඇය යටතේත් පවත්වා ගත හැකි නම් පහසුවකි. දක්ෂයාට තැන දිය යුතු වෙයි. 'මේකා ලංකාවෙ හිටිය නම් කොච්චර ලේසිද..? දැන් ඉතින් මං මැරෙන්ඩ ඕනෑ..'





ඔහු දුරකතන ඇමතුමක් ගත්තේ මුදිතාටය.

"ආන්ටි.. සංතුෂී ලංකාවට ඇවිත් ඉන්නෙ.."

මුදිතාට එය සතුටුජනක ආරංචියක් විය. කුමන හේතුවකට නමා මේ කෙල්ල සොයනවාදැයි ඇයටම පැහැදිලි නැත. නමුත් ඇය හමුවිය යුතුය.

"අනේ පුතා.. මට කොහොම හරි මුණගස්සන්න බලන්න.. මං ඔච්චර කියලත්.."

"ශුවර් ආන්ටි.. මේ පංකජ වැඩක් බාරගත්තොත්.. ආයෙ දෙකක් නෑ.."

"ආ.. ඇති.. ඇති.. කයිවාරුව ඇති.. මට කියන්න දවස.. මම ට්‍රේන් එකේ කොළඹ එන්නං.."

"ඕ...කේ ආන්ටි.."

පංකජ් සතුටින් යුතුව දුරකථන අතළුව තැබුවේය.

* * * * * * *

සංකේත් විදේශගතව ගොස් උන්නේ තම මිතුරෙකුගේ නිවසේය. ඇවිදීම ඇර ඔහුට වෙන කරන්නටද දෙයක් නොවීය.

"සංකේත්.. මොකද කරන්නෙ..?"

මිතුරාගේ බිරිඳ අමල්කා කතා කළාය.

"කම්මැලිකමේ ඉන්නවා.. ලංකාවට යන්නත් හිතෙනවා.. එහෙ ගියා නම් වැඩ ගොඩයි.."



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

ඔහු ගත් තීරණය ගැන පසුතැවෙමින් සිටියේය.

"මාත් දැන් යනවා වැඩට.. ආ.. ලංකාවෙ මැගසින් පත්තර ටිකක් තියෙනවා.. බලන්න.."

ඇය පුවත්පත්, සඟරා ගොන්නක්ම සංකේත් වෙත දුන්නාය. අමල්කාන්.. භාතියත් පිටවී ගිය පසු.. සංකේත් නිවසේ තනිවිය. සීතල අධිකය. පැන්ට්‍රියට ගිය ඔහු උණුසුම් කෝපි කෝප්පයක් සාදාගෙන සාලයට වූයේ හිතේ වූ පාළුවත් තුරුළු කර ගනිමිනි. 'නමවත් කීවෙ නැති කෙල්ල.. සුදු සුරංගනාවි.. පන්සල ළඟ දැක්ක හොල්මන.. මාව පිස්සෙක් කළා.. මේ ලෝකෙ තියෙන හැමදේම මට එපා කළා..'

සංකේත් පුවත්පත් කිහිපයක තොරතුරු උඩින් පල්ලෙන් කියවා දැමුවේය. ඔහු බොහෝ විට පුවත්පත් කියවූයේ අන්තර්ජාලයෙනි. සඟරාවක් පෙරළූ ඔහු තමාගේ සිතුවමක් දැක.. පුදුම වූයේය.

සංතුෂීගේ ප්‍රථම චිත්‍ර ප්‍රදර්ශනය යනුවෙන් එහි සඳහන් වී තිබුණි. මේ තමාගේ චිත්‍රයකි. සංතුෂී කොහොමද තමාව ඇන්දෙ..? ඔහු වහාම ලංකාවට දුරකථන ඇමතුමක් ගත්තේය. ඒ වනවිට මුදිතා උත්තේ දහවලට උයන්නට ලෑස්ති වෙමිනි.

"අම්මා.. සංතුෂීව හම්බවුණාද..?"

"මොකද මේ හදිසියෙම සංතුෂී ලන්ඩන් ඇවිල්ලද..?"

"නෑ අම්මා.. මේ පත්තරේ ආටිකල් එකක්.. ඒ කෙල්ල මගෙ පින්තූරයක් ඇඳලනේ.."





ඒ පින්තූරය ඇත්තේ තමා ළඟ වග මුදිතා කීවේ නැත.

''මට පංකජ කීවා සංතුෂී මුණගැස්සන්නම් කියලා.."

''හරි.. හරි.. මං පංකජට ගන්නම්.."

එසේ කියමින් ඔහු දුරකථන ඇමතුම විසන්ධි කළේය. මුදිතාට කිසිවක්ම තේරුම් ගත නොහැක. තම පුතාගේ රූපය.. ඒ කෙල්ලගේ පසුවේ නිදන් වූයේ කොහොමද..? ඒ රූපයෙන් පුතාව වසාගෙන මතුවන්නේ තම ආදරණීය සොහොයුරාගේ රූපය නොවේද..?

හිත පසුතැවෙමින් පවතී. මේ භුක්ති විඳින සැප සම්පත්වලින් භාගයක් අයිති ධම්මටය. ඔහු නැති නිසා ඔහුගේ බිරිඳටත් දරුවන් දෙදෙනාටත් ඒවා හිමිවිය යුතුවෙයි. නමුත් අනුත්තරා කිසිම දිනෙක ඒවා ඉල්ලාගෙන වලව්වට ආවේ නැත. තමා සොයන්නේ ඔවුන්වයි. ඔවුන්.. අනුත්තරාගේ ගම වූ කුලිගාපිටියේ නැත. පොළොන්නරුවේත් නැත. ඉඳින්.. කොහේ කියා හොයන්නද..? මුදිතා ඔවුන් සෙවීම අතඇර තිබිණි. වැඩිමහල් දියණිය හදා ගැනීමට ඉල්ලුවේ අනුත්තරා යළිත් ගැබ්ගෙන ඇති බව පවසන්නට ඇය වලව්වට ආ දිනය. තම අම්මාත් අප්පච්චීත් ඇයට කෙතරම් නිගා කළාද..? ඇය දරු දෙදෙනා සමග කොහේ හෝ දුක් විඳිනවා ඇත. යටපත් වී ගොස් තිබුණු ඒ මතකය යළි ඇවිස්සුණේ සංතුෂීගේ චිත්‍රය දැකීමෙනි.

පංකජගේ දුරකථනය ක්‍රියා විරහිත වී තිබීම නිසා සංකේත්ට උපරිමයට කේන්ති ඇවිස්සී තිබිණි. 'මී හරකා.. ඊ. තිස්සෙ කෙල්ලොත් එක්ක මල් කඩ කඩ ඉඳලා.. දැන් බැටිරි ලෝ ඇති..'



The Reader's Place http://e-pusthakalaya.blogspot.com/

"ඔබ මෙතෙක් නිර්මාණය කළ චිත්‍ර අතරින් වඩාත්ම ප්‍රිය කරන්නේ කුමන චිත්‍රයටද..?"

සහරාවට යළිත් ඔහු නෙත් යොමු කළේය. තමා අම්මාට කතා කළේ කෙතරම් කලබලෙන්ද..? 'ෂත්.. මෙච්චර ප්‍රශ්න අහලා.. මේකිගෙ ෆොටෝ එකක් දාලා නෑනේ..'

"මම මේ චිත්‍රය නම් කළේ බෝසත් කියලා.. ඇත්තටම.. මේ තරුණයා දුටු පළමු මොහොතෙම ක්ෂණිකව හිතට ආපු සිතුවිල්ල තමයි බෝසත්.. කියන එක. මට ඒක හිතාගන්න බෑ.. මගේ අප්පච්චි නැතිවෙනකොට මට අවුරුදු පහයි. අම්මගේත්, අප්පච්චිගේත් විවාහයේ ඡායාරූපයේ ඉන්න මගේ අප්පච්චිගේ රූපය මගේ පපුව ඇතුළෙ හැංගිලා තිබුණා. මං හිතන්නේ මේ තරුණයව දැක්ක ගමන් මට අප්පච්චි ගැන මතකය ඇවිස්සෙන්න ඇති. එක රැයකින්.. මං දන්නෑ.. මං ඇහිපිල්ලමක්වත් ගැහුවද කියලා.. මුළු රෑ පුරාම මම මේ චිත්‍රය ඇන්දා.."

"මේ රූපය හිමි තරුණයා ඔබට අවසර දුන්නද..?"

"නැහැ.. මම ඔහු දුටුවා විතරයි.. ඔහුගේ හඬවත් අහලා නෑ.. නමුත් දැන් ඔහු මගේ මතකයේ සදාකාලිකව ජීවත්වෙනවා.."

චිත්‍රය ගැන සඳහන් වූ දේවල් සංකේත්ට පුදුමය. 'මේ කෙල්ල මාව දැකලා තියෙන්නෙ පන්සලෙන්.. සමහරවිට.. එයාගෙ අම්මා එදා අපෙ අම්මට මූණ දෙන්නෙ නැතිව ගියේ ඒ හින්දද දන්නෙ නෑ.. ඇත්තටම චිත්‍රෙ 'බෝසත්' කියල නම් කළේ.. මගෙ මූණෙ එහෙම බෝසත් පෙනුමක් සංතුෂිට පෙනුණද දන්නෑ.. ඇත්තට එහෙම කෙල්ලෙකුට හිතෙන්නනත් විශේෂ හේතුවක් ඇතිනෙ.. කෙල්ල ඇත්තටම අර භුවනි කියන්නා වාගේ මට





ලව්ද දන්නෙත් නෑ.. ඉතින් මොනවා කරන්නද..? යූ ආ ටූ ලේට් සංතුෂී..'

එය එසේ වුවත් සංතුෂීව දැක ගැනීමේ බලවත් ආසාවක්.. ඇයට අවශ්‍ය ඕනෑම දෙයක් පරිත්‍යාග කිරීමේ උවමනාවක් ඔහුට සංතුෂී කෙරේ දැනිණි. 'ෂත්.. ඒ චිත්‍රෙ එයා ළඟ තියෙනවද දන්නෑ.. ඒත් භුවනින් එක්සිබිෂන් එක බැලුවානේ..' දැන් සංකේත්ට යමක් වැටහෙයි.. 'භුවනි අර තරම් කස්තිරමක් නැටුවේ තමාගේ මේ බෝසත් චිත්‍රය දැකීමෙන් විය යුතුය. සංතුසියි මායි යාළුයි කියලා අම්මවත් ඇවිස්සුවෙ ඒ හින්ද තමයි..'

"මං දන්නවා.. ඔයා උමේෂ්ව බඳින්නෙ කැමැත්තකින් නෙමේ කියලා.. ඇත්තටම ලොකු පුතේ.. ඔයාගෙ ජීවිතේටත් මට වගේ වෙයි කියලා මට ලොකු බයක් තිබුණා.."

අනුත්තරා කතා කළේ රාත්‍රියට ආහාර පිසින ගමන්මය. අත් වේල නොකෑවත් ඩිනලිටත්, සංතුෂීටත් රාත්‍රියට නම් බඩ කට පුරා කන්නට අවශ්‍ය වෙයි. පොලොස් මැල්ලුමේ තෙම්පරාදුවට ඩිනලිගේ බඩගිනි වැඩිය. ඇය පිඟාන සෝදාගෙන අනුත්තරා ළඟට ගියාය.

"පොඩ්ඩක් ඉන්නවා.. කරවල හොද්ද ඉදිලා නෑ හලෝ.."

සංතුෂී හොද්ද හැඳිගාමින්ම කීවාය.

"ඔහොම හැඳි ගෑවොත් කරෝල සූප් තමා බොන්න වෙන්නෙ.. උමේෂ් අයියගෙ අම්මා.. හට්ටි වලං ඔළුවෙ තමල ගෙදර එවයි.."



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

ඩිනාලි කීවේ විහිලුවටය.

"එහෙම එවනව නම් ඒකත් ලොකු දෙයක්.."

ඇයට කියවිණි. අනුත්තරාට මේවා අහන්නට නොහැකිය. අකමැත්තෙන් දරුවාව විවාහ කර දී අවසානයේ ඇය දුක් විඳින්නට වුවහොත් තමාට මේ ජීවිතයෙන් ඵලක් නැත.

"දවාලෙ ඉතුරු අල ටිකක් ඇති.. කෝ.. අල්ලන්න පුතේ පිඟාන.. දැන් මේසෙට ගිහින් කන්න.."

දරුවාගේ බඩගින්න වැඩිවී ඇත. නැතිබැරිකම් දන්නා දරුවා දැන් 'චයිනීස්' ඉල්ලා කරදර කරන්නේ නැත. අල බතල කැලෑ කොළ, කොස්, පොලොස්.. දැන් ඇයට හුරුය. අනුත්තරා.. සංකුසිගේ අතින් හැන්ද අතට ගත්තාය. ඩිනාලි කීවාක් මෙන් ඇයට ඉඳුම් පිහුම් හුරුවක් නැත.

The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

"ඈ ලොකු පුතේ.. උමේෂ් මොකද කියන්නෙ..?"

අනුත්තරා කරවල හොද්දට හීනියට කැපූ තක්කාලි, ළූණු පෙති හා කරපිංචා එකතු කළාය. මාළු මිරිස් කරල් දෙක තුනකුත් දෙකට පලා නොදැමුවහොත් ඇයට හොද්දේ රස මදිය.

"උමේෂ් කියන දේවල් මට තේරෙන්නෙ නෑ අම්මෙ.. එයා ඉතින් මට වඩා ප්‍රොෆේෂන් එකෙන් උසස්නෙ.. මං නිකම්ම නිකං පත්තරේක ආර්ටිස්ට් කෙනෙක්. එයා අහනවා චිත්‍ර ඇඳලා සල්ලි හම්බ කරන්න පුළුවන්ද කියලා.."

දියණියගේ තේරීම හරිය. සංකේත් චිත්‍රවලට පුදුම ලෙස





ප්‍රිය කරයි. දියණියගේ ආත්මය ඇඳිම නම් ඇය විවාහ විය යුත්තේ ඇගේ ආත්මයට ආදරය කරන කෙනෙකු සමගය. යැනසීමක් නැති විවාහයක ඇය සදාකාලික වැඳවන්නියක විය යුතුද..? එහෙත්.. දැන් මනාල පාර්ශවයෙන් යෝජනා ස්ථිර කර එවා ඇත. දැන් ඇත්තේ නැකැත් බැලීමටය. ඉන්පසු මාස හයකට පමණ එහායින් විවාහ උත්සවය ගන්නට බලාපොරොත්තු වෙයි. දරුවා දැන් ඉන්නේ හිත හදාගෙනය.

"එයා ෆස්ට් ප්ලේස් දෙන්නෙ සල්ලිවලට... ඒකයි මට මැනේජ්මන්ට් කෝස් එකක් කරලා ඒ පැත්තෙ රස්සාවකට යන්න කියන්නෙ.."

"ඔයා මොකද කිව්වෙ..?"

"මොනවා කියන්නද ඉතින්..?"

පංකජ් කී කාරණාව දැන් දියණියට පැවසිය හැකි නම් හොඳ යයි අනුත්තරාට සිතුණි. එහෙත් සංකේත් යනු කාගේ කවුදැයි පැවසුවහොත් ප්‍රශ්න ඇතිවිනු ඇතැයි ඇයට සිතුණි. නමුත් උමේෂ් කියනවා නම් වැඩි පඩියකට රැකියාවට යන ලෙස.. එම ආයතනයේ රැකියාව කරන්නේ චිත්‍ර සම්බන්ධයෙන් නිසා.. සංකුසී අකමැති නොවනු ඇත. මවත් දුවත් අතර මෙතෙක් කල් නම් රහස් තිබුණේ නැත. සංකුසී ඔහුට ආදරය නොකළා නම් මෙලහටත් මෙය පවසන්නට තිබුණි. උමේෂ් හා විවාහ වූවායින් පසුව.. සංකේත් ගැන අදහස් අත්හැර ගනු ඇත.

අනුත්තරා අස් රෙදි කඩකින් අල්ලා කරවල හොද්ද බෑවාය. එහි සුවඳ ගේ පුරාම පැතිරෙමින් තිබුණි. ඩිනාලි පිඟාන ඔසවාගෙන කුස්සියට දිව ආවාය.

"තව බත් ටිකක්.."

"හා.."

අනුත්තරා ඇයට තව බත් හැන්දක් බෙදුවාය. දරුවන් දෙදෙනා මෙලෙස තමා ළඟ, තම ඇස්වලට පෙනි පෙනී දුක වින්දත් ඇයට සැපකි.

"මං දෙයක් කියන්නද ලොකු පුතේ.."

"මොකක්ද අම්මා..?"

"ඔය සංකේත්.."

අම්මා සංකේත් ගැන කතා කරද්දි සංතුෂී කලබල වූවාය. අම්මා නම් ගම් පවා දන්නේ කොහොමද..?

"සංකේත් කියන්නෙ අපේ ඉඩම් ගත්ත මහත්තයා.."

"අම්මා.."

"ඔව් පුතේ ඔව්.. අපිට අල්ලන්න පුළුවන් කෙනෙක් නෙමේ පුතේ.. හිත හදාගෙන උමේෂ්ව බැඳලා පවුල්වෙන එක හොඳයි.."

'සංකේත් හැදුවෙ මාත් එක්ක සෙල්ලම් කරන්නද..? අනේ ඒක නම් වෙන්න බෑ..'

සංතුෂී හඬාගෙන කාමරයට ගියාය. තමා මෙය කතා කළ වෙලාව වැරදි යයි ඇයට හිතුණේ බඩගින්නේ බත් කන්නට බලා උන් දරුවා දැන් ඉතින් නොකා නිදියන එක ගැනය. 'කමක් නෑ.. වේලක් නොකෑවට මැරෙනවයෑ.. මං හිටියෙ ඒක



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/



කියාගන්න බැරිව.. මේවා නම් දෛවයේ හාස්කම්.. තාම දන්නෙ නෑ ඒ තමුන්ගෙ නෑන්දගෙ පුතා කියලා..'

* * * * * * *

සංකේත් සහරාවේ කතුවරියට කතා කර සංතුෂීගේ දුරකතන අංකය ඉල්ලා ගත්තේය. තමා චිත්‍ර ලෝලියෙක් බවත්, ඇය හා කතාකිරීමට කැමති බවත් පැවසූ විට කතුවරිය එම නොම්මරය ලබා දුන්නේ සංතුෂීගෙන් විමසා බලාය. සහරා කතුවරියට ඔහු නියම නම නොකියා 'ප්‍රගීත්' යයි කීවේය. අනතුරුව ඔහු සංතුෂීගේ ජංගම දුරකතනයට ඇමතුමක් ගත්තේය.

"සංතුෂී.. මම ප්‍රගීත්.. මම ඉන්ග්ලන්ඩ් ඉඳලා කතා කරන්නෙ.."

ඔහු ඉතා විනීතව තමාව හඳුන්වා දුන්නේය. ඇගේ කටහඬ තමාට පුරුදු බව ඔහුට හැඟිණි. එහෙත් ජීවිතයට දැකලාවත්, කතා කරලාවත් නැති කෙනෙකුගේ කටහඬ පුරුදු ලෙස හැඟෙන්නේ කෙසේද..? ඇය ඉතා සුහදව කතා කළාය.

ඇගේ සම්පූර්ණ නම සංතුෂී රණබාහු විය. තමාගේ නම ද ප්‍රගීත් රණබාහු යයි කීවද ඇය එය විශ්වාස කළේ නැත.

"ලංකාවට ආවාම මම නංගිව මීට් වෙන්න කැමතියි.. මට ආසයි මගෙ චිත්‍රයක් අන්දා ගන්න.. ඔයා අර ඇඳලා තිබුණ බෝසත් කියන චිත්‍රෙ හරිම තාත්විකයි. මගෙ කාමරේ පිරිලා තියෙන්නෙ ඔයාගේ චිත්‍ර වලින්.."

සංතුෂීට දැනුණේ ආත්මීය සතුටකි. තමාගේ චිත්‍රවලට මේ

තරම් උනන්දුව දක්වන පුද්ගලයෙකු හමුවීම සතුටකි. තම චිත්‍ර අගය කරමින් රසිකයින් කතා කිරීමට සාමාන්‍ය දෙයක් වුවත්.. මේ රසිකයා තරම් හදවතින් පිනා ගිය සතුටකින් කතා කළ අයෙකු සොයා ගැනීම දුෂ්කර විය.

"මම තව සතියකින් ලංකාවට එනවා.."

සංකේත් එය එම මොහොතෙහි තීරණය කළේය. තම හිත ගත් කෙල්ලගේ හැඩරුව ඇයට පවසා චිත්‍රයක් ඇඳ ගැනීමේ උවමනාව ඔහුට තිබිණි.

"ම්.. සතියකින් කියන්නෙ.."

"ඊළඟ සිකුරාදා වෙද්දි මං ලංකාවෙ.. මට ඉක්මනටම ඔයාව මීට් වෙන්න අපොයිමන්ට් එකක් ඕන. අපේ අම්මත් ආසයි චිත්‍රවලට.. මම අම්මත් එක්කම එන්නං.."

සංතුෂී තරමක අපහසුතාවයකට පත්වූවාය. ඔහු හමුවන්නේ කොහොමද..? නිවසට, කාර්යාලයට හෝ මහමගට එන්නට කියන්නට නොහැකිය.

"ආ..හ්.. BMICH එකේ ආකිටෙක්ට් එක්සිබිෂන් එක තියෙනවා.. මම ඉරිදට නම් ඒක බලන්න යන්න ඉන්නෙ.. මගෙ යාළුවෙකුත් එක්ක.. ඇවිත් කෝල් කරන්න.."

ඇය කිංකිණී හඬින් කියා සිටියාය. සංකේත්ගේ හදවතට යම්කිසි අස්වැසුමක් ලැබෙමින් පැවතුණි.

ආදරය.. යනු හිමිකර ගැනීමයි. හිමිකර ගැනීම යනු ආශාවයි. තණ්හාවයි. තණ්හාවෙන් ආශාවෙන් බදා ගන්නට





යන්නේ අයිති කරගන්නට යන්නේ ඇගේ ශරීරයද..

කාරණා කෙසේ වුවද ඇය තම සෙවනැල්ල සේ.. ළඟින් සිටිය යුතුය යන අදහස සංකේත්ගේ හදවත පුරාම රැඳී තිබුණි. 'සංතුසී අම්මාට අපොයිමන්ට්ස් දුන්නෙ නැති වුණාට මට නම් දුන්නා..' ඔහු සිතුවේය. එහෙත් තමා ඔවුනගේ ඉඩම ගත් සංකේත් බව ඇය හඳුනා ගත්තා නම් තමාට හිමිවන්නේ බැණුම් වරුසාවකි.

ලංකාවට පැමිණි සංකේත් මාතලේ බලා ගියේ නැත. ඔහු තමා පැමිණි බව අම්මාට දන්වා ඉඩමේ කුඩා නිවසෙහිම නැවතුණේය. එය පංකජ විසින් අලුත්වැඩියා කර අවශ්‍ය බඩු භාණ්ඩ තබා තිබුණි. ඔහු කොළඹ නැවතී ඉරිදා වාස්තු විද්‍යා ප්‍රදර්ශනය පැවැත්වෙන BMICH භූමියට ඇතුළු විය.

"මම ඉන්නෙ 213 ෂෝ රූම් එකේ.. ඒක මගෙ යාළුවෙකුගේ.."

ඇය කියා තිබිණි. ඒ අනුව සංකේත්.. කුටිය අසලට ගොස් ඔහුගේ ජංගම දුරකථනයෙන් ඇයට ඇමතුමක් ගත්තේය. සංතුසී පුදුම වූවාය. තමාට සංකේත්ගේ ජංගම දුරකථනයෙන් ඇමතුමකි. මේ මාස කීපයකට පසුවය. ඔහුට තමා අමතකව ගොස් තිබුණිද..?

"හලෝ සංකේත්.."

ඇය මහත් උද්යෝගයකින් කතා කළාය. තමාව උමේෂ්ගෙන් ගලවා ගැනීමට කුමන මොහොතක හෝ ඔහු එනු ඇතැයි ඇය තුළ විශ්වාසයක් ඇතිවිය.



The Reader's Place http://e-pusthakalaya.blogspot.com/

සංතුසී තමාගේ නියම නම දැනගත්තේ කෙසේදැයි සංකේත්ට පුදුම සිතිණි. තමා ඇයට පැවසුවේ ප්‍රගීත් යන්නය. තම දුරකථනයෙන් මේ ඇයට කතා කළ පළමු මොහොතයි. ඈය තම අංකය දුරකථනයේ මතකයේ තැන්පත් කරගෙන විය යුතුය. දැන් නම් තමාට සිදුවන්නේ මේ ජනකායක් මධ්‍යයේ ඇගෙන් ගුටි කන්නටය. ඕනෑම දෙයකට මුහුණ දීමේ අරමුණින් ඔහු 213 කුටිය වෙත ගමන් කළේය. ඔහුට තම දැස් අදහාගත නොහැකි විය. තමා සෙවූ සුරංගනාවිය ඉන්නේත් මේ කුටියේය. තව කෙල්ලන් කිහිප දෙනෙකු සිටියි. සංකේත් මොහොතකට තක්බීර් වී බලා සිටියේය. ඔහු යළිත් සංතුසීගේ නොම්මරය එබුවේ.. මෙතන සිටින කෙල්ලන් අතරින් සංතුසී කවුදැයි සොයා ගැනීමටයි. පුදුමයකි. නාද වුණේ.. සුරංගනාවියගේ දුරකතනයයි. දෙයියනේ.. ඒ කියන්නෙ.. මං මේ පෙරුම් පුරාගෙන ආදරේ කරල තියෙන්නෙ සංතුසීටද..?

උන් හිටි තැන් අමතක වූ සංකේත්.. වහාම ඉදිරියට ගොස් සංතුසීගේ දෑතින් අල්ලා ගත්තේ ඇයද පුදුම කරවමිනි. ඔහුට ඕනෑ වුණේ ඇයව තම පපුවට තබා තද කර ගැනීමටය.

"සං.. සංකේත්.. ඔයා.."

ඇය වෙව්ලන හඬින් කතා කළාය.

"ඔයා.. ඔයා කොහෙද ගිහින් හිටියෙ..? ඇයි මා.. ව.. බලන්න ආවෙ නැත්තෙ..?"

සංතුසී ඔහුගේ දෑතේ එල්ලීගෙනම උන්නාය. නමුත්.. ඊළඟ මොහොතේ ඇයගේ කම්මුලට චටාස් ගා පාරක් වැදිණි. ඊළඟ





පාර වැදුණේ සංකේත් ගේ කම්මුලටය. පිරිස ඔවුන් ඉදිරියේ වටවූහ. සංකේත් හා සංතුසී ඉදිරියේ උන්නේ උමේෂ්ය.

"උමේෂ්.. නවත්තගන්න.. මේක මගෙ පෞද්ගලික දෙයක්.."

සංතුසී කැගැසුවාය. මේ ඇය විවාහ වීමට සිටින තරුණයා වග ඒ මොහොතේ සංකේත්ට දැනිණි. අමාරුවෙන් දිනා ගත් ලෝකය කැලි කැලිවලට කැඩී තම දෙපාමුල විසිර ගිය බව ඔහුට දැනිණි.

"ප්ලීස්.. ප්ලීස්.. කලබල කරන්න එපා.. මට පොඩි වැරදීමක් වුණා.."

සංකේත් උමේෂ්ගෙන් සමාව යදින අයුරින් කතා කළේ ඇත්තටම වරද තමාගේ නිසාය. සංතුසීගේ කම්මුල රතු පැහැ ගැන්වීම තිබිණි.

"මිගොල්ලො යන්ඩ.. මේක අපේ පෞද්ගලික දෙයක්.. බොහොම ස්තූතියි බලන්න ආවට.."

වටේ රැස්වූ පිරිසට සංකේත් එසේ කියද්දි පිරිස ලැජ්ජාවෙන් පිටවී ගියහ. සංතුසී සංකේත්ගේ අත අල්ලා ගත්තේ උමේෂ් නොසිතූ ආකාරයෙනි.

"මම මේ කේස් එක කෙලින්ම උසාවි අරගෙන යනවා.. මට ලැජ්ජා කළාට.."

ඊළඟ මොහොතේ සංතුසී සංකේත්ගේ අත අතහැර දිව ගියාය. සෙනග අතරේ ඇය කොහේ දිව ගියාදැයි සංකේත්ටවත්



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

උමේෂ්ටවත් සොයා ගත නොහැකි විය. සංකේත් දිගින් දිගටම ඇයට ඇමතුම් ගත්තත් ඒ එකකටවත් ප්‍රතිචාරයක් නොවිණි.

"මේකෙ දෙකෙන් එකක් විසඳන්න ඕන මිනිහෝ.. දෙකෙන් එකක්.."

උමේෂ් යළිත් සංකේත්ගේ කොලරයෙන් අල්ලා ගත්තේය.

"අපි මේක හොඳින් කතා කරල විසඳ ගමු මහත්තයෝ.. මේ ගෑනු කේස්වලට පොලිසි ගිහින් වැඩක් නෑ.."

"ඇයි නැත්තෙ..? ඕ අයි සී මගෙ යාලුවෙක්.. මං මේක උසාවි ගෙනියනවා.. ලක්ෂ දහයක් වන්දි ඉල්ලනවා.."

සංකේත් සිනාසුණේය.

"මොකද තමුසෙ හිනාවෙන්නෙ..?"

"එතකොට ප්‍රශ්නෙ ඉවරද..? ඔයාට බඳින්න ඉන්න කෙල්ල වටින්නෙ ලක්ෂ දහයද..?"

"තමුසෙ ඒකිව බඳින්න හිතාගෙන නෙමෙයිද ආශ්‍රය කරන්නෙ..?"

සංකේත්.. යළිත් සිනාසුණේය.

"හරි මචං.. උඹ උසාවි පලයං.. ප්‍රශ්නෙ ඔතනින් කෙලවර වෙනව නම්.. මට තියෙන්නෙ ලක්ෂ දහයේ චෙක් එකට සිග්නේචර් එක ගහන්න එක විතරයි.."

උමේෂ්ගේ දෑස් උඩ ගියේය. 'මේ යකා කොච්චර





පෝසතෙක්ද..? පෙනුමෙන් නම් එහෙම නෑ.. ලස්සනයි තමයි.. එහෙනං ඒකයි මේ පට්ට බැල්ලි මාව අතෑරලා මේකත් එක්ක යාලු වෙලා තියෙන්නෙ..'

"මට කතා කර කර ඉන්න වෙලා නෑ.. සංතුෂී හොයා ගන්න ඕන.. මචං උඹ කැමති දෙයක් කරපන්.. මේ මගේ කාඩ් එක.."

සංකේත් තම මුදල් පසුම්බියෙන් කාඩ්පතක් ගෙන ඔහු වෙත විසි කරමින්ම සෙනග අතරින් දිව ගියේය. සංතුෂී දිව ගියේ කොහාටදැයි සංකේත්ට සිතාගත නොහැකි විය. BMICH එක පුරාම ඇයව සෙවූ ඔහු පිස්සෙක් මෙන් ත්‍රීවීලරයක නැගුණේය. ඔහුගේ කාරය තිබුණේත් පංකජ ළඟය. මේ ලංකාවට පය ගැහුවා පමණි. තමා මෙරටට ආ බව කිසිවෙකු දන්නේ නැත.

"කොහාටද මහත්තයා..?"

"අවිස්සාවේල්ලට.."

සංතුෂී යන්නට ඇත්තේ ගෙදරට යයි ඔහු අනුමාන කළේය. ත්‍රීවීලර්කරු හැකි උපරිම වේගයෙන් පැය එකහමාරක් පමණ ගතවෙද්දී රබර් ගස් වත්ත හංදියට පැමිණියේය. නිවසේ දොර වසා ඇත.

"සංතුෂී.. සංතුෂී.. බබා ඔයා කොහේද..?"

ඔහු කෑගැසුවේය. මිදුල පුරාම කොළ වැටී ඇත.



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

මාසෙකින්වත් මිදුල අතු ගෑ බවක් පෙනෙන්නට නැත. ඔවුන් කොහේ ගියාද..?

"සංතුසී.."

ඒ ශබ්දයටදෝ පල්ලෙහා පුංචි ටකරං ගෙදරක උන් කෙල්ලක ඉදිරියට ආවාය.

"නෝනලා නෑ සර්.."

"කොහෙ ගිහින්ද..?"

"වෙන ගෙයක් අරගෙන ගියා.."

"කවදද..?"

"දැන් මාස දෙකකටත් වැඩි සර්.."

"කොහාටද යනවා කීවෙ..?"

"හරියටම කිව්වෙ නෑ.. සර්ගේ නම සංකේත්ද..?"

සංකේත් පුදුම විය. මේ නිවස අතහැර යන්නට හේතුව තමා විය හැකිය.

"ඔව්.."

"අනුත්තරා නෝනා මට කිව්වා.. සංතුසී අක්කව හොයාගෙන මහත්තයෙක් එයි කියලා.. ආවොත් කියන්න කිව්වා.. සංතුසී අක්කව හොයන එක නවත්තන්නන කියලා.. අක්කට පාඩුවෙ ඉන්න දෙන්න කියලා.."





එසේ නම් ඉංග්‍රීසි ටීචර්.. තමාගැන සියලුම දේ දැනගෙන ඇත. තම දුව ආරක්‍ෂා කර ගැනීමේ පළමු පියවර ලෙසින් ඇය ගෙය මාරු කර යන්නට ඇත.

"දැන් ඒ නෝනා මෙතන නැහේ.. අපි යමුද මහත්තයා.."

සංකේත් සිය පාරකටත් වඩා සංතුසීට ඇමතුමක් ගන්නට උත්සාහ කළේය. එහෙත් දැන් දුරකථනය ක්‍රියාවිරහිත කර ඇත.

'එයා උමේෂ්ට කැමති නම්.. ඇයි මගෙ අත අල්ලා ගත්තෙ.. එයා ආදරේ මට..'

සංකේත් හිතුවේය. 'උමේෂ්.. ඇයව බලහත්කාරයෙන් කසාද බඳින්නට ඉන්නවාද..? ඒත් මං ඉඹින්න හදන්නෙ අන්සතු මලක්..'

"මහත්තයා අපි යමුද..?"

ත්‍රීවිලර්කරුට හදිසිය.

"බැරිවෙලා හරි සංතුසී ආවොත්.. කියන්න මම එයාව හොයනවා කියලා.."

සංකේත් දැරියට කීවේය. තමාගේ පපුවේ ඇති වේදනාව ඇය තේරුම් ගත්තේ නැතත්.. හිස වැනුවාය. සංතුසී.. මං ඔයා ගිය තැනක් හොයන්නේ කොහොමද..?

✸ ✸ ✸ ✸ ✸ ✸ ✸

සංතුසී කෑගසමින් හැඬුවාය. අනුත්තරා.. නුගේගොඩින් පුංචි ඇනෙක්සියක් ගත්තේ.. ටියුෂන් පන්ති බහුල වූ නිසාය.



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

කැතරීනුත් අකමැත්තෙන් හෝ සංතුසීගේ විවාහයද කෙරෙන තුරු කියා ඔවුන් සමග පදිංචියට ආවාය. ඒ තීරණය ගැනුනේ මීට මාස දෙකකට පමණ උඩදීය.

"ලොකු පුතේ.. අඩලා අඩලා හරි හිත හදාගන්න.. සංකේත් එක්ක අපට පැහෙන්න බෑ.."

අනුත්තරා හඩන දියණියගේ හිස අත ගෑවාය.

"දැන් උමේෂ් මාව මරයි.. මේ මගෙ කම්මුලට ගහපු තැන රිදෙනවා.."

සංතුසී හිස හැරවූවාය. මොනවා වුණත් තාම දියණිය ඔහුට නීත්‍යානුකූලව දී නැත. උගත් කෙනෙක්, පිරිසක් මධ්‍යයේ මෙලෙස ආවේගශීලීව හැසිරෙනවාද..? තමා කෙදිනකවත් ඇයට පහරක් ගසා නැත. ධම්මගේ මරණයෙන් පසු සැර වැර කරලාවත් නැත. දුප්පත් බව, නැතිබැරි බව, අසරණබව ඇත්තය. එහෙත්.. මෙසේ ගහන්නට උමේෂ්ට ඇති අයිතිය කුමක්ද..? එවැනි කෙනෙකුට ජීවිතයම බාරදෙන්නේ කොහොමද..? මොන සැප සම්පත් තිබුණද.. ගැහැනියකගේ ජීවිතය ඉන් පිරෙන්නේ නැත. ඇගේ හදවත, ජීවිතය පුරවාලිය හැක්කේ පිරිමියෙකුගේ ආදරයෙනි. එය අහිමි වූ කල ගැහැනියකට සිදුවන්නේ නොපෙනෙන ගින්නක රස්නයෙන් තැම්බි තැම්බී ජීවත්වීමටය.

"දැන් උමේෂ් එයිද අම්මෙ..?"

"බලමුකො.. එයා හිතේ ආවේගෙට එහෙම කරාද දන්නෙත් නෑ.. බලමු කතා කරලා.."





"අනේ.. මාව මරලා දාන්න අම්මා.. මට ඒ මිනිහත් එක්ක යන්න බෑ.."

සංතුසී උමේෂ්ට කැමති වූයේ තමාට කීකරුවීමක් ලෙසිනි. එසේ නැතිව හදවතින් ඔහුට ආදරය කළේ නැත. ආදරවන්තයාද, ඇගේ ඉරණම්කරුවාද.. ඇය සොයාගෙන ඇවිදිනි. අනුත්තරාට මේ කිසිවක් සිතාගත නොහැක. දැන් ඉතින් උමේෂ්ව කසාද බැන්දත් ඇයට ඉන්නට සිදුවන්නේ සිරකාරියක ලෙසිනි.

"ඔහොම අඩලා අඩලා දියවෙයි දැන්.. වොෂ් එකක් දාගන්න.. මාත් මේ ආවා විතරයි.."

අනුත්තරා කුස්සියට වැදුණාය. ඊනලින් තවම ගෙදර ඇවිදින් නැත. පුංචි අම්මා පන්සලට යන්නට ඇත. මෙහි ආවදා ඉඳන් ඇයට යන්නට නිදහස් තැනකට ඇත්තේ පන්සල පමණි. දැන් උයන්නට ඇත්තේ කුඩා පැන්ට්‍රි එකක් පමණි. ඉව්වාට අද සංතුසී නම් කන්නේ නැත. තමාටද කන්නට නොහැකිය. ඊනලිටත්, පුංචි අම්මාටත් පාන් රාත්තලක් ගෙනත් තබා හොද්දක් හදන්නට ඇය හිතා ගත්තාය. 'අනේ හෙට ඉර පායන්නෙ නැත්නම්..' ඇයට සිතුණි. ඒ තරමට හෙට දිනය අභියෝගාත්මකය.

✸ ✸ ✸ ✸ ✸ ✸ ✸

මුදිතා ඇත්තටම කලබල වූවාය. සංකේත් මේ පිස්සෙකු සේ හැසිරෙන්නේ සංතුසී නිසාය. දෛවය මහා පුදුමාකාර ලෙස ඔවුන්ව මුණ ගස්සවා ඇතත් තම එකම පුතු එවැනි දුගී ගැහැනියකගේ දුවට දිය නොහැකිය. තම පවුලේ අභිමානය ර. ක ගත යුතුය.



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

"පුතා ඕක හිතෙන් අත්ඇර ගන්න.. ඔය කෙල්ල අපට ගැළපෙන්නෙ නෑ.. නොගැළපෙන විවාහයක් කරගෙන ඔයාගෙ මාමාට අන්තිමට වල පල්ලට යන්න සිද්ධ වුණා.. මට ඒක අමතක කරන්න බෑ.. ඔයාටත් ඒක කරගන්නද ඕන වෙලා තියෙන්නෙ.."

මුදිතා කෑගැසුවාය. තම සැමියා.. මේ සිසිම දේකට හාවක් හුවක් නොකියයි.

"අනිත් එක ඒ කෙල්ලට බඳින්නත් කොල්ලෙක් ඉන්නව නම්.. ඒවා කඩන්න පව් නැද්ද..? ඔය කොල්ලා ඔයාව මරලා දායි.."

මුදිතා කෑගැසුවාය. සංකේත් නිහඬව හිඳියි. ඔහුගේ නිහඬකම යනු බලවත් අධිෂ්ඨානයකි. එහෙත්.. තම පවුලට වලව් පරපුරකින් අභිමානවත් ලේලියක ගෙන ආ යුතුය. භුවනී බැන්දා නම් මීට හොඳය. ඇය රූ රැජිනකි. ඇගේ තාත්තා පැවතෙන්නේ හොඳ රදල පරම්පරාවකිනි. තමා ඇයව නවත්තා ගත්තේ ද ඒ බව දැනගෙනමය.

'දැන් ඉතින් සංතුසී සොයාගෙන යා යුතුය. ඇය ඉන්නා තැනක් සොයා ගන්නේ කොහොමද..?' මුදිතා දහ අතේ කල්පනා කළාය.

* * * * * * *

පංකජ් මාතලේ ආවේ කාලෙකට පසුය. දැන් ඉතින් කෙසේ හෝ සංතුසී සොයා නුදුන්නොත්.. ඔහු පිස්සෙකු වෙනු ඇත.



The Reader's Place.
http://e-pusthakalaya.blogspot.com/



"උඹ මෙහෙ ඉඳලා බෑ.. යං.. අනුත්තරාන්ට් විදුෂන් කරන්න එහෙ මෙහෙ යනවා හැම තැනම.. එහෙම අල්ලා ගනිමු.."

පංකජ් කීවේය. එවිට ඇගේ පස්සෙන් ගොස් තමාට දුව දෙන්න යැයි කිව හැකිද..? සංකේත්ට තමා ජීවිතයේ මෙතරම් අසරණ වූ දවසක් මතක නැත. ආදරය මිනිසුන් අසරණ කරවයි. ආදරය මිනිසුන් අතරමං කරවයි.

පංකජ්ට යමක් කල්පනා වුණේය. ඔහු වහා ත්‍රීවීලරයේ රියදුරා සිසිරට කතා කළේය. ඔහු ත්‍රීවීලරය මිලදී ගත්තේ ආයතනයට අවශ්‍ය නිසාය.

"සිසිර.. මතකද දවසක් මාත් එක්ක යද්දි කොට්ටාවෙදි.. නංගා ගත්තා නෝනා කෙනෙක්.."

"ගීතා නෝනාද..?"

පංකජ්ට යකා නගින්නේ මෙවැනි අවස්ථාවලදීය.

"නෑ මිනිහෝ.. අවුරුදු පනහක විතර සුදු ලස්සන ඊව කෙනෙක්.. අර මහරගම ක්ලාස් එහෙකට ගිහින් ඇරලුවේ.."

"ආ.. මතකයි.."

"එදා.. මං හිතන්නෙ සිකුරාදා වගේ දවසක්.. ඒ නෝනා ඒ ක්ලාස් එකට එනවද කියලා බලලා.. මට කොහොම හරි ඒ නෝනාට නොදැනෙන්න.. ඒ නෝනගෙ ගෙදර හොයලා දෙන්න ඕනෑ.."

"හරි සර්.. මං ඒක කරන්නං.."

සිසිර වැඩේ බාර ගත්තේය.

* * * * * * *

සංතුසී නිවසින් එළියටවත් බැස්සේ නැත. මෙය අනුන්ගේ කුලී නිවසක් වග අම්මා ද නිතර නිරතම මතක් කරයි. අම්මා ගෙන් ගෙට ගොස් පිසූකෑත් දීමට ගත්තේ සංතුසී නිසාය. ඇගේ මගුල් උත්සවය ගැනීමට මුදල් හෙවීමටය. ඒ සියල්ල දැන් නිෂ්ඵල උත්සාහයක් වග සංතුසීට දැනෙයි. ඊයේ උමේෂ්.. නැවත අවුදින් කෑගසා ගිය හැටි ඇය සිහිපත් කළාය.

"එහෙනම්.. අල්ලා ගත්තෙ.. හොඳ සල්ලිකාරයෙක්.. නේද..? මාව රැවැට්ටුවට මම හොඳ පාඩමක් උගන්නනවා.."

"කාටද පාඩම් උගන්වන්නෙ.. මටද..?"

"ඔව්.. උඹට තමයි.."

"කතා කරන කෑත උමේෂ්.."

"උඹ ඔහොම මගුල්.."

ඔහු එසේ කියනවිට අනුත්තරා එළියට ආවාය. දියණිය නැටූ මගුලක් නැත. ඇයට ආදරය කරන පුද්ගලයා ඇයව සොයාගෙන ආවා පමණය.

"උමේෂ් පුතා.. හරියට හොයලා බලලා කතාකරන්න.. වැදගත් රස්සාවක් කරන වැදගත් පවුලක ළමයෙක් නේද..?"

අනුත්තරා කතා කළේ කතා නොකර බැරිම තැනය.





"වැදගත් කෙනෙකුට ගැළපෙන තැනකට නොයා.. මේ කුලී කාමර අස්සෙ රිංගන්න ආවට මටත් හොඳ පාඩම් මේවා.."

අනුත්තරා සංතුසී ද රැගෙන ගෙතුළට ගියාය. හිත් බිඳීම් සිදුවූ පසු නැවත එකතු වන්නේ කොහොමද..? බිඳුණු පිඟානක පැලැස්තර දමා අලවා බත් කෑ නොහැකිය.

"ඔයා පාඩුවෙ ඉන්න.. වෙන දෙයක් වෙයි.. බලෙන් ඇගේ ගහන්න හැදුවෙ නෑ.."

අනුත්තරා සංතුසීට තරමක් සැර වූවාය. උමේෂ් පිටවී ගියේ කේන්තියෙන් වුවත් ඔහුට සංතුසී අත හැරීමට හිතක් තිබුණේත් නැත. මෙච්චර 'ලස්සන කෙල්ලෙක්.. මොන වැරැද්දක් කරත් අතාරින්නෙ කොහොමද..? මාත් ලේසියෙන් අතාරින්නෙ නෑ.. ෂහ්.. වෙඩින් ගන්න කලින් මට තිබුණෙ රෙජිස්ටර් වෙලා ඉන්න..එහෙම නම්.. මහ ගෑනි ඉස්සරහම ඒකිගෙ කණට ගහලා මං කවුද කියන එක පෙන්වන්න තිබුණා..'

* * * * * * *

"සිසිර.. හරිද මේ යන පාර..."

පංකජ් විමසුවේ.. ඔහුට සිදුවූ වැරදීම් මතක වන විටය. වැරදීම් නිසා සිදුවන හමුවීම් කෙතරම් සුන්දරද..? පංකජ්ට ගීතා හමුවූයේ එම වැරදීමකට පිං සිදු වීමටය. තමා මෙතෙක් ඇසුරු කළ යුවතියන් හැමෝටම වඩා තම බිරිඳ කර ගැනීමට සුදුසු තැනැත්තිය ගීතාංජලී බව දැන් පංකජ් තේරුම් ගෙන සිටියි. සංකේත් හාවක් හුවක් නොමැතිව ත්‍රීවීලරයේ වාඩිවී සිටියි. 'අනේ මෙහෙම සිටුවරුන්ටත් ත්‍රීවීලර්වල එන්ඩ වුණානෙ..'



The Reader's Place http://e-pusthakalaya.blogspot.com/

"ඒ මැඩම් ගියෙ නම් මෙන්න මේ ගෙදරට.."

සිසිර ත්‍රීවීලරය නතර කළේය. සංකේත් කලබල වී දුව යනු ඇතැයි පංකජ සිතුවත් එසේ නොවීය. රාත්‍රී නවයත් පසුවී ඇත. මේ මොහොත සියලු නිවැසියන් තම දවස අහවර කිරීමට සැරසෙන වේලාවයි.

* * * * * * *

සංතුසී නිදාගන්න හිතුවේ නින්ද අවශ්‍ය වූ නිසා නොවේ. ඒ තරමට හිත කලකිරී ලොවම එපාවී තිබිණි. උමේෂ්ගේ හැසිරීම රළුය. පරළුය. තමා කළේ කුමක්ද කියාවත් ඔහු නොදන්නවා විය හැක. ඇත්තටම එවැනි මිනිසෙකු සමග ජීවිත කාලයක් වසන්නේ කොහොමද..?

ගේට්ටුව ළඟ කවුරුන් හෝ සිටින වග සංතුසීට අවබෝධ විණි. රෑට පන්ති කරන අම්මා තවමත් පැමිණ නැත. පුංචි ආච්චි රෑ හත වෙද්දී කා බී නිම කර බෙහෙත් බී නිදා ගනියි. ඩිනලි කාමරයේ පාඩම් කරයි. ඇය නයිටියකට මාරුවීමට සිතුවා පමණය. එහෙත්.. වහාම ගවුමක් දාගත් ඇය මිදුලට ආවාය.

"කවුද ඔය..?"

සංතුසී ඇසුවේ බියෙන් ගැහෙමිනි. උමේෂ් තමාට අනතුරක් කරන්නට පැමිණ ඇත්නම් ඒ ඔනෑම අභියෝගයකට මුහුණ දීමේ ශක්තියක් ඇය සතුව තිබිණි. විවාහ ගිවිස ගෙන නැත. අඩු ගණනේ ඔහුට තමා ආදරෙයිවත් කියා නැත. තම ජීවිතය ගැන ඔහුට අයිතියක් නැත.





"සංතුසී.."

ඒ කටහඬ සංකේත්ගේය. දෙවියනි.. ඔහු තමාව සොයාගෙන අවුදිනි. සංතුසී ගේට්ටුවේ කුඩා කොටස විවර කළාය.

"සංකේත්.. ඇයි පුදුං අයියෙ.. ඔයා මේ..?"

ඇයට හැඬිණි. නොහඬා ඉන්නේ කෙසේද..? තමාට මේ ලෝකයේ කොහේවත් සැඟවීමක් නැත.

"ඔයා මගෙ.. මගේමයි.. ඒකයි මේ හැමදේම.."

එසේ කියමින් සංකේත් දැඩිව ඇයව වැළඳ ගත්තේය. ඇයට හෙල්ලෙන්නට තියා හුස්ම ගන්නවත් බැරි ලෙසින් ග්‍රහණය තද විය.

"ම.. මං මැරෙ..නවා.. තව ටිකෙන්.."

යාන්තම් ග්‍රහණය බුරුල් වූ පසු ඇය කීවාය. සංකේත් සිය අයිතිය තහවුරු කර ගනිමින් ඇගේ සුදු දෙකම්මුල් සිප ගත්තේය. සිනිඳුය. මලක් සේම සිනිඳුය. මලක් සේම පිවිතුරුය. මේ පතාගෙන ආ.. සොයාගෙන ආ.. කොහේ තිබුණත් හිමි වෙන්නට තිබූ ආදරයයි.

"ආයෙත් තද කරලා බදා ගන්නද.. මැරෙයිද..?"

"මැරුණට කමක් නෑ.. එහෙම කරන්න මං.. මං ඔයාගෙ නම්.."

සංකේත් වඩාත් හැඟීම්බරවී සිටියේය. පෙර ලෙස නැතත්..

ඔහු ඇයව තම පපුවට තුරුළු කරගෙන බොහෝ වෙලා සිටියේය. ඒ කෙතරම් වේලාවක්දැයි දෙදෙනාටම නිනව් නැතිවිය.

වේලාව ගත කරගනු බැරිව දුක් වින්දේ ත්‍රිවීලරයේ උන් සිසිරත් පංකජත්ය. තව කෙනෙක් දුක් වින්දාය. ඒ පාවම් කරමින් උන් ඩිනලීය. අක්කා එළියට ගියා ගියාමය. ඒ අයියාත් සමග එෆෙයාර් එකක් ඇති වුණේ කොහොමද..? එතකොට උමේෂ්යියා.. අනේ මන්දා.. දැන් අම්මත් එනවා ඇති.

* * * * * * *

මුදිතා වඩාත් කලබල වී සිටියාය. රවී බිරිඳගේ හැසිරීම ගැන කලබල නොවූයේ මේ ගැනුන්ගේ හැටි නිසාය. පරම්පරා ගණනකට සල්ලි හම්බකර අහවරය. තව ගැනුගේ සල්ලි කුමකටද..? මේ ගැනි තණ්හාවෙන් පිපිරෙනවා.

"මුදිතා.. අපි ගිහින් ඔය ගැනු ළමයා බලමු.."

"බලන්නෙ මොකටද..? මං කැමති නෑ.."

"පුතාගෙ හිත ගිය තැනනේ.. මොකක් හරි හේතුවක් නිසානෙ කැමතිවෙන්න ඇත්තෙ.. අනික ඉතින්.. එයා කැමති නම් ඇයි අපි ඒකට අකුල් හෙලන්නෙ..?"

"ඔයාට තේරෙන්නෙ නෑ රවී.. ඔයාට මේවා තේරෙන්නෙ නෑ.."

"පුතා.. ට අපිව එපාවෙයි මුදිතා ඔයා මේ විදිහට කෑගහන්න ගියොත්.."





"අපි හොඳ පරම්පරාවක මිනිස්සු.. ඔය කොළඹ ඉන්නෙ.. පහත් කුලවල මිනිස්සු.. අපේ ලේලි වලව් පෙලපතකින් එන්න ඕනෑ.. අපිට ඉන්නෙ එක දරුවයි.."

මුදිතාගේ තර්කයටත් සාධාරණ හේතු තිබිණි. පවුලක රඳා පැවතීම, නම්බුව, කීර්තිනාමය මේ සියල්ල පවතින්නේ ගෘහනිය හෙවත් බිරිඳ අතයි. ඉදින් පුතාගේ බිරිඳ මේ හැම දෙයකින්ම පරිපූර්ණ විය යුතු නොවේද..?

"එක දරුවයි තමයි.. අපි ගිහින් බලලා තීරණයක් ගමුකො.. අපි දැකලා නෑනේ ඒ ළමයා.."

"ඔය අර චිත්‍ර අඳින කෙල්ලෙක්.. කාමරේ පුරා ගහගෙන තියෙන්නෙ.."

මුදිතා කෝපයෙන් යුතුව කීවාය.

"මොනවගෙන් අඩුපාඩුවක්ද..? සිටුවරයෙක් වගේ.. ඇයි මෙයාට බැරි තමන්ට ගැළපෙන කෙල්ලෙක් හොයාගන්න.."

* * * * * * *

සංකේත් රිය පැදෙව්වේ දෙගිඩියාවෙනි. අම්මා සංතුසීට අකමැති වුවහොත් සියල්ල කණපිට පෙරලෙනු ඇතැයි ඔහුට සිතුණි. අම්මාගේ හිත තලා පුරුද්දක් නැත. සංතුසී තම ජීවිතයයි.

"පුතා ඔච්චර කල්පනා කර කර ඩ්‍රයිව් කරන්න එපා.."

තාත්තා තම පැත්තට සිටීම සංකේත්ට සවියක් විය. මෝටර් රථය සංතුසීලාගේ කුඩා කුලී ගෙදර ඉදිරිපිට නතර කළේය.



The Reader's Place http://e-pusthakalaya.blogspot.com/

මුදිතාගේ මුහුණ හොඳටම නරක්වී තිබුණි. 'මොන ගුබ්බෑයමක්ද මේ.. කුලී ගෙවල්වල ලගින්නෙ තමන්ටය කියලා ස්ථිර තැනක් නැති හින්දනේ...'

* * * * * * *

අනුත්තරා පිරිසට පිළිගත්තේ ගැහෙන පපුවෙන් යුක්තවය. මෙය මගුල් කෑමක් හෝ මගුල් තුලා බලන්නට පැමිණි ගමනක් නොවන වග ඇය තේරුම් ගත්තේ මුදිතා දුටුවනමය. ඇය ගෙට ගොඩවෙන්නට අදිමදි කරමින් සිටියාය. වෙන කළ යුතු දෙයක් නැත. කොතනකට පලා ගියත් ඉරණම්කරු සොයාගෙන අවුදිනි.

අනුත්තරා දැත් එක්කොට ආචාර කරමින් ඔවුන් සියලු දෙනා පිළිගත්තාය.

"නංගි.. වතුර එකක් බොමු.."

රවි අයියා එසේ කියමින් තම අපහසුතාවය මග හැරියා යැයි ඇයට සිතුණි. ඇය වහා කුස්සියට ගොස් පිල්ටර් එකෙන් වතුර වීදුරුවක් පුරවා.. සංතුසී අතට දුන්නාය.

"යන්න.. ඉස්සරහට.. ඔහොමම යන්න.."

"අනේ මට බෑම්මා.."

"වෙන කරන්න දෙයක් නෑ.. ඕන දේකට මූණ දෙන්න.. අද මේකෙ දෙකෙන් එකක් විසඳෙයි.. පුතාගෙ අම්මගෙ මූණ හොඳ නෑ.."





අනුත්තරා රහසින් මෙන් කීවාය. තමාට මහත් කුතුහලයකට මුහුණ දීමට සිදුන වග සංතුසී දැන උන්නාය. කුමන දෙයක් වුණත් සංකේත් තමාව අත් නොහරින වග සංතුසී දැන උන්නාය. එහෙත් ඔහු තම මවටත් දැඩි සේ ආදරය කරයි. ඔහුට මව අත හැරීමටද නොහැක. අම්මා තරුණ කාලයේ මුහුණ දුන් අත්දැකීමම තමාට කැරකී ඇවිදිනි: සංතුසී.. ඉදිරියට ගියේ හිතට දිරිගෙනය.

සංතුසී, මුදිතාගේ සිත ඇය දැකීමෙන් සන්තෝෂ වුණ බව ඇත්තය. කෙල්ල සුදුම සුදුය. නිවුණු ඉඳුරන්ය. ගාත්‍ර දාත්‍ර පෙනුම මීසක දහකාර විසේකාර බවක් පෙනෙන්නට නැත. එහෙත්.. වලව් පෙලපතක් නැත. කොළඹ කියන්නෙ.. ගොවිගමත් නෙමේ වෙන්න ඇති.. පාත රටනෙ.. මේ කොල්ලා මල්ලි කරගන්න දේම කර ගන්න යන හැටි.. කොහේ කරපු පවක් පඩිසං දෙන්න එනවද මංදා..

"මැඩම්ටත් වතුර ගේන්නද..? දුර ඇවිල්ලා තිබහා ඇති.."

සංකේත් හිකිස් ගා හිනැහුණේය. සංතුසී යටැසින් ඔහුට රව්වාය. මුදිතා සිනාසී 'එපා' යයි හිස සැලුවාය.

'හොඳ ගැනු ළමයෙක්.. කතාබහත් සංවරයි.. ඒත් කොහොමද ඉඩදෙන්නෙ.. හරියට ඉන්න හිටින්න තැනක් නෑ.. තාත්තත් නෑ..' මුදිතා කල්පනා කළාය. මොහොතකින් තේ බීම සඳහා ඇරයුම් ලැබිණි. තේ මේසයේ තිදෙනාම වාඩි ගත්හ.

"දුවත් ඉඳගන්න.."

රවී තම ලේලියට ආරාධනා කළාය. පුතාගේ තේරීම හරියටම හරිය. මේ සුදු රෝස මල මාතලේටම අයිති මලකි.



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

පිරිමියෙකුගේ හිත ඇදී යන සියලුම ගුණාංග ඇය සතුය. එහෙත් තම බිරිඳ සොයන වත්පොහොසත්කම් නැත. කුලගොත ගැන ද ඇත්තේ සැකයකි.

"මහත්තයා නැති වුණේ ළමයි පුංචි කාලෙද්ද..?"

මුදිතා ඇසුවාය. ඒ පැනය අනුත්තරා බලාපොරොත්තුවෙන් උන් නිසා දැසට කඳුළු ඉනුවේ නැත.

"ඔව්.. දැන් අවුරුදු පහළොවකටත් වැඩියි අක්කෙ.."

ඇය තමාට 'අක්කා' යයි ඇමතීම ගැන මුදිතා තුළ වැඩි සතුටක් නොවීය.

"අමාරුවෙන් ජීවත්වෙන්න ඇත්තෙ.. හස්බන්ඩ් මොනවද කළේ..?"

"එයා.. ඩොක්ටර් කෙනෙක් අක්කෙ.."

"ඩොක්ටර් කිව්වෙ.. මේ.. ආයුර්වේද වෙන්නැති.."

රවීට තම බිරිඳ ගැන කේන්තියක් ඇතිවිය. එහෙත් වෛද්‍යවරයෙකුගේ බිරිඳක් මෙතරම් දුක් විඳින්නේ ඇයි..? එය විශ්වාස කළ නොහැකි දෙයකි. වෛද්‍යවරයෙක් හම්බ කළ ධනයක් නැද්ද..? අඩු ගණනේ තමන්ටයි කියා පර්චස් දහයක වත්කමක්වත් නැතුවාවත්ද..?

"මට නම් ඒක විශ්වාස කරන්න බැ.. ඔයාලා අපේ ළමයව රවට්ටලා.. දුව ලස්සනයි තමයි.. ඒත් කොහොමද අපි මේ විවාහයට කැමති වෙන්නෙ.."





අනුත්තරා.. තේ රැගෙන එද්දි මුදිතා කීවාය. මේ කපටි ගැහැනිය තමාවත් රවට්ටන්නට උත්සාහ කරන වග මුදිතා තේරුම් ගත් නිසා අකමැත්ත කෙලින්ම කීවාය. අනුත්තරා ගල් පිළිමයක් සේ නොසැලී උන්නාය.

"මම දන්නවා අක්කෙ.. අක්කලා මේකට කැමති වෙන්නෙ නෑ කියලා.."

"අක්කෙ අක්කෙ කියන්නෙ අපි නෑදෑයෝ වෙලත් නෑ.."

සංකේත් මේවා ඉවසා සිටියේ අමාරුවෙනි. අම්මා කවදාවත් මෙසේ කතා කරනු ඇතැයි ඔහු නොසිතුවේය. එහෙත් තාත්තා අතින් සන් කරමින් කීවේ නිහඬ වන ලෙසයි.

"ඇති.. ඇති.. මැඩම්.. අපට තවත් අපහාස කරන්න එපා.. අපේ අම්මා හුඟාක් දුක් විඳපු කෙනෙක්.."

"අනික අපිට ඉන්නෙ ඇස් දෙක වගෙ එකයි.."

මුදිතා කතා කරන්නේ.. දරු දුක හිතේ තියාගෙනය. එහෙත් අනුත්තරාට තව දුරටත් එසේ සිටිය නොහැකි විය. ඇය සංවේදීය. මේ අවස්ථාව ආවේගශීලීය. ඇය වහා ඇතුළු කාමරයට දිව ගියාය.

තමා නිසා ඇයගේ හිත රිදුණු වග තේරුම් ගත් මුදිතා ද වහාම ඇය පසුපසින් ගියාය. සංතුෂ් ද ඒ වහාම කාමරයට දිව ගියාය.

අනුත්තරා අල්මාරියේ ප්‍රවේශම් කරගෙන සිටි ඡායාරූපයක් ගෙන.. මුදිතාගේ අතෙහි තබා ඇඳේ මුනින් තලා වූවාය. අම්මා



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

පෙන්වූයේ අම්මාගේත් අප්පච්චිගේත් මගුල් පින්තූරයයි. එය දුටු.. සංකේත්ගේ අම්මා එය පපුවට තුරුළු කරගෙන ඉදිරිපසට දිව ගියේ හඬමින්මය.

"රවී.. අනේ රවී.. මේ මොකද වෙන්නෙ..?"

පින්තූරය සැමියා අත තබා, ඇය යළිත් කාමරයට අවුත් අනුත්තරා කෙලින් කරගෙන ඇයව තරයේ වැළඳ ගත්තාය.

"මං උඹලව හෙව්වා නංගියේ.. හැම තැනම හෙව්වා.. පොළොන්නරුවෙ හෙව්වා.. කුලියාපිටියෙ හෙව්වා.. හීනෙකින්වත් හිතුවෙ නෑ කොළඹට ඇවිත් මෙහෙම දුක් විඳිනවා කියලා.."

සංතුසිව මේ කිසිවක් තේරුම්ගත නොහැකි විය. සංකේත් කාමරයට අවුත් සංතුසිව තරයේ වැළඳ ගත්තේය. අනුත්තරාව අත හල මුදිතා සංතුසි වෙතට අවුත් ඇයගේ මුහුණ සිප ගත්තාය.

"මේ.. මගෙම දුව.. ඉතින්.. අනේ දුව මට සමාවෙන්න.. මේක නම් මහා පුදුම හමුවීමක්.."

අම්මා මෙතරම් හැඬූ දවසක් සංකේත්ට මතක නැත. මේ මියගිය තම මාමාගේ දියණිය වග සංකේත්ට කීවේ තාත්තාය. සංතුසී රණබාහු.. යන නම ගැනවත් තමා තුළ කුතුහලයක් ඉපදුණේ නැත. එකම වාසගම මේ රටේ කී දාහකට තියෙනවාද..? මෙය නම් දෛවෝපගත සිදුවීමක්. සංකේත්ට මෙය දැනෙන්නේ තවමත් සිහිනයක් ලෙසිනි.

* * * * * * *





රාත්‍රිය උදාවී ඇත. හැමෝටම දෙව්රම් විහාරයට යාමට අවශ්‍ය වූ නිසා බුදුන් වැඳ ගැනීමට කවුරුත් පන්සලට ගොඩ වුණහ. රෑ අටට පමණ වුවත් මුදිතාත් අනුත්තරාත් බෝධිය ළඟ පිළිම තිබ්බා සේ වාඩිවී සිටිති.

සංකේත්.. පාරේ කාරය ඉදිරිපිටට වී සිටිද්දී සංතුසී එතනට පැමිණියාය.

"මට නම් මේ හැමදේම පුදුමයි.. ඔයා මගෙ මාමාගෙ දුව කිව්වම.. ඔයා අහම්බෙන් හම්බවෙච්ච හැටි.."

සංකේත් කීවේ ඇගේ සුමුදු අත සිය අතේ පටලවාගෙනය. ඇය දෑස්වලින් පිනාපුණේ අතීතය මතක් කරමිනි. සංකේත් තමාට කිසි දිනයක උරුම නොවන පූජනීය වස්තුවක් සේ ඇය සැලකුවාය.

"මටත් හීනයක් වගේ අයියෙ.."

"අපරාදෙ.. අපෙ අම්මා ඔයාව හදාගන්න ගන්නනේ ඉඳලා තියෙන්නෙ.."

"දැන් ඉතින් අරගෙන යන්න.. එහෙම හදාගන්න ගත්තා නම් මම ඔයාගෙ නංගි.."

ඇතින් හඳ පායාගෙන එයි. පාරම පාළුය. ඒ සඳ මෝරන අනුරාගී රාත්‍රියේ සුදු කෙල්ලව ළයට තුරුළු කරගත් ඔහු රිදෙන්නටම ඇගේ කම්මුල සිප ගත්තේය.

"අම්මලා එයි.."



The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

ඇය කෙඳිරුවාය.

"ආපුදෙන් ඉතින්.."

"බයවෙන්නෙ මොකටද නෑනා අයිති මස්සිනාට කියලා නැන්දාමයි කිව්වෙ.."

සංතුසී සිනාසුණේ සතුටිනි. එහෙත් මෙතෙක් ජීවිත කාලයේම ඇය සිනාසුණේ පපුව යට දුක හංගාගෙනය.

"ඔයා මගෙ නංගි නොවී නෑනා වුණ එක කොච්චර හොඳද කෙල්ලෙ.."

සංකේත් කීවේ.. යළිත් තම ආදරයේ අයිතිය තහවුරු කර ගනිමිනි.

**- නිමි -**

The Reader's Place
http://e-pusthakalaya.blogspot.com/

Read new Sinhala Novels Free
Log Into
http://e-pusthakalaya.blogspot .com

# තරංගා දිසානායක

# මාල ගීරා තටු

මාල ගීරා තටු



'මම මේ චිත්‍රය නම් කළේ බෝසත් කියලා. ඇත්තටම.... මේ තරුණයා දුටු පළමු මොහොතෙම ක්ෂණිකව හිතට ආපු සිතුවිල්ල තමයි බෝසත් කියන එක. මට ඒක හිතා ගන්න බෑ.... මගේ අප්පච්චි නැති වෙනකොට මට අවුරුදු පහයි. අම්මගෙත්, අප්පච්චිගෙත් විවාහයේ ඡායාරූපයේ ඉන්න මගේ අප්පච්චිගේ රූපය මගේ පපුව ඇතුළේ හැංගිලා තිබුණා. මං හිතන්නෙ මේ තරුණයා දැක්ක ගමන් මට අප්පච්චි ගැන මතකය ඇවිස්සෙන්න ඇති. එක රැයකින්.... මං දන්නෑ... මං ඇහිපිල්ලමක්වත් ගැහුවද කියලා.... මුළු රැය පුරාම මම මේ චිත්‍රය ඇන්දා...'

- සන්තුෂි සාරණා රණබාහු -

'මං ඔයාව දැක්කා බබා... දෙව්රම් විහාරේදී... ඒ දැක්කදා ඉඳලා... මම ඔයාව හොයනවා.... අද අහම්බෙන් දැක්කෙ...'

- සංකේත් රණබාහු වික්‍රමසූරිය -

ISBN 978-955-1116-72-9

තාරා ප්‍රකාශන
250/ඒ/6, පින්කොවත්ත,
පොල්ගහහේන, රාගම.
071 - 4244873

රු.390/-

The Reader's Place
http://...blogspot.com/